(හත්වැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

අංක. 2]

# පාර්ලිමේන්තුවේ

# න්‍යාය පුස්තකය

## 2010 නොවැම්බර් මස 09 වැනි අඟහරුවාදා ඇතුළුව එදින සිට

## නිකුත් කළේ 2010 ඔක්තෝබර් මස 21 වැනි බ්‍රහස්පතින්දා

### 2010 නොවැම්බර් මස 09 වැනි අඟහරුවාදා

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0119/'10

1\.

ගරු දයාසිරි ජයසේකර මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) වර්ෂ 2005 සිට 2010 මාර්තු 31 දක්වා ශ්‍රී ලංකාවට ගෙන්වන ලද සේලයින්,

(i) ප්‍රමාණය කොපමණද;

(ii) වර්ග කවරේද;

(iii) ආනයනය කිරීමට වැයවූ මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) පසුගිය දිනවල සේලයින් හිඟයක් පිළිබඳව විවිධ තොරතුරු පුවත්පත්වල පළවූ අතර එවැනි තත්ත්වයක් ඇතිවීමට හේතු කවරේද;

(ii) එවැනි තත්ත්වයක් ඇති කිරීමට නිලධාරියෙකු සම්බන්ධ නම්, ඔවුන්ට එරෙහිව ගත් පියවර කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0260/'10

2\.

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) හම්බන්තොට දිස්ත්‍රික්කයේ තංගල්ල කලාප අධ්‍යාපන කාර්යාලයට අයත් බෙලිඅත්ත කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයෙන් පාලනය වන රජයේ පාසල්වල අධ්‍යාපනය ලබන දරුවන්ගේ විභාග සමත්වීමේ ප්‍රතිශතය අඩුවෙමින් පවතින බව එතුමා දන්නෙහිද?

(ආ) එම අධ්‍යාපන කලාපයෙන් 2007, 2008 සහ 2009 වර්ෂයන්හිදී අ.පො.ස. උසස් පෙළ සමත්ව විශ්වවිද්‍යාල අධ්‍යාපනය ලැබීමට සුදුසුකම් ලැබූ සිසුන් සංඛ්‍යාව සහ ඔවුන් අයත් පාසල්වල නම් වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) වර්ෂය ආරම්භයේදී පෙළපොත් සහ ගුරුවන්ගේ විෂය නිර්දේශයන් නියමිත වේලාවට නොලැබීම සිසුන්ගේ අධ්‍යාපනය පහත වැටීමට හේතුවන බව එතුමා පිළිගන්නේද;

(ii) එසේ නම්, එම සිසුන්ගේ අධ්‍යාපනය වැඩි දියුණු කිරීම හා කුසලතා වර්ධනය කිරීමට අවශ්‍ය පෙළපොත් නියමිත කාලයට ලබා දීමට පියවර ගන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) (i) එම පාසල් නියමිත පරිදි අධීක්ෂණය කිරීම සඳහා අදාළ නිලධාරීන් යොමු කිරීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, ඒ සඳහා ගන්නා ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0273/’10

3.

ගරු රාජීව විජේසිංහ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන සහ ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) “ඉන්ටර්නැෂනල් ක්‍රයිසීස් ගෲප්” නමැති සංවිධානයක් පිළිබඳව එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම සංවිධානයේ නියෝජිතයින් දැනට ශ්‍රී ලංකාව තුළ සිටිත් ද, එසේත් නැති නම්, පසු ගිය වර්ෂ 10ක කාලය තුළ සිටියෝ ද;

(ii) එම සංවිධානය ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වූයේ කවර විධිවිධාන යටතේද;

(iii) එහි ජාත්‍යන්තර ක්‍රියාකාරිකයින් සඳහා වීසා බලපත් ලබා දුන්නේ කෙසේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මෙම සංවිධානය විසින් ශ්‍රී ලංකාව තුළ සේවයේ යොදවනු ලැබූ ශ්‍රී ලාංකිකයින්ගේ නම් කවරේද;

(ii) ඔවුන් සතු අධ්‍යාපනික හෝ වෙනත් සුදුසුකම් කවරේද;

(iii) “ඉන්ටර්නැෂනල් ක්‍රයිසීස් ගෲප්” සංවිධානය විසින් ඒ එක් එක් තැනැත්තාට ගෙවන ලද මුදල සහ ඒවා ගෙවූ පදනම කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) (i) මෙම සංවිධානය හෝ එහි සේවකයින්ගෙන් කිසිවකු ශ්‍රී ලංකාවේදී බදු ගෙවිය යුතුව තිබේද;

(ii) එසේ නම්, ඔවුන් එම වගකීම ඉටු කර තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0293/10

4.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) 2006 වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාව පෙන්වා දෙන පරිදි,

(i) මීටර් 9ක් දිග ලී කණු 21000ක් හා මීටර් 10ක් දිග ලී කණු 3400ක් මිලදී ගැනීම සඳහා මිල ගණන් කැඳවන ලද බවත්;

(ii) අවම මිල ගණන් ඉදිරිපත් කළ රාජ්‍ය දැව සංස්ථාවේ ටෙන්ඩරය පිළිනොගත් බවත්;

(ii) දෙවනුව අඩුම මිල ගණන් ඉදිරිපත් කළ දකුණු අප්‍රිකානු සමාගමට ටෙන්ඩරය ප්‍රදානය කළ බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) කෙසේ වෙතත් මීටර් 9ක් දිග ලී කණු 10500ක් හා මීටර් 10ක් දිග ලී කණු 1700ක් මිලදී ගත් බවත්;

(ii) එයින් දකුණු පළාතට සැපයූ කණු 2363කින් පාවිච්චියට ගෙන තිබුනේ කණු 73ක් පමණක් බවත්;

එතුමා දන්නෙහිද?

(ඇ) රාජ්‍ය දැව සංස්ථාවට ඉහත ටෙන්ඩරය ප්‍රදානය නොකිරීම නිසා රුපියල් මිලියන 79.5ක පාඩුවක් සිදු වූ බව එතුමා පිළිගන්නෙහිද?

(ඇ) එකී පාඩුව පිළිබඳව වගකිවයුත්තන්ගේ නම් කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0366/'10

5.

ගරු අජිත් පී. පෙරේරා මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) ලෝක සෞඛ්‍ය සංවිධානයේ ප්‍රමිතීන් අනුව වෛද්‍යවරුන් සහ ජනතාව අතර පැවතිය යුතු අවම අනුපාතය කුමක්ද;

(ii) සෞඛ්‍ය අමාත්‍යාංශය පිළිගන්නා ප්‍රමිතීන් අනුව ශ්‍රී ලංකාවේ වෛද්‍යවරුන් සහ ජනතාව අතර තිබිය යුතු අවම අනුපාතය කොපමණද;

(iii) දැනට ශ්‍රී ලංකාව තුළ පවතින වෛද්‍යවරුන් සහ ජනතාව අතර අනුපාතය කොපමණද;

(iv) මධ්‍යම රජයේ පාලනය යටතේ පවතින රෝහල්වල සේවය කරන වෛද්‍යවරුන් සංඛ්‍යාව කොපමණද;

(v) පළාත් සභා යටතේ පවතින රෝහල්වල සේවය කරන වෛද්‍යවරුන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාලවලින් පිටවන වෛද්‍යවරුන් රජයේ සේවයට බඳවා ගැනීම නතර කිරීමට හෝ සීමා කිරීමට තීරණය කර තිබේද;

(ii) එසේ නම්, ඒ සඳහා හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0411/'10

6.

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා,— වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවට අයත් මහනුවර හන්තාන වත්තෙන් අක්කර 45 රූඩ් 02 පර්චස් 16 ක බිම් ප්‍රමාණයක් නීත්‍යානුකූල නොවන ඉඩම් හුවමාරුවක් ලෙස ෂාමිනී කිරිඇල්ල සහ පිලිප් ජයවර්ධන යන අය වෙත ලබා දී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) මෙම ඉඩම ලබාදිය හැක්කේ ව්‍යවස්ථාපිතව ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට පවරාගෙන වුවත්, එම ක්‍රියා මාර්ගය අනුගමනය නොකර එවකට සිටි අමාත්‍යතුමා සහ ජ.න.ව.ස.ම සභාපතිතුමා විසින් එම ඉඩම පවරා ඇත්තේ නීත්‍යානුකූල නොවන ආකාරයකට බව එතුමා පිළිගන්නෙහිද?

(ඇ) (i) නීත්‍යානුකූලව පවරා නොමැති නම්, මෙම ඉඩම වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයට නැවත පවරා ගැනීමට කටයුතු කරන්නේද;

(ii) නීත්‍යානුකූල නොවන මෙම ඉඩම් ගණුදෙනුවට වගකිව යුත්තෝ කවුරුන්ද;

(iii) ඔවුන් සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0431/'10

7.

ගරු රවී කරුණානායක මහතා,— විදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) විදේශ කටයුතු අමාත්‍යවරයා සිය ධූරයේ රාජකාරි භාරගත් දිනයේ සිට අද දක්වා විදේශ කටයුතු අමාත්‍යවරයා ලෙස විදේශ ගතවූ වාර සංඛ්‍යාව කොපමණද;

(ii) සංචාරය කළ රටේ නම, සංචාරය සඳහා හේතුව, අමාත්‍යවරයා සඳහා වියදම, කැටුව ගිය පුද්ගලයන්ගේ නම් සහ ඔවුන් වෙනුවෙන් දැරූ පිරිවැය, එක් එක් සංචාරය සඳහා වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එක් එක් සංචාරය තුළින් මෙරට ලැබූ ප්‍රතිලාභ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) පසුගිය වර්ෂ 5 තුළ, වත්මන් අමාත්‍යවරයාට පෙර එම තනතුර දැරූ පුද්ගලයන් ඉහත සඳහන් රටවලටම සංචාරය කළ වාර ගණන කොපමණද;

(ii) ඒ සඳහා වැයවූ සමස්ත පිරිවැය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0556/'10

8.

ගරු අජිත් කුමාර මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) 2009.02.20 දින ත්‍රස්තවාදී ගුවන් ප්‍රහාරයෙන් හානියට පත් වූ දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ලේ ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ ඇස්තමේන්තු අනුව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කළ මුළු මුදල කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) එම ගොඩනැගිල්ලේ අලුත්වැඩියා කටයුතු සිදුකරන ලද පෞද්ගලික කොන්ත්‍රාත්කරුවන්ගේ නම්, කොන්ත්‍රාත් වටිනාකම හා ගෙවා ඇති මුදල් ප්‍රමාණයන් කවරේද;

(ii) ගොඩනැගිල්ලේ වර්ග අඩියක් සඳහා ඇස්තමේන්තුගත වියදම කොපමණද;

(iii) අලුත්වැඩියාවට අදාළ සියලු මුදල් ගෙවා අවසන් කර තිබේද;

(iv) අලුත්වැඩියා කටයුතු සඳහා ටෙන්ඩර් ප්‍රදානය කිරීමේදී නියමිත ටෙන්ඩර් පටිපාටි අනුගමනය කර තිබේද;

(v) එසේ නම්, ඊට අදාළ විස්තර ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) අලුත්වැඩියා කටයුතු ආරම්භ කළ දිනය කවරේද;

(ii) එම කටයුතු අවසන් කිරීමට ගිවිසුම්ගත කාලය කොපමණද;

(iii) මේ වන විට ගොඩනැගිල්ලේ ප්‍රතිසංස්කරණ කටයුතු මුළුමනින්ම අවසන් කර තිබේද;

(iv) ගොඩනැගිල්ලේ ප්‍රතිසංස්කරණ කටයුතු සම්බන්ධයෙන් සෑහීමකට පත් විය හැකි බවට විශේෂඥ වාර්තාවක් තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0261/'10

9.

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) හම්බන්තොට දිස්ත්‍රික්කයේ, වලස්මුල්ල කලාප අධ්‍යාපන කාර්යාලයට අයත් වලස්මුල්ල කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයෙන් පාලනය වන රජයේ පාසල්වල අධ්‍යාපනය ලබන දරුවන්ගේ විභාග සමත්වීමේ ප්‍රතිශතය අඩුවෙමින් පවතින බව එතුමා දන්නෙහිද?

(ආ) එම අධ්‍යාපන කලාපයෙන් 2007, 2008 සහ 2009 වර්ෂයන්හිදී අ.පො.ස. උසස් පෙළ සමත්ව විශ්වවිද්‍යාල අධ්‍යාපනය ලැබීමට සුදුසුකම් ලැබූ සිසුන් සංඛ්‍යාව සහ ඔවුන් අයත් පාසල්වල නම් වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) වර්ෂය ආරම්භයේදී පෙළපොත් සහ ගුරුවන්ගේ විෂය නිර්දේශයන් නියමිත වේලාවට නොලැබීම සිසුන්ගේ අධ්‍යාපනය පහත වැටීමට හේතුවන බව එතුමා පිළිගන්නේද;

(ii) එසේ නම්, එම සිසුන්ගේ අධ්‍යාපනය වැඩි දියුණු කිරීම හා කුසලතා වර්ධනය කිරීමට අවශ්‍ය පෙළපොත් නියමිත කාලයට ලබා දීමට පියවර ගන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) (i) එම පාසල් නියමිත පරිදි අධීක්ෂණය කිරීම සඳහා අදාළ නිලධාරීන් යොමු කිරීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, ඒ සඳහා ගන්නා ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0387/'10

10.

ගරු දයාසිරි ජයසේකර මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) පසුගිය වර්ෂ 6 ක කාලය තුළ රෝහල්වලින් ඉවත් කළ බාල වර්ගයේ ඖෂධ ප්‍රමාණය කොපමණද;

(ii) එසේ ඉවත් කරන ලද ඖෂධවල වටිනාකම කොපමණද;

(iii) එම ඖෂධ ගෙන්වීමට අනුමතිය ලබා දී ඇත්තේ කවුරුන්ද;

(iv) එම ඖෂධ විනාශ කිරීමට රජය විසින් මුදලක් වැය කළේද;

(v) එසේ නම්, එම මුදල කොපමණද;

(vi) බාල වර්ගයේ ඖෂධ ගෙන්වීමෙන් සමස්තයක් ලෙස රජයට දැරීමට සිදු වූ අලාභය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0432/'10

11.

ගරු රවි කරුණානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) රටක උද්ධමනය ගණනය කිරීමට බලය ලත් ආයතන කවරේද;

(ii) පසුගිය වර්ෂ 15ක කාලය තුළ එක් එක් වර්ෂයේදී ශ්‍රී ලංකාවේ උද්ධමන අනුපාතිකය කොපමණද;

(iii) එක් එක් වර්ෂයේදී උද්ධමනය නිසා සිදුවන අගය අඩුවීම ගණන් බැලීමෙන් 1995 වර්ෂයේ රු.1000.00 ක අද වන විට මුදලේ තථ්‍ය වටිනාකම (1995 උපයන ලද රු. 1000.00 ක අද දින ක්‍රය ශක්තිය) කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) රටේ ආර්ථිකය වගකීමෙන් තොරව මෙහෙයවීම වෙනුවෙන් වගකිවයුතු පුද්ගලයින්ගේ නම් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) ඉන්දියාව, පාකිස්ථානය, මාලදිවයින, භූතානය, නේපාලය, සිංගප්පූරුව සහ මැලේසියාව වැනි රටවල උද්ධමනය පසුගිය වර්ෂ 5 සඳහා කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0557/'10

12.

ගරු අජිත් කුමාර මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) ත්‍රස්තවාදී ගුවන් ප්‍රහාරයෙන් හානියට පත්වූ දේශීය ආදායම් ගොඩනැගිල්ල අලුත්වැඩියා කර අවසන් කරන තෙක් දෙපාර්තමේන්තුවේ අංශ ස්ථාපිත කිරීම සඳහා කුලී පදනම මත ලබාගත් ගොඩනැගිලි කවරේද;

(ii) එම ගොඩනැගිලිවල අයිතිකරුවන්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

(iii) එක් එක් කුලී ගොඩනැගිල්ලට ගෙවා ඇති මුළු මුදල් ප්‍රමාණයන් වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ඒවායේ කුලී කාල සීමාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) (i) දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ එක් එක් අංශ තවදුරටත් කුලී ගොඩනැගිලිවල පවත්වාගෙන යනු ලබන්නේද;

(ii) එසේ නම්, ඊට හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0262/'10

13.

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) හම්බන්තොට දිස්ත්‍රික්කයේ, වලස්මුල්ල කලාප අධ්‍යාපන කාර්යාලයට අයත් කටුවන කොට්ඨාශ අධ්‍යාපන කාර්යාලයෙන් පාලනය වන රජයේ පාසල් වල අධ්‍යාපනය ලබන දරු දැරියන්ගේ විභාග සමත් වීමේ ප්‍රතිශතය අඩුවෙමින් පවතින බැව් ඔබතුමා දන්නෙහිද?

(ආ) එම අධ්‍යාපන කලාපයෙන් 2007, 2008 සහ 2009 වර්ෂයන්හිදී අ.පො.ස. උසස් පෙළ සමත්ව විශ්වවිද්‍යාල අධ්‍යාපනය ලැබීමට සුදුසුකම් ලැබූ සිසුන් සංඛ්‍යාව සහ ඔවුන් අයත් පාසල්වල නම් වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) වර්ෂය ආරම්භයේදී පෙළපොත් සහ ගුරුවන්ගේ විෂය නිර්දේශයන් නියමිත වේලාවට නොලැබීම සිසුන්ගේ අධ්‍යාපනය පහත වැටීමට හේතුවන බව එතුමා පිළිගන්නේද;

(ii) එසේ නම්, එම සිසුන්ගේ අධ්‍යාපනය වැඩි දියුණු කිරීම හා කුසලතා වර්ධනය කිරීමට අවශ්‍ය පෙළපොත් නියමිත කාලයට ලබා දීමට පියවර ගන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) එම පාසල් නියමිත පරිදි අධීක්ෂණය කිරීම සඳහා අදාළ නිලධාරීන් යොමු කිරීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, ඒ සඳහා ගන්නා ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0433/'10

14.

ගරු රවී කරුණානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) උතුරු සහ නැගෙනහිර පළාත්වල මේ වන විට ලියාපදිංචි වී ඇති ආගමික ආයතන සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවායේ නම් සහ ලිපිනයන් කවරේද;

(iii) ඒවා අතුරෙන් වඩා වැදගත්කමින් යුතු වූද, ඓතිහාසික වටිනාකමින් යුක්ත වූද, ආගමික ස්ථාන 20 හි නම් කවරේද;

(iv) රජය විසින් එම ආගමික ආයතන වෙත වෙන් කර දී ඇති මුදල් ප්‍රමාණය කොපමණද;

(v) එම ආයතනයන්හි වැඩ වෙසෙන පූජකවරුන් සංඛ්‍යාව එක් එක් ආගම අනුව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0558/'10

15.

ගරු අජිත් කුමාර මහතා,— ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) අයිෆා සම්මාන උළෙල සඳහා සුගතදාස ගෘහස්ත ක්‍රීඩාංගනය නවීකරණය කරනු ලැබුවේද;

(ii) එසේ නවීකරණය කිරීමේදී ගෘහස්ත ක්‍රීඩාංගනය තුළ සිදු කළ වෙනස්කම් පිළිබඳ සම්පූර්ණ විස්තර කවරේද;

(iii) එම නවීකරණය කිරීම් සිදු කරනු ලැබූ ආයතනය කුමක්ද;

(iv) ඊට වැය කළ මුදල කොපමණද;

(v) එම මුදල් ප්‍රතිපාදන ලබා දුන් ආයතනය කුමක්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) සුගතදාස ගෘහස්ත ක්‍රීඩාංගනය තුළ,

(i) නවීකරණයට පෙර අසුන්ගත හැකිව තිබූ පුද්ගලයින් සංඛ්‍යාව කොපමණද;

(ii) නවීකරණයෙන් පසු අසුන්ගත හැකි පුද්ගලයින් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*1.
විසර්ජන පනත් කෙටුම්පත (2011) — දෙවැනි වර කියවීම

*2.
භාණ්ඩාගාර ලේකම් (නියෝජිතයන් පත්කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම

*3.
ගෙවීම් පැහැර හරිනු ලැබූ බදු (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම

*4.
සූදු (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — දෙවන වර කියවීම

*5.
ශ්‍රී ලංකා රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා (ඉවත් කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම

*6.
බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම

*7.
රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම

*8.
මරණ ලියාපදිංචි කිරීමේ (තාවකාලික විධිවිධාන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම

*9.
පළාත් පාලන ආයතන (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම

*10.
පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම

*11.
අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 1),— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(2) වැනි ව්‍යවස්ථාව සමඟ කියවිය යුතු, 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් ජනාධිපතිවරයා විසින් සාදන ලදුව, 2010 ජූනි මස 17 දිනැති අංක 1658/31 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2010.10.20 වැනි දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතුය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත)

*12.
අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 2),— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(2) වැනි ව්‍යවස්ථාව සමඟ

කියවිය යුතු, 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් ජනාධිපතිවරයා විසින් සාදන ලදුව, 2010 අගෝස්තු මස 09 දිනැති අංක 1666/1 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2010.10.20 වැනි දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතුය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත)

*13.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 3),— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(2) වැනි ව්‍යවස්ථාව සමඟ කියවිය යුතු, 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් ජනාධිපතිවරයා විසින් සාදන ලදුව, 2010 සැප්තැම්බර් මස 09 දිනැති අංක 1670/20 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2010.10.20 වැනි දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතුය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත)

*14.

කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත යටතේ නියෝගය,— 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනතේ 14(1) වැනි වගන්තිය යටතේ සෙස් බදු සම්බන්ධයෙන් කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2010 ජූලි මස 09 දිනැති අංක 1661/36 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ 2010.10.20 වැනි දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතුය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත)

*15.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— මුදල් පනත යටතේ නියෝග,— 2004 අංක 11 දරන මුදල් පනතේ 22 වැනි වගන්තිය සමග කියවිය යුතු 26 වැනි වගන්තිය යටතේ ජාත්‍යන්තර විදුලි සංදේශ ක්‍රියාකරු බදු සම්බන්ධයෙන් මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2010 ජූලි මස 12 දිනැති අංක 1662/1 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2010.10.20 වැනි දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතුය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත)

*16.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ නියමය,— 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3 වැනි වගන්තිය යටතේ නිෂ්පාදන බදු සම්බන්ධයෙන් මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයා විසින් සාදනු ලදුව, 2010 අගෝස්තු මස 30 දිනැති අංක 1669/1 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2010.10.20 වැනි දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතුය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත)

*17.

ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමා,— මැනුම් පනත යටතේ නිවේදනය (අංක 1),— 2002 අංක 17 දරන මැනුම් පනතේ 41 වැනි වගන්තිය සමග කියවිය යුතු, එම පනතේ 65 වැනි වගන්තිය යටතේ ඉඩම් අමාත්‍යවරයා විසින් අනුමතකර 2005 නොවැම්බර් මස 23 වැනි දින අංක 1420/20 දරන ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ "2005 ඉඩම් මැනුම් සභා (වෘත්තියේ යෙදීමේ වාර්ෂික බලපත්‍ර)" නියෝගයේ 3 වැනි ඡේදය සංශෝධනය කිරීම සඳහා 2009 දෙසැම්බර් මස 18 වැනි දින අංක 1633 දරන ගැසට් පත්‍රයේ පල කරනු ලැබ, 2010.10.19 වැනි දින ඉදිරිපත් කරන ලද නිවේදනය අනුමත කළ යුතු ය.

*18.

ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමා,— මැනුම් පනත යටතේ නිවේදනය (අංක 2),— 2002 අංක 17 දරන මැනුම් පනතේ 39 වැනි වගන්තිය සමග කියවිය යුතු, එම පනතේ 65 වැනි වගන්තිය යටතේ ඉඩම් අමාත්‍යවරයා විසින් අනුමතකර 2005 නොවැම්බර් මස 23 වැනි දින අංක 1420/20 දරන ගැසට් පත්‍රයේ පල කරනු ලැබූ "2005 ඉඩම් මැනුම් (ලියාපදිංචි කිරීමේ)" නියෝගයෙහි 2(2) ඡේදය සංශෝධනය කිරීම සඳහා 2010 ජූනි මස 22 වැනි දින අංක 1659/9 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පල කරනු ලැබ, 2010.10.19 වැනි දින ඉදිරිපත් කරන ලද නිවේදනය අනුමත කළ යුතු ය.

*19.

ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමා,— හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත යටතේ නියෝග,— 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ 60 සහ 62 වැනි වගන්ති සමඟ කියවිය යුතු, එකී පනතේ 67 වැනි වගන්තිය යටතේ ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2009 අගෝස්තු 24 දිනැති, අංක 1616/23 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2010.05.06 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*20.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— විසර්ජන පනත යටතේ යෝජනාව,— 2008 අංක 43 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුවරයාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, වැඩබලන මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයා විසින් දෙන ලද පහත දැක්වෙන අංක 27 දරන නියමය අනුමත කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

## 2008 අංක 43 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ අංක 27 දරන නියමය

වැඩ බලන මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍ය, සරත් අමුණුගම වන මම, 2008 අංක 43 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එකී පනතේ තෙවැනි උපලේඛනයේ විෂය අංක: 21302 "පොත් මුද්‍රණය, ප්‍රචාරණය හා අලෙවිය අත්තිකාරම් ගිණුම — අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව" වෙත පැවරී ඇති කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මගින් වෙනස් කරමි.

| | | | |
|---|---|---|---|
| (i) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ II වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති වියදමෙහි උපරිම සීමාව | සංශෝධන නොමැත | |
| (ii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ III වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල අවම සීමාව | රු. 2,400,000,000<br>රු. 2,162,000,000 | සිට<br>දක්වා |
| (iii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ IV වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල හර ශේෂයන්ගේ උපරිම සීමාව | සංශෝධන නොමැත | |

(iv) එකී පනතේ තෙවැනි උපලේඛනයේ V වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති බැරකම්හි උපරිම සීමාව — රු. 100,000,000 සිට රු. 960,000,000 දක්වා

(මෙම නියමය වලංගු වන්නේ 2009.12.31 වැනි දින දක්වා පමණි)

අත්සන් කළේ/ ආචාර්ය සරත් අමුණුගම,
වැඩ බලන මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමා.

2010.07.03 වැනි දින,
කොළඹ 01.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත)

*21.

සෞඛ්‍ය අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් 2007,— 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 30(2) සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2009.07.08 වැනි දින ඉදිරිපත් කරන ලද 2007.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2009.05.05 දින සලකා බලන ලදි.)

*22.

සෞඛ්‍ය අමාත්‍යතුමා,— විජය කුමාරතුංග අනුස්මරණ රෝහලේ වාර්ෂික වාර්තාව හා ගිණුම් 2007,— 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 30(2) සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2009.07.08 වැනි දින ඉදිරිපත් කරන ලද 2007.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් විජය කුමාරතුංග අනුස්මරණ රෝහලේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2009.05.05 දින සලකා බලන ලදි.)

*23.

සෞඛ්‍ය අමාත්‍යතුමා,— ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහලේ වාර්ෂික වාර්තාව හා ගිණුම් 2006,— 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 30(2) සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2009.07.08 වැනි දින ඉදිරිපත් කරන ලද 2006.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහලේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2009.05.05 දින සලකා බලන ලදි.)

*24.

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ වාර්ෂික වාර්තාව 2007,— 1984 අංක 06 දරන ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය පනත සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වැනි වගන්තිය අනුව 2009.09.09 වැනි දින ඉදිරිපත් කරන ලද 2007 ජනවාරි මස 01 වැනි දින සිට 2007 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(විද්‍යා හා තාක්ෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2009.08.06 දින සලකා බලන ලදී.)

*25.

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා,— කාර්මික තාක්ෂණ ආයතනයේ වාර්ෂික වාර්තාව 2006,— 1994 අංක 11 දරන විද්‍යා හා තාක්ෂණ සංවර්ධන පනතේ 40(3) සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වැනි වගන්තිය අනුව 2009.09.06 වැනි දින ඉදිරිපත් කරන ලද 2006 ජනවාරි මස 01 වැනි දින සිට 2006 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් කාර්මික තාක්ෂණ ආයතනයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(විද්‍යා හා තාක්ෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2009.08.06 දින සලකා බලන ලදී.)

*26.

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා,— අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව 2006,— 2005 අංක 32 දරන අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩල පනතේ 29(5) වැනි වගන්තිය අනුව සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වැනි වගන්තිය අනුව 2009.09.09 වැනි දින ඉදිරිපත් කරන ලද 2006 ජනවාරි 01 වැනි දින සිට 2006 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(විද්‍යා හා තාක්ෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2009.08.06 දින සලකා බලන ලදී.)

*** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**

## 2010 නොවැම්බර් මස 10 වැනි බදාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0039/'10

1.

ගරු රවී කරුණානායක මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) 2009 වර්ෂයේ ජනවාරි සිට දෙසැම්බර් තෙක් වූ එක් එක් මාසයේදී, ශ්‍රී ලංකා මධ්‍යම ගමනාගමන මණ්ඩලය (ශ්‍රී.ලං.ග.ම) විසින් මාසික වාර ප්‍රවේශපත්‍රවලින් ලබා ගන්නා ලද ආදායම කොපමණද;

(ii) ඉහත කී ආදායම එකී මාස තුළදී ශ්‍රී.ලං.ග.ම විසින් මගී ප්‍රවාහනය තුළින් ලබා ගන්නා ලද මුළු ආදායමෙහි ප්‍රතිශතයක් ලෙස කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ලබා ගන්නා ලද ආදායම එක් එක් මාසය ආරම්භයේදී බැංකුවක තැන්පත් කිරීම මගින් අදාළ ආයතනය අමතර පොලියක් උපයනු ලබන්නේද;

(ii) එසේ නම්, ඉහත කී මාස තුළදී එලෙස උපයාගත් මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0076/'10

2.

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) දැනට වර්ෂයකට පෙර කොන්ක්‍රීට් අතුරා සකසන ලද හම්බන්තොට දිස්ත්‍රික්කයේ, බෙලිඅත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, තාරපේරිය නැගෙනහිර ග්‍රාම නිලධාරී වසමේ, තාරපේරිය, පොත්තෙවෙල වැව මාර්ගයේ මීටර් 200 ක දුර ප්‍රමාණයෙහි මේ වන විට කොන්ක්‍රීට් ගැලවී, අබලන් වී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම මාර්ගය සංවර්ධනය කිරීම සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන කොපමණද;

(ii) ඉදිකිරීම් සඳහා මුදල් නිදහස් කිරීමේදී ප්‍රමිතීන්ට අනුව වැඩ නිම කළ බවට කාර්මික නිලධාරීන්ගේ නිර්දේශ ලබාගෙන තිබේද;

(iii) එම මාර්ගය සඳහා ගෙවීම් කටයුතුවලදී වෙනත් කුමන ආයතනවලින් නිර්දේශ ලබාගෙන තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) මේ පිළිබඳව විධිමත් පරීක්ෂණයක් පැවැත්වීමටත්, එම මාර්ගය යථා තත්වයට පත් කිරීමටත් එතුමා කටයුතු කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0528/'10

3.

ගරු දයාසිරි ජයසේකර මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) නැගෙනහිර පළාතේ, ඇතුළත වටරවුම් මාර්ගය සංවර්ධනය කිරීම සඳහා යෝජිත මාර්ගයක් ද;

(ii) එසේ නම්, එම මාර්ගය මේ වන විට සංවර්ධනය කරමින් පවතින්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) මෙම මාර්ගයේ සංවර්ධන කටයුතු කරනු ලබන්නේ නම්,

(i) එහි දිග කිලෝමීටර් කොපමණද;

(ii) එහි වැඩ අවසන් කිරීමට යෝජිත දිනය කවරේද;

(iii) ඒ සඳහා ඇස්තමේන්තුගත මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මෙම මාර්ගය ඉදිකිරීම සඳහා ටෙන්ඩර් කැඳවනු ලැබුවේද;

(ii) එසේ නම්, ටෙන්ඩර් ඉදිරිපත් කරන ලද ආයතනවල නම් කවරේද;

(iii) ඒ ඒ ආයතන විසින් ඉදිරිපත් කරන ලද ටෙන්ඩර් මිල ගණන් කවරේද;

(iv) ටෙන්ඩරය පිරිනමන ලද ආයතනය හා අදාළ ටෙන්ඩර් මුදල කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) (i) මෙම මාර්ගය ඉදිකිරීම සඳහා ඇස්තමේන්තු ගත මුළු මුදල දේශීය අරමුදල්වලින් ලබා ගත්තේද;

(ii) නොඑසේ නම්, විදේශ ආධාර මගින් ලබා ගත්තේද;

(iii) විදේශ ආධාර ලබා ගත්තේ නම්, ආධාර ලබාදුන් රටේ නම කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0607/'10

4.

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) යාපනය, කිළිනොච්චිය හා මුලතිව් දිස්ත්‍රික්ක තුළ පුරන් වූ කුඹුරු බිම් ප්‍රමාණය හෙක්ටයාර කොපමණද;

(ii) එම කුඹුරු නැවත අස්වැද්දීම සඳහා ගොවීන්ට දිරිදීම් ලබා දෙන්නේද;

(iii) එසේ නම්, ඒ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එම කුඹුරු අස්වැද්දීමෙන් ලබා ගැනීමට අපේක්ෂිත වී අස්වැන්න මෙට්‍රික් ටොන් සංඛ්‍යාව කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0613/'10

5.

ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය,— ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) සපුගස්කන්ද තෙල් පිරිපහදුව පුළුල් කිරීමේ ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තුගත පිරිවැය කොපමණද;

(ii) එම ව්‍යාපෘතිය මෙහෙයවනු ලබන්නේ ණය පහසුකම් යටතේද; ප්‍රදාන යටතේද;

(iii) එම ව්‍යාපෘතිය අවසන් කිරීමට අපේක්ෂිත වර්ෂය කවරේද;

(iv) උක්ත ව්‍යාපෘතිය අවසානයේදී ඉහළ නැංවීමට අපේක්ෂිත දෛනික තෙල් පිරිපහදු ධාරිතාවය බොර තෙල් බැරල් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) හම්බන්තොට දිස්ත්‍රික්කයේ නව තෙල් පිරිපහදුවක් ආරම්භ කිරීමට යෝජිතව තිබේද;

(ii) එසේ නම්, එම ව්‍යාපෘතිය ආරම්භ කිරීමට අපේක්ෂිත වර්ෂය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0621/'10

6.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ චක්‍රලේඛ අංක 2008/41 මගින් පාසල් ආදී ශිෂ්‍ය සංගම් හා වෙනත් විවිධ සංගම් මගින් පාසල් සිසුන්ගෙන් සහ දෙමාපියන්ගෙන් යම් යම් හේතු දක්වා මුදල් එකතු කිරීම තහනම් කර ඇති බව එතුමා පිළිගන්නෙහිද?

(ආ) එසේ තිබියදී කොළඹ රාජකීය විද්‍යාලයේ ආදි ශිෂ්‍ය සංගමය 2010 රෝයල් පැරේඩ් (Royal Parade) නමින් රු. 600 ක් වටිනා කොටු කාඩ්පත් ළමුන් අතර බෙදා එමගින් මුදල් එකතු කරන බව එතුමා දන්නෙහිද?

(ඇ) උක්ත චක්‍රලේඛයට පටහැනිව මුදල් එකතු කර තිබේ නම්, ඒ වෙනුවෙන් ගනු ලබන පියවර කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0040/'10

7.

ගරු රවි කරුණානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) පසුගිය වර්ෂ දහයක කාලය තුළ එක් එක් වර්ෂයේදී, ශ්‍රී ලංකා රජයට ණය මුදල් ලබා දී ඇති රටවල්, ජාත්‍යන්තර මූල්‍ය ආයතන හෝ බැංකු සහ පෞද්ගලික ආයතනවල නම් කවරේද;

(ii) මේ වන විට ගෙවීමට ඉතිරිව තිබෙන ණය ප්‍රමාණය කොපමණද;

(iii) 1999 වර්ෂය අවසාන වන විට ගෙවීමට ඉතිරිව තිබූ ණය ප්‍රමාණය කොපමණද;

(iv) 1999 වර්ෂයේ සිට මේ දක්වා වූ කාලය තුළ එක් එක් වර්ෂයේදී රටවල් විසින් හෝ ආයතන විසින් ලබාදී ඇති ණය ප්‍රමාණය කොපමණද;

(v) ණය පොලී අනුපාතිකයන් සහ ණය ආපසු ගෙවිය යුතු කාල පරිච්ඡේදය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මේ දක්වා ලබාගෙන ඇති ණය මුදල්ද සමග වර්ෂ 2000 සිට 2015 දක්වා වූ කාලය තුළ එක් එක් වර්ෂය සඳහා සම්පූර්ණ ණය ක්‍රමක්ෂය (මුල් ණය මුදල සහ පොලී ගෙවීම්) කොපමණද;

(ii) ඉහත දක්වා ඇති දත්ත ඇමරිකානු ඩොලර් වලින් සහ විශේෂ ගැනුම් හිමිකම් (SDR) වලින් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0077/'10

8\.

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) දැනට වර්ෂයකට පෙර කොන්ක්‍රීට් අතුරා සකසන ලද හම්බන්තොට දිස්ත්‍රික්කයේ, බෙලිඅත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, තාරපේරිය බටහිර ග්‍රාම නිලධාරී වසමේ, ගල්කෙම පන්සල මාර්ගයේ මීටර් 200 ක දුර ප්‍රමාණයෙහි මේ වන විට කොන්ක්‍රීට් ගැලවී, අබලන් වී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම මාර්ගය සංවර්ධනය කිරීම සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන කොපමණද;

(ii) ඉදිකිරීම් සඳහා මුදල් නිදහස් කිරීමේදී ප්‍රමිතීන්ට අනුව වැඩ නිම කළ බවට කාර්මික නිලධාරීන්ගේ නිර්දේශ ලබාගෙන තිබේද;

(iii) එම මාර්ගය සඳහා ගෙවීම් කටයුතුවලදී වෙනත් කුමන ආයතනවලින් නිර්දේශ ලබාගෙන තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) මේ පිළිබඳව විධිමත් පරීක්ෂණයක් පැවැත්වීමටත්, එම මාර්ගය යථා තත්වයට පත් කිරීමටත් එතුමා කටයුතු කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0529/'10

9\.

ගරු දයාසිරි ජයසේකර මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) නැගෙනහිර පළාතේ, තිරුක්කොන්ඩියාඩුමඩු - ජයන්තිපුර මාර්ගය සංවර්ධනය කිරීම සඳහා යෝජිත මාර්ගයක් ද;

(ii) එසේ නම්, එම මාර්ගය මේ වන විට සංවර්ධනය කරමින් පවතින්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) මෙම මාර්ගයේ සංවර්ධන කටයුතු කරනු ලබන්නේ නම්,

(i) එහි දිග කිලෝමීටර් කොපමණද;

(ii) එහි වැඩ අවසන් කිරීමට යෝජිත දිනය කවරේද;

(iii) ඒ සඳහා ඇස්තමේන්තුගත මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මෙම මාර්ගය ඉදිකිරීම සඳහා ටෙන්ඩර් කැඳවනු ලැබුවේද;

(ii) එසේ නම්, ටෙන්ඩර් ඉදිරිපත් කරන ලද ආයතනවල නම් කවරේද;

(iii) ඒ ඒ ආයතන විසින් ඉදිරිපත් කරන ලද ටෙන්ඩර් මිල ගණන් කවරේද;

(iv) ටෙන්ඩරය පිරිනමන ලද ආයතනය හා අදාළ ටෙන්ඩර් මුදල කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) (i) මෙම මාර්ගය ඉදිකිරීම සඳහා ඇස්තමේන්තු ගත මුළු මුදල දේශීය අරමුදල්වලින් ලබා ගත්තේද;

(ii) නොඑසේ නම්, විදේශ ආධාර මගින් ලබා ගත්තේද;

(iii) විදේශ ආධාර ලබා ගත්තේ නම්, ආධාර ලබාදුන් රටේ නම කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0608/'10

10.

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා,— වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) 2007, 2008 හා 2009 වර්ෂවලදී මෙරට දළ වාර්ෂික පොල් අස්වැන්න කොපමණද;

(ii) ඉහත සඳහන් වර්ෂවලදී පොල් අපනයනය මගින් ඉපැයූ සමස්ත ආදායම කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) දකුණු පළාත තුළ පොල් වගාවේ සීඝ්‍රයෙන් පැතිර යන පොල් කොළ වියලීමේ රෝගය මර්ධනයට මෙතෙක් ගෙන ඇති පියවර කවරේද;

(ii) එම රෝගය අනෙකුත් ප්‍රදේශවල ව්‍යාප්තවීම වැළැක්වීමට ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද ?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0622/'10

11.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) කොළඹ රාජකීය විද්‍යාලයේ ඉගෙනුම ලබන මුළු සිසුන් සංඛ්‍යාව කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) 2008 වර්ෂය සඳහා එම පාසලේ එක් ශිෂ්‍යයෙකුගෙන් රු. 3300ක් බැගින් පාසල් ගාස්තු අයකර ඇති බව එතුමා පිළිගන්නෙහිද?

(ඇ) (i) 2009 වර්ෂය සඳහා පාසල් ගාස්තු ලෙස එම පාසලේ එක් ශිෂ්‍යයෙකුගෙන් අයකර ඇති මුදල කොපමණද;

(ii) 2009 වර්ෂය සඳහා කොළඹ රාජකීය විද්‍යාලයට රජයෙන් වෙන කරන ලද මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0041/'10

12.

ගරු රවී කරුණානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ හිටපු සභාපතිවරුන් වන ගරු ජෝන් අමරතුංග, ගරු ජෙයරාජ් ප්‍රනාන්දුපුල්ලේ සහ ගරු රෝහිත බෝගොල්ලාගම යන මහත්වරුන් විසින් ඉදිරිපත් කරන ලද කෝප් (COPE) වාර්තා සහ 2007 ජනවාරි 12 වැනි දින ගරු විජයදාස රාජපක්ෂ මහතා විසින් ඉදිරිපත් කරන ලද වාර්තාව සම්බන්ධයෙන් ගනු ලැබූ ක්‍රියාමාර්ග එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) හිටපු විගණකාධිපති මායාදුන්න මහතා විසින් ඉදිරිපත් කරන ලද 2006 ජූලි 20 වැනි දිනැති වාර්තාව සහ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ සභාපති ගරු රවුෆ් හකීම් මහතා විසින් 2007 නොවැම්බර් 29 වැනි දින ඉදිරිපත් කරන ලද අංක PS12 දරන වාර්තාව සම්බන්ධයෙන් ගනු ලැබූ ක්‍රියාමාර්ග කවරේද;

(ii) ඉහත වාර්තාවලට අනුව විමර්ශනය කරන ලද ආයතනවල නම් කවරේද;

(iii) කාරක සභා වාර්තාවේ සඳහන් උපදෙස් අනුව ආරම්භ කරන ලද ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0080/'10

13.

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) දැනට වර්ෂයකට පෙර කොන්ක්‍රීට් අතුරා සකසන ලද හම්බන්තොට දිස්ත්‍රික්කයේ, බෙලිඅත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ගජනායකගම ග්‍රාම නිලධාරී වසමේ, මොරයාය හංදියේ සිට බෝගමුව දක්වා මාර්ගයේ මීටර් 200 ක දුර ප්‍රමාණයෙහි මේ වන විට කොන්ක්‍රීට් ගැලවී, සම්පූර්ණයෙන්ම අබලන් වී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම මාර්ගය සංවර්ධනය කිරීම සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන කොපමණද;

(ii) ඉදිකිරීම් සඳහා මුදල් නිදහස් කිරීමේදී ප්‍රමිතීන්ට අනුව වැඩ නිම කළ බවට කාර්මික නිලධාරීන්ගේ නිර්දේශ ලබාගෙන තිබේද;

(iii) එම මාර්ගය සඳහා ගෙවීම් කටයුතුවලදී වෙනත් කුමන ආයතනවලින් නිර්දේශ ලබාගෙන තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) මේ පිළිබඳව විධිමත් පරීක්ෂණයක් පැවැත්වීමටත්, එම මාර්ගය යථා තත්වයට පත් කිරීමටත් එතුමා කටයුතු කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0530/'10

14.

ගරු දයාසිරි ජයසේකර මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) නැගෙනහිර පළාතේ, මහඔය - වෙන්කලඩි මාර්ගය සංවර්ධනය කිරීම සඳහා යෝජිත මාර්ගයක් ද;

(ii) එසේ නම්, එම මාර්ගය මේ වන විට සංවර්ධනය කරමින් පවතින්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) මෙම මාර්ගයේ සංවර්ධන කටයුතු වසිදුකරනු ලබන්නේ නම්,

(i) එහි දිග කිලෝමීටර් කොපමණද;

(ii) එහි වැඩ අවසන් කිරීමට යෝජිත දිනය කවරේද;

(iii) ඒ සඳහා ඇස්තමේන්තුගත මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මෙම මාර්ගය ඉදිකිරීම සඳහා ටෙන්ඩර් කැඳවනු ලැබුවේද;

(ii) එසේ නම්, ටෙන්ඩර් ඉදිරිපත් කරන ලද ආයතනවල නම් කවරේද;

(iii) ඒ ඒ ආයතන විසින් ඉදිරිපත් කරන ලද ටෙන්ඩර් මිල ගණන් කවරේද;

(iv) ටෙන්ඩරය පිරිනමන ලද ආයතනය හා අදාළ ටෙන්ඩර් මුදල කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) මෙම මාර්ගය ඉදිකිරීම සඳහා ඇස්තමේන්තු ගත මුළු මුදල දේශීය අරමුදල්වලින් ලබා ගත්තේද;

(ii) නොඑසේ නම් විදේශ ආධාර මගින් ලබා ගත්තේද;

(iii) විදේශ ආධාර ලබා ගත්තේ නම්, ආධාර ලබාදුන් රටේ නම කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0623/'10

15.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— පරිසර අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) වාහන දුම් පරීක්ෂා කිරීම සඳහා දිවයින පුරා පිහිටුවා ඇති සේවා ස්ථාන සංඛ්‍යාව කොපමණද;

(ii) වාහන දුම් පරීක්ෂා කිරීමෙන් රජය මෙතෙක් ලබා ඇති ආදායම කොපමණද;

(iii) පරිසර සංරක්ෂණ බද්දක් වශයෙන් සලකන මෙම බදු මුදලින් පරිසර සංරක්ෂණය සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(iv) වාහන දුම් පරීක්ෂා කර තත්ත්ව සහතිකයක් නිකුත් කිරීමට එම පරීක්ෂණය පවත්වනු ලබන ආයතන සපුරා ඇති සුදුසුකම් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2010 නොවැම්බර් මස 11 වැනි බ්‍රහස්පතින්දා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0042/'10

1.

ගරු රවී කරුණානායක මහතා,— උසස් අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) රජයට අයත් විශ්වවිද්‍යාල සංඛ්‍යාව කවරේද;

(ii) එම එක් එක් විශ්වවිද්‍යාලය පිහිටා ඇති ස්ථානය සහ එම ස්ථානය අයත් වන පළාත, දිස්ත්‍රික්කය සහ මැතිවරණ කොට්ඨාසය කවරේද;

(iii) ශ්‍රී ලංකාව තුළ පෞද්ගලික විශ්වවිද්‍යාල ක්‍රියාත්මක වන්නේද;

(iv) එසේ නම්, ඒවායේ නම් සහ එම එක් එක් විශ්වවිද්‍යාලයේ ලියාපදිංචි වී ඇති ශිෂ්‍ය සංඛ්‍යාව කවරේද;

(v) එම විශ්වවිද්‍යාල මගින් දේශීය උපාධි පිරිනමනු ලබන්නේද; නැතහොත් විදේශීය උපාධි පිරිනමනු ලබන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) පසුගිය වර්ෂ හයක කාලය තුළ එක් එක් විශ්වවිද්‍යාලයේ අධ්‍යයන කටයුතු පවත්වනු ලැබූ දින සංඛ්‍යාව කවරේද;

(ii) පසුගිය වර්ෂ හයක කාලය තුළ කිසිදු පංති වර්ජනයකින් තොරව විශ්ව විද්‍යාලයේ අධ්‍යයන කටයුතු පවත්වනු ලැබුවේ නම්, එලෙස අධ්‍යයන කටයුතු පැවැත්වීමට ඉඩ තිබූ දින ගණන හා ඉහත (i) හි සඳහන් දින ගණන අතර සංසන්දනය කවරේද;

(iii) පසුගිය වර්ෂ 5 තුළ එක් එක් විශ්වවිද්‍යාලයේ සාමාන්‍ය ශිෂ්‍ය පැමිණීම වාර්ෂික පදනමින් කොපමණද;

යන්න එතුමා එක් එක් පීඨය අනුව සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) බරපතළ ලෙස නවක වධය දීම පිළිබඳව වාර්තා වී ඇති විශ්වවිද්‍යාල සංඛ්‍යාව කවරේද;

(ii) පසුගිය වර්ෂ 2 තුළ ඒ සම්බන්ධයෙන් අධිකරණයේ විභාග කර අවසන් වූ සහ ඉදිරියේ දී විභාගවීමට නියමිතව ඇති නඩු සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0053/'10

2.

ගරු රාජීව විජේසිංහ මහතා,—මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) රාජ්‍ය නොවන සංවිධානවලට සහ පාර්ලිමේන්තු පනතකින් සංස්ථාගත කර ඇති සමාජ සේවා කටයුතුවල යෙදෙන ආයතනවලට ලැබෙන විදේශ අරමුදල් අධීක්ෂණය කිරීම සඳහා පවතින යාන්ත්‍රණයන් කවරේද;

(ii) සමාගම් රෙජිස්ට්‍රාර්වරයා වෙත ලියාපදිංචි වී ඇති සමාජ සේවා හෝ පර්යේෂණ හෝ උපදේශන කටයුතුවල යෙදෙන සමාගම්වලට ලැබෙන විදේශ මුදල් අධීක්ෂණය කිරීම සඳහා පවතින යාන්ත්‍රණයන් කවරේද;

(iii) මෙම සමාගම් නීතියෙන් නියමකර ඇති පරිදි තම ලැබීම් ඉදිරිපත් කරන්නේද, බදු ලිපිගොනු පවත්වාගෙන යන්නේ ද සහ මෙවන් සමාගම්වලට ලැබී තිබිය හැකි ප්‍රදානයන් සහ මෙවන් සමාගම්වලට ලැබී තිබිය හැකි ප්‍රදානයන් මත බදු ගෙවීම් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) වර්ෂ 1999 සහ 2010 අතර වර්ෂ 2010 ඇතුළත් කාලසීමාව තුළ ජනවාර්ගික අධ්‍යයනය පිළිබඳ ජාත්‍යන්තර මධ්‍යස්ථානයට බාහිර මූලාශ්‍රවලින් ලැබුණ අරමුදල් සහ එම අරමුදල් භාවිතා කළ කාරණා කවරේද;

(ii) මෙම අරමුදල් ලබාගත් හේතු විදේශ සම්පත් දෙපාර්තමේන්තුව විසින් අනුමත කළේද;

(iii) මෙම අරමුදල් භාවිතා කිරීම ආණ්ඩුවේ කිසියම් නියෝජිතායතනයක් මගින් අධීක්ෂණය කළේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0081/'10

3.

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) දැනට වර්ෂයකට පෙර කොන්ක්‍රීට් අතුරා සකසන ලද හම්බන්තොට දිස්ත්‍රික්කයේ, බෙලිඅත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, වකමුල්ල ග්‍රාම නිලධාරී වසමේ, තොරණ හංදියේ සිට ජල සම්පාදන මණ්ඩලය දක්වා මාර්ගයේ මීටර් 200 ක දුර ප්‍රමාණයෙහි මේ වන විට කොන්ක්‍රීට් ගැලවී, වලවල් සෑදී, අබලන් වී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම මාර්ගය සංවර්ධනය කිරීම සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන කොපමණද;

(ii) ඉදිකිරීම් සඳහා මුදල් නිදහස් කිරීමේදී ප්‍රමිතීන්ට අනුව වැඩ නිම කළ බවට කාර්මික නිලධාරීන්ගේ නිර්දේශ ලබාගෙන තිබේද;

(iii) එම මාර්ගය සඳහා ගෙවීම් කටයුතුවලදී වෙනත් කුමන ආයතනවලින් නිර්දේශ ලබාගෙන තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) මේ පිළිබඳව විධිමත් පරීක්ෂණයක් පැවැත්වීමටත්, එම මාර්ගය යථා තත්ත්වයට පත් කිරීමටත් එතුමා කටයුතු කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0130/'10

4\.

ගරු රොෂාන් රණසිංහ මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) 2005 වර්ෂය වන විට මෙරටේ ක්‍රියාත්මක වූ ග්‍රාමීය විදුලි යෝජනා ක්‍රම නම් වශයෙන්, ඒ ඒ දිස්ත්‍රික්කය අනුව කවරේද;

(ii) 2005 වර්ෂයේ සිට මේ දක්වා ආරම්භ කරන ලද ග්‍රාමීය විදුලි ව්‍යාපෘතිවල නම් එක් එක් දිස්ත්‍රික්කය අනුව කවරේද;

(iii) ඒ එක් එක් ව්‍යාපෘතිය වෙනුවෙන් වැය කරන ලද මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ඉදිරියේදී ඇති කිරීමට බලාපොරොත්තු වන ග්‍රාමීය විදුලි යෝජනා ක්‍රම කවරේද;

(v) ඒ සඳහා වැය කිරීමට බලාපොරොත්තු වන මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0294/10

5\.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) 1991.08.25 දින ලංගම ජනතාකරණය කිරීමෙන් පසු 2002 වර්ෂය දක්වා විශ්‍රාම ගිය සේවකයන්ට මුල් පත්වීමේ දින සිට පාරිතෝෂික ගෙවීමට ශ්‍රී ලංගමය බැඳී සිටින බව එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) මුල් පත්වීමේ දින සිට ඔවුන්ට පාරිතෝෂික ගෙවීමට නොහැකි බවට ශ්‍රී ලංගමය අධිකරණ තීන්දුවක් ඉල්ලා සිටියේද;

(ii) එම අධිකරණ තීන්දුව කුමක්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) කම්කරු කොමසාරිස්වරයා විසින් එම විශ්‍රාමිකයන්ට පාරිතෝෂික ගෙවන ලෙස උපදෙස් ලබා දී තිබේද;

(ii) එසේ නම්, ඒ විශ්‍රාමික සේවකයින් කී දෙනෙකු සඳහාද;

(iii) ගෙවීමට ඇති මුළු මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) (i) එම විශ්‍රාමිකයන්ට පාරිතෝෂික ගෙවීමට කටයුතු නොකරන්නේ මන්ද;

(ii) එම මුදල් කඩිනමින් ගෙවීමට ගන්නා ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0342/'10

6.

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) ජී. එස්. පී. ප්ලස් සහනය යටතේ අප රටින් අපනයනය කරන නිෂ්පාදන වර්ගයන් කවරේද;

(ii) එම නිෂ්පාදන අපනයනය කරන රටවල් කවරේද;

(iii) නිෂ්පාදන යැවීමේදී ලබා දුන් බදු සහනය කොපමණද;

(iv) මෙම සහනය ඉවත් කළහොත් අහිමි වන රැකියා සංඛ්‍යාව කොපමණද;

(v) මෙම සහනය ඉවත් කිරීමෙන් බලපෑමක් ඇතිවන ව්‍යාපාර සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) රජය විදේශ විනිමය උපයා ගැනීම සඳහා ගන්නා පියවර කවරේද;

(ii) ජී. එස්. පී. ප්ලස් නොදුන් යුරෝපා රටවලට නිෂ්පාදන යැවීමේ දී සිදු වන පාඩුව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0531/’10

7.

ගරු දයාසිරි ජයසේකර මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) නැගෙනහිර පළාතේ, අක්කරපත්තු - මඩකලපුව - තිරික්කොන්ඩියාඩුමඩු මාර්ගය සංවර්ධනය කිරීම සඳහා යෝජිත මාර්ගයක් ද;

(ii) එසේ නම්, එම මාර්ගය මේ වන විට සංවර්ධනය කරමින් පවතින්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) මෙම මාර්ගයේ සංවර්ධන කටයුතු කරනු ලබන්නේ නම්,

(i) එහි දිග කිලෝමීටර් කොපමණද;

(ii) එහි වැඩ අවසන් කිරීමට යෝජිත දිනය කවරේද;

(iii) ඒ සඳහා ඇස්තමේන්තුගත මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මෙම මාර්ගය ඉදිකිරීම සඳහා ටෙන්ඩර් කැඳවනු ලැබුවේද;

(ii) එසේ නම්, ටෙන්ඩර් ඉදිරිපත් කරන ලද ආයතනවල නම් කවරේද;

(iii) ඒ ඒ ආයතන විසින් ඉදිරිපත් කරන ලද ටෙන්ඩර් මිල ගණන් කවරේද;

(iv) ටෙන්ඩරය පිරිනමන ලද ආයතනය හා අදාළ ටෙන්ඩර් මුදල කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) (i) මෙම මාර්ගය ඉදිකිරීම සඳහා ඇස්තමේන්තු ගත මුළු මුදල දේශීය අරමුදල්වලින් ලබාගත්තේද;

(ii) නොඑසේ නම් විදේශ ආධාර මගින් ලබාගත්තේද;

(iii) විදේශ ආධාර ලබාගත්තේ නම් ආධාර ලබාදුන් රටේ නම කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0566/'10

8.

ගරු බුද්ධික පතිරණ මහතා,— සමූපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) සමූපකාර පනත යටතේ මහ බැංකුව විසින් ලියාපදිංචි කරන ලද සීමාසහිත ශ්‍රී ලංකා මානව සම්පත් සංවර්ධන බැංකු සමිතිය මේ වනවිට සියලුම ශාඛාවන් ඇවර කර, වසා දමා ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම බැංකුව සතුව පැවති ශාඛාවන් ප්‍රමාණය කොපමණද;

(ii) තැන්පත්කරුවන් සංඛ්‍යාව සහ තැන්පත් කර තිබූ මුළු තැන්පතු ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) තැන්පතු ආපසු ගෙවීම සඳහා 2007 වර්ෂයේදී අතුරු කමිටුවක් පත් කළේද;

(ii) එසේ නම්, එම අතුරු කමිටුවේ ප්‍රතිඵල කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) (i) ඉහත බැංකුවේ තැන්පත්කරුවන්ට ආපසු ගෙවිය යුතු මුළු මුදල් ප්‍රමාණය කොපමණද;

(ii) එම මුදල් නැවත ගෙවීමට කටයුතු කර තිබේද;

(iii) නොඑසේ නම්, එම මුදල් ගෙවා අවසන් කරනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0573/'10

9.

ගරු රවුෆ් හකීම් මහතා,— ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) 2004 දෙසැම්බර් 26 වැනි දින සිදුවූ සුනාමි ව්‍යසනයෙන්, දෙමව්පියන් මිය යාමෙන් හෝ අතුරුදහන්වීමෙන් අනාථයන් බවට පත්වූ දරුවන්ගෙන් රජයේ සහ පෞද්ගලික ළමා නිවාසවලට ඇතුළත් කරනු ලැබූ දරුවන්ගේ සංඛ්‍යාව කොපමණද;

(ii) එවකට එම දරුවන්ගේ වයස සහ ඔවුන්ගේ නම් හෝ පසුව ළමා නිවාස මගින් ඔවුන් හඳුනාගැනීම පිණිස තබන ලද නම් කවරේද;

(iii) එම එක් එක් දරුවා රජයේ පරිවාස භාරයට ලබාදීමට සහාය වූ පොලිස් ස්ථාන, රෝහල් හෝ පුද්ගලයන් කවරේද;

(iv) මේ වන විට එම දරුවන් රඳවා සිටින රජයේ සහ පෞද්ගලික ළමා නිවාසයන්හි නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම දරුවන් අතරින්, මේ වන විට, දෙමව්පියන් හෝ භාරකරුවන් හඳුනාගෙන ඔවුන්ගේ භාරකත්වයට පත්කර ඇති දරුවන්ගේ සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන්ගේ නම්, වයස, එම පවරා දෙන ලද දිනය, ඉදිරිපත්වූ දෙමව්පියන් හෝ භාරකරුවන්ගේ නම්, ලිපිනයන් සහ එම පැවරීම සිදු කරන ලද අධිකරණය කවරේද;

යන්න දිස්ත්‍රික් මට්ටමින් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0047/'10

10.

ගරු රවි කරුණානායක මහතා,— ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) ලෝක වෙළඳපොළෙහි තෙල් බැරලයක මිල පහත වැටී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) 2010 ජනවාරි සිට මේ දක්වා වූ කාල පරිච්ඡේදය තුළ තෙල් බැරලයක මිල උච්ඡාවචනය වී ඇති ආකාරය කෙබඳුද;

(ii) මෙරටට පැමිණෙන විදේශීය නැව්වලට අලෙවි කරන ඩීසල් ලීටරයක විකුණුම් මිල සහ දේශීය පාරිභෝගිකයින්ට අලෙවි කරන ඩීසල් ලීටරයක විකුණුම් මිල කවරේද;

(iii) ගුවන් යානාවන්හි භාවිතය සඳහා අලෙවි කරන ඉන්ධනවල මිල කවරේද;

(iv) දේශීය ධීවර යාත්‍රා සඳහා අලෙවි කරන ඩීසල් ලීටරයක මිල කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) විදේශීය නැව්වලට අලෙවිකරන ඉන්ධන සඳහා ලබාදෙන සහනය දේශීය ධීවර යාත්‍රාවලට ලබා නොදීමට හේතු කවරේදැයි එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0335/'10

11.

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) හම්බන්තොට දිස්ත්‍රික්කයේ, සූරියවැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සූරියවැව, නඹඩගස්වැව, ප්‍රියශානි ලිපිනයේ පදිංචි එස්. ජී. කුසුමාවතී මහත්මියට ලබා දුන් නඹඩගස්වැව, මහආර යූඩී 06, අංක 7 වාරි ඉඩම මෙතෙක් නිරවුල් කර දී නොමැති බවත්;

(ii) ඇයගේ ස්වාමිපුරුෂයා වල් අලියකුගේ පහර දීමෙන් මිය ගොස් ඇති අතර ඇය විසින් අති දුෂ්කරතා මධ්‍යයේ දරුවන් 4 දෙනෙකු පෝෂණය කරන බවත්;

(iii) කුසුමාවතී මහත්මියගේ අංක 7 ඉඩම අනවසරයෙන් වෙනත් අයකු විසින් අල්ලාගෙන ඇති අතර, මීට අමතරව ඔහු විසින් යූඩී. 08 වූ තවත් ඉඩමක්ද අල්ලාගෙන ඇති බවත්;

(iv) මෙම ඉඩම නිරවුල් කර ගැනීම සඳහා කුසුමාවතී මහත්මිය මයුරපුර ඉඩම් කාර්යාලයට ගොස් තම ඉල්ලීම් ඉදිරිපත් කර ඇති බවත්;

(v) ඒ සම්බන්ධයෙන් මෙතෙක් නිලධාරීන් අවධානය යොමුකර නොමැති බවත්;

එතුමා දන්නෙහිද ?

(ආ) (i) කුසුමාවතී මහත්මියට ලැබී ඇති අංක 7 ඉඩමේ නිරවුල් භුක්තිය ඇයට ලබාදීමට කටයුතු කරන්නෙහිද;

(ii) නොඑසේ නම්, ඒ සඳහා වෙනත් ඉඩමක් ඇයට ලබාදෙන්නේද;

(iii) එසේ නම්, ඒ කොපමණ කාලයක් තුළදී ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0532/'10

12.

ගරු දයාසිරි ජයසේකර මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) නැගෙනහිර පළාතේ, අම්බිලන්තුරෙයි - වීරමුනායි මාර්ගය සංවර්ධනය කිරීම සඳහා යෝජිත මාර්ගයක් ද;

(ii) එසේ නම්, එම මාර්ගය මේ වන විට සංවර්ධනය කරමින් පවතින්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) මෙම මාර්ගයේ සංවර්ධන කටයුතු කරනු ලබන්නේ නම්,

(i) එහි දිග කිලෝමීටර් කොපමණද;

(ii) එහි වැඩ අවසන් කිරීමට යෝජිත දිනය කවරේද;

(iii) ඒ සඳහා ඇස්තමේන්තුගත මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මෙම මාර්ගය ඉදිකිරීම සඳහා ටෙන්ඩර් කැඳවනු ලැබුවේද;

(ii) එසේ නම්, ටෙන්ඩර් ඉදිරිපත් කරන ලද ආයතනවල නම් කවරේද;

(iii) ඒ ඒ ආයතන විසින් ඉදිරිපත් කරන ලද ටෙන්ඩර් මිල ගණන් කවරේද;

(iv) ටෙන්ඩරය පිරිනමන ලද ආයතනය හා අදාළ ටෙන්ඩර් මුදල කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) (i) මෙම මාර්ගය ඉදිකිරීම සඳහා ඇස්තමේන්තු ගත මුළු මුදල දේශීය අරමුදල්වලින් ලබා ගත්තේද;

(ii) නොඑසේ නම්, විදේශ ආධාර මගින් ලබා ගත්තේද;

(iii) විදේශ ආධාර ලබා ගත්තේ නම්, ආධාර ලබාදුන් රටේ නම කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0048/'10

13.

ගරු රවී කරුණානායක මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) ඉහළ කොත්මලේ ජල විදුලි බලාගාර ව්‍යාපෘතියේ ඉදිකිරීම් නිමකරන දිනය කවරේද;

(ii) ව්‍යාපෘතිය ආරම්භයේදී ඇස්තමේන්තුගත පිරිවැය සහ මේ වන විට පිරිවැය වෙන් වශයෙන් කවරේද;

(iii) මෙම ව්‍යාපෘතිය සඳහා මුදල් ලබාදීමට ඉඩ ඇති රට හෝ ආයතනයේ නම කවරේද;

(iv) ණය ලබාදීමේ කොන්දේසි කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) මුදලේ අගය ක්ෂයවීම ද ඇතුළත්ව විදුලි ඒකකයක පිරිවැය කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0336/'10

14.

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) හම්බන්තොට දිස්ත්‍රික්කයේ, හම්බන්තොට කලාප අධ්‍යාපන කාර්යාලයට අයත්, ලුණුගම්වෙහෙර කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයෙන් පාලනය වන එම්. ආර්. තාසිම් මුස්ලිම් විද්‍යාලයේ අනුමත ගුරුවරු සංඛ්‍යාව කොපමණද;

(ii) මෙම විද්‍යාලයේ ගුරු ඌණතාවයන් පවතින විෂයයන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉංග්‍රීසි විෂයය සඳහා 2006 වර්ෂයේ සිට ගුරු පුරප්පාඩු පවතින බවත්;

(ii) එම විෂයය සඳහා ස්වේච්ඡාවෙන් ඉගැන්වීමට හම්බන්තොට මේ වීදිය ලිපිනයේ පදිංචි තුවාන් සල්ෆිකාර් අලි මහතා කටයුතු කළ බවත්;

එතුමා දන්නෙහිද?

(ඇ) (i) ඔහුගේ සේවය නැවත මෙම විද්‍යාලයට ලබාගැනීම සඳහා අවශ්‍ය කටයුතු සලසා දෙන්නේද;

(ii) එසේ නම්, ඒ කවදා සිටද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0533/'10

15.

ගරු දයාසිරි ජයසේකර මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) නැගෙනහිර පළාතේ, සියඹලාණ්ඩුව - අම්පාර - කාරතිව් මාර්ගය සංවර්ධනය කිරීම සඳහා යෝජිත මාර්ගයක් ද;

(ii) එසේ නම්, එම මාර්ගය මේ වන විට සංවර්ධනය කරමින් පවතින්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) මෙම මාර්ගයේ සංවර්ධන කටයුතු කරනු ලබන්නේ නම්,

(i) එහි දිග කිලෝමීටර් කොපමණද;

(ii) එහි වැඩ අවසන් කිරීමට යෝජිත දිනය කවරේද;

(iii) ඒ සඳහා ඇස්තමේන්තුගත මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මෙම මාර්ගය ඉදිකිරීම සඳහා ටෙන්ඩර් කැඳවනු ලැබුවේද;

(ii) එසේ නම්, ටෙන්ඩර් ඉදිරිපත් කරන ලද ආයතනවල නම් කවරේද;

(iii) ඒ ඒ ආයතන විසින් ඉදිරිපත් කරන ලද ටෙන්ඩර් මිල ගණන් කවරේද;

(iv) ටෙන්ඩරය පිරිනමන ලද ආයතනය හා අදාළ ටෙන්ඩර් මුදල කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) (i) මෙම මාර්ගය ඉදිකිරීම සඳහා ඇස්තමේන්තු ගත මුළු මුදල දේශීය අරමුදල් වලින් ලබා ගත්තේද;

(ii) නොඑසේ නම්, විදේශ ආධාර මගින් ලබා ගත්තේද;

(iii) විදේශ ආධාර ලබා ගත්තේ නම්, ආධාර ලබාදුන් රටේ නම කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2010 නොවැම්බර් මස 12 වැනි සිකුරාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0049/'10

1\.
ගරු රවි කරුණානායක මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) දකුණු පළාතේ එක් එක් දිස්ත්‍රික්කයේ පිහිටා ඇති දිස්ත්‍රික් මූලික රෝහල් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) දිස්ත්‍රික් මූලික රෝහලක පැවතිය යුතු අවම තනතුරු සංඛ්‍යාව කොපමණද;

(iii) ඉහත සඳහන් රෝහල්වල දැනට පවතින තනතුරු සංඛ්‍යාව කොපමණද;

(iv) ඉහත සඳහන් එක් එක් රෝහලේ පවතින පුරප්පාඩු සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් එක් එක් රෝහල, දිස්ත්‍රික් රෝහලක තත්ත්වයට උසස් කරනු ලැබූ දිනය කවරේද;

(ii) එලෙස උසස් කරනු ලැබුවේ කවුරුන් විසින්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) ඉහත සඳහන් එක් එක් දිස්ත්‍රික් මූලික රෝහලේ දැනට පවතින මානව සහ භෞතික සම්පත් ඌණතාවන් සපුරාදීමට ගතවන කාලසීමාව කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0253/'10

2\.
ගරු සජිත් ප්‍රේමදාස මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) හම්බන්තොට දිස්ත්‍රික්කයේ, හම්බන්තොට කලාප අධ්‍යාපන කාර්යාලයට අයත්, ලුණුගම්වෙහෙර කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයෙන් පාලනය වන රජයේ පාසල්වල අධ්‍යාපනය ලබන දරුවන්ගේ විභාග සමත්වීමේ ප්‍රතිශතය අඩුවෙමින් පවතින බව එතුමා දන්නෙහිද?

(ආ) එම අධ්‍යාපන කලාපයෙන් 2007, 2008 සහ 2009 වර්ෂයන්හිදී අ.පො.ස. උසස් පෙළ සමත්ව විශ්වවිද්‍යාල අධ්‍යාපනය ලැබීමට සුදුසුකම් ලැබූ සිසුන් සංඛ්‍යාව සහ ඔවුන් අයත් පාසල්වල නම් වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) (i) වර්ෂය ආරම්භයේදී පෙළපොත් සහ ගුරුවන්ගේ විෂය නිර්දේශයන් නියමිත වේලාවට නොලැබීම සිසුන්ගේ අධ්‍යාපනය පහත වැටීමට හේතුවන බව එතුමා පිළිගන්නේද;

(ii) එසේ නම්, එම සිසුන්ගේ අධ්‍යාපනය වැඩි දියුණු කිරීම හා කුසලතා වර්ධනය කිරීමට අවශ්‍ය පෙළපොත් නියමිත කාලයට ලබා දීමට පියවර ගන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) (i) එම පාසල් නියමිත පරිදි අධීක්ෂණය කිරීම සඳහා අදාළ නිලධාරීන් යොමු කිරීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම් ඒ, සඳහා ගන්නා ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0534/'10

3.

ගරු දයාසිරි ජයසේකර මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) නැගෙනහිර පළාතේ, අක්කරපත්තු - සකාමම් මාර්ගය සංවර්ධනය කිරීම සඳහා යෝජිත මාර්ගයක් ද;

(ii) එසේ නම්, එම මාර්ගය මේ වන විට සංවර්ධනය කරමින් පවතින්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) මෙම මාර්ගයේ සංවර්ධන කටයුතු කරනු ලබන්නේ නම්,

(i) එහි දිග කිලෝමීටර් කොපමණද;

(ii) එහි වැඩ අවසන් කිරීමට යෝජිත දිනය කවරේද;

(iii) ඒ සඳහා ඇස්තමේන්තුගත මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මෙම මාර්ගය ඉදිකිරීම සඳහා ටෙන්ඩර් කැඳවනු ලැබුවේද;

(ii) එසේ නම්, ටෙන්ඩර් ඉදිරිපත් කරන ලද ආයතනවල නම් කවරේද;

(iii) ඒ ඒ ආයතන විසින් ඉදිරිපත් කරන ලද ටෙන්ඩර් මිල ගණන් කවරේද;

(iv) ටෙන්ඩරය පිරිනමන ලද ආයතනය හා අදාළ ටෙන්ඩර් මුදල කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) (i) මෙම මාර්ගය ඉදිකිරීම සඳහා ඇස්තමේන්තු ගත මුළු මුදල දේශීය අරමුදල්වලින් ලබා ගත්තේද;

(ii) නොඑසේ නම්, විදේශ ආධාර මගින් ලබා ගත්තේද;

(iii) විදේශ ආධාර ලබා ගත්තේ නම්, ආධාර ලබාදුන් රටේ නම කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0565/'10

4.

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) 2004/14 උපරිමය රැදී සිටීමේ වාසි චක්‍රලේඛය, 2005/04 උසස්වීම් චක්‍රලේඛය සහ 2008/45 පශ්චාත් උපාධි නොමැති උපාධිධාරී ගුරුවරුන්ට උසස්වීම් ලබා දීමේ චක්‍රලේඛය අනුව මාතර දිස්ත්‍රික්කයේ අධ්‍යාපන කලාප හතරෙහි ගුරුවරුන්ට උසස්වීම් ලබා දුන් බවත්;

(ii) ඊට අදාළ හිඟ වැටුප් මෙතෙක් ගෙවා නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) 2004/14, 2005/04 සහ 2008/45 චක්‍රලේඛවලට අනුව උසස්වීම් ලබා දී ඇති ගුරුවරුන් සංඛ්‍යාව සහ ඒ අනුව හිඟ වැටුප් ලබාදී ඇති ගුරුවරුන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) මේ වන විට හිඟ වැටුප් ලැබිය යුතු ගුරු සංඛ්‍යාව කොපමණද;

(iii) හිඟ වැටුප් ලෙස ඔවුන්ට ගෙවිය යුතු මුළු මුදල් ප්‍රමාණය කොපමණද;

(iv) මෙතෙක් හිඟ වැටුප් නොගෙවීමට හේතු කවරේද;

(v) හිඟ වැටුප් ගෙවා අවසන් කරන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0576/'10

5\.

ගරු ජෝන් අමරතුංග මහතා,— ඉදි කිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) රද්දොළුගම නිවාස සංකීර්ණයේ මායිම් ඇල හරහා වෙන්දේසි ඉඩමක පදිංචි වනිගසිංහ යන අයට පාරක් ලබාදීමට නිවාස සංවර්ධන අධිකාරියේ හිටපු සාමාන්‍යාධිකාරීවරයා සැළසුම් කළ බවත්,

(ii) අතිගරු ජනාධිපතිතුමාට නිවාසලාභීන් කළ පැමිණිලි අනුව එවකට නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශයේ ලේකම් වෙත ජනාධිපති කාර්යාංශයෙන් එවන ලද 2006.01.31 ලිපියෙන් එම පාර වසා දැමීමට නියෝග කර ඇති බවත්;

(iii) හිටපු සාමාන්‍යාධිකාරීවරයා විසින් වනිගසිංහ නැමැත්තා මඟින් පාර්ලිමේන්තු උපදේශක කාරක සභාවට ව්‍යාජ කරුණු ඉදිරිපත් කොට එම පාර ලබාදීමට සැළසුම් කර ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) වනිගසිංහ යන අයගේ නිවස ඉදිරිපිට පුළුල් පාරක් ඇති බවත්,

(ii) නිවස පිටුපසින්ද පාරක් ලබාදීමට කුවිතාන්සි මඟින් මුදල් ලබාගෙන ඔප්පුවක් ලබාදීමට සැළසුම් කර ඇති බවත්,

(iii) මෙය පාර්ලිමේන්තු ඉතිහාසයේ උපදේශක කාරක සභාව නොමග යැවූ ප්‍රථම අවස්ථාව බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඇ) අදාළ සියලුම වාර්තා අධිකාරියේ සභාපතිවරයාට බාරදී ඇති බැවින් අතිගරු ජනාධිපතිතුමාගේ 2006.01.31 ලිපියේ නිර්දේශය අනුව 'එම පාර වසා දැමීමට' පියවර ගන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0635/'10

6\.

ගරු හේමාල් ගුණසේකර මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) 2009 වර්ෂය තුළ වැසීගිය පාසල් අතරින්;

(i) ප්‍රාථමික පංති පමණක් පැවැත්වූ පාසල් සංඛ්‍යාව;

(ii) සාමාන්‍ය පෙළ දක්වා පැවති පාසල් සංඛ්‍යාව;

(iii) උසස් පෙළ දක්වා පැවති පාසල් සංඛ්‍යාව;

කොපමණද යන්න, වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) (i) එම පාසල් වැසීයාමට තුඩුදුන් ප්‍රධාන හේතු කවරේද;

(ii) මෙලෙස පාසල් වැසීයාම වැළැක්වීම සඳහා යෝජිත ක්‍රියාමාර්ගයක් පවතින්නේද;

(iii) එසේ නම්, ඒ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0636/'10

7.

ගරු විජය දහනායක මහතා,— පරිසර අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) රසායනික පොහොර වෙනුවට විකල්පයක් ලෙස කාබනික පොහොර භාවිතය හා නිෂ්පාදනය ගොවීන් අතර ප්‍රචලිත කිරීම සඳහා පියවර ගෙන තිබේද;

(ii) එසේ නම්, ඒ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) කිරින්ද, පුහුල් ඇල්ල ප්‍රාදේශීය සභාවට අයත් ලක්ෂ 56 ක වියදමින් ඉදිකල කසල භාවිතයෙන් කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය කරන මධ්‍යස්ථානය ජනතා විරෝධතා නිසා දැනට වසා දමා ඇති බව එතුමා දන්නෙහිද?

(ඇ) එය නැවත විවෘත කිරීම සඳහා ගන්නා පියවර කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0638/'10

8.

ගරු අරුන්දික ප්‍රනාන්දු මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) විල්පත්තු වනෝද්‍යාන සංරක්ෂණ හා සංවර්ධන ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක කරනු ලබන සංරක්ෂණ හා සංවර්ධන පියවර කවරේද;

(ii) එම ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තුගත මුළු වියදම කොපමණද;

(iii) ව්‍යාපෘතිය අවසන් කිරීමට අපේක්ෂිත වර්ෂය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ඉහත ව්‍යාපෘතිය අවසානයේදී වනෝද්‍යානයෙන් ඉපැයීමට අපේක්ෂිත වාර්ෂික ආදායම කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0639/'10

9.

ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා,— වරාය හා ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) හම්බන්තොට දිස්ත්‍රික්කයේ, මත්තල ජාත්‍යන්තර ගුවන් තොටුපළ ඉදිකිරීම සඳහා ඇස්තමේන්තුගත මුළු මුදල කොපමණද;

(ii) එම ඉදිකිරීම් සඳහා වෙන්කර ඇති භූමිය හෙක්ටයාර කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) අදාළ ඉදිකිරීම් සඳහා එම භූමියෙන් ඉවත් කිරීමට සිදුවන පවුල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පවුල් අතරින් නීත්‍යානුකූල පදිංචිකරුවන් සහ අනවසර පදිංචිකරුවන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම පවුල් සඳහා විකල්ප ඉඩම් ලබාදීමේ ක්‍රියාවලියක් පවතීද;

(iv) එසේ නම්, ඒ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) එම ගුවන්තොටුපොළ ඉදිකිරීම් කටයුතු අවසන් කිරීමට අපේක්ෂිත වර්ෂය කවරේද;

(ii) නව ගුවන්තොටුපොළ ඉදිකිරීමෙන් පසුව එය වාර්ෂිකව පරිහරණය කරනු ඇතැයි අපේක්ෂිත ගුවන් මගීන් සංඛ්‍යාව දළ වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0050/'10

10.

ගරු රවී කරුණානායක මහතා,— ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් නිෂ්පාදනය කරනු ලබන හෝ ආනයනය කරනු ලබන සියළුම නිෂ්පාදන කවරේද;

(ii) එක් එක් අයිතමය සම්බන්ධයෙන් එහි පිරිවැය (ලාභය අඩුකර විකුණුම් මිල) සහ පිරිවැය සංයුතියෙහි විස්තර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) පහත දක්වා ඇති පරිදි පිරිවැය ගණනය කිරීමේ සියලු අදියරවලදී සියලුම බදු කොපමණද;

| | | | |
|---|---|---|---|
| විකුණුම් මිල | | XXXX | |
| නිෂ්පාදන පිරිවැය | XXXX | | |
| පරිපාලන පිරිවැය | XXXX | | |
| අලෙවි පිරිවැය | XXXX | | |
| මූල්‍ය පිරිවැය | XXXX | | |
| ප්‍රචාරණ පිරිවැය | XXXX | XXXX | |
| දළ ලාභය | | | XXXX |
| බදු අඩුකර | XXXX | | |
| (සියලුම වර්ග වෙන් වෙන් වශයෙන් සඳහන් කළ යුතුය) | | | XXXX |
| ශුද්ධ ලාභය | | | XXXX |

(ii) පසුගිය වර්ෂ 15 සඳහා ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවෙහි සහ එහි පරිපාලිත සමාගම්වල වාර්ෂික ලාභය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) රුපියල්වලට පරිවර්තනය කිරීමට ඇති මුදල් නොකරන ලද ඩොලර් මත බැංකුවලට ගෙවීමට ඇති මුළු ණය ප්‍රමාණය කොපමණද;

(ii) හුවමාරු අලාභය දරන්නේ කවුරුන්ද;

(iii) (ආ) (i) අනුව විකුණනු ලබන මුළු ප්‍රමාණය එහි සමස්ත මූල්‍ය වටිනාකම සමඟ කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද ?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0254/’10

11.

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) හම්බන්තොට දිස්ත්‍රික්කයේ, හම්බන්තොට කලාප අධ්‍යාපන කාර්යාලයට අයත්, තිස්සමහාරාම කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයෙන් පාලනය වන රජයේ පාසල්වල අධ්‍යාපනය ලබන දරුවන්ගේ විභාග සමත්වීමේ ප්‍රතිශතය අඩුවෙමින් පවතින බව එතුමා දන්නෙහිද?

(ආ) එම අධ්‍යාපන කලාපයෙන් 2007, 2008 සහ 2009 වර්ෂයන්හිදී අ.පො.ස. උසස් පෙළ සමත්ව විශ්වවිද්‍යාල අධ්‍යාපනය ලැබීමට සුදුසුකම් ලැබූ සිසුන් සංඛ්‍යාව සහ ඔවුන් අයත් පාසල්වල නම් වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) වර්ෂය ආරම්භයේදී සිසුන්ගේ පෙළපොත් සහ ගුරුවන්ගේ විෂය නිර්දේශයන් නියමිත වේලාවට නොලැබීම සිසුන්ගේ අධ්‍යාපනය පහත වැටීමට හේතුවන බව එතුමා පිළිගන්නේද;

(ii) එසේ නම්, එම සිසුන්ගේ අධ්‍යාපනය වැඩි දියුණු කිරීම හා කුසලතා වර්ධනය කිරීමට අවශ්‍ය පෙළපොත් නියමිත කාලයට ලබා දීමට පියවර ගන්නේද:

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) (i) එම පාසල් නියමිත පරිදි අධීක්ෂණය කිරීම සඳහා අදාල නිලධාරීන් යොමු කිරීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, ඒ සඳහා ගන්නා ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0535/’10

12.

ගරු දයාසිරි ජයසේකර මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) නැගෙනහිර පළාතේ, සියඹලාණ්ඩුව - පොතුවිල් - අක්කරපත්තු මාර්ගය සංවර්ධනය කිරීම සඳහා යෝජිත මාර්ගයක්ද;

(ii) එසේ නම්, එම මාර්ගය මේ වන විට සංවර්ධනය කරමින් පවතින්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) මෙම මාර්ගයේ සංවර්ධන කටයුතු කරනු ලබන්නේ නම්

(i) එහි දිග කිලෝමීටර් කොපමණද;

(ii) එහි වැඩ අවසන් කිරීමට යෝජිත දිනය කවරේද;

(iii) ඒ සඳහා ඇස්තමේන්තුගත මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මෙම මාර්ගය ඉදිකිරීම සඳහා ටෙන්ඩර් කැඳවනු ලැබුවේද;

(ii) එසේ නම්, ටෙන්ඩර් ඉදිරිපත් කරන ලද ආයතනවල නම් කවරේද;

(iii) ඒ ඒ ආයතන විසින් ඉදිරිපත් කරන ලද ටෙන්ඩර් මිල ගණන් කවරේද;

(iv) ටෙන්ඩරය පිරිනමන ලද ආයතනය හා අදාළ ටෙන්ඩර් මුදල කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) මෙම මාර්ගය ඉදිකිරීම සඳහා ඇස්තමේන්තු ගත මුළු මුදල දේශීය අරමුදල් වලින් ලබා ගත්තේද;

(ii) නොඑසේ නම්, විදේශ ආධාර මගින් ලබා ගත්තේද;

(iii) විදේශ ආධාර ලබා ගත්තේ නම්, ආධාර ලබාදුන් රටේ නම කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0255/'10

13.

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) හම්බන්තොට දිස්ත්‍රික්කයේ, හම්බන්තොට කලාප අධ්‍යාපන කාර්යාලයට අයත්, හම්බන්තොට කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයෙන් පාලනය වන රජයේ පාසල්වල අධ්‍යාපනය ලබන දරුවන්ගේ විභාග සමත්වීමේ ප්‍රතිශතය අඩුවෙමින් පවතින බව එතුමා දන්නෙහිද?

(ආ) එම අධ්‍යාපන කලාපයෙන් 2007, 2008 සහ 2009 වර්ෂයන්හිදී අ.පො.ස. උසස් පෙළ සමත්ව විශ්වවිද්‍යාල අධ්‍යාපනය ලැබීමට සුදුසුකම් ලැබූ සිසුන් සංඛ්‍යාව සහ ඔවුන් අයත් පාසල්වල නම් වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) වර්ෂය ආරම්භයේදී සිසුන්ගේ පෙළපොත් සහ ගුරුවන්ගේ විෂය නිර්දේශයන් නියමිත වේලාවට නොලැබීම සිසුන්ගේ අධ්‍යාපනය පහත වැටීමට හේතුවන බව එතුමා පිළිගන්නේද;

(ii) එසේ නම්, එම සිසුන්ගේ අධ්‍යාපනය වැඩි දියුණු කිරීම හා කුසලතා වර්ධනය කිරීමට අවශ්‍ය පෙළපොත් නියමිත කාලයට ලබා දීමට පියවර ගන්නේද:

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) එම පාසල් නියමිත පරිදි අධීක්ෂණය කිරීම සඳහා අදාල නිලධාරීන් යොමු කිරීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම් ඒ සඳහා ගන්නා ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0436/'10

14.

ගරු රවී කරුණානායක මහතා,— උසස් අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) උතුරු පළාත, නැගෙනහිර පළාත සහ උතුරු මැද පළාත තුළ ක්‍රියාත්මකව පවතින විශ්වවිද්‍යාල සංඛ්‍යාව කොපමණද;

(ii) එම විශ්වවිද්‍යාල සඳහා වෙන් කර දී ඇති ශිෂ්‍ය සංඛ්‍යාව කොපමණද;

(iii) එක් එක් විශ්වවිද්‍යාලයේ, එක් එක් පීඨය තුළ ඉගෙනුම ලබන එක් ශිෂ්‍යයකු සඳහා වියදම් කරන මුදල කොපමණද;

(iv) එම විශ්වවිද්‍යාලවල සේවය කරන කථිකාචාර්යවරුන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එක් එක් විශ්වවිද්‍යාලයේ වර්ෂයකට අධ්‍යයන කටයුතු පවත්වන දින ගණන කොපමණද;

(ii) පසුගිය වර්ෂ තුනක කාලය තුළ එක් එක් වර්ෂයේදී එම විශ්වවිද්‍යාලවලට ප්‍රායෝගිකව ක්‍රියාත්මකවීමට හැකි වූ දින ගණන කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0536/'10

15.

ගරු දයාසිරි ජයසේකර මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) නැගෙනහිර පළාතේ, පොතුවිල් - පානම මාර්ගය සංවර්ධනය කිරීම සඳහා යෝජිත මාර්ගයක් ද;

(ii) එසේ නම්, එම මාර්ගය මේ වන විට සංවර්ධනය කරමින් පවතින්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) මෙම මාර්ගයේ සංවර්ධන කටයුතු කරනු ලබන්නේ නම්,

(i) එහි දිග කිලෝමීටර් කොපමණද;

(ii) එහි වැඩ අවසන් කිරීමට යෝජිත දිනය කවරේද;

(iii) ඒ සඳහා ඇස්තමේන්තුගත මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මෙම මාර්ගය ඉදිකිරීම සඳහා ටෙන්ඩර් කැඳවනු ලැබුවේද;

(ii) එසේ නම්, ටෙන්ඩර් ඉදිරිපත් කරන ලද ආයතනවල නම් කවරේද;

(iii) ඒ ඒ ආයතන විසින් ඉදිරිපත් කරන ලද ටෙන්ඩර් මිල ගණන් කවරේද;

(iv) ටෙන්ඩරය පිරිනමන ලද ආයතනය හා අදාළ ටෙන්ඩර් මුදල කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) (i) මෙම මාර්ගය ඉදිකිරීම සඳහා ඇස්තමේන්තු ගත මුළු මුදල දේශීය අරමුදල්වලින් ලබා ගත්තේද;

(ii) නොඑසේ නම්, විදේශ ආධාර මගින් ලබා ගත්තේද;

(iii) විදේශ ආධාර ලබා ගත්තේ නම්, ආධාර ලබාදුන් රටේ නම කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

1.

ගරු රවි කරුණානායක මහතා,— ජනාධිපතිවරයා සහ අගමැතිවරයා විසින් අමාත්‍ය ධූරයන් දැරීම යෝග්‍ය නොවීම,— විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2010 ඔක්තෝබර් මස 08) "ඉතා ඵලදායී පරිපාලනයක් පවත්වාගෙන යාමටත්, අමාත්‍යවරුන්ගේ කටයුතු නිසි ලෙස සමාලෝචනය කිරීමටත්, ජනාධිපතිවරයා හා අගමැතිවරයා විසින් කිසිදු අමාත්‍ය ධූරයක් දැරීම යෝග්‍ය නොවන බව මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි." යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී. [පා. 1/'10]

පා. 4/'10

2.
ගරු රවි කරුණානායක මහතා,— පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ (COPE), රාජ්‍ය ගිණුම් කාරක සභාවේ (PAC) සහ උපදේශක කාරක සභාවල සියලුම රැස්වීම්වලට සහභාගි වීමට මාධ්‍යවේදීන්ට අවසර ලබාදීම,— පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ, රාජ්‍ය ගිණුම් කාරක සභාවේ සහ උපදේශක කාරක සභාවල සියලුම රැස්වීම්වලට මාධ්‍යවේදීන්ගේ සහභාගිත්වය තුළින් එම සාකච්ඡා වඩාත් ඵලදායී, අර්ථවත් හා විනිවිදභාවයකින් යුක්ත වනු ඇති බැවින් මාධ්‍යවේදීන්ට එම රැස්වීම්වලට සහභාගි වීමට අවසර දිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 5/'10

3.
ගරු රවි කරුණානායක මහතා,— කෘෂිකාර්මික ස්වයං රැකියාවල නියුතු ගොවීන්ට කෘෂිකාර්මික ණය ලබා දීම,— කෘෂිකාර්මික ස්වයං රැකියාවල නියුතු ගොවීන්ට 5% ක අඩු පොළී අනුපාතයක් මත රු. 250,000 උපරිමයකට යටත්ව කෘෂිකාර්මික ණය ලබා දිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 6/'10

4.
ගරු රවි කරුණානායක මහතා,— පොලිතින්, ප්ලාස්ටික් ආදී අපද්‍රව්‍ය ඉවත් කිරීම පිළිබඳව ජනතාව දැනුවත් කිරීම සඳහා දීප ව්‍යාප්ත වැඩ සටහනක් ක්‍රියාත්මක කිරීම,— දිවයිනේ පොලිතින් හා ප්ලාස්ටික් ද්‍රව්‍ය භාවිතය සීඝ්‍රයෙන් වැඩි වී ඇති අතර, ඒවා අනිසි ලෙස බැහැර කිරීමෙන් මහා පරිමාණයෙන් පරිසර දූෂණය සිදුවන බැවින් එවැනි අපද්‍රව්‍ය ඉවත් කිරීම පිළිබඳව ජනතාව දැනුවත් කිරීම සඳහා දීප ව්‍යාප්ත වැඩ සටහනක් ක්‍රියාත්මක කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 7/'10

5.
ගරු රවි කරුණානායක මහතා,— රාජ්‍ය බැංකු වලින් ලබා ගත් ණය පැහැරහරින්නන්ගේ නම් ප්‍රසිද්ධියට පත් කිරීම,— රාජ්‍ය බැංකුවලින් රුපියල් මිලියන 100 කට අධික ණය ලබා ගෙන ආපසු ගෙවීම පැහැරහරින්නන්ගේ නම් ප්‍රසිද්ධියට පත් කිරීම සඳහා නීති සම්පාදනය කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 8/'10

6.
ගරු රවි කරුණානායක මහතා,— පෞද්ගලික මන්ත්‍රීන්ගේ යෝජනා ක්‍රියාත්මක කිරීම,— පෞද්ගලික මන්ත්‍රීන්ගේ යෝජනා ඵලදායී ක්‍රමයක් වන අයුරින්, ඒවා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබීමෙන් පසු වසරක් තුල විවාදයට භාජනය කළ යුතු බවත්, ඒවා සභා සම්මත වුවහොත්, හය මාසයක් තුළ අමාත්‍ය මණ්ඩලය විසින් ද අනුමත කළ යුතු බවත් මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 9/'10

7.
ගරු රවි කරුණානායක මහතා,— පාර්ලිමේන්තුව තුළ ජාතික ගීය වාදනය කිරීම,— දිවයින තුළ ජාතික මමත්වයක් වර්ධනය කිරීමට හැකිවනු වස් පාර්ලිමේන්තුවේ රැස්වීම ආරම්භ කිරීමට හා අවසාන කිරීමට පෙරාතුව පාර්ලිමේන්තුව තුළ ජාතික ගීය වාදනය කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 10/'10

8.
ගරු රවි කරුණානායක මහතා,— බලගතු ශ්‍රී ලාංකික අනන්‍යතාවයක් ගොඩනැගීම,— ආණ්ඩුවේ ලිපිලේඛනාදියෙහි යම් කෙනෙකුගේ ජාතිය හා ආගම සඳහන් කිරීම අවශ්‍ය කරුණක් වීම බලගතු ශ්‍රී ලාංකික අනන්‍යතාවයක් ගොඩනැගීමට බාධාවක් හා අවහිරයක් වී ඇති බැවින් එම අවශ්‍යතාවය ඉවත් කළ යුතු යයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 11/'10

9.
ගරු රවි කරුණානායක මහතා,— වාණිජ අරමුණු සඳහා ආගමික නායකයින්ගේ රූප භාවිතා කිරීම වැළැක්වීම,— සියලුම ආගම්වලට සමානව ගරු කළ යුතු අතර කිසිදු වෙළෙඳ දැන්වීමක හෝ වෙනත් ආගමික නොවන භාණ්ඩයක බුදුරජාණන් වහන්සේගේ, ජේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ, ශිව දෙවියන්ගේ සහ මහම්මත් නබිතුමන්ගේ රූප ඇතුලත් නොකළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 12/'10

10.
ගරු රවි කරුණානායක මහතා,— අධිකරණයට අපහාස කිරීම පිළිබඳ කාර්ය පටිපාටිය විධිමත් කිරීමට නව නීති සකස් කිරීම,— සියලු දෙනාටම සමාන සාධාරණත්වයක් සහතික කරනු වස් ශක්තිමත් ප්‍රජාතන්ත්‍රවාදයක් සහ උද්දීප්තිමත් නිදහස් මාධ්‍යයක් පවත්වාගෙන යාම සඳහා අධිකරණයට අපහාස කිරීම පිළිබඳ කාර්ය පටිපාටිය විධිමත් කිරීමට නව නීති සකස් කළයුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 13/'10

11.
ගරු රවි කරුණානායක මහතා,— මහජන යහපත උදෙසා නඩුකරණයට නීති හඳුන්වාදීම,— දිළිඳු ජනතාවගේ මූලික මිනිස් අයිතිවාසිකම් කඩවීම, රාජ්‍ය ප්‍රතිපත්ති වල අඩංගු දේ හෝ ඒවායේ බලපෑම, පොදු කටයුතු ඉටු කිරීමට නාගරික අධිකාරයන්ට බලපෑම් කිරීම, ආගමික අයිතිවාසිකම් හෝ අනෙකුත් මූලික අයිතිවාසිකම් කඩවීම සහ අධික මහජන ණය හා පුරවැසියන් අතිරේක වගකීම් වලට යොමු කැරෙන දූෂණය යන කරුණු සම්බන්ධයෙන් මහජන යහපත උදෙසා නඩුකරණයට නීති හඳුන්වා දිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 14/'10

12.
ගරු රවි කරුණානායක මහතා,— දේශපාලන පක්ෂ විසින් මැතිවරණ කොමිෂන් සභාවට මූල්‍ය විගණන වාර්තාවක් ඉදිරිපත් කිරීම,— සියලුම පිළිගත් දේශපාලන පක්ෂ විසින් උපයාගත් ආදායම් හා දැරූ වියදම් විගණනයට භාජනය කළ යුතු හා මැතිවරණ කොමිෂන් සභාවට ඉදිරිපත් කළ යුතු යයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 15/'10

13.
ගරු රවි කරුණානායක මහතා,— රාජ්‍ය නිලධාරීන්ට දඬුවම් පැමිණවීම,— රජයේ උසස් නිලධරයන් තම ස්වාධීන නිලය දේශපාලනීකරණය කරන්නේ නම් හා අයථා ලෙස යොදා ගන්නේ නම්, එයින් වැරදිකරුවන් බව ඔප්පු වූ වහාම ඔවුන්ට දඬුවම් පැමිණවිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 16/'10

14.
ගරු රවී කරුණානායක මහතා,— විශ්‍රාම ගැන්වීමේ වයස් සීමාව දීර්ඝ කිරීම,— රාජ්‍ය නිලධාරීන්ගේ විශ්‍රාම ගැන්වීමේ වයස අවුරුදු 65 දක්වා වැඩි කළ යුතු යැයිද, ව්‍යවස්ථාදායකය විසින් නිර්දේශ කරනු ලැබුවහොත් විශේෂ කුසලතා ඇති නිලධාරීන් සඳහා එය අවුරුදු 70 දක්වා දීර්ඝ කළ හැකි යැයි ද මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 17/'10

15.
ගරු රවී කරුණානායක මහතා,— අධ්‍යාපනය ආරක්ෂා කිරීම සඳහා තත්ත්ව ආරක්ෂණ සභාවක් ස්ථාපිත කිරීම,— වගකීමකින් තොරව විශ්වවිද්‍යාල නාමයන් භාවිත කරමින් ශ්‍රී ලංකාව තුළ විශාල වශයෙන් අධ්‍යාපනික ආයතන බිහිවෙමින් පවතින නිසා, අධ්‍යාපනය අනාගත පරම්පරාව සඳහා ආරක්ෂා කර දීම උදෙසා " තත්ත්ව ආරක්ෂණ සභාවක්" නීතිමය වශයෙන් වහා ස්ථාපිත කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 18/'10

16.
ගරු රවී කරුණානායක මහතා,— "නඩු පවරන නිලධාරී" නමැති තනතුරක් ඇති කිරීම,— රාජ්‍ය සේවය දේශපාලන බලපෑම් වලින් තොර බවට සහතික කරනු වස්, ආයතනවල ගුණාත්මකභාවයට බලපාන ලෙස සිදු කළ අයථා පරිහරණයන්, දූෂණයන් හෝ අකාර්යක්ෂමතාවයන් පිළිබඳ සිද්ධීන්, ස්වාධීන කොමිසම්, රාජ්‍ය ගිණුම් කාරක සභාව සහ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව මගින් වාර්තා කළ වහාම ඒ සම්බන්ධ පැමිණිලි මෙහෙයවන, පාර්ලිමේන්තුවට සෘජුවම වාර්තා කරනු ලබන තනතුරක්, "විශේෂ නඩු පවරන නිලධාරී" යනුවෙන් නාමයෙන් ඇති කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 19/'10

17.
ගරු රවී කරුණානායක මහතා,— අයවැය සම්මත කිරීමට පෙර පූර්ව අයවැය විවාදයක් පැවැත්වීම,—ඉන්දියාව හා එක්සත් රාජධානිය මෙන් අවසාන හා පූර්ණ අයවැය සම්මත කිරීමට මාස තුනකට ප්‍රථම, අයවැය ඇස්තමේන්තුවල අහිතකර හෝ අවාසිදායක බලපෑම් ඇතොත් ඒවා අවම කිරීමට සහ නිවැරදි කිරීමට හැකි වන පරිදි පූර්ව අයවැය විවාදයක් පැවැත්විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 20/'10

18.
ගරු රවී කරුණානායක මහතා,— උද්ධමනයට ගැලපෙන සේ සේවා නියුක්තිකයන්ට 1%ක දීමනාවක් ගෙවීම,— රාජ්‍ය ආයතන විසින් පරිපාලනය කරනු ලබන සේවා නියුක්තිකයන්ගේ අර්ථසාධක අරමුදල හා සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල ගෙවීමේ දී එක් එක් වර්ෂයේ උද්ධමනය ප්‍රමාණයට වඩා 1%ක දීමනාවක් සේවා නියුක්තිකයන්ට ලබා දීමට සහතික විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 21/'10

19.
ගරු රවී කරුණානායක මහතා,— ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට නොමිලේ ගමන් පහසුකම් සැලසීම,— සියලුම ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට පොදු ගමනාගමන සේවාවන්වල නොමිලේ ගමන් පහසුකම් සලසා දිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 22/'10

20.

ගරු රවි කරුණානායක මහතා,— අර්බුද සමථ මධ්‍යස්ථානයක් පිහිටුවීම,— සාමය කඩවීම වැනි ජාතික ප්‍රශ්නයක් ඇති ශ්‍රී ලංකාව බහු ජාතික හා බහු ආගමික රටක් වන හෙයින්, ශ්‍රී ලංකාව තුළ, කලාපය තුළ හා සමස්ථ වශයෙන් ලෝකයේම එවැනි ප්‍රශ්න විසඳීම සඳහා බෞද්ධ, ක්‍රිස්තියානි, හින්දු හා ඉස්ලාම් ආගම්වල ශක්තිය ප්‍රයෝජනයට ගනිමින් අර්බුද සමථ මධ්‍යස්ථානයක් පිහිටු විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 23/'10

21.

ගරු රවි කරුණානායක මහතා,— විශ්‍රාමික පාරිතෝෂික මුදල් ප්‍රමාදයකින් තොරව ලබා දීම,— මෙතෙක් විශ්‍රාමික පාරිතෝෂික මුදල් ලබා නොදුන් විශ්‍රාමිකයින්ට එම විශ්‍රාමික පාරිතෝෂික මුදල් ප්‍රමාදයකින් තොරව ලබා දීමට කටයුතු කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 24/'10

22.

ගරු රවි කරුණානායක මහතා,— ජාතික ප්‍රතිපත්ති සැලසුම් සභාවක් පත් කිරීම,— ක්‍රමවත් ජාතික ප්‍රතිපත්ති හා සැලසුම් නිර්මාණය කිරීම සඳහා දේශපාලනඥයන්ගෙන් හා විෂය බද්ධ වෘත්තීයවේදීන්ගෙන් සමන්විත ආණ්ඩු මාරුවීම් අනුව වෙනස් නොවන නිශ්චිත බලයක් සහිතවූත් ජාතික ප්‍රතිපත්ති සැලසුම් සභාවක් පත්කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 25/'10

23.

ගරු රවි කරුණානායක මහතා,— විදේශ රැකියා නියුක්තිකයන්ගේ ගැටලු නිරාකරණය කිරීම සඳහා නීතිමය බලතල සහිත ඒකකයක් පිහිටුවීම,— විදේශ රැකියාවන්හි නියුක්ත වූවන්ට සිදුවන පහරදීම්, පැහැරගෙන යෑම්, ස්ත්‍රී දූෂණ, ලිංගික අපචාරයෙහි යෙදවීම්, මිනීමැරීම් හා විදේශගත වීමේදී සිදුවන මුදල් වංචා කිරීම් හා විදේශගත වී අනාථ වූවන් නැවත ගෙන්වා ගැනීම හා ඔවුන්ගේ ආරක්ෂාව පිළිබඳ සොයා බැලිය හැකි නීතිමය බලතල ඇති ඒකකයක් පිහිටුවිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 26/'10

24.

ගරු රවි කරුණානායක මහතා,— නව නිපැයුම්කරුවන් ලෝකයට හඳුන්වා දීම සඳහා ජාතික වැඩ පිළිවෙළක් සකස් කිරීම,— නව නිපැයුම්කරුවන් සහ විවිධ දක්ෂතා ඇති පුරවැසියන් ලෝකයට හඳුන්වාදීම සඳහා ද ඔවුන් සතු දක්ෂතා හා එකී නිර්මාණ දියුණු කර ගැනීම සඳහා ද ජාතික වැඩ පිළිවෙළක් සකස් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 27/'10

25.

ගරු රවි කරුණානායක මහතා,— දේශීය අමු ද්‍රව්‍ය යොදා ගන්නා කර්මාන්තකරුවන්ට බදු සහන ලබා දීම,— සම්පූර්ණයෙන් ජාත්‍යන්තර වෙළෙඳපොල සඳහා ඉලක්ක කර ගනිමින් 75% කට වඩා දේශීය අමුද්‍රව්‍ය යොදා ගනිමින් භාණ්ඩ නිපදවන දේශීය කර්මාන්තකරුවන්ට අවුරුදු 02ක බදු සහන කාලයක් ලබා යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 28/'10

26.
ගරු රවී කරුණානායක මහතා,— වතුකර ජනතාවට පුරවැසිකම් ලබාදීම,— වතුකරයේ ශ්‍රී ලංකා පුරවැසිකම නොමැති සියලු ජන කොට්ඨාසවලට ඔවුන්ගේ කැමැත්ත මත පුරවැසිභාවය ලබා දිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 29/'10

27.
ගරු රවී කරුණානායක මහතා,— දිවයිනේ ප්‍රාථමික පාසල් දරුවන්ට නොමිලේ කිරි වීදුරුවක් ලබා දීම,— දිවයිනේ සියලු ප්‍රාථමික පාසල් දරුවන්ට උදෑසන නොමිලයේ කිරි වීදුරුවක් ලබා දීමට කටයුතු කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 30/'10

28.
ගරු රවී කරුණානායක මහතා,— සේවක අර්ථසාධක අරමුදල් හා සේවා නියුක්ති භාරකාර අරමුදල් සතියක් ඇතුළත ඉල්ලුම්කරුවන්ට ලබා දීම,— සේවක අර්ථ සාධක අරමුදල් හා සේවා නියුක්ති භාරකාර අරමුදල් සතියක් ඇතුළත ඉල්ලුම්කරුවන්ට ලබා දිය හැකි වැඩ පිළිවෙළක් සකස් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 31/'10

29.
ගරු රවී කරුණානායක මහතා,— පාසල් ළමුන් සඳහා නිදහස් වාර ගමන් ප්‍රවේශ පත්‍ර ලබා දීම,— පාසල් ළමුන්ට මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ බස් රථවල ගමන් කිරීම සඳහා නිදහස් වාර ප්‍රවේශපත් ක්‍රමයක් හඳුන්වාදීමට මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 32/'10

30.
ගරු රවී කරුණානායක මහතා,— ක්‍රීඩා පාසල් ඉදිකිරීම හා ජාතික ක්‍රීඩා ප්‍රතිපත්තියක් සකස් කිරීම,— දිගුකාලීන ඉලක්කයක් සහිත ජාතික ක්‍රීඩා ප්‍රතිපත්තියක් හා වැඩ පිළිවෙළක් සකස් කිරීම උදෙසා මූලික වශයෙන් සෑම දිස්ත්‍රික්කයක්ම ආවරණය වන පරිදි ක්‍රීඩාගාර, පිට්ටනි, උපකරණ හා ක්‍රීඩා උපදේශකයන්ගෙන් සමන්විත උසස් ගණයේ ක්‍රීඩා පාසල් ඉදි කිරීමටත් ජාතික ක්‍රීඩා ප්‍රතිපත්තියක් සකස් කිරීමටත් මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 33/'10

31.
ගරු රවී කරුණානායක මහතා,— ජාතික භාෂා අධ්‍යාපන මණ්ඩපයක් පිහිටුවීම,— ගුරුවරුන්ට සිංහල, දෙමළ, ඉංග්‍රීසි භාෂා ඉගැන්වීම සඳහා ජාතික භාෂා අධ්‍යාපන මණ්ඩපයක් ස්ථාපිත කිරීමට මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 34/'10

32.
ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා, —පුත්තලම දිස්ත්‍රික්කය තුළ කාර්මික උද්‍යාන පිහිටුවීම, —කර්මාන්ත වැඩි දියුණු කිරීමේ හා තරුණ තරුණියන්ට රැකියා අවස්ථා ලබා දීමේ අදහසින් පුත්තලම දිස්ත්‍රික්කය තුළ කාර්මික උද්‍යාන පිහිටුවිය යුතු යයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 35/'10

33.
ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා,— කල්මුනේ නගරය තුළ පිහිටි සාතන්කර්නි මහජන ක්‍රීඩාංගනය සංවර්ධනය කිරීම,— දිගාමඩුල්ල දිස්ත්‍රික්කයේ තරුණ තරුණියන්ගේ විවිධ වූ ක්‍රීඩා කුසලතාවයන් හා හැකියාවන් වැඩි දියුණු කිරීම සඳහා උසස් තත්වයේ පහසුකම් සපයාදීමේ අදහසින් කල්මුනේ නගරය තුළ පිහිටි සාතන්කර්නි මහජන ක්‍රීඩාංගනය සියලු පහසුකම් සහිත ජාත්‍යන්තර ක්‍රීඩාංගනයක් ලෙස සංවර්ධනය කළ යුතු යයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 39/'10

34.
ගරු අජිත් කුමාර මහතා,— කෑගල්ල දිස්ත්‍රික්කය තුළ කෞතුකාගාරයක් පිහිටුවීම,— කෑගල්ල දිස්ත්‍රික්කය තුළ ඇති පෞරාණික, සංස්කෘතික, සමාජමය වටිනාකමක් ඇති ස්ථානවල තොරතුරු ලබා ගත හැකි හා කෞතුක භාණ්ඩ සඳහා කෞතුකාගාරයක් පිහිටුවීමට පියවර ගත යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 40/'10

35.
ගරු අජිත් කුමාර මහතා,— අධිකරණය, පොලීසිය, බන්ධනාගාරය ඒකාබද්ධ වන අයුරින් ජනාධිපති කොමිසමක් පත් කිරීම,— සමාජයෙහි ව්‍යාප්තව යමින් පවතින අපරාධ අඩු කිරීමත්, අපරාධ නීති පද්ධතියේ පවතින අඩුපාඩු අඩුකර අපරාධ නීතිය සංශෝධනය කිරීමත්, අධිකරණය තුළ ගොඩගැසී ඇති ඉඩම් නඩු ඇතුලු නඩු විභාග අවසන් කිරීම හා අධිකරණය, පොලිසිය හා බන්ධනාගාර නවීකරණය කර කඩිනම් සේවයක් ලබා දීම සඳහාත් අධිකරණය, පොලීසිය, බන්ධනාගාරය ඒකාබද්ධ වන අයුරින් ජනාධිපති කොමිසමක් පත් කිරීමට මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 41/'10

36.
ගරු අජිත් කුමාර මහතා,— දේශපාලන පළිගැනීම්වලට ලක් වූවන්ට සහන සැලසීම සඳහා ජනාධිපති කොමිසමක්,— අතීතයේ සිට මේ දක්වා ජනතාව තමන් දරන දේශපාලන මතය නිසා පීඩාවට හා දේශපාලන පළිගැනීම්වලට ලක් වූ අයගේ පැමිණිලි විභාග කර සහන සැලසිය හැකි පූර්ණ බලැති ජනාධිපති කොමිසමක් පත් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 42/'10

37.
ගරු අජිත් කුමාර මහතා,— 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනත සංශෝධනය කිරීම,— ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික කටයුතුවල නියැලෙන ගොවීන් සතු ඉඩම්වල අයිතිය විවිධ හිමිකම් යටතේ පවතින අතර ඉන් බොහෝ දෙනෙක් අඳ ගොවියන් වන හෙයින් ද, ඉහත පනත මගින් අඳ ගොවි ක්‍රමය අහෝසි කිරීමේ හේතුවෙන් අඳ ගොවීන් ගොවි බිම් වලින් නෙරපා දමා ඇති අතර නීතිමය රැකවරණයක් නොමැතිකමින් විවිධ ගැටුම්කාරී තත්ත්වයන් නිර්මාණය වෙමින් පවතින හෙයින් ද, අඳ ගොවීන්ට වූ එම අසාධාරණය දුරලීම සඳහා 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනත සංශෝධනය කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 43/'10

38.
ගරු අජිත් කුමාර මහතා,— උස්සන්ගොඩ කඳුවැටිය පිහිටි භූමිය සංරක්ෂණය කිරීම,— ප්‍රාග් ඓතිහාසික යුගයේ මධ්‍යම පුරාශිලා යුගයට අයත් යැයි හඳුනාගෙන ඇති දකුණු පළාතේ අම්බලන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් මුහුදු වෙරළ තීරයේ පිහිටා ඇති දකුණේ හෝර්ටන් තැන්න නමින් ප්‍රකට උස්සන්ගොඩ කඳුවැටිය පිහිටා ඇති භූමිය, ශ්‍රී ලංකාවේ විවෘත ජනාවාසයකින් අවුරුදු විසි අටදහසක් පැරණි ජ්‍යාමිතික ආයුධ හා පාෂාණ සොයාගත් භූමියක් ලෙස ද, සාගර හා ගොඩබිම් ජෛව විවිධත්වය අතින් ඉතා පොහොසත් භූමියක් ලෙස ද, කදිම කැස්බෑ වාසස්ථානයක් ලෙස ද, සුනාමි රළ පහරින් ජනතාව ආරක්ෂා කළ පවුරක් ලෙස ද, අතිශය වටිනාකමක් උරුම කරගෙන ඇති හෙයින් එම භූමිය තුළ ආරම්භ කිරීමට යෝජිත ව්‍යාපෘති නවතා දමා වහාම සංරක්ෂණය කළ යුතු පරිසර පද්ධතියක් ලෙස ප්‍රකාශයට පත් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 44/'10

39.
ගරු රවී කරුණානායක මහතා,— රාජ්‍ය තොරතුරු නිදහස්ව ලබා ගැනීම සඳහා නීති සම්පාදනය කිරීම,— රජයේ විනිවිදභාවය පවත්වා ගැනීම සඳහා ද, මහජනතාවට සියලු රාජ්‍ය තොරතුරු නිදහස්ව ලබා ගැනීමේ අයිතිය උදෙසා ද පාර්ලිමේන්තුව තුළ නීති සම්පාදනය කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.45/'10

40.
ගරු රවී කරුණානායක මහතා,— ශ්‍රී ලාංකිකයින්ට වඩා යහපත් සෞඛ්‍ය අවස්ථාවන් සලසා දීම,— ජනතාවගෙන් විශාල පිරිසකට හදවත් සැත්කම් කිරීම අවශ්‍යව ඇති හෙයින්, ශ්‍රී ලාංකිකයන්ට වඩා හොඳ සෞඛ්‍ය අවස්ථාවන් සලසා දිය යුතු යයි ද, ඒ සඳහා පෞද්ගලික අංශයේ සේවකයින්ට සේවක අර්ථසාධක අරමුදල හෝ සේවක භාරකාර අරමුදල හරහා නොමිලයේ පහසුකම් සලසා දිය යුතු යැයි ද, රජයේ සේවකයන් හෝ සේවා වියුක්තිකයන් සඳහා සම්පූර්ණ වියදම රජය විසින් ජනාධිපති අරමුදල හරහා සැපයිය යුතු යැයි ද මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.46/'10

41.
ගරු රවී කරුණානායක මහතා,— ලෝක පරිසරය ආරක්ෂා කිරීම,— ශ්‍රී ලංකාව, ලෝක පරිසරය ආරක්ෂා කිරීම කෙරෙහි දැඩි අවධානය යොමු කළ යුතු අතරම ගෝලීය උණුසුම වැළැක්වීමට විශේෂයෙන් පියවර ගතයුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.47/'10

42.
ගරු රවී කරුණානායක මහතා,— පාර්ලිමේන්තුවේ වැඩකටයුතු විකාශනය කිරීම,— රූපවාහිනිය හෝ අන්තර්ජාලය හරහා පාර්ලිමේන්තුවේ වැඩ කටයුතු සජීවීව හෝ පරීක්ෂිතව විකාශනය කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.48/'10

43.
ගරු රවී කරුණානායක මහතා,— එතෙර ජීවත් වන ශ්‍රී ලාංකිකයන්ට ඡන්දය ප්‍රකාශ කිරීමට අවසර දීම,— එතෙර ජීවත්වන ශ්‍රී ලාංකිකයන්ට ඉදිරි මැතිවරණ සඳහා ඡන්දය ප්‍රකාශ කිරීමට අවසර දිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.49/’10

44.
ගරු රවී කරුණානායක මහතා,— විද්‍යුත් ඡන්ද ප්‍රකාශ කිරීමේ ක්‍රමයක් හඳුන්වාදීම,— යල්පැන ගිය වර්තමාන ඡන්දය ප්‍රකාශ කිරීමේ ක්‍රමය වෙනුවට විද්‍යුත් ඡන්දය ප්‍රකාශ කිරීමේ ක්‍රමයක් හඳුන්වා දිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.50/’10

45.
ගරු අජිත් කුමාර මහතා,— ශ්‍රී ලංකාවේ වටිනා ස්වභාවික සම්පත් හා ඒ ආශ්‍රිත ප්‍රදේශ ආරක්ෂා කිරීම සඳහා විධිමත් විද්‍යාත්මක සැලැස්මක් ක්‍රියාත්මක කිරීම,— ශ්‍රී ලංකාවේ පමණක් නොව ලෝකයේම වටිනා ස්වාභාවික සම්පත් ලෙස සැලකෙන සිංහරාජ වනාන්තරය, කන්නෙලිය රක්ෂිත වනාන්තරය, රුමස්සල කන්ද, කොග්ගල ඔය දූපත් හා කඩොලාන පද්ධතිය, රැම්සා තෙත් බිමක් වන මාදු ගඟ හා ඒ ආශ්‍රිත ප්‍රදේශ ආරක්ෂා කිරීමටත්, ප්‍රවර්ධනය කිරීමටත් විධිමත් විද්‍යාත්මක සැලැස්මක් ක්‍රියාත්මක කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.51/’10

46.
ගරු අජිත් කුමාර මහතා,— ගාලු කොටුව හා ඒ ආශ්‍රිත ඓතිහාසික හා පුරා විද්‍යාත්මක උරුමයන් ආරක්ෂා කිරීම, ප්‍රවර්ධනය කිරීම හා නිසි ප්‍රයෝජන ලබා ගැනීමට කටයුතු කිරීම,— සංචාරක කර්මාන්තයේ ඉතා වැදගත් මධ්‍යස්ථානයක් වූ ද, ඓතිහාසික හා පුරා විද්‍යාත්මක වටිනාකමකින් යුතු වූ ද, ලෝක උරුමයක් ලෙස සැලකෙන ගාලු කොටුපවුර, ගාලු කොටුව ඇතුළත හා ගාලු කොටුව ආශ්‍රිතව ඇති ඓතිහාසික හා පුරා විද්‍යාත්මක උරුමයන් ආරක්ෂා කිරීමටත්, ප්‍රවර්ධනය කිරීමටත්, ඒ හා සම්බන්ධ රාජ්‍ය ආයතන හා ජන සහභාගීත්වය ඇතිව විධිමත් සැලැස්මක් ක්‍රියාත්මක කරමින් අප රටට මෙම ඓතිහාසික උරුමයේ නිසි ප්‍රයෝජන ලබා ගැනීමට කටයුතු කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.52/’10

47.
ගරු තිලංග සුමතිපාල මහතා,— ශ්‍රී ලංකාවේ ජීවත්වන අඩු පහසුකම් සහිත නිවාස හිමියන්ගේ නිවාස ප්‍රශ්න විසඳීමට ප්‍රායෝගික වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම,—ශ්‍රී ලංකාවේ ජීවත්වන සෑම පවුලකටම ඔවුන්ගේ මූලික අවශ්‍යතාවයන් වන පානීය ජලය, විදුලිය, සනීපාරක්ෂක පහසුකම් හා මුළුතැන් ගෙයකින් සමන්විත නිවසක ජීවත්වීමේ අයිතිය සුරක්ෂිත කිරීම වෙනුවෙන් මහින්ද චින්තන ඉදිරි දැක්ම යටතේ තට්ටු නිවාස හා තට්ටු නිවාස පොකුරු යෝජනා ක්‍රම කොළඹ හා තදාසන්න නගරවල ඉදිකරමින් ජනතාවගේ නිවාස ප්‍රශ්න විසඳීම සඳහා ප්‍රායෝගික වැඩසටහනක් ඇති කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.53/’10

48.
ගරු තිලංග සුමතිපාල මහතා,—කොළඹ නගරයේ වැසි ජලය බැස යාම ක්‍රමවත් කිරීම,— කොළඹ නගරයේ තවමත් පවතින්නේ වසර 100 කටත් වඩා පැරණි ජලය බැස යන කාණු පද්ධතියක් වන අතර එය නිසියාකාරව ක්‍රියාත්මක නොවන බැවින් පැය භාගයක පමණ අඛණ්ඩ වර්ෂාවකින් කොළඹ නගරයම ජලයෙන් යටවන තත්ත්වයකට පත්ව ඇති හෙයින්ද, අවිධිමත් ලෙස ඉදිකරන ලද නිවාස, ගොඩනැගිලි හා අනවසර ඉදිකිරීම් වලින් පරිසරයට හානි සිදුවන හෙයින්ද, අධික වැසි අවස්ථාවලදී කොළඹ නගර සහා බල ප්‍රදේශය තුළ ඇතිවන ගංවතුර ආපදා තත්ත්වය අවම කිරීම සඳහා වැසි ජලය ක්‍රමවත්ව බැස යාමට හැකිවන පරිදි අදාළ කාණු පද්ධතිය නවීකරණය හා ශුද්ධ පවිත්‍ර කර විධිමත්ව පවත්වාගෙන යා යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.54/'10

49.

ගරු තිලංග සුමතිපාල මහතා,— වෛද්‍ය ක්ෂේත්‍රයේ වෘත්තීමය වටිනාකම සුරැකීම,—දේශීය හා ජාත්‍යන්තර වෛද්‍ය ක්‍රමය තුළ වෘත්තීමය සුදුසුකම් හා අත්දැකීම නොමැති වෛද්‍යවරුන් හා වෛද්‍යවරියන් ප්‍රතිකාර කිරීමෙහි යෙදී සිටීම තුළින් සාමාන්‍ය රෝගී ජනතාවට විශාල ගැටලු වලට මුහුණ පෑමට සිදුවීමෙන් අසරණ තත්ත්වයකට පත්ව ඇති හෙයින් ද, ඒ තුළින් වෛද්‍ය ක්ෂේත්‍රය තුළ සිටින්නා වූ සුදුසුකම් ඇති වෛද්‍ය වෘත්තිකයන් සමාජය තුළ අවමානයට පත්ව ඇති හෙයින්ද, වෛද්‍ය ක්ෂේත්‍රයේ වෘත්තීමය වටිනාකම සුරැකීමට, ක්‍රමවත්ව හා විධිමත්ව නීත්‍යානුකූලව ක්‍රියාත්මක විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.55/'10

50.

ගරු තිලංග සුමතිපාල මහතා,— මාධ්‍ය නිදහස හා තොරතුරු දැනගැනීමේ අයිතිය තහවුරු කිරීම,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළම තොරතුරු දැනගැනීමේ හා ප්‍රකාශ කිරීමේ අයිතිය තහවුරු කර ඇති හෙයින් ද, තාක්ෂණය දියුණු වෙමින් පවතින ලෝකයක සත්‍ය සැඟවීමට හෝ වසන් කිරීමට අවස්ථාවක් නොමැති හෙයින් ද, ප්‍රජාතාන්ත්‍රික රටක සියලු පුරවැසියන්ට නිදහස් මාධ්‍ය තුළින් දැනුම හා අවබෝධය ලබාගැනීමේ අවකාශය ලබාදිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.56/'10

51.

ගරු තිලංග සුමතිපාල මහතා,—ක්‍රීඩාව තුළින් නිරෝගීමත් සමාජයක් නිර්මාණය කිරීම,— ළමා අවධියේදීම දරුවන් ක්‍රීඩාවට යොමු කිරීම තුළින් නිරෝගීමත් සමාජයක් බිහිකිරීමටත්, සහජ කුසලතා ඇති දරුවන් ජාත්‍යන්තර තලයට යොමු කිරීමටත්, ලොව සුපතල ක්‍රීඩකයින් බිහි කර රටට කීර්තියක් ලබා ගැනීමටත් හැකිවන පරිදි ජාති භේදයෙන් පන්ති භේදයෙන් තොරවූ සාධාරණ ක්‍රම වේදයක් රාජ්‍ය මට්ටමින් සකස් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.57/'10

52.

ගරු රවී කරුණානායක මහතා,— ඡන්ද හිමි නාම ලේඛනය නිරතුරුව යාවත්කාලීන කිරීම,— ඡන්ද හිමි නාම ලේඛනය මුළු වර්ෂයෙන්ම දින තිහක කාලයක් සඳහා පමණක් යාවත්කාලීන වන ලයිස්තුවක් නොව නිරතුරුවම යාවත් කාලීන වන විවෘත ලැයිස්තුවක් විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.59/'10

53.

ගරු රවී කරුණානායක මහතා,— විදේශ රැකියාවල නියුතු අය සඳහා විශ්‍රාම වැටුප් ක්‍රමයක් ලබාදීම, —විදේශ ගතවී ඉතා අපහසුවෙන් උපයාගත් ධනය ශ්‍රී ලංකාවේ ධන සම්පත්තිය වැඩිකිරීම සඳහා එවන විදේශ රැකියාවල නියුතු අය ඇගයීම පිණිස විශ්‍රාම වැටුප් ක්‍රමයක් ලබා දීම සඳහා පියවර ගතයුතු බව මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.60/'10

54.

ගරු රවී කරුණානායක මහතා,— 2009 මැයි 19 දිනට පෙර සේවයේ සිටි සන්නද්ධ සේනාවන් සඳහා විශ්‍රාම වැටුප් ප්‍රදානය කිරීම,—පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වසර පහක සේවා කාලය සම්පූර්ණවූ පසු විශ්‍රාම වැටුප් ලැබීමට සුදුසුකම් ලබන බැවින් සන්නද්ධ සේනාවන්වල අවුරුදු 22 ක කාලය සම්පූර්ණ නොකළද 2009 වර්ෂයේ මැයි 19 වන දිනට පෙර ක්‍රියාකාරී සේවයේ යෙදී සිටි යුධ සෙබළුන්ට ද විශ්‍රාම වැටුප් ලබා දිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.62/'10

55.

ගරු රවී කරුණානායක මහතා,— දුබල හා එහා මෙහා යා නොහැකි පුද්ගලයන් සඳහා විශේෂ සැලසුම් හඳුන්වාදීම,— නීතියේ සඳහන් වන පරිදි දුබල හා එහා මෙහා යා නොහැකි පුද්ගලයන්ගේ පහසුව තහවුරු කිරීමට හා ඔවුන් සතු ඵලදායීතාව වර්ධනය කිරීම සඳහාත් ඔවුන් අනවශ්‍ය ලෙස අනුන් මත යැපීම අවම කිරීම සඳහාත් සියලු නව රජයේ ගොඩනැගිලිවල විශේෂිත සැලසුම් ක්‍රමයක් ඇතිකළ යුතු බව මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.63/'10

56.

ගරු රවී කරුණානායක මහතා, — ඡන්දය ප්‍රකාශ කිරීමේ අයිතිය තහවුරු කිරීම,— ලියාපදිංචිවූවද ඡන්දය ප්‍රකාශකිරීමට අවස්ථාව නොලැබුනු ඡන්දදායකයන් බොහෝ සංඛ්‍යාවක් සිටින බැවින් වයස අවුරුදු 18 ට වැඩි සියලුම පුද්ගලයන්ට ඡන්දය ප්‍රකාශ කිරීමේ අයිතිය ලබා දිය යුතු බව සහ ඡන්ද හිමි නාමලේඛනයේ නම සඳහන්වූ නමුත් ඡන්දය ප්‍රකාශ නොකරන පුද්ගලයන්ගෙන් දඩ මුදලක් අයකළ යුතුබව මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.64/'10

57.

ගරු රවී කරුණානායක මහතා,— දූෂණයෙන් තොර ලෝකයක් තහවුරු කිරීම— දූෂණය මුලින් උපුටා දැමීම සඳහා ලෝකයේ පාර්ලිමේන්තු සංවිධාන සමඟ එක්වී ශ්‍රී ලාංකික පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් කටයුතු කළ යුතු බවට මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.65/'10

58.

ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා,— කාදී අධිකරණ පද්ධතියට නිසි ස්ථානය ලබා දීම,— 1929 දරණ මුස්ලිම් විවාහ හා දික්කසාද ආඥාපනත යටතේ කාදී අධිකරණ පද්ධතිය ශ්‍රී ලංකාවේ ස්ථාපිත කළ අතර ඉන් පසුව 1951 දී මුස්ලිම් විවාහ හා දික්කසාද පනත යටතේ සංශෝධනය කරන ලද එම ආඥාපනත මුස්ලිම් පවුල්වල පැනනගින ගැටලු පිළිබඳ සියළුම කාරණා සම්බන්ධ තීරණයන් ගැනීමට කාදී විනිශ්චකාරවරුන්ගේ බල තල වැඩිකළ යුතු අතර එම පද්ධතියේ ගෞරවයට නිසි තැන ලබා දෙමින් නඩු විභාග වාර නිසි පරිදි පැවැත්වීමට කාදී අධිකරණ පද්ධතියේ තත්ත්වය උසස් කළ යුතු බව සහ අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කාදී විනිශ්චකාරවරුන් පත්කරන බැවින් සෙසු අධිකරණ නිලධාරීන් හට හිමි වන ගරුත්වය හා පිළිගත් වැටුප් තලය මත ස්ථාන ගත කළ යුතු බව මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 69/'10

59.

ගරු රවී කරුණානායක මහතා,— මූලාවට ලක්වූ තැන්පත්කරුවන්ට තම මුදල් නැවත ගෙවීම,— ව්‍යාජ මූල්‍ය ආයතනවල තම මුදල් තැන්පත්කර එමගින් මූලාවට ලක්වූ බොහෝ දෙනෙක් සිටින බැවින් හා පසුගිය 2009/2010 මැතිවරණ ව්‍යාපාරයේදී මෙම රජය විසින් තැන්පත්කරුවන් සහ මූල්‍ය ආයතනවලට ඔවුන්ගේ හිඟ මුදල් නැවත ගෙවීමට පොරොන්දුවී ඇති බැවින්, මහ බැංකුව මෙම ආයතනවල භාරකරු හෙයින් වඩා කාර්යක්ෂම ලෙස කටයුතු කළ යුතු බවත්, තැන්පත්කරුවන්ට තම හිඟ මුදල ලබා දීමට රජය ඉදිරිපත් විය යුතු බවත්, මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 70/’10

60.
ගරු බුද්ධික පතිරණ මහතා,—ආබාධිත හා විශේෂ අවශ්‍යතා ඇති දරුවන්ට වෘත්තීය පුහුණුව ලබාදීම,—ආබාධිත හා විශේෂ අවශ්‍යතා සහිත දරුවන් සඳහා වෘත්තීය පුහුණුවක් දිස්ත්‍රික් හා පළාත් මට්ටමින් ලබා දී එම දරුවන් වඩාත් විධිමත් ආකාරයෙන් රැකියා අවස්ථාවලට යොමු කිරීමේ වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කල යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 71/’10

61.
ගරු බුද්ධික පතිරණ මහතා,— දේශීය ආයුර්වේද වෛද්‍යවරුන් සඳහා සාමවිනිසුරු පත්වීම් ලබා දීම,— දේශීය ආයුර්වේද වෛද්‍යවරුන් මුදල් සහ වරප්‍රසාද අපේක්ෂාවෙන් තොරව ඔවුන්ගෙන් සමාජයට ඉටුවිය යුතු සමාජ වගකීමක් ලෙස සලකා විශේෂයෙන් ග්‍රාමීය ජනතාවට විශාල සේවාවක් ඉටු කරනු ලබන බැවින් එම සේවාවට ගරු කිරීමක් ලෙස ආයුර්වේද වෛද්‍ය සභාවේ ලියාපදිංචි වී ඇති සියළුම දෙනාට සාමවිනිසුරු පදවි ලබා දිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 72/’10

62.
ගරු බුද්ධික පතිරණ මහතා,— සාමවිනිසුරු තනතුරු ලබා දීමේ දී විධිමත් ක්‍රමවේදයක් සකස් කිරීම,— මුළු මහත් සමාජයම පොදුවේ පිළිගනු ලබන සහ සමාජයට විශාල සේවාවක් සපයනු ලබන තනතුරක් වන සාමවිනිසුරු තනතුරු ලබා දීමේදී ඒ සඳහා සුදුසු නිර්නායක පදනම් කොට ගෙන එම තනතුරු ලබා නොදීම නිසා එම තනතුරෙහි ගෞරවය හා පොදු පිළිගැනීම ක්‍රමයෙන් හීන වන බැවින් ඒ සඳහා පොදුවේ පිලිගත හැකි නිර්නායක පදනම් කර ගන්නා වූ ක්‍රමවේදයක් සකස් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

ප.74/’10

63.
ගරු බුද්ධික පතිරණ මහතා,— සුනාමි ඛේදවාචකයෙන් ඇතිවූ ගැටලු විසඳීම,— සුනාමි ඛේදවාචකය හේතුවෙන් කුමන හෝ ආකාරයේ ගැටලුවකට මුහුණ දී මේ වන තෙක් නොවිසඳී පවතින ගැටලු තිබේ නම්, ප්‍රාදේශීය ලේකම්, දිස්ත්‍රික් ලේකම් කොට්ඨාස මට්ටමින් සොයා බලා ඔවුන් මුහුණ දී ඇති හා දැනටත් මුහුණ දෙනු ලබන ගැටලු අවම කිරීම සඳහා කාර්යක්ෂම වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

ප.75/’10

64.
ගරු බුද්ධික පතිරණ මහතා,— ගෘහස්ථ ශ්‍රමිකයින් සඳහා ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීම,— ශ්‍රී ලංකාවේ විවිධ රැකියා උත්පාදන ක්ෂේත්‍ර තුළ විවිධ නිෂ්පාදන කටයුතු කරන දසලක්ෂයකට ආසන්න ගෘහස්ථ ශ්‍රමිකයින් සඳහා දේශපාලන බල අධිකාරිය ඒ සඳහා සබැඳි සියලු ක්ෂේත්‍රයන්හි ප්‍රවීණයින්, උගතුන් හා බුද්ධිමතුන්ගෙන් මෙන්ම රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතනයන්හි ද සහාය ලබා ගනිමින් විධිමත් ජාතික ප්‍රතිපත්තියක් සකස් කොට එය කඩිනමින් ක්‍රියාත්මක කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

ප.76/’10

65.
ගරු බුද්ධික පතිරණ මහතා,—වී වගා කළ නොහැකි කුඹුරු ඉඩම් ඵලදායි කටයුතු සඳහා යොදා ගැනීම,—කුඹුරු ඉඩම් ගොඩකිරීමේ නීතිය උල්ලංඝනය නොවන පරිදි, විධිමත් අධ්‍යයනයකින් හඳුනා ගැනීමෙන් පසු කිසිසේත්ම වී වගා කළ නොහැකි කුඹුරු ඉඩම්වල ඵලදායි

කෘෂි නිෂ්පාදන පමණක් වගා කිරීමටත් ,ඉදිකිරීම් කටයුතු සඳහා කිසිසේත්ම ඉඩ ප්‍රස්ථා නොලැබෙන ආකාරයේ වැඩසටහන් සම්පාදනය කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

ප.77/'10

66.
ගරු බුද්ධික පතිරණ මහතා,— රාජ්‍ය සේවයේ විශ්‍රාමිකයින්ගේ වැටුප් විෂමතා ඉවත් කිරීම,— 2006/6 වැටුප් ප්‍රතිශෝධන චක්‍ර ලේඛයට අනුව 2006.06.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි රාජ්‍ය සේවකයන්ගේ වැටුප් පරිවර්තනය කිරීම නිසා 2006.06.01 දිනට පෙර විශ්‍රාම ගිය සහ ඉන්පසු විශ්‍රාම ගිය රාජ්‍ය සේවකයන් අතර දැඩි වැටුප් විෂමතාවක් පවතින බැවින් එය ඉවත් කිරීමට ජාතික වැඩ පිළිවෙළක් සකස් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

ප.78/'10

67.
ගරු බුද්ධික පතිරණ මහතා,— දිස්ත්‍රික් මට්ටමින් තොරතුරු මධ්‍යස්ථාන ඇති කිරීම,— භූගෝලීය පිහිටීම, ඓතිහාසික පසුබිම, වගාකරන භෝග වර්ග, මාර්ග පද්ධතිය, රජයේ කාර්යාල, පාසල්, විශ්වවිද්‍යාල, දුම්රිය ස්ථාන සහ බස් නැවතුම් පොළවල් ආදී සියලුම තොරතුරු පරිගණක ගත කරන ලද හා ලේඛන ගත කරන ලද තොරතුරු මධ්‍යස්ථාන ඇති කිරීමටත්, එහි පළමු පියවරේදී පළාත් මට්ටමින්, දෙවැනි පියවර ලෙස දිස්ත්‍රික් මට්ටමින් සහ තෙවැනි පියවර ලෙස ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශ මට්ටමින් මෙම මධ්‍යස්ථාන ඇති කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

ප.79/'10

68.
ගරු බුද්ධික පතිරණ මහතා,—ශ්‍රී ලංකාවේ දහම් පාසල් අධ්‍යාපනය හා පරිපාලනය විධිමත් කිරීම,— ශ්‍රී ලංකාවේ සියලුම ආගම්වල දහම් පාසල් අධ්‍යාපනය හා පරිපාලනය වඩාත් විධිමත් කිරීමට සහ බෞද්ධ දහම් පාසල් තුළ පවත්නා දහම් අවසාන හා ධර්මාචාර්ය විභාග මෙන්ම සියලුම ආගම්වල දහම් පාසල් තුළ පැවැත්වෙන ඒ හා සමාන විභාග සහතික පත්‍ර සඳහා නිසි පිළිගැනීමක් ලබා දීමට, දහම් පාසල් සඳහා අඛණ්ඩව මානව සම්පත් හා භෞතික සම්පත් ලබා දීමෙන් දහම් පාසල් සඳහා පැමිණෙන සිසුන් සංඛ්‍යාව වැඩි කිරීමට කඩිනම් වැඩ පිළිවෙළක් සකස් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

ප.80/'10

69.
ගරු බුද්ධික පතිරණ මහතා,—සුනඛයින්, බළලුන් වැනි සුරතල් සතුන් ඇති කිරීම සම්බන්ධ නීති සම්පාදනය,— නිවෙස්වල හෝ අලෙවි කිරීම සඳහා ඇති කරන සුනඛයින්, බළලුන් වැනි සුරතල් සතුන් පළාත් පාලන ආයතනවල ලියාපදිංචි කිරීම සඳහා අවශ්‍ය නීති සම්පාදනය කළ යුතු අතර, එම සතුන්ගේ පැටවුන් අලෙවි කිරීම නීත්‍යානුකූලව අවසර ලත් මධ්‍යස්ථානවලදී පමණක් සිදු කළ යුතු බවත්, එසේ නොවන ස්ථානවල ඇති කරන ගැහැණු සතුන් අනිවාර්යයෙන්ම වන්ද්‍යාකරණයට ලක් කිරීමටත්, අවශ්‍ය නීති සම්පාදනය කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

ප. 81/'10

70.
ගරු බුද්ධික පතිරණ මහතා,— රැකියා වෙළඳපොළට අවශ්‍ය ශ්‍රමිකයින් පුහුණු කිරීම—, අනාගත ශ්‍රී ලංකාවේ බිහිවන නව රැකියා අවස්ථා සඳහා අවශ්‍ය ශ්‍රමිකයින් පුහුණු කිරීමේ ක්‍රමවේදයකට මුල පිරීමේ කාර්යය වඩාත් කාර්යක්ෂම ලෙස රට තුළ පවත්නා සියලුම තෘතීක අධ්‍යාපන ආයතන මගින් ආරම්භ කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

ප. 82/'10

71.
ගරු බුද්ධික පතිරණ මහතා,— රාජ්‍ය පරිපාලන ව්‍යුහය ප්‍රතිසංවිධානය කිරීම,— දැනට රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය මගින් ග්‍රාම නිලධාරී වසම් යළි සීමා නිර්ණය කිරීම සඳහා කටයුතු කරගෙන යමින් සිටින බැවින් එසේ සීමා නිර්ණය කරනු ලබන ග්‍රාම නිලධාරී වසම් තුළින් නව ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශ සීමා සහ නව දිස්ත්‍රික් සීමා නිර්ණය කළ යුතු බවත්, මෙසේ නිර්ණය කරනු ලබන ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය පළාත් පාලන ආයතන බල ප්‍රදේශය බවට පත්කළ යුතු අතර එකී බල ප්‍රදේශයට කොට්ඨාස අධ්‍යාපන බල ප්‍රදේශය, පොලිස් බල ප්‍රදේශය, ගොවිජන සේවා බල ප්‍රදේශය, ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා නිලධාරී බල ප්‍රදේශය ඇතුළු සියලු රාජ්‍ය ආයතනයන්හි බල ප්‍රදේශ සීමා සංයුක්ත වන පරිදි සමස්ත රාජ්‍ය ව්‍යුහයම ප්‍රතිසංවිධානය විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

ප. 83/'10

72.
ගරු බුද්ධික පතිරණ මහතා,— නිල්වලා ගඟ ව්‍යාපාරයේ ඉදිරි සංවර්ධන කටයුතු යළි ආරම්භ කිරීම,— මාතර දිස්ත්‍රික්කයේ නිල්වලා ගඟ ව්‍යාපාරයේ සංවර්ධන කටයුතු අතර මග ඇන හිටීමෙන් එම මිටියාවතේ පෝෂක ප්‍රදේශයන්හි භව භෝග වගා කරන ජනතාවට මුහුණ පෑමට සිදුවී ඇති ගැටලු කඩිනමින් විසඳීමට පියවර ගත යුතු බවත්, නිල්වලා ගඟ ව්‍යාපාරයේ ඉදිරි සංවර්ධන කටයුතු කඩිනමින් යළි ආරම්භ කළ යුතු බවත් මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

ප.84/'10

73.
ගරු බුද්ධික පතිරණ මහතා,— පළාත් සභා සහ පළාත් පාලන ආයතනවල මහජන නියෝජිතයිනගේ නිල කාලයට පසුද සාමවිනිසුරු පදවිය ලබාදීම—, පළාත් සභා සහ පළාත් පාලන ආයතනවල මහජන නියෝජිතයින්ට දෙනු ලබන සාමවිනිසුරු තනතුරු ඔවුන්ගේ නිල කාලයට පමණක් සීමාවන බැවින්, නිල කාලයෙන් පසුවත් ඔවුන්ගෙන් එම සේවාව ලබා ගැනීම සඳහා පැමිණෙන විශාල පිරිසක් අපහසුතාවයට පත්වන බැවින්, එම මහජන නියෝජිතයන්ට තම නිල කාලයෙන් පසුවත්, සාම විනිසුරු තනතුරු ලබා දීම සඳහා සුදුසු වැඩ පිළිවෙළක් සකස් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

ප.85/'10

74.
ගරු බුද්ධික පතිරණ මහතා,— සියළුම පළාත් සභා ජනතා නියෝජිතයන්ගේ දීමනා හා වරප්‍රසාද පිළිබඳව නැවත සලකා බැලීම,— දිවයිනේ දැනට ක්‍රියාත්මක වන පළාත් සභා හා ඉදිරියේදී විධිමත්ව ක්‍රියාත්මකවීමට නියමිත උතුරු පළාත් සභාවේ ගරු අමාත්‍යවරුන්, සභාපතිවරුන්, උපසභාපතිවරුන්, ආණ්ඩු පාර්ශ්වයේ සංවිධායකවරුන්, සභා නායකවරුන්, විරුද්ධ පාර්ශ්වයේ නායකවරුන්, විරුද්ධ පාර්ශවයේ ප්‍රධාන සංවිධායකවරුන් සහ ගරු මන්ත්‍රීවරුන්ගේ දීමනා, වරප්‍රසාද හා පහසුකම් ක්‍රමවත් තත්වයක නොපවතින බැවින් මේ පිළිබඳව ගැඹුරින් සලකා බලා ඒ සඳහා විධිමත් ක්‍රියාමාර්ග ගත යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

ප. 86/'10

75.
ගරු බුද්ධික පතිරණ මහතා,— පළාත් පාලන ආයතන වල සියලුම මහජන නියෝජිතයින්ගේ දීමනා හා වරප්‍රසාද පිළිබඳ නැවත සලකා බැලීම,—දිවයිනේ ක්‍රියාත්මක වන හා ඉදිරියේදී ක්‍රියාත්මකවීමට නියමිත සියලුම මහ නගර සභා, නගර සභා හා ප්‍රාදේශීය සභාවන්හි පුරපතිවරයන්, නගරාධිපතිවරයන්, සභාපතිවරයන්,නියෝජ්‍ය පුරපතිවරයන්,නියෝජ්‍ය නගරාධිපතිවරයන්,උප සභාපතිවරුන්, විපක්ෂනායකවරයන් හා මන්ත්‍රීවරයන්ගේ දීමනා, වරප්‍රසාද සහ අනෙකුත් පහසුකම් ක්‍රමවත් තත්වයක නොපවතින

බැවින් මේ පිළිබඳව ගැඹුරින් සලකා බලා ඒ සඳහා විධිමත් ක්‍රියාමාර්ග ගත යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

ප.87/'10

76.
ගරු බුද්ධික පතිරණ මහතා,— උතුරු නැගෙනහිර අතුරුදහන් වූ දෙමළ ජනතාවට මරණ සහතික ලබා දීම,— උතුරු නැගෙනහිර ප්‍රදේශවල යුද්ධය පැවති පසුගිය දශක තුනක පමණ කාලය තුළ විවිධ හේතූන් නිසා අතුරුදහන් වී ඇති පුද්ගලයන් මේ වන විට ජීවතුන් අතර සිටී ද නැද්ද යන්න කඩිනමින් පරීක්ෂණ පවත්වා ඔවුන් ජීවතුන් අතර නොමැති නම් ඔවුන් සඳහා මරණ සහතික ලබා දිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

ප. 88/'10

77.
ගරු බුද්ධික පතිරණ මහතා,— ජාතික තරුණ ප්‍රතිපත්තියක් සකස් කිරීම,— සියළුම දේශපාලන පක්ෂ නියෝජනය කරන පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන්ගෙන් සමන්විත විශේෂ කාරක සභාවක් පත්කොට ශ්‍රී ලංකාවට යෝග්‍යවූ ජාතික තරුණ ප්‍රතිපත්තියක් සකස් කිරීම ආරම්භ කළ යුතු යැයි ද, ඒ සඳහා ඒ හා සබැඳි සියලු ක්ෂේත්‍රයන් නියෝජනය වන පරිදි ප්‍රවීණයන්, උගතුන් හා බුද්ධිමතුන්ගෙන් මෙන්ම රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතනයන්හි සහාය ලබා ගත යුතු යැයි ද මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

ප. 89/'10

78.
ගරු බුද්ධික පතිරණ මහතා,— රජයේ පාසල් හා විශ්වවිද්‍යාල නිවාඩු දිනවලදී එම මධ්‍යස්ථාන අධ්‍යාපන ඒකක සඳහා ලබාදීම,—රජයේ පාසල් නිවාඩු කාලයේදී සහ සවස් වරුවලත් විශ්වවිද්‍යාල නිවාඩු දිනවලත් එම මධ්‍යස්ථාන මුල් කොට ගෙන ව්‍යාපාරික ප්‍රජාව, රාජ්‍ය නොවන සංවිධාන, වාණිජ මණ්ඩල, ප්‍රජා මූල සංවිධාන සම්බන්ධ කර ගන්නා වූ පුළුල් වැඩ පිළිවෙළක් වශයෙන් වැඩිහිටි හා නොවිධිමත් අධ්‍යාපන ඒකක සහනදායී ගාස්තු පදනමක් මත ආරම්භකළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

ප. 90/'10

79.
ගරු බුද්ධික පතිරණ මහතා,— පුරප්පාඩු වන ග්‍රාම නිලධාරී තනතුරු වල වැඩ බැලීමේ පත්වීම් සඳහා කාර්යක්ෂම වැඩ පිළිවෙළක් සකස් කිරීම,— ග්‍රාම නිලධාරී තනතුරක පුරප්පාඩු ඇති වූ විට ආසන්න ග්‍රාම නිලධාරී වසමේ ග්‍රාම නිලධාරීවරයා වැඩ බැලීම සඳහා පත් කරනු ලබන්නේ ඉතා සුළු දීමනාවක් යටතේ බැවින් ද, මෙම වැඩ බැලීමේ පත්වීම් තුළින් ග්‍රාම නිලධාරී වසම් දෙකෙහිම කාර්යක්ෂමතාව බිඳ වැටෙන බැවින්ද, එම තත්වය මග හරවා ගැනීම සඳහා සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකම ග්‍රාම නිලධාරී සංචිතයක් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය තුළ පිහිටුවිය යුතු අතර පුරප්පාඩු සිදුවන වසම සඳහා එකී සංචිතය තුළින් ග්‍රාම නිලධාරීන් පත් කිරීම සහ එම සංචිතය තුළ සිටින ග්‍රාම නිලධාරීන්ට ප්‍රාදේශීය ලේකම් විසින් පවරනු ලබන වෙනත් ඵලදායී ක්ෂේත්‍ර හෝ රාජකාරී සඳහා යෙදවීමේ වැඩ පිළිවෙළක් සකස් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

ප. 91/'10

80.
ගරු බුද්ධික පතිරණ මහතා,— වර්තමානයේ ක්‍රියාත්මක වන සිවිල් ආරක්ෂක කමිටුවලට නිල පිළිගැනීමක් ලබා දීම,— සෑම ග්‍රාම නිලධාරී වසමකම පිහිටා ඇති ආගමික සිද්ධස්ථානයන්හි නායක ස්වාමීන්වහන්සේ, පූජකතුමා, විදුහල්පතිතුමා, ග්‍රාම නිලධාරී, සමෘද්ධි සංවර්ධන නිලධාරී, කෘෂිකර්ම පර්යේෂණ සහකාරවරයා, ජන සභා ලේකම්වරු, ප්‍රදේශයේ පොලිස් ස්ථානය නියෝජනය කරන නිලධාරියකු සහ එම ග්‍රාම නිලධාරී වසමේ පිහිටි ස්වේච්ඡා සංවිධාන, රාජ්‍ය හා පෞද්ගලික අංශ වල සේවය කරන අදාළ වසමේ පදිංචිව සිටින නියෝජිතයින්ගෙන් සමන්විත සිවිල් ආරක්ෂක කමිටු ගොඩනැගීමට වඩාත් පහසුවීම සඳහා වර්තමාන සිවිල් ආරක්ෂක කමිටුවලට නිල පිළිගැනීමක් ලබා දිය හැකි පරිදි පාර්ලිමේන්තු

පනතක් සම්මත කළ යුතු යැයි ද, ඒ තුළින් ග්‍රාම නිලධාරී වසම තුළ සිදුවන අපරාධ හා දූරාචාර, නීති විරෝධී කටයුතු පිළිබඳ අදාළ අංශ සමඟ මනා සම්බන්ධීකරණයක් ගොඩනැගීමට හැකි වන පරිදි අදාළ නීති සම්පාදනය කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

ප. 92/’10

81.

ගරු බුද්ධික පතිරණ මහතා,— දිවයින තුළ දැනට ක්‍රියාත්මක වන යල් පැන ගිය නීති අණපනත් යාවත්කාලීන කිරීම,— ශ්‍රී ලංකාවේ මේ වනවිටත් අධිරාජ්‍යවාදී යුගයේදී හඳුන්වාදෙන ලද නීති අණපනත් ක්‍රියාත්මකවන බැවින් එම නීති අණපනත් යළි අධ්‍යනය කිරීමේ කමිටු පත්කර, යල් පැනගිය දඬුවම්, දඩ මුදල් ආදිය යාවත්කාලීන කිරීමේ ජාතික වැඩපිළිවෙලක් ක්‍රියාවට නැංවිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

ප. 93/’10

82.

ගරු බුද්ධික පතිරණ මහතා,— සියලු මැතිවරණ එකම දිනක පැවැත්වීම,— ශ්‍රී ලංකාව තුළ 1988 සිට 2010 දක්වා වසර 22 ක කාලය තුළ 1990, 1992, 1995, 1996, 1998, 2003 සහ 2007 වසරවලදී හැර අන් සෑම වසරකදීම කිසියම් මැතිවරණයක් පවත්වා ඇති අතර, එසේ මැතිවරණ පැවැත්වීම ජනතා මතය සලකා බැලීම සඳහා වටිනා නිර්ණායකයක් වුවද, මේ තුළින් රටේ ආර්ථිකය, පරිපාලනය ආදි සෑම ක්ෂේත්‍රයකටම දැඩි බලපෑමක් ඇති කරන බැවින් පළාත් පාලන මැතිවරණ, මහා මැතිවරණ සහ ජනාධිපතිවරණය එකම දිනයකදී පැවැත්වීමට හැකි වන පරිදි එකී ආයතනවල නිල කාලය සංශෝධනය කිරීමටත්, ගැලපෙන මැතිවරණ ක්‍රමවේදයක් නිර්මාණය කිරීමටත් සුදුසු පරිදි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයක් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

ප. 94/’10

83.

ගරු බුද්ධික පතිරණ මහතා,— පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කිරීමට කටයුතු කිරීම,— රට තුළ ප්‍රජාතන්ත්‍රවාදය වඩාත් ශක්තිමත් කිරීමේ අරමුණ ඇතිව පාර්ලිමේන්තුව හා පළාත් සභා අතරත්, පළාත් සභා හා පළාත් පාලන ආයතන අතරත් මනා සම්බන්ධීකරණයක් පවත්වා ගෙන යාම අත්‍යාවශ්‍ය වන අතර ඒ සඳහා පළාත් පාලන ආයතන ප්‍රධානීන්, පළාත් සභා තුළ නියෝජනයවීම සහතිකවනු පිණිස ද, පළාත් සභා ප්‍රධානීන් පාර්ලිමේන්තුව තුළ නියෝජනය වීම සහතිකවනු පිණිසද ක්‍රමවේදයක් සකස් කිරීමට අවශ්‍ය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයක් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

ප. 95/’10

84.

ගරු බුද්ධික පතිරණ මහතා,— ජාතික ඒකාග්‍රතාව ඇති කිරීමට පියවර ගැනීම,— ජාතික ඒකාග්‍රතාවය ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් දෙමළ භාෂාව කථා කරන ජනතාව ජීවත් වන ප්‍රදේශවල සිංහල භාෂා පුහුණු වැඩ සටහන් ද, සිංහල භාෂාව කථා කරන ජනතාව ජීවත් වන ප්‍රදේශවල දෙමළ භාෂා පුහුණු වැඩසටහන් ද, රාජ්‍ය, රාජ්‍ය නොවන හා පෞද්ගලික ආයතනයන්හි සහයෙන් ක්‍රියාත්මක විය යුතු අතර රාජ්‍ය හා පෞද්ගලික විද්‍යුත් මෙන්ම මුද්‍රිත මාධ්‍ය ආයතනවල සහයෝගය ලබාගනිමින් මෙම පුහුණු වැඩ සටහන් ආරම්භ කිරීම සඳහා ජාතික වැඩ පිළිවෙළක් ක්‍රියාවට නැංවිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

ප. 96/’10

85.

ගරු බුද්ධික පතිරණ මහතා,— කලත්‍රයාගේ නොමනා ක්‍රියා නිසා අසරණභාවයට පත්වන පාර්ශවයට සහන සලසා දීම,— විවාහක අඹුසැමි යුවලක් එකම වහලක් යට ජීවත්ව සිටින අවස්ථාවලදී පුරුෂයා හෝ බිරිඳ සුරාව, සූදුව සහ වෙනත් අපචාරී කටයුතුවල යෙදෙමින් ඉඩම් හෝ ගේ දොර බඩු මුට්ටු තම පෞද්ගලික අභිමතය පරිදි විකුණමින් හෝ අන් අයට පවරමින් හැසිරීම නිසාවෙන් අනෙක් පාර්ශවයත් සමඟ දරුවන් දැඩි අසරණභාවයට පත් වන අවස්ථාවලදී

එම තත්වය වළක්වා ගැනීම සඳහා අවශ්‍ය නීති සම්පාදනය කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

---

## 2010 නොවැම්බර් මස 23 වැනි අඟහරුවාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0256/'10

1\.
ගරු සජිත් ප්‍රේමදාස මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) හම්බන්තොට දිස්ත්‍රික්කයේ, හම්බන්තොට කලාප අධ්‍යාපන කාර්යාලයට අයත් සූරියවැව කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයෙන් පාලනය වන රජයේ පාසල්වල අධ්‍යාපනය ලබන දරුවන්ගේ විභාග සමත්වීමේ ප්‍රතිශතය අඩුවෙමින් පවතින බව එතුමා දන්නෙහිද?

(ආ) එම අධ්‍යාපන කලාපයෙන් 2007, 2008 සහ 2009 වර්ෂයන්හිදී අ.පො.ස. උසස් පෙළ සමත්ව විශ්ව විද්‍යාල අධ්‍යාපනය ලැබීමට සුදුසුකම් ලැබූ සිසුන් සංඛ්‍යාව සහ ඔවුන් අයත් පාසල්වල නම් වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) වර්ෂය ආරම්භයේදී පෙළපොත් සහ ගුරුවන්ගේ විෂය නිර්දේශයන් නියමිත වේලාවට නොලැබීම සිසුන්ගේ අධ්‍යාපනය පහතවැටීමට හේතුවන බව එතුමා පිළිගන්නේද;

(ii) එසේ නම්, එම සිසුන්ගේ අධ්‍යාපනය වැඩි දියුණු කිරීම හා කුසලතා වර්ධනය කිරීමට අවශ්‍ය පෙළපොත් නියමිත කාලයට ලබා දීමට පියවර ගන්නේද:

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) (i) එම පාසල් නියමිත පරිදි අධීක්ෂණය කිරීම සඳහා අදාළ නිලධාරීන් යොමු කිරීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම් ඒ සඳහා ගන්නා ක්‍රියා මාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0437/'10

2\.
ගරු රවී කරුණානායක මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) උතුරු සහ නැගෙනහිර පළාත්වල අද වන විට ක්‍රියාත්මකව පවතින ජාතික සහ පළාත් පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පාසල්වල සිටින ශිෂ්‍ය සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එකී පාසල්වල සිටින ගුරුවරුන් සංඛ්‍යාව පාසල් පදනමින් කොපමණද;

(ii) පාසලක් නිසි ලෙස පවත්වාගෙන යාමට තිබිය යුතු ගුරු ශිෂ්‍ය අනුපාතය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) පසුගිය වර්ෂ 2 තුළ අධ්‍යාපනය වෙනුවෙන් දරන ලද පිරිවැය වාර්ෂික පදනමින් කොපමණද;

(ii) මීළඟ වර්ෂය සඳහා වෙන් කර ඇති මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0537/'10

3.

ගරු දයාසිරි ජයසේකර මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) නැගෙනහිර පළාතේ, ත්‍රිකුණාමලය - හබරණ මාර්ගය සංවර්ධනය කිරීම සඳහා යෝජිත මාර්ගයක්ද;

(ii) එසේ නම්, එම මාර්ගය මේ වන විට සංවර්ධනය කරමින් පවතින්නේද;

යන්න එතුමා දන්වන්නෙහිද?

(ආ) මෙම මාර්ගයේ සංවර්ධන කටයුතු කරනු ලබන්නේ නම් ;

(i) එහි දිග කිලෝමීටර් කොපමණද;

(ii) එහි වැඩ අවසන් කිරීමට යෝජිත දිනය කවරේද;

(iii) ඒ සඳහා ඇස්තමේන්තුගත මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මෙම මාර්ගය ඉදිකිරීම සඳහා ටෙන්ඩර් කැඳවනු ලැබුවේද;

(ii) එසේ නම්, ටෙන්ඩර් ඉදිරිපත් කරන ලද ආයතනවල නම් කවරේද;

(iii) ඒ ඒ ආයතන විසින් ඉදිරිපත් කරන ලද ටෙන්ඩර් මිල ගණන් කවරේද;

(iv) ටෙන්ඩරය පිරිනමන ලද ආයතනය හා අදාළ ටෙන්ඩර් මුදල කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) (i) මෙම මාර්ගය ඉදිකිරීම සඳහා ඇස්තමේන්තු ගත මුළු මුදල දේශීය අරමුදල්වලින් ලබා ගත්තේද;

(ii) නොඑසේ නම්, විදේශ අධාර මගින් ලබා ගත්තේද;

(iii) විදේශ ආධාර ලබා ගත්තේ නම්, ආධාර ලබාදුන් රටේ නම කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0567/'10

4.

ගරු නූර්දීන් මෂූර් මහතා,— තැපැල් හා විදුලි සංදේශ අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) පුත්තලම දිස්ත්‍රික්කයේ තිල්ලෙයියඩි ප්‍රදේශයේ තැපැල් කාර්යාලයක් හෝ උප තැපැල් කාර්යාලයක් නොමැති නිසා එම ප්‍රදේශවාසීන්ට නොයෙකුත් දුෂ්කරතාවයන්ට මුහුණ දීමට සිදුවී ඇති බවත් එතුමා දන්නෙහිද?

(ආ) එම ජනතාවට තැපැල් කාර්යාලීය අවශ්‍යතාවයන් පහසුවෙන් ඉටු කර ගැනිම පිණිස තිල්ලෙයියඩි ප්‍රදේශය ආවරණය වන පරිදි උප තැපැල් කාර්යාලයක් ස්ථාපිත කිරීමට නොපමාව පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0569/'10

5.

ගරු අජිත් පී. පෙරේරා මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) කළුතර දිස්ත්‍රික්කයේ, එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස බල ප්‍රදේශය තුළ 2008, 2009 සහ 2010 වර්ෂවලදී ඩෙංගු රෝගය වැළඳුන රෝගීන් සංඛ්‍යාව සහ ඩෙංගු රෝගය නිසා මියගිය රෝගීන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) කළුතර දිස්ත්‍රික්කය තුළ ඩෙංගු රෝගය සීඝ්‍රලෙස ව්‍යාප්තවීමේ අනතුරට මුහුණපා ඇති ප්‍රදේශ කවරේද;

(ii) එම ප්‍රදේශය තුළ ඩෙංගු රෝගය මර්ධනය කිරීම සඳහා මේ වන විට ගෙන ඇති විශේෂිත පියවර කවරේද;

(iii) ඒ සඳහා ඉදිරියේදී ගනු ලබන වෙනත් විශේෂිත පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0570/'10

6.

ගරු කරු ජයසූරිය මහතා,— ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) රද්දොළුගම නිවාස සංකීර්ණයේ ඉතිරිව ඇති බිම් කැබලි විකිණීමට නිවාස සංවර්ධන අධිකාරිය විසින් ක්‍රියාත්මක කළ සැළසුමක් එහි නිවාසලාභීන් අතිගරු ජනාධිපතිතුමා වෙත කළ පැමිණිල්ලක් අනුව අත්හිටවූ බවත්;

(ii) ඒ සම්බන්ධව ජනාධිපති විමර්ශණ අංශය කළ පරීක්ෂණයේ නිර්දේශය ජනාධිපති ලේකම් විසින් එවකට නිවාස සංවර්ධන අධිකාරියේ සභාපති වෙතද, නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශයේ ලේකම් වෙත ද යොමු අංක SP/4/2/4/2/1 හා 2006/02/28 දිනැති ලිපියෙන් දන්වා ඇති බවත්;

(iii) එම ලිපියේ (කෙටියෙන්) "ඉතිරිව ඇති කුඩා බිම් කැබලි වසර 23 පමණ කාලයක් එහි නිවැසියන් භුක්ති විඳ ඇති හෙයින් ඔවුනට විකිණීමෙන් පවරාදීමට අතිගරු ජනාධිපතිතුමාගේ අවධානය යොමු කර තිබිණ. ජනාධිපති විමර්ශන අංශයේ නිර්දේශය අනුව රද්දොළුගම නිවාස සංකීර්ණය වටා යාමට ඇති මාර්ගය 1820 බිම් කොටසෙන් වෙන් කිරීම සහ 1819 බිම් කැබැල්ල යාබද නිවැසියන් වෙත විකිණීමෙන් පවරාදීම සුදුසු බවත් දන්වමි" යන්න සඳහන්ව ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) අතිගරු ජනාධිපතිතුමාගේ ඉහත නියෝගය නොපමාව ඉටුකර දීමට එතුමා පියවර ගන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0571/'10

7.

ගරු රුවන් රණතුංග මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) ත්‍රිවිධ හමුදාවේ සහ පොලිසියේ සේවය කොට, දුබලතා මත විශ්‍රාම ගන්වා දැනට විශ්‍රාම වැටුප් ලබන පුද්ගලයින් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන් දැනට ලබන අවම විශ්‍රාම වැටුප කොපමණද;

(iii) කොටුගොඩ, නැදගමුව, පිටවෙල පාරේ, අංක: 215/බී දරන, නිවසේ පදිංචි, සේවා අංක: B6511 දැරූ නාවික හමුදාවේ ඉංජිනේරු කාර්මික සේවයේ යෙදී සිට 1985/10/30 වැනි දින දුබලතා මත විශ්‍රාම ගත්වා දැනට මීනුවන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් විශ්‍රාම වැටුප් අංක: 3971 යටතේ රුපියල් 6561.20ක විශ්‍රාම වැටුපක් ලබන, ඊ.එම්.ඩී. කීර්තිසිංහ ඒකනායක වැනි අය කුමන වර්ගීකරණයට අයත් වන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) කීර්තිසිංහ මහතා වැනි අය ලබන විශ්‍රාම වැටුප වර්තමාන ජීවන වියදමට අනුව ප්‍රමාණවත් නොවන බැවින්, ඔවුන්ගේ විශ්‍රාම වැටුප වැඩිකිරීමට හෝ ජීවනෝපාය මාර්ගයක් සළසා ගැනීමට ප්‍රමාණවත් සහනයක් ලබා දීමට හෝ ගෙන ඇති පියවර කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0637/'10

8.

ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා,— සාම්ප්‍රදායික කර්මාන්ත හා කුඩා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) 2009 වර්ෂය අවසන් වන විට ජාතික ශිල්ප සභාවේ ලියාපදිංචි විවිධ හස්ත කර්මාන්ත ක්ෂේත්‍රවල නියුතු ශිල්පීන් සංඛ්‍යාව කවරේද;

(ii) මෙරට හස්ත කර්මාන්තයේ නියුතු ශිල්පීන් විසින් මුහුණදෙන අමුද්‍රව්‍ය සොයාගැනීමේ දුෂ්කරතාවයට පිළියම් වශයෙන් ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) හස්ත කර්මාන්ත ශිල්පීන් සතු දැනුම සංරක්ෂණයට හා අනාගත පරපුරට උරුම කරදීම සඳහා ක්‍රියාත්මක වැඩ පිළිවෙලක් පවතින්නේද;

(ii) එසේ නම්, ඒ කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

257/'10

9.

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) හම්බන්තොට දිස්ත්‍රික්කයේ, හම්බන්තොට කලාප අධ්‍යාපන කාර්යාලයට අයත් අම්බලන්තොට කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයෙන් පාලනය වන රජයේ පාසල්වල අධ්‍යාපනය ලබන දරුවන්ගේ විභාග සමත්වීමේ ප්‍රතිශතය අඩුවෙමින් පවතින බව එතුමා දන්නෙහිද?

(ආ) එම අධ්‍යාපන කලාපයෙන් 2007, 2008 සහ 2009 වර්ෂයන්හිදී අ.පො.ස. උසස් පෙළ සමත්ව විශ්ව විද්‍යාල අධ්‍යාපනය ලැබීමට සුදුසුකම් ලැබූ සිසුන් සංඛ්‍යාව සහ ඔවුන් අයත් පාසල්වල නම් වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) වර්ෂය ආරම්භයේදී පෙළපොත් සහ ගුරුවන්ගේ විෂය නිර්දේශයන් නියමිත වේලාවට නොලැබීම සිසුන්ගේ අධ්‍යාපනය පහත වැටීමට හේතුවන බව එතුමා පිළිගන්නේද;

(ii) එසේ නම්, එම සිසුන්ගේ අධ්‍යාපනය වැඩි දියුණු කිරීම හා කුසලතා වර්ධනය කිරීමට අවශ්‍ය පෙළපොත් නියමිත කාලයට ලබා දීමට පියවර ගන්නේද:

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) (i) එම පාසල් නියමිත පරිදි අධීක්ෂණය කිරීම සඳහා අදාළ නිලධාරීන් යොමු කිරීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම් ඒ සඳහා ගන්නා ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0438/'10

10.

ගරු රවී කරුණානායක මහතා,— රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) මෙරට සිටින ග්‍රාම නිලධාරීවරුන් සංඛ්‍යාව පළාත් සහ දිස්ත්‍රික් පදනමින් කොපමණද;

(ii) ඔවුන්ට මසකට ගෙවනු ලබන මුදල කොපමණද;

(iii) ඔවුන්ගේ රැකියාවට අදාළ විෂය ක්ෂේත්‍රය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) උතුරු සහ නැගෙනහිර පළාත්වල අළුතින් පත්කරන ලද ග්‍රාම නිලධාරීවරුන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පත්වීම් සම්බන්ධයෙන් යොදා ගන්නා ලද නිර්ණායක කවරේද;

(iii) තෝරා ගැනීම් සිදු කරන ලද්දේ කෙසේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0538/'10

11.

ගරු දයාසිරි ජයසේකර මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) නැගෙනහිර පළාතේ, ත්‍රිකුණාමලය - පුල්මුඩේ මාර්ගය සංවර්ධනය කිරීම සඳහා යෝජිත මාර්ගයක්ද;

(ii) එසේ නම්, එම මාර්ගය මේ වන විට සංවර්ධනය කරමින් පවතින්නේද;

යන්න එතුමා දන්වන්නෙහිද?

(ආ) මෙම මාර්ගයේ සංවර්ධන කටයුතු කරනු ලබන්නේ නම්

(i) එහි දිග කිලෝමීටර් කොපමණද;

(ii) එහි වැඩ අවසන් කිරීමට යෝජිත දිනය කවරේද;

(iii) ඒ සඳහා ඇස්තමේන්තුගත මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මෙම මාර්ගය ඉදිකිරීම සඳහා ටෙන්ඩර් කැඳවනු ලැබුවේද;

(ii) එසේ නම්, ටෙන්ඩර් ඉදිරිපත් කරන ලද ආයතනවල නම් කවරේද;

(iii) ඒ ඒ ආයතන විසින් ඉදිරිපත් කරන ලද ටෙන්ඩර් මිල ගණන් කවරේද;

(iv) ටෙන්ඩරය පිරිනමන ලද ආයතනය හා අදාළ ටෙන්ඩර් මුදල කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) (i) මෙම මාර්ගය ඉදිකිරීම සඳහා ඇස්තමේන්තු ගත මුළු මුදල දේශීය අරමුදල්වලින් ලබා ගත්තේද;

(ii) නොඑසේ නම්, විදේශ ආධාර මගින් ලබා ගත්තේද;

(iii) විදේශ ආධාර ලබා ගත්තේ නම්, ආධාර ලබාදුන් රටේ නම කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0568/'10

12.

ගරු නූර්දීන් මෂූර් මහතා,— ධීවරාය හා ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) පුත්තලම දිස්ත්‍රික්කයේ, කන්ඩක්කුලිය, පෙරුම්කඩල් මුහුදුබඩ ප්‍රදේශය විටින් විට සීඝ්‍ර මුහුදුකෑමට ලක්වන ප්‍රදේශයක් බවත්, එයින් එම ප්‍රදේශයේ ධීවරයින්ගේ නැවතුම් පොළ වන ධීවර වාඩිවලට සහ අවට තිබෙන වෙළඳසැල් ගොඩනැගිලිවලට බලවත් හානි සිදුවන බවත් එතුමා දන්නෙහිද?

(ආ) එම ප්‍රදේශයේ සිදුවන සීඝ්‍ර මුහුදුකෑම වළකාලීම සඳහා ගත යුතු කඩිනම් ක්‍රියා මාර්ග වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව ඔස්සේ අප්‍රමාදව ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0258/'10

13.

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) හම්බන්තොට දිස්ත්‍රික්කයේ, තංගල්ල කලාප අධ්‍යාපන කාර්යාලයට අයත් තංගල්ල කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයෙන් පාලනය වන රජයේ පාසල්වල අධ්‍යාපනය ලබන දරුවන්ගේ විභාග සමත්වීමේ ප්‍රතිශතය අඩුවෙමින් පවතින බව එතුමා දන්නෙහිද?

(ආ) එම අධ්‍යාපන කලාපයෙන් 2007, 2008 සහ 2009 වර්ෂයන්හිදී අ.පො.ස. උසස් පෙළ සමත්ව විශ්ව විද්‍යාල අධ්‍යාපනය ලැබීමට තේරීපත්වූ වූ සිසුන් සංඛ්‍යාව සහ ඔවුන් අයත් පාසල් වල නම් වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) වර්ෂය ආරම්භයේදී පෙළපොත් සහ ගුරුවන්ගේ විෂය නිර්දේශයන් නියමිත වේලාවට නොලැබීම සිසුන්ගේ අධ්‍යාපනය පහත වැටීමට හේතුවන බව එතුමා පිළිගන්නේද;

(ii) එසේ නම්, එම සිසුන්ගේ අධ්‍යාපනය වැඩි දියුණු කිරීම හා කුසලතා වර්ධනය කිරීමට අවශ්‍ය පෙළපොත් නියමිත කාලයට ලබා දීමට පියවර ගන්නේද:

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) (i) එම පාසල් නියමිත පරිදි අධීක්ෂණය කිරීම සඳහා අදාළ නිලධාරීන් යොමු කිරීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, ඒ සඳහා ගන්නා ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0474/'10

14.

ගරු රවී කරුණානායක මහතා,— සමූපකාර සහ අභ්‍යන්තර වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ සාමාජිකයන්ගේ නම් කවරේද;

(ii) පසුගිය වර්ෂ තුනක කාලය තුළ එක් එක් වර්ෂයේදි පාරිභෝගික කටයුතු පිළිබද අධිකාරිය විසින් එක් මාසයකදී සිදු කරන ලද වැටලීම් සංඛ්‍යාව කොපමණද;

(iii) පසුගිය අවුරුදු තුනක කාලය තුළදී සිදු කරන ලද වැදගත්ම සහ වැඩිම වටිනාකමක් ඇති වැටලීම් දහය කවරේද;

(iv) එක් එක් දිස්ත්‍රික්කය තුළ සිදු කරන ලද වැටලීම්වලදී සොයා ගන්නා ලද වැරදිවල වටිනාකම් කවරේද;

(v) පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ සේවයේ නියුතු නිලධාරීන්ගේ සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0539/'10

15\.

ගරු දයාසිරි ජයසේකර මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) නැගෙනහිර පළාතේ, බෝගහවැව - පුල්මුඩේ මාර්ගය සංවර්ධනය කිරීම සඳහා යෝජිත මාර්ගයක්ද;

(ii) එසේ නම්, එම මාර්ගය මේ වන විට සංවර්ධනය කරමින් පවතින්නේද;

යන්න එතුමා දන්වන්නෙහිද?

(ආ) මෙම මාර්ගයේ සංවර්ධන කටයුතු කරනු ලබන්නේ නම්,

(i) එහි දිග කිලෝමීටර් කොපමණද;

(ii) එහි වැඩ අවසන් කිරීමට යෝජිත දිනය කවරේද;

(iii) ඒ සඳහා ඇස්තමේන්තුගත මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මෙම මාර්ගය ඉදිකිරීම සඳහා ටෙන්ඩර් කැඳවනු ලැබුවේද;

(ii) එසේ නම්, ටෙන්ඩර් ඉදිරිපත් කරන ලද ආයතනවල නම් කවරේද;

(iii) ඒ ඒ ආයතන විසින් ඉදිරිපත් කරන ලද ටෙන්ඩර් මිල ගණන් කවරේද;

(iv) ටෙන්ඩරය පිරිනමන ලද ආයතනය හා අදාළ ටෙන්ඩර් මුදල කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) (i) මෙම මාර්ගය ඉදිකිරීම සඳහා ඇස්තමේන්තු ගත මුළු මුදල දේශීය අරමුදල්වලින් ලබා ගත්තේද;

(ii) නොඑසේ නම්, විදේශ ආධාර මගින් ලබා ගත්තේද;

(iii) විදේශ ආධාර ලබා ගත්තේ නම්, ආධාර ලබාදුන් රටේ නම කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2010 නොවැම්බර් මස 24 වැනි බදාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0259/'10

1\.

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) හම්බන්තොට දිස්ත්‍රික්කයේ, තංගල්ල කලාප අධ්‍යාපන කාර්යාලයට අයත්

අඟුණකොලපැලැස්ස කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයෙන් පාලනය වන රජයේ පාසල්වල අධ්‍යාපනය ලබන දරුවන්ගේ විභාග සමත්වීමේ ප්‍රතිශතය අඩුවෙමින් පවතින බව එතුමා දන්නෙහිද?

(ආ) එම අධ්‍යාපන කලාපයෙන් 2007, 2008 සහ 2009 වර්ෂයන්හිදී අ.පො.ස. උසස් පෙළ සමත්ව විශ්වවිද්‍යාල අධ්‍යාපනය ලැබීමට සුදුසුකම් ලැබූ සිසුන් සංඛ්‍යාව සහ ඔවුන් අයත් පාසල්වල නම් වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) වර්ෂය ආරම්භයේදී සිසුන්ගේ පෙළපොත් සහ ගුරුවන්ගේ විෂය නිර්දේශයන් නියමිත වේලාවට නොලැබීම සිසුන්ගේ අධ්‍යාපනය පහත වැටීමට හේතුවන බව එතුමා පිළිගන්නේද;

(ii) එසේ නම්, එම සිසුන්ගේ අධ්‍යාපනය වැඩි දියුණු කිරීම හා කුසලතා වර්ධනය කිරීමට අවශ්‍ය පෙළ පොත් නියමිත කාලයට ලබා දීමට පියවර ගන්නේද:

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) (i) එම පාසල් නියමිත පරිදි අධීක්ෂණය කිරීම සඳහා අදාල නිලධාරීන් යොමු කිරීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම් ඒ සඳහා ගන්නා ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0475/'10

2.

ගරු රවී කරුණානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) අවසන් වරට පළාත් පාලන මැතිවරණ පවත්වන ලද දිනය කවරේද;

(ii) එක්සත් ජාතික පක්ෂය විසින් සහ ජනතා විමුක්ති පෙරමුණ විසින් ජයග්‍රහණය කරන ලද පළාත් පාලන සභා සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) නිල කාලය නිමවීමට පෙර අත්හිටුවන ලද හෝ විසුරුවා හරින ලද සභා සංඛ්‍යාව කොපමණද;

(iv) එසේ විසුරුවා හරින ලද සභා කවරේද;

(v) ඒවා අත්හිටුවන ලද හෝ විසුරුවා හරින ලද දිනයන් සහ එසේ කිරීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත (අ) (ii) හි සඳහන් සභා අතරින් නගරාධිපතිවරුන් ධූරයෙන් ඉවත් කරන ලද, ඔවුන්ගේ තනතුරු අත්හිටුවන ලද හෝ ඔවුන් තනතුරෙන් පහ කරන ලද, එසේත් නැති නම්, ඔවුන් විමර්ශනයට භාජනය කරන ලද පළාත් පාලන ආයතනවල නම් කවරේද;

(ii) එම සිදුවීම්වලට අදාළ දිනයන් සහ එබඳු ක්‍රියාමාර්ග ගැනීමට හේතු කවරේද;

(iii) මේ වන විට ඔවුන් සම්බන්ධයෙන් එළඹී ඇති නිගමනයන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0540/'10

3.

ගරු දයාසිරි ජයසේකර මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) නැගෙනහිර පළාතේ, ත්‍රිකුණාමලය - තිරික්කොණ්ඩියාඩිමඩු මාර්ගය සංවර්ධනය කිරීම සඳහා යෝජිත මාර්ගයක් ද;

(ii) එසේ නම්, එම මාර්ගය මේ වන විට සංවර්ධනය කරමින් පවතින්නේද;

යන්න එතුමා දන්වන්නෙහිද?

(ආ) මෙම මාර්ගයේ සංවර්ධන කටයුතු කරනු ලබන්නේ නම්;

(i) එහි දිග කිලෝමීටර් කොපමණද;

(ii) එහි වැඩ අවසන් කිරීමට යෝජිත දිනය කවරේද;

(iii) ඒ සඳහා ඇස්තමේන්තුගත මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මෙම මාර්ගය ඉදිකිරීම සඳහා ටෙන්ඩර් කැඳවනු ලැබුවේද;

(ii) එසේ නම්, ටෙන්ඩර් ඉදිරිපත් කරන ලද ආයතනවල නම් කවරේද;

(iii) ඒ ඒ ආයතන විසින් ඉදිරිපත් කරන ලද ටෙන්ඩර් මිල ගණන් කවරේද;

(iv) ටෙන්ඩරය පිරිනමන ලද ආයතනය හා අදාළ ටෙන්ඩර් මුදල කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) (i) මෙම මාර්ගය ඉදිකිරීම සඳහා ඇස්තමේන්තු ගත මුළු මුදල දේශීය අරමුදල්වලින් ලබා ගත්තේද;

(ii) නොඑසේ නම්, විදේශ ආධාර මගින් ලබා ගත්තේද;

(iii) විදේශ ආධාර ලබා ගත්තේ නම්, ආධාර ලබාදුන් රටේ නම කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0572/'10

4.

ගරු අජිත් කුමාර මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) අංක 06/2006(iv) හා 2007.08.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව විද්‍යුත් වෛද්‍ය කාර්මික විද්‍යාඥ හා වැඩ මූලික (විශේෂ) යන තනතුරු සඳහා කේත අංක MN - 7 - 2006 A ට අදාල වැටුප ගෙවන ලෙස අධ්‍යක්ෂ (ජීව වෛද්‍ය ඉංජිනේරු සේවා) විසින් අංක BES/පුලි/විවිධ 99 1 හා 2009.08.25 දිනැති ලිපියෙන් ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහල වෙත දන්වා ඇතත් එම රෝහලේ ඉහත කාර්ය මණ්ඩලයට ගෙවනු ලබන්නේ කේත අංක MT2-2006 A දරන අඩු වැටුප් තලය බවත්;

(ii) එම කාර්ය මණ්ඩලයට වඩා අඩු වැටුප් තලයක සිටි සිවිල් (විදුලි, ගොඩනැගිලි) වැඩ මූලික (Forman) තනතුරු සඳහා කේත අංක MN - 7 - 2006 A වැටුප ගෙවන බැවින් වැටුප් විෂමතාවයක් ඇති වී තිබෙන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) ඉහත රෝහලේ ඇති සියලුම වෛද්‍ය උපකරණ (Medical Equipments) හා විකිරණ යන්ත්‍ර (X Ray Machine) නඩත්තුව වැනි අත්‍යවශ්‍ය සේවාවන් ඉටුකරනු ලබන මෙම විද්‍යුත් වෛද්‍ය කාර්මික විද්‍යාඥ කාර්ය මණ්ඩලය නිර්දේශිත වැටුප් තලයේ පිහිටුවා ඔවුන්ට හිමි හිඟ වැටුප් ලබා දීමට පියවර ගන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0625/'10

5\.

ගරු අශෝක් අබේසිංහ මහතා,— තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) නව නිර්මාණකරුවන් විසින් තමන්ට සිදුවන අසාධාරණකම් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා නව නිමැයුම්කරුවන්ගේ කොමිසම වෙත ඉදිරිපත් කරනු ලැබ ඇති පැමිණිලි පිළිබඳව එතුමා දන්නෙහිද?

(ආ) (i) නව නිර්මාණකරුවන් වන ව්‍යාපාරික සෙනෙවිරත්න, කර්තෘවාර්ය රිචඩ් නිකපිටිය සහ කේ. ඩී. පෙරේරා යන අය විසින් ඔවුන්ගේ නිර්මාණ වංචාකර ඇති බවට කරනු ලබන ප්‍රකාශ සම්බන්ධව ගෙන ඇති පියවර කවරේද;

(ii) නව නිර්මාණකරුවන් විසින් නව නිමැවුම්කරුවන්ගේ කොමිසමේ සභාපති සහ එහි සමහර නිලධාරීන් සම්බන්ධව කර ඇති ලිඛිත පැමිණිලි පිළිබඳව විධිමත් පරීක්ෂණයක් සිදුකර තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) නව නිමැවුම්කරුවන්ගේ කොමිසමේ සභාපතිගේ අත්තනෝමතික ක්‍රියාවන් පිළිබඳව විධිමත් පරීක්ෂණයක් පවත්වන ලෙස නිර්මාණ මංකොල්ලයට හසුවී සිටින නිර්මාණකරුවෝ ජනාධිපතිතුමාගෙන් ලිඛිතව ඉල්ලා ඇති බවත්;

(ii) එම කොමිසමට වර්ෂයක් සඳහා රජය ලබාදුන් ප්‍රතිපාදන සුළු කාලයක් තුළ වියදම් කර ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ඈ) ඉහත සඳහන් කොමිසමේ විගණන වාර්තා එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0628/'10

6\.

ගරු අනුර දිසානායක මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) ශ්‍රී ලංකාවේ සිටින කෘෂිකර්ම උපදේශකවරුන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන් සේවයට බඳවා ගැනීමේ ක්‍රියා පටිපාටිය කවරේද;

(iii) කෘෂිකර්ම උපදේශක ශ්‍රේණි හා ඊට අදාළ ශ්‍රේණි සඳහා බඳවා ගැනීමේ සුදුසුකම් කවරේද;

යන්න එතුමා මේ සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) පළාත් අනුව සිටිය යුතු කෘෂිකර්ම උපදේශකවරුන්ගේ සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද ;

(ii) ඌව පළාත් සභාවට බඳවාගත් කෘෂිකර්ම උපදේශකවරුන්ගේ සංඛ්‍යාව කොපමණද;

(iii) කෘෂිකර්ම උපදේශක පුහුණු හා කෘෂිකර්ම ඩිප්ලෝමාවේදීන් අතර සමානත්වයක් පවතින්නේද;

(iv) කෘෂිකර්ම උපදේශක පුහුණු ශ්‍රේණිය සඳහා අවශ්‍ය සුදුසුකම් කවරේද;

(v) කෘෂිකර්ම ඩිප්ලෝමාවේදීන්, කෘෂිකර්ම උපදේශක තනතුරට බඳවා ගැනීම සඳහා ක්‍රියා පටිපාටියක් තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0641/’10

7.

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා,— රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) ශ්‍රී ලංකාව තුළ පිහිටි ග්‍රාම නිලධාරී වසම්වල සේවය කරන රාජ්‍ය සහ පළාත් සභාවලට අයත් නිලධාරීන් කවරේද;

(ii) එම එක් එක් නිලධාරියා ඉටු කරන රාජකාරිය සහ ගෙවනු ලබන ආරම්භක මාසික වැටුප වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) වාර්ෂිකව මෙම නිලධාරීන් සඳහා වේතන හා දීමනා ගෙවීම වෙනුවෙන් වැය කරනු ලබන මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) රජය විසින් ග්‍රාම නිලධාරී වසම් සඳහා පත්කිරීමට බලාපොරොත්තුවන ජනසභා ලේකම්වරුන්ගේ කාර්යභාරයන් කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0642/’10

8.

ගරු අජිත් කුමාර මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) මෙම වර්ෂය තුළදී රැකියා ලබා දීමට අපේක්ෂිත රැකියා විරහිත උපාධිධාරීන් සංඛ්‍යාව කොපමණ ද;

(ii) ඒ සඳහා දැන්වීම් ප්‍රසිද්ධකර සම්මුඛ පරීක්ෂණ පවත්වා තිබේද;

(iii) එම බඳවා ගැනීම් ආරම්භ කරන හා අවසන් කරන දිනයන් කවරේද;

(iv) ඉහත රැකියා ලබාදීමේ වැඩ පිළිවෙළ වෙනුවෙන් අයවැය ඇස්තමේන්තුව මගින් වෙන්කිරීමට අපේක්ෂිත මුදල කොපමණද:

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0338/’10

9.

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) හම්බන්තොට දිස්ත්‍රික්කයේ, ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අග්බෝපුර ග්‍රාම නිලධාරි වසමේ පිහිටි වීරවිල නව නගරය, අග්බෝපුර, කු.ග. 19, අංක 447 දරන නිවාස ඉඩම, ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ 1998/01/27 දිනැති හම්/11/ප්‍ර 47494 දරන දීමනා පත්‍රය මගින් එච්. ජී. දයානන්ද මහතා වෙත ලබාදී ඇති බවත්;

(ii) ඒ අනුව එම දීමනා පත්‍රයේ සඳහන් හතර මායිම් තුල පිහිටි භූමි භාගය ඔහුට හිමි වන බවත්;

(iii) දයානන්ද මහතා මෙම ඉඩම වසර 21 ක් භුක්ති විඳ ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(අ) (i) ඉහත ඉඩමට වෙනත් පුද්ගලයෙකු අනවසරයෙන් ඇතුල්කරලීමට එම ප්‍රදේශයේ සේවයේ නියුතු ග්‍රාම නිලධාරීන් විසින් කටයුතු කර ඇති බව එතුමා පිළිගන්නේද ;

(ii) එසේ නම්, දයානන්ද මහතාට අයථා බලපෑම් කළ එම නිලධාරීන් සම්බන්ධයෙන් ගන්නා ක්‍රියා මාර්ග කවරේද:

(iii) එම ඉඩම් කොටස නිරවුල්කර දයානන්ද මහතාට ලබා දීම සඳහා අදාළ බලධාරීන්ට නියෝග කරන්නේද;

(iv) එසේ නම්, ඒ කොපමණ කාලයක් තුළදීද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0476/'10

10.

ගරු රවී කරුණානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) පසුගිය වර්ෂ 10ක කාලය තුළ එක් එක් වර්ෂයේදී සිගරට් සහ මධ්‍යසාරවල මිල වැඩි කරනු ලැබූ දිනයන් සහ ප්‍රමාණයන් කවරේද;

(ii) සිගරට් සහ මධ්‍යසාරවල මිල වැඩි කළ එම එක් එක් අවස්ථාවේදී පෙර පැවති මිලට වඩා වැඩියෙන් නියම කළ මිල ගණන් හේතුවෙන් උපයාගත් සමස්ත ආදායම වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) මිල වැඩි කිරීම මගින් සිගරට් හා මධ්‍යසාර භාවිතය අධෛර්යමත් කිරීමට රජය උනන්දුවක් දක්වන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) සිගරට් සහ මධ්‍යසාර සඳහා පනවා ඇති සියළු බදු වර්ග කවරේද යන්න එතුමා වෙන් වෙන් වශයෙන් සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0541/'10

11.

ගරු දයාසිරි ජයසේකර මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) නැගෙනහිර පළාතේ, අල්ල - කන්තලේ මාර්ගය සංවර්ධනය කිරීම සඳහා යෝජිත මාර්ගයක් ද;

(ii) එසේ නම්, එම මාර්ගය මේ වන විට සංවර්ධනය කරමින් පවතින්නේද;

යන්න එතුමා දන්වන්නෙහිද?

(ආ) මෙම මාර්ගයේ සංවර්ධන කටයුතු කරනු ලබන්නේ නම්;

(i) එහි දිග කිලෝමීටර් කොපමණද;

(ii) එහි වැඩ අවසන් කිරීමට යෝජිත දිනය කවරේද;

(iii) ඒ සඳහා ඇස්තමේන්තුගත මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මෙම මාර්ගය ඉදිකිරීම සඳහා ටෙන්ඩර් කැඳවනු ලැබුවේද;

(ii) එසේ නම්, ටෙන්ඩර් ඉදිරිපත් කරන ලද ආයතනවල නම් කවරේද;

(iii) ඒ ඒ ආයතන විසින් ඉදිරිපත් කරන ලද ටෙන්ඩර් මිල ගණන් කවරේද;

(iv) ටෙන්ඩරය පිරිනමන ලද ආයතනය හා අදාළ ටෙන්ඩර් මුදල කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) (i) මෙම මාර්ගය ඉදිකිරීම සඳහා ඇස්තමේන්තු ගත මුළු මුදල දේශීය අරමුදල්වලින් ලබා ගත්තේද;

(ii) නොඑසේ නම්, විදේශ අධාර මගින් ලබා ගත්තේද;

(iii) විදේශ ආධාර ලබා ගත්තේ නම්, ආධාර ලබාදුන් රටේ නම කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0629/'10

12.

ගරු අනුර දිසානායක මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) 2005 වර්ෂයේ සිට මේ දක්වා වසා දැමූ එක් එක් පාසලක සිටි ගුරුවරු සංඛ්‍යාව හා සිසුන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ලංකාවේ රජයේ පාසල්වලින් පරිගණක , අන්තර්ජාල , විදුලිය, පානීය ජලය, දුරකථන, පුස්තකාල, විද්‍යාගාර , ක්‍රීඩාංගන හා වැසිකිළි යන එක් එක් පහසුකම ඇති පාසල් සංඛ්‍යාව දිස්ත්‍රික් මට්ටමින් කොපමණද;

(ii) ඉහත එක් එක් පහසුකම ඇති පාසල් සංඛ්‍යාව මුළු රජයේ පාසල් සංඛ්‍යාවෙන් කවර ප්‍රතිශතයක්ද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0478/'10

13.

ගරු රවී කරුණානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) මූල්‍ය වගකීම් පනතට අනුව රටේ මූල්‍ය තත්වය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට නියමිත කවදාද;

(ii) මූල්‍ය වගකීම් පනතට අනුව ගිණුම් ප්‍රකාශනය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබුවේද;

(iii) එසේ නම්, එය ඉදිරිපත් කරනු ලැබුවේ කවදාද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ගිණුම් ප්‍රකාශනයෙහි හෙජිං ගනුදෙනුව අනිශ්චිත වගකීමක් ලෙස සඳහන් කර තිබේද හා නොඑසේ නම් ඊට හේතුව කවරේද;

(ii) හෙජිං ගනුදෙනුව පිළිබඳ ප්‍රශ්නයෙහි වර්තමාන තත්ත්වය කවරේද;

(iii) විනිමය පාලන දෙපාර්තමේන්තුව ගෙවීම් නොකරන ලෙසට උපදෙස් දී තිබූ නමුත් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව හෝ රජය විසින් හෙජිං ගනුදෙනුව වෙනුවෙන් ජාත්‍යන්තර බැංකු වෙත ගෙවීම් කරනු ලැබුවේද;

(iv) හෙජිං ගනුදෙනුවට අදාළ ප්‍රශ්නය සම්බන්ධයෙන් ගනු ලබන නිශ්චිත ක්‍රියා මාර්ග කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0494/'10

14.

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) අද වන විට ශ්‍රී ලංකාවේ ජීවත්වන අඳ ගොවියන්ගේ අඳ අයිතිය, ඉඩම් අයිතිය සහ අනුප්‍රාප්තික අයිතිය අහිමි වී ඇති බවත්;

(ii) ඊට ප්‍රධානතම හේතුව 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනත බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) අද ගොවියාගේ අඳ අයිතිය නැවත වරක් නව පනතක් මගින් ඔවුන්ට ලබාදීමට කටයුතු කරන්න්නේද;

(ii) එසේ නම්, ඊට අවශ්‍ය ක්‍රියා මාර්ග ගනු ලබන නිශ්චිත කාල වකවානුව කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0546/'10

15.

ගරු දයාසිරි ජයසේකර මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) මඩකලපුව දිස්ත්‍රික්කයේ ඉදිකිරීමට යෝජිතව තිබූ ආරුගම්බේ පාලමෙහි ඉදිකිරීම් අවසන්ව ඇත්තේද;

(ii) නොඑසේ නම්, එහි වර්තමාන තත්ත්වය කවරේද;

(iii) එම පාලම ඉදිකිරීම සඳහා ඇස්තමේන්තුගත මුදල කොපමණද;

(iv) මේ වන විට වැය කර ඇති මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) එම පාලම ඉදිකිරීමට මුදල් ආයෝජනය කරන ලද ආයතනයේ නම කවරේද;

(ii) ඒ සඳහා විදේශ ආධාර ලැබුනේ නම්, ආධාර ප්‍රදානය කළ රට සහ අදාළ මුදල කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මෙම පාලමේ ඉදිකිරීම් කටයුතු කරනු ලබන ආයතනයේ නම කවරේද;

(ii) එම ආයතනයට ඉදිකිරීම් කටයුතු පවරනු ලැබූ පදනම කවරේද;

(iii) ඉදිකිරීම් කටයුතු පැවරීම සඳහා ටෙන්ඩර් කැඳවන ලද්දේද;

(iv) එසේ නම්, ටෙන්ඩර් ඉදිරිපත් කරන ලද ආයතන හා ඉදිරිපත් කළ මිල ගණන් වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන් ද?

---

## 2010 නොවැම්බර් මස 25 වැනි බ්‍රහස්පතින්දා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0479/'10

1.

ගරු රවී කරුණානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ කාර්ය භාරය කවරේද;

(ii) සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් විමර්ශනය කරනු ලැබ ඇති, අභ්‍යන්තරික තැනැත්තන් විසින් සිදු කරන ලද වංචනික ගනුදෙනු සංඛ්‍යාව කොපමණද;

(iii) එම විමර්ශන කටයුතුවලට සම්බන්ධ නම් සහ සිද්ධි කවරේද;

(iv) මේ වන විට එම විමර්ශන කටයුතුවලින් ලැබී ඇති ප්‍රතිඵලය කවරේද;

(v) එම සිද්ධි සමථයකට පත් කොට හෝ ඒ වෙනුවෙන් දඩ මුදල් අය කරනු ලැබ තිබේද;

(vi) අය කරනු ලැබූ දඩ මුදල් ප්‍රමාණයන් සහ එක් එක් පැමිණිල්ල සමථයකට පත් කරනු ලැබූ දිනයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0495/'10

2.

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) හම්බන්තොට දිස්ත්‍රික්කය තුළ තිබෙන ලියාපදිංචි පෙර පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පෙර පාසල්වල අධ්‍යාපනය ලබන දරු දැරියන්ට ආහාර වේලක් ලබා දීමට සහ ඉගැන්වීම් කටයුතු කරන පාලිකාවන්ට වැටුපක් ලබාදීමට වර්තමාන රජය කටයුතු කරන්නේද;

(iii) නොඑසේ නම්, ඊට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0547/'10

3.

ගරු දයාසිරි ජයසේකර මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ඉදිකිරීමට යෝජිතව තිබූ පුදමින්කට්ටු පාලමෙහි ඉදිකිරීම් අවසන්ව ඇත්තේද;

(ii) නොඑසේ නම්, එහි වර්තමාන තත්ත්වය කවරේද;

(iii) එම පාලම ඉදිකිරීම සඳහා ඇස්තමේන්තුගත මුදල කොපමණද;

(iv) මේ වන විට වැය කර ඇති මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) එම පාලම ඉදිකිරීමට මුදල් ආයෝජනය කරන ලද ආයතනයේ නම කවරේද;

(ii) ඒ සඳහා විදේශ ආධාර ලැබුනේ නම්, ආධාර ප්‍රදානය කළ රට සහ අදාළ මුදල කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මෙම පාලමේ ඉදිකිරීම් කටයුතු කරනු ලබන ආයතනයේ නම කවරේද;

(ii) එම ආයතනයට ඉදිකිරීම් කටයුතු පවරනු ලැබූ පදනම කවරේද;

(iii) ඉදිකිරීම් කටයුතු පැවරීම සඳහා ටෙන්ඩර් කැඳවන ලද්දේද;

(iv) එසේ නම්, ටෙන්ඩර් ඉදිරිපත් කරන ලද ආයතන හා ඉදිරිපත් කළ මිල ගණන් වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන් ද?

0630/'10

4.

ගරු අනුර දිසානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) 2010.07.20 වැනි දින වන විට මන්නාරම් ද්‍රෝණියේ ඛනිජ තෙල් ලිං කැනීමේ කටයුතුවල තත්වය කවරේද;

(ii) ඉන්දියාවේ කෙයාර්න් සමාගම සමග ඇති කරගත් තෙල් ලිං කැනීම සඳහා වන ගිවිසුම කුමක්ද;

(iii) එම ගිවිසුමට අනුව ගවේෂණය කළ මුළු භූමියෙන් කෙයාර්න් සමාගමට ලබාදුන් භූමි ප්‍රමාණය කවරේද;

(iv) එකී ගිවිසුමට අනුව එම සමාගම කැනීම් අවසන් කළ යුතු දිනය කවරේද;

(v) නියමිත දිනට කැනීම් කටයුතු අවසන් නොකරන්නේ නම්, ගිවිසුමට අනුව ගන්නා ක්‍රියා මාර්ගය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) කැනීම් කටයුතු සිදුකරන කොන්ත්‍රාත් සමාගමේ ගිණුම් කටයුතු ලංකා රජය යටතේ සිදුකරන්නේද;

(ii) එසේ නම්, අදාළ ගිවිසුමට එළඹි දිනයේ සිට 2010.07.20 වන දිනට ගිණුම් වාර්තා සභාවට ඉදිරිපත් කරන්නේද;

(iii) එකී ගිණුම් වාර්තා සමාලෝචනය සඳහා ලංකාවේ වගකියන ආයතනයක් තිබේද;

(iv) එසේ නම්, එහි නම කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0643/'10

5.

ගරු අජිත් කුමාර මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) රැකියා විරහිත සෞන්දර්ය උපාධිධාරීන්ට රැකියා ලබාදීමට වැඩ පිළිවෙළක් මේ වන විට සකසා තිබේද;

(ii) එසේ නම්, ඒ කවරේද;

යන්න එතුමා මේ සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත වැඩසටහනින් රැකියා ලබා දීමට අපේක්ෂිත සෞන්දර්ය උපාධිධාරීන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඒ සඳහා වෙන් කර ඇති මුදල් ප්‍රමාණය කොපමණද;

(iii) බඳවා ගැනීමට අදාළ දැන්වීම් ප්‍රසිද්ධකර, සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවා තිබේද;

(iv) එසේ නම්, එම සම්මුඛ පරීක්ෂණ සඳහා සහභාගි වූ සංඛ්‍යාව කොපමණද;

(v) ඔවුන් අතරින් රැකියා ලබා දෙන සංඛ්‍යාව කොපමණද;

(vi) එම බඳවා ගැනීම් ආරම්භ කරන හා අවසන් කරන දිනයන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0758/'10

6\.
ගරු වසන්ත අලුවිහාරේ මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) මාතලේ මහ රෝහලේ නව ශල්‍ය වෛද්‍ය සංකීර්ණයේ වැඩ අවසන් කර රෝහල් අධිකාරියට භාර දී තිබේද;

(ii) මෙම නව ශල්‍ය වෛද්‍ය සංකීර්ණයේ ඉදිකිරීම් ආරම්භ කළ දිනය හා අවසන් කළ දිනය කවරේද;

(iii) එම වෛද්‍ය සංකීර්ණයේ ඉදිකිරීම් අවසන්ව ඇත්නම්, එය විවෘත කිරීම මේ දක්වා ප්‍රමාද කිරීමට හේතු කවරේද;

(iv) මෙම නව ගොඩනැගිල්ල කඩිනමින් විවෘත කිරීම සඳහා පියවර ගන්නේද;

(v) එසේ නම්, එය විවෘත කරනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එම නව ශල්‍ය වෛද්‍ය සංකීර්ණය ඉදිකිරීම සඳහා සහ වායු සමීකරණ හා අනෙකුත් මූලික උපාංග සවිකිරීම සඳහා වැය කරන ලද මුදල් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0761/'10

7\.
ගරු තිස්ස අත්තනායක මහතා,— තැපැල් හා විදුලි සංදේශ අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගම විසින් VOIP අන්තර්ජාතික දුරකථන සේවාවන් සම්බන්ධයෙන් ටෙලිකොම් ඒෂියා සමාගම සමග ගිවිසුමකට එළඹුනේද;

(ii) ඒ සඳහා ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයේ පූර්ව අනුමතිය ලැබුනේද;

(iii) එම ගිවිසුමට එළඹීමට පෙර අන්තර්ජාතික දුරකථන ඇමතුම් වෙනුවෙන් විනාඩියකට ඇමරිකානු ඩොලර් (US$) 0.075ක මුදලක් ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගමට ලැබුනේද;

(iv) එම ගිවිසුම නිසා ඉහත මුදල විනාඩියකට ඇමරිකානු ඩොලර් (US$) 0.069 දක්වා අඩු වී තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත සමාගම සමඟ ගිවිසුමට එළඹෙන ලෙස වර්ෂ 2009 සැප්තැම්බර් මස දී මුල්වරට යෝජනාවක් ඉදිරිපත් කරනු ලැබුවේද;

(ii) ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය එම යෝජනාව නීතිමය හා මූල්‍යමය කරුණු මත ප්‍රතික්ෂේප කළේද;

(iii) එසේ නම්, එම සමාගම ශ්‍රී ලංකාවට නැවත ගෙන්වනු ලැබුවේ කවුරුන්ද;

(iv) එම ගිවිසුම අත්සන් කර ඇත්තේ අදාළ සාමාන්‍ය කාර්ය පටිපාටියට පටහැනිවද;

(v) එම ගිවිසුම අත්සන් කිරීමෙන් ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගමට සිදුවන අලාභය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0482/'10

8.

ගරු රවී කරුණානායක මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) කොළඹ මහ නගර සභාව අවසන් වරට තේරී පත්වූයේ කවදාද;

(ii) අවසන් වරට තේරී පත්වූ හෝ නම් කරනු ලැබූ නගරාධිපතිවරයාගේ හා නියෝජ්‍ය නගරාධිපතිවරයාගේ නම් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) විශේෂ කොමසාරිස්වරයෙකු පත්කරනු ලැබුවේ කවදාද;

(ii) දූෂණ හේතුවෙන් සභාව ක්‍රියාත්මකවීම අත්හිටුවන ලද්දේ කවදාද;

(iii) ඒ පිළිබඳ වාර්තාව ප්‍රධාන අමාත්‍යවරයාට ලබාදෙන ලද්දේ කවදාද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) චෝදනා පත්‍රය හා චෝදනා පිළිබඳ සොයාගත් තොරතුරු අඩංගු කමිටු වාර්තාව සභාගත කරන්නේද;

(ii) විශේෂ කොමසාරිස්වරයෙකු පත්කරනු වෙනුවට මැතිවරණයක් පැවැත්වීම සඳහා කටයුතු කිරීමට ප්‍රධාන අමාත්‍යවරයාට හැකියාවක් නොතිබුණේද;

(iii) නාගරික මන්ත්‍රීවරුන්ට එරෙහිව චෝදනා ඉදිරිපත් කිරීමට කටයුතු කෙරෙන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0496/'10

9.

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) හම්බන්තොට දිස්ත්‍රික්කයේ ළදරුවන්ගේ පෝෂණ මට්ටම පිලිබඳව ඇති වත්මන් සංඛ්‍යාලේඛන කවරේද;

(ii) එම සංඛ්‍යාලේඛන අනුව, ළදරුවන්ගේ පෝෂණ මට්ටම සතුටුදායක තත්වයක පවතින්නේද;

(iii) එම ළදරුවන්ගේ පෝෂණ මට්ටම වැඩිදියුණු කිරීමට ගන්නා වූ පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0548/'10

10.

ගරු දයාසිරි ජයසේකර මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ඉදිකිරීමට යෝජිතව තිබූ ඉරක්කන්ඩි පාලමෙහි ඉදිකිරීම් අවසන්ව ඇත්තේද;

(ii) නොඑසේ නම්, එහි වර්තමාන තත්ත්වය කවරේද;

(iii) එම පාලම ඉදිකිරීම සඳහා ඇස්තමේන්තුගත මුදල කොපමණද;

(iv) මේ වන විට වැය කර ඇති මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) එම පාලම ඉදිකිරීමට මුදල් ආයෝජනය කරන ලද ආයතනයේ නම කවරේද;

(ii) ඒ සඳහා විදේශ ආධාර ලැබුනේ නම්, ආධාර ප්‍රදානය කළ රට සහ අදාළ මුදල කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මෙම පාලමේ ඉදිකිරීම් කටයුතු කරනු ලබන ආයතනයේ නම කවරේද;

(ii) එම ආයතනයට ඉදිකිරීම් කටයුතු පවරනු ලැබූ පදනම කවරේද;

(iii) ඉදිකිරීම් කටයුතු පැවරීම සඳහා ටෙන්ඩර් කැඳවන ලද්දේද;

(iv) එසේ නම්, ටෙන්ඩර් ඉදිරිපත් කරන ලද ආයතන හා ඉදිරිපත් කළ මිල ගණන් වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන් ද?

0631/'10

11.

ගරු අනුර දිසානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) ලංකාවේ දකුණු අක්වෙරළේ අවසාධිත ද්‍රෝණි 2 හි ඛනිජ තෙල් පැවැතීම සම්බන්ධව කරන ලද පර්යේෂණයන්හි ප්‍රතිඵල කවරේද;

(ii) එම පර්යේෂණයේ ලිඛිත තොරතුරු / සටහන් ඇත්නම් ඉදිරිපත් කරන්නේද;

(iii) එම පර්යේෂණ සම්බන්ධයෙන් වගකියන ආයතනය හෝ එකී වගකීම පැවරූ ආයතනයේ නම කවරේද;

(iv) එම ආයතනය විසින් ලබාදුන් තොරතුරුවල වගකීම දරන ලංකාවේ විද්‍යාඥයින් සිටින්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මෙම දකුණු වෙරළේ ඛනිජ තෙල් සම්බන්ධයෙන් ඉන්දියාව හෝ වෙනත් රටක් සමග ගිවිසුම් අත්සන් කර තිබේද;

(ii) එසේ නම්, එය මේ සභාවට ඉදිරිපත් කරන්නේද;

(iii) නොඑසේ නම්, ඉදිරියේදී ඉන්දියාව හෝ වෙනත් රටක් සමග ගිවිසුමක් අත්සන් කිරීමට රජය තීරණය කර තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0483/'10

12.

ගරු රවී කරුණානායක මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) කැලි කසළ එකතු කිරීම සඳහා කොළඹ මහ නගර සභාව විසින් දිනකට වැයකරන මුළු මුදල කොපමණද;

(ii) දිනකට එකතු කරන කැලි කසළ ටොන් සංඛ්‍යාව කොපමණද;

(iii) කැලි කසළ එකතු කිරීමේදී ටොන් එකක් සඳහා අය කරනු ලබන මුදල කොපමණද;

(iv) කොළඹ මහ නගර සභාව විසින් කැලි කසළ එකතු කිරීමේ කාර්යය සඳහා සම්බන්ධ කර ගෙන ඇති සමාගම් කවරේද;

(v) කැලි කසළ එකතු කිරීම සහ බැහැර කිරීම සඳහා වන ජාතික සැලැස්ම බස්නාහිර පළාත තුළ ක්‍රියාත්මක කළ හැකිද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ජයවර්ධනපුර මහ නගර සභාව

(ii) මහරගම නගර සභාව

(iii) මොරටුව මහ නගර සභාව

(iv) දෙහිවල ගල්කිස්ස මහ නගර සභාව

යන ආයතන විසින්, එම ආයතන සීමා තුළ කැලි කසළ එකතු කිරීම සඳහා වැය කරන මුදල කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0497/'10

13.

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) හම්බන්තොට දිස්ත්‍රික්කයේ මේ වන විට සිටින ගැබිනි මව්වරුන්ගේ පෝෂණ තත්ත්වය පිළිබඳව ලැබී ඇති වත්මන් සංඛ්‍යාලේඛන කවරේද;

(ii) එම දත්තයන් අනුව ගැබිනි මව්වරුන්ගේ පෝෂණ තත්ත්වය සතුටුදායක මට්ටමක පවතින්නේද;

(iii) එම ගැබිණි මව්වරුන්ගේ පෝෂණ මට්ටම වැඩිදියුණු කිරීමට ගන්නා වූ පියවර කවරේද?;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0549/'10

14.

ගරු දයාසිරි ජයසේකර මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ඉදිකිරීමට යෝජිතව තිබූ රලිතුලායි පාලමෙහි ඉදිකිරීම් අවසන්ව ඇත්තේද;

(ii) නොඑසේ නම්, එහි වර්තමාන තත්ත්වය කවරේද;

(iii) එම පාලම ඉදිකිරීම සඳහා ඇස්තමේන්තුගත මුදල කොපමණද;

(iv) මේ වන විට වැය කර ඇති මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) එම පාලම ඉදිකිරීමට මුදල් ආයෝජනය කරන ලද ආයතනයේ නම කවරේද;

(ii) ඒ සඳහා විදේශ ආධාර ලැබුනේ නම්, ආධාර ප්‍රදානය කළ රට සහ අදාළ මුදල කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මෙම පාලමේ ඉදිකිරීම් කටයුතු කරනු ලබන ආයතනයේ නම කවරේද;

(ii) එම ආයතනයට ඉදිකිරීම් කටයුතු පවරනු ලැබූ පදනම කවරේද;

(iii) ඉදිකිරීම් කටයුතු පැවරීම සඳහා ටෙන්ඩර් කැඳවන ලද්දේද;

(iv) එසේ නම්, ටෙන්ඩර් ඉදිරිපත් කරන ලද ආයතන හා ඉදිරිපත් කළ මිල ගණන් වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන් ද?

0633/'10

15\.

ගරු අනුර දිසානායක මහතා,— නැවත පදිංචි කිරීමේ අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) උතුරු ප්‍රදේශයේ සිටින යුද්ධයෙන් දෙමාපියන් අහිමි වූ දරුවන් සංඛ්‍යාව;

(ii) එම දරුවන් අතර සිටින පාසල් සිසුන් සංඛ්‍යාව;

(iii) ඔවුන්ගෙන් මේ වන විට පාසල් යන සංඛ්‍යාව;

කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) දෙමාපියන් අහිමි වූ ඉහත දරුවන් වෙනුවෙන් සහ ඔවුන් අතරින් පාසල් නොයන දරුවන් වෙනුවෙන් දියත් කර ඇති වැඩ පිළිවෙළවල් කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2010 නොවැම්බර් මස 26 වැනි සිකුරාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0096/'10

1\.

ගරු රවී කරුණානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) 1948 වර්ෂයේ සිට 1994 වර්ෂය දක්වා එක් එක් වර්ෂය අවසාන වන විට;

(ii) 1995 වර්ෂයේ සිට 2009 වර්ෂය දක්වා, එක් එක් වර්ෂය අවසානයේ හා 2010 වර්ෂයේ මේ දක්වා;

ගෙවීමට තිබූ සමස්ත රාජ්‍ය ණය ප්‍රමාණය දේශීය ණය සහ විදේශීය ණය ලෙස වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ඉහත (i) හි සහ (ii) හි සඳහන් කාලපරිච්ඡේදයන්හි එක් එක් වර්ෂය සඳහා මුළු ණය ක්‍රමක්ෂය (මුල් මුදල + පොලිය වශයෙන් ගෙවූ මුදල) කොපමණ ද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) 1948 වර්ෂයේ සිට 2003 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදය, 2003 වර්ෂය, 2004 වර්ෂය, 2005 වර්ෂය, 2006 වර්ෂය, 2007 වර්ෂය සහ 2008 වර්ෂයේ සිට මේ දක්වා වූ කාලපරිච්ඡේදය යන කාල වකවානු සඳහා,

(i) ලෝක බැංකුව

(ii) ජාත්‍යන්තර මූල්‍ය අරමුදල

(iii) ආසියානු සංවර්ධන බැංකුව

(iv) ජපන් ජාත්‍යන්තර සහයෝගීතා බැංකුව

(v) ඇමෙරිකා එක්සත් ජනපදය

(vi) ජපානය

(vii) යුරෝපා සංගමයේ (EU) රටවල්

(viii) ඉන්දියාව

(ix) චීනය

යන සංවිධාන සහ රටවල් වෙත ගෙවිය යුතුව තිබූ මුළු ණය ප්‍රමාණයන්, ඒ සඳහා වන සාමාන්‍ය පොලී වියදමද සමගින් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) එමෙන්ම පසුගිය වර්ෂ 5 තුළ එක් එක් වර්ෂය සඳහා ඒක පුද්ගල ආදායම සමග සන්සන්දනාත්මකව ඒක පුද්ගල ණය බර ප්‍රමාණයන් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0359/'10

2.

ගරු අජිත් පී. පෙරේරා මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) ශ්‍රී ලංකාව තුළ ඇති,

(i) රජයේ ජාතික පාසල් සහ රජයේ අනෙකුත් පාසල් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) පළමු ශ්‍රේණියේ සිට උසස් පෙළ දක්වා ඉංග්‍රීසි මාධ්‍යයෙන් උගන්වන රජයේ පාසල් සංඛ්‍යාව සහ සියලුම පන්ති සඳහා ඉංග්‍රීසි භාෂාවෙන් ඉගැන්වීම් නොකරන නමුත් අවම වශයෙන් ඉංග්‍රීසි මාධ්‍යයෙන් ඉගැන්වීම සිදුකරන රජයේ පාසල් සංඛ්‍යාව දිස්ත්‍රික් මට්ටමින්, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ඒවායේ නම් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) බණ්ඩාරගම සහ මිල්ලනිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස තුළ ඉංග්‍රීසි මාධ්‍යයෙන් උගන්වන පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවායේ නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) ඉංග්‍රීසි භාෂාව භාවිතය සම්බන්ධ අනාගත අභියෝගවලට මුහුණදීමට සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකම අවම වශයෙන් ඉංග්‍රීසි මාධ්‍යයෙන් උගන්වන පාසල් දෙකක්වත් වහාම ආරම්භ කළ යුතු බව එතුමා පිළිගන්නේද;

(ii) නොඑසේ නම්, ඊට ඉදිරිපත් කරන විකල්ප කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0406/'10

3.

ගරු තිලංග සුමතිපාල මහතා,— ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) කොළඹ දිස්ත්‍රික්කයේ ඇති;

(i) පර්චස් 4 ට අඩු බිම් ප්‍රමාණයක පිහිටි අඩු පහසුකම් සහිත නිවාස සංඛ්‍යාව කොපමණද;

(ii) අඩු පහසුකම් සහිත අනවසර නිවාස සංඛ්‍යාව කොපමණද;

(iii) අනවසර නිවාස පිහිටි මුළු භූමි ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) මෙම අඩු පහසුකම් සහිත නිවාස, පහසුකම් සහිත නිවාස බවට පත්කිරීම සඳහා ගෙන ඇති පියවර කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0410/’10

4\.

ගරු දිළුම් අමුණුගම මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) 2004 වර්ෂයේ රාජ්‍ය සේවයේ සිටි සේවක සංඛ්‍යාව කොපමණද;

(ii) වර්ෂ 2010 වන විට රාජ්‍ය සේවයේ සිටින සේවක සංඛ්‍යාව කොපමණද;

(iii) 2004 වර්ෂයේ සිට මේ දක්වා රාජ්‍ය සේවයට බඳවා ගෙන ඇති සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) තවදුරටත් මෙම සේවක සංඛ්‍යාව වැඩි කිරීමට කටයුතු කරන්නේද;

(ii) එසේ වැඩි කිරීමට ගන්නා ක්‍රියාමාර්ගය කුමක්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0463/’10

5\.

ගරු නූර්දීන් මෂූර් මහතා,— නැවත පදිංචි කිරීමේ අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) වර්ෂ 2004 සිට 2010 දක්වා වූ කාලය තුළ නැවත පදිංචි කිරීමේ අමාත්‍යාංශයේ ප්‍රතිපාදනවලින් සෘජු වශයෙන් හෝ එම අමාත්‍යාංශ යෝජනා සැලස්මක් අනුව වෙනත් අමාත්‍යාංශ ප්‍රතිපාදනවලින් හෝ ක්‍රියාත්මක කළ වැඩ සටහනක් යටතේ, පුත්තලම, මන්නාරම, වවුනියාව යන දිස්ත්‍රික්කවල අවතැන්වූ පවුල්වල තරුණියන්ට ස්වයං රැකියාවල නියැළීම පිණිස එක් එක් වර්ෂයේ පවත්වන ලද මැහුම් පාඨමාලාවන් ගණන කොපමණද;

(ii) එම මැහුම් පුහුණු පාඨමාලාවන් සඳහා එක් එක් වාරයන් සඳහා තෝරා ගන්නා ලද තරුණියන්ගේ සංඛ්‍යාව, ඔවුන්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

(iii) එම එක් එක් මැහුම් පුහුණු පාඨමාලාවන් සඳහා වෙන්කරන ලද මුළු මුදල, එයින් වියදම් කරන ලද මුදල සහ එම වැය ශීර්ෂය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) මෙම පාඨමාලාවන් සඳහා පුහුණුකරුවන් ලෙස බඳවා ගන්නා ලද අයවලුන්ගේ සංඛ්‍යාව, නම් සහ ලිපිනයන්, ඔවුන් වෙනුවෙන් ගෙවීම් කළ අකාරය සහ ගෙවන ලද ප්‍රමාණය කවරේද යන්න එක් එක් වර්ෂයට අදාළව, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් එතුමා සඳහන් කරන්නෙහිද ?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0498/’10

6\.

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) හම්බන්තොට දිස්ත්‍රික්කය තුළ ඇති පවුල් සෞඛ්‍ය සේවා කොට්ඨාස සංඛ්‍යාව කොපමණද;

(ii) එම කොට්ඨාසවල සේවය කරන පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනියන් සංඛ්‍යාව කොපමණද;

(iii) එම පවුල් සෞඛ්‍ය සේවා කොට්ඨාස වෙන් කර තිබෙන ජන අනුපාතය කුමක්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) හම්බන්තොට දිස්ත්‍රික්කය තුළ පවුල් සෞඛ්‍ය සේවා කොට්ඨාස වෙන් කර ඇති ආකාරය සතුටුදායක වන්නේද;

(ii) පවුල් සෞඛ්‍ය සේවයේ නිරත වී සිටින නිලධාරිනියන්ට ලබා දී ඇති පහසුකම් සතුටුදායක තත්ත්වයක පවතින්නේද ;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0550/'10

7.

ගරු දයාසිරි ජයසේකර මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ඉදිකිරීමට යෝජිතව තිබූ ගංගි පාලමෙහි ඉදිකිරීම් අවසන්ව ඇත්තේද;

(ii) නොඑසේ නම්, එහි වර්තමාන තත්ත්වය කවරේද;

(iii) එම පාලම ඉදිකිරීම සඳහා ඇස්තමේන්තුගත මුදල කොපමණද;

(iv) මේ වන විට වැය කර ඇති මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) එම පාලම ඉදිකිරීමට මුදල් ආයෝජනය කරන ලද ආයතනයේ නම කවරේද;

(ii) ඒ සඳහා විදේශ ආධාර ලැබුනේ නම්, ආධාර ප්‍රදානය කළ රට සහ අදාළ මුදල කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මෙම පාලමේ ඉදිකිරීම් කටයුතු කරනු ලබන ආයතනයේ නම කවරේද;

(ii) එම ආයතනයට ඉදිකිරීම් කටයුතු පවරනු ලැබූ පදනම කවරේද;

(iii) ඉදිකිරීම් කටයුතු පැවරීම සඳහා ටෙන්ඩර් කැඳවන ලද්දේද;

(iv) එසේ නම්, ටෙන්ඩර් ඉදිරිපත් කරන ලද ආයතන හා ඉදිරිපත් කළ මිල ගණන් වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0634/'10

8.

ගරු අනුර දිසානායක මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) 2010.08.01 වන විට ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය මගින් සිදුකරනු ලැබූ නව බඳවා ගැනීම් කවරේද;

(ii) ජනසභා ලේකම් තනතුරට බඳවා ගැනීම ඊට අන්තර්ගත වන්නේද;

(iii) එම තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය අවම සුදුසුකම් කවරේද;

(iv) ජනසභා ලේකම් තනතුරු සඳහා බඳවා ගන්නා සංඛ්‍යාව කොපමණද;

(v) මේ වන විට දැන්වීම් ප්‍රසිද්ධකර, සම්මුඛ පරීක්ෂණ කැඳවා තිබේද;

(vi) එසේ නම්, සම්මුඛ පරීක්ෂණ සඳහා සහභාගී වූ සංඛ්‍යාව කොපමණද;

(vii) එයින් බඳවා ගනු ලබන සංඛ්‍යාව කොපමණද;

(viii) එම බඳවා ගැනීම් ආරම්භ කරන හා අවසන් කරන දිනයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මෙම නව තනතුරු සඳහා අදාළ අමාත්‍යාංශයේ අයවැය ඇස්තමේන්තු මගින් වෙන් කර ඇති මුදල කවරේද;

(ii) මුදල් වෙන්කොට නොමැති නම්, ඊට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0466/'10

9.

ගරු අජිත් පී. පෙරේරා මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) රජයේ ප්‍රතිශක්තිකරණ වැඩපිළිවෙල අඩාල වී ඇති බවත්, ඒ පිළිබඳව විපක්ෂය වගකිවයුතු බවත් හිටපු සෞඛ්‍ය අමාත්‍යවරයා 2010.06.10 දින පාර්ලිමේන්තුවේදී ප්‍රකාශ කළ බව එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) රජයේ ප්‍රතිශක්තිකරණ වැඩ පිළිවෙල අඩාල වී තිබේද;

(ii) එසේ නම්, එයට හේතු කවරේද;

(iii) ප්‍රතිශක්තිකරණ වැඩපිළිවෙල අඩාල වී ඇත්නම්, එය නැවත සාර්ථක ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා ගන්නා පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0481/'10

10.

ගරු රවී කරුණානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන වාණිජ බැංකු සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් බැංකුව සතු ශාඛාවන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) විදේශ විනිමය ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් කටයුතු කිරීමට මහ බැංකුවට ඇති බලය මෙම බැංකුවලට පවරා තිබේද;

(ii) විදේශ විනිමය හුවමාරු කිරීමේ නිරත බැංකු නොවන සමාගම් සංඛ්‍යාව කොපමණද;

(iii) එම සමාගම්වල නම් සහ ඒවායෙහි පාර්ශ්වකරුවන්ගේ හෝ අධ්‍යක්ෂවරුන්ගේ නම් කවරේද;

(iv) විදේශ විනිමය හුවමාරුව සඳහා එම සමාගම් තෝරා ගැනීමට භාවිතා කළ නිර්ණායකයන් කවරේද;

(v) පසුගිය වර්ෂ දෙක තුළ එක් එක් වර්ෂයේ දී ඔවුන් හුවමාරු කළ ප්‍රමාණය කොපමණද;

(vi) විදේශ විනිමය හුවමාරු කිරීමෙහි නිරතවීමට මෙවන් බැංකු නොවන ආයතනවලට ඉඩ ලබා දීම තුළින් රටට ලැබෙන වාසි කවරේද;

(vii) එවැනි ආයතන සංඛ්‍යාව වැඩි කරනු ලබන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0499/'10

11.

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) හම්බන්තොට දිස්ත්‍රික්කයේ තිබෙන රජයේ රෝහල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම රෝහල් වර්ගීකරණය කර ඇති ආකාරය කවරේද;

(iii) එක් එක් රෝහලට ලබා දී ඇති ගිලන් රථ සංඛ්‍යාව කොපමණද;

(iv) ඒවායේ වර්තමාන තත්ත්වය කුමක්ද;

(v) ඒවා සෑහීමකට පත්විය හැකි මට්ටමක පවතින්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0551/'10

12.

ගරු දයාසිරි ජයසේකර මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ඉදිකිරීමට යෝජිතව තිබූ යාංඔය පාලමෙහි ඉදිකිරීම් අවසන්ව ඇත්තේද;

(ii) නොඑසේ නම්, එහි වර්තමාන තත්ත්වය කවරේද;

(iii) එම පාලම ඉදිකිරීම සඳහා ඇස්තමේන්තුගත මුදල කොපමණද;

(iv) මේ වන විට වැය කර ඇති මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) එම පාලම ඉදිකිරීමට මුදල් ආයෝජනය කරන ලද ආයතනයේ නම කවරේද;

(ii) ඒ සඳහා විදේශ ආධාර ලැබුනේ නම්, ආධාර ප්‍රදානය කළ රට සහ අදාළ මුදල කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මෙම පාලමේ ඉදිකිරීම් කටයුතු කරනු ලබන ආයතනයේ නම කවරේද;

(ii) එම ආයතනයට ඉදිකිරීම් කටයුතු පවරනු ලැබූ පදනම කවරේද;

(iii) ඉදිකිරීම් කටයුතු පැවරීම සඳහා ටෙන්ඩර් කැඳවන ලද්දේද;

(iv) එසේ නම්, ටෙන්ඩර් ඉදිරිපත් කරන ලද ආයතන හා ඉදිරිපත් කළ මිල ගණන් වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන් ද?

0500/'10

13.

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— වාරිමාර්ග හා ජලසම්පත් කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) හම්බන්තොට දිස්ත්‍රික්කයේ ඇති එක් එක් ගොවිජන සේවා බල ප්‍රදේශය තුළ තිබෙන මහා වාරි සහ සුළු වාරි වැව් සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවා පිහිටා ඇති ස්ථාන සහ එම වැව්වල නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2008 සහ 2009 වසර දෙක තුළ ඉහත වැව්වලින් පිළිසකර කරන ලද වැව් සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවායේ නම් සහ පිහිටි ස්ථාන කවරේද;

(iii) ප්‍රතිසංස්කරණයට ලක් නොවූ වැව්වල නම් සහ ඒවා පිහිටා ඇති ස්ථාන කවරේද;

(iv) එම වැව් පිළිසකර කිරීමට ගතවන කාලය නිශ්චිත වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0552/'10

14.

ගරු දයාසිරි ජයසේකර මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) මඩකලපුව දිස්ත්‍රික්කයේ ඉදිකිරීමට යෝජිතව තිබූ කල්ලඩි පාලමෙහි ඉදිකිරීම් අවසන්ව ඇත්තේද;

(ii) නොඑසේ නම්, එහි වර්තමාන තත්ත්වය කවරේද;

(iii) එම පාලම ඉදිකිරීම සඳහා ඇස්තමේන්තුගත මුදල කොපමණද;

(iv) මේ වන විට වැය කර ඇති මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) එම පාලම ඉදිකිරීමට මුදල් ආයෝජනය කරන ලද ආයතනයේ නම කවරේද;

(ii) ඒ සඳහා විදේශ ආධාර ලැබුනේ නම්, ආධාර ප්‍රදානය කළ රට සහ අදාළ මුදල කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මෙම පාලමේ ඉදිකිරීම් කටයුතු කරනු ලබන ආයතනයේ නම කවරේද;

(ii) එම ආයතනයට ඉදිකිරීම් කටයුතු පවරනු ලැබූ පදනම කවරේද;

(iii) ඉදිකිරීම් කටයුතු පැවරීම සඳහා ටෙන්ඩර් කැඳවන ලද්දේද;

(iv) එසේ නම්, ටෙන්ඩර් ඉදිරිපත් කරන ලද ආයතන හා ඉදිරිපත් කළ මිල ගණන් වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන් ද?

0578/'10

15.

ගරු රවී කරුණානායක මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) වාර්ෂිකව ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාලවලින් උපාධි ලබා පිටවන වෛද්‍යවරු සංඛ්‍යාව කවරේද;

(ii) වෛද්‍යවරු වශයෙන් ලියාපදිංචි වීමට සුදුසුකම් ලබන විදේශ වෛද්‍ය උපාධිධාරීන් සංඛ්‍යාව කවරේද;

(iii) ඉහත කී උපාධිධාරීන් වෛද්‍යවරු වශයෙන් ලියාපදිංචි කිරීම සඳහා පවත්වනු ලබන විභාග, ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විසින් පවත්වනු ලබන්නේද සහ 2010.01.01 දින සිට එය වෙනත් අධිකාරියකට පවරා තිබේද;

(iv) එසේ පවරා තිබේ නම්, එම නව අධිකාරියේ නම කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) වසරක කාලයක් සඳහා මෙරටට අවශ්‍ය වන වෛද්‍යවරු සංඛ්‍යාව කවරේද;

(ii) වෛද්‍යවරයකුට ගෙවනු ලබන සාමාන්‍ය වැටුප කවරේද;

(iii) ඔවුන්ට ලබාදී ඇති අනෙකුත් ප්‍රතිලාභ කවරේද;

(iv) ශ්‍රී ලංකාවේදී සුදුසුකම් ලැබූ වෛද්‍යවරුන් හට නිවාඩු ලබා විදේශගත වීමට අවසර තිබේද;

(v) එසේ නම්, ඔවුන්ට එලෙස නිවාඩු ලබාගෙන විදේශ ගතවීම සඳහා අවසර ලබාදෙන කාලසීමාව කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2010 නොවැම්බර් මස 27 වැනි සෙනසුරාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0038/'10

1\.

ගරු රවි කරුණානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් ඉඩම්වල අයිතිය, ගිවිසුම්වලට එළැඹීමෙන් තොරව නීත්‍යානුකූල නොවන ආකාරයෙන් විවිධ පුද්ගලයින් වෙත පවරා දී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත ඉඩම් පවරා දී ඇති පදනම, පැවරුම්ලාභීන්ගේ නම් හා ලබා දී ඇති ඉඩම්වල ප්‍රමාණයන් කොපමණද;

(ii) නීත්‍යානුකූල ක්‍රමවේදයක් අනුගමනය කිරීමෙන් තොරව එම ඉඩම් පවරා දුන් නිලධාරීන්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගැනීමට ක්‍රියා කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0464/'10

2\.

ගරු නූර්දීන් මෂූර් මහතා,— නැවත පදිංචි කිරීමේ අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) වර්ෂ 2004 සිට 2010 දක්වා වූ කාලය තුළ නැවත පදිංචි කිරීමේ අමාත්‍යාංශයේ ප්‍රතිපාදනවලින් සෘජු වශයෙන් හෝ එම අමාත්‍යාංශ යෝජනා සැලස්මක් අනුව වෙනත් අමාත්‍යාංශ ප්‍රතිපාදනවලින් හෝ ක්‍රියාත්මක කළ වැඩ සටහනක් යටතේ, පුත්තලම, මන්නාරම සහ වවුනියාව යන දිස්ත්‍රික්කවල අවතැන්වූ පවුල්වල කාන්තාවන්ට ස්වයං රැකියාවල නියැළීම පිණිස ලබා දෙන ලද මහන මැසින් සංඛ්‍යාව කොපමණද;

(ii) එම මහන මැසින්ලාභීන්ගේ නම්, ලිපිනයන්, ඒවා නිකුත් කළ දිනයන් සහ එම වවුචර්පත් අංක කවරේද;

(iii) එම එක් එක් මහන මැසිමේ වටිනාකම සහ එක් එක් මහන මැසිම මිලදී ගැනීම සඳහා වියදම් කළ මුදල කොපමණද:

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) එම ව්‍යාපෘතිය සඳහා වෙන්කළ මුළු මුදල කොපමණද;

(ii) එයින් වියදම් කළ මුදල කොපමණද;

(iii) වියදම් සිදු කළ වැය ශීර්ෂය කවරේද;

යන්න එක් එක් වර්ෂයට අදාළව, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0467/'10

3.

ගරු අජිත් පී. පෙරේරා මහතා,— වරාය හා ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සේවය කළ පතිරගේ නිහාල් පෙරේරා සහ එස්. බී. විමලවීර විසින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවට ඉදිරිපත් කළ අංක එච්.ආර්.සී./5432/03 සහ එච්.ආර්.සී/5798/03 දරන පැමිණිලි සම්බන්ධයෙන් "සහකාර ආරක්ෂක නිලධාරී තනතුරට අනික් පිරිස පත් කළ දින සිට පත්කර, වැටුප් පියවර යථාවත් කළ යුතු බවට" එම කොමිසම 2005.12.12 දින නිර්දේශ කර ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 13/2005 අනුව මානව හිමිකම් කොමිෂන් සභාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීමට ශ්‍රී ලංකා වරාය අධිකාරිය බැඳී ඇති බව එතුමා පිළිගන්නේද;

(ii) ඉහත නිර්දේශ ක්‍රියාත්මක නොකිරීම පිළිබඳව පාර්ලිමේන්තුවේ මහජන පෙත්සම් කාරක සභාවට ඉදිරිපත් කළ පෙත්සම සම්බන්ධයෙන් 2009.10.22 දින එළැඹි එකඟතාවය පරිදි ඔවුන් දෙදෙනාගේ පත්වීම් තවමත් ලබාදී නැත්තේ මන්ද;

(iii) මහජන පෙත්සම් කාරක සභාව වරාය අධිකාරියේ සභාපති වෙත යැවූ 2009.11.24 සහ 2010.02.09 දිනැති ලිපිවල සඳහන් නියමයන් ක්‍රියාත්මක නොකිරීමට හේතු කවරේද;

(iv) එම කාරක සභාවේදී ඇතිවූ එකඟතාවය අනුව අදාළ පත්වීම් සිදුකිරීමට කටයුතු කරන්නේද;

(v) එසේ නම්, ඒ කවදාද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0501/'10

4.

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) හම්බන්තොට දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක වන පාසල් පෝෂණ වැඩසටහන් කවරේද;

(ii) ඒ වෙනුවෙන් රජය වැය කරන මුදල කොපමණද;

(iii) එම දිස්ත්‍රික්කයේ අධ්‍යාපනය වෙනුවෙන් වෙන් කර ඇති මුදලින් පාසල් පෝෂණ ව්‍යාපෘති සඳහා වෙන්කළ ප්‍රතිශතය කොපමණද;

(iv) පාසල් පෝෂණ ව්‍යාපෘති වෙනුවෙන් වෙන් කළ මුදල ප්‍රමාණවත්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0545/'10

5\.

ගරු ශාන්ත බණ්ඩාර මහතා,— ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) 1948 වර්ෂයේ සිට මේ දක්වා කාලය තුළ ශ්‍රී ලංකා ක්‍රීඩක ක්‍රීඩිකාවන් ඔලිම්පික් තරඟ සඳහා ඉදිරිපත් වූ බව එතුමා දන්නෙහිද?

(ආ) ඔලිම්පික් තරඟ සඳහා ඉදිරිපත් වූ එම ක්‍රීඩක නාම ලේඛනය සහ එම ක්‍රීඩකයින් විසින් ලබාගත් ජයග්‍රහණත්, ඊට අදාළ වර්ෂයනුත් එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) ඉදිරි ඔලිම්පික් ක්‍රීඩා උළෙල පවත්වනු ලබන ස්ථානය සහ වර්ෂය කවරේද;

(ii) ඒ සඳහා අප රට වෙනුවෙන් ක්‍රීඩකයින් සහභාගි වන්නේද;

(iii) ඒ සම්බන්ධයෙන් දියත් කර ඇති වැඩපිළිවෙල කුමක්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0553/'10

6\.

ගරු දයාසිරි ජයසේකර මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) මඩකලපුව දිස්ත්‍රික්කයේ ඉදිකිරීමට යෝජිතව තිබූ කොඩ්ඩායිකල්ලාර් පාලමෙහි ඉදිකිරීම් අවසන්ව ඇත්තේද;

(ii) නොඑසේ නම්, එහි වර්තමාන තත්ත්වය කවරේද;

(iii) එම පාලම ඉදිකිරීම සඳහා ඇස්තමේන්තුගත මුදල කොපමණද;

(iv) මේ වන විට වැය කර ඇති මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) එම පාලම ඉදිකිරීමට මුදල් ආයෝජනය කරන ලද ආයතනයේ නම කවරේද;

(ii) ඒ සඳහා විදේශ ආධාර ලැබුනේ නම්, ආධාර ප්‍රදානය කළ රට සහ අදාළ මුදල කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මෙම පාලමේ ඉදිකිරීම් කටයුතු කරනු ලබන ආයතනයේ නම කවරේද;

(ii) එම ආයතනයට ඉදිකිරීම් කටයුතු පවරනු ලැබූ පදනම කවරේද;

(iii) ඉදිකිරීම් කටයුතු පැවරීම සඳහා ටෙන්ඩර් කැඳවන ලද්දේද;

(iv) එසේ නම්, ටෙන්ඩර් ඉදිරිපත් කරන ලද ආයතන හා ඉදිරිපත් කළ මිල ගණන් වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0563/'10

7\.

ගරු ආර්. යෝගරාජන් මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) 2009 වර්ෂයේදී රජයට පවරාගැනීමට නියමිතව තිබූ වතු රෝහල් සංඛ්‍යාව කොපමණද;

(ii) මේ දක්වා රජයට පවරාගෙන ඇති වතු රෝහල් සංඛ්‍යාව කොපමණද;

(iii) එලෙස පවරා ගන්නා ලද එක් එක් රෝහලේ සිදු කරන ලද යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම් කවරේද;

(iv) ඉහත කී රෝහල් සඳහා බඳවා ගන්නා ලද කාර්ය මණ්ඩලය කවරේද;

(v) එකී රෝහල්වල වත්මන් කාර්ය මණ්ඩලය නව සේවක සංඛ්‍යාවට අන්තර්ග්‍රහණය කරගැනීම සඳහා පියවර ගන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද ?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0626/'10

8\.

ගරු බුද්ධික පතිරණ මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) 2009 නොවැම්බර් මස 13 වන දින ශ්‍රී ලංකා මහ බැංකුවට බැංකු සහායකයින් බඳවා ගැනීම සඳහා පැවත්වූ තරග විභාගයට ඉදිරිපත් වූ මුළු විභාග අපේක්ෂකයින් සංඛ්‍යාව කොපමණද;

(ii) එම විභාගයෙන් සමත්වූ සංඛ්‍යාව කොපමණද;

(iii) එහි ප්‍රතිඵල මත මේ වන විට මහ බැංකුවට බැංකු සහායකයන් බඳවා ගෙන තිබේද;

(iv) එසේ නම්, එම සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ඉහත විභාගයේ ප්‍රතිඵල මෙතෙක් විභාග අපේක්ෂයන්ට පෞද්ගලිකව නිකුත් කර නොමැති බව එතුමා දන්නෙහිද?

(ඇ) එසේ නම්, ඊට හේතු කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0044/'10

9\.

ගරු රවි කරුණානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) ආනයනය කරන ලද හා දේශීයව නිෂ්පාදනය කරන ලද සහල්, සීනි, තිරිඟු පිටි, පරිප්පු, කිරිපිටි, ලූනු හා මිරිස් ආදී භාණ්ඩ මුළු ප්‍රමාණය කොපමණද;

(ii) ඉහත භාණ්ඩ මත පනවා ඇති තීරුබදු, වැට් බදු හා නිෂ්පාදන බදු ප්‍රමාණයන් කවරේද;

(iii) ඉහත (ii) ට අනුව තීරුබදු හා බදු මගින් උපයාගත් මුළු ආදායම කොපමණද;

යන්න පසුගිය වර්ෂ 5ට අදාළව, වෙන් වෙන් වශයෙන්, එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0502/'10

10\.

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) හම්බන්තොට දිස්ත්‍රික්කයේ තිබෙන කරදිය ධීවර තොටුපලවල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම තොටුපලවල් ආශ්‍රිතව පිහිටුවා ඇති ධීවර සමිති සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත ධීවර තොටුපලවල් ආශ්‍රිත ධීවර ප්‍රජාව වෙනුවෙන් රාජ්‍ය මැදිහත්වීම තුළින් ක්‍රියාත්මක වන සහන වැඩ සටහන් කවරේද;

(ii) ඒ සඳහා වෙන් කර ඇති මුදල කොපමණද;

(iii) එම මුදල අදාළ කටයුතු සඳහා ප්‍රමාණවත්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0554/'10

11.

ගරු දයාසිරි ජයසේකර මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) මඩකලපුව දිස්ත්‍රික්කයේ ඉදිකිරීමට යෝජිතව තිබූ පෙරියකල්ලාර් පාලමෙහි ඉදිකිරීම් අවසන්ව ඇත්තේද;

(ii) නොඑසේ නම්, එහි වර්තමාන තත්ත්වය කවරේද;

(iii) එම පාලම ඉදිකිරීම සඳහා ඇස්තමේන්තුගත මුදල කොපමණද;

(iv) මේ වන විට වැය කර ඇති මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) එම පාලම ඉදිකිරීමට මුදල් ආයෝජනය කරන ලද ආයතනයේ නම කවරේද;

(ii) ඒ සඳහා විදේශ ආධාර ලැබුනේ නම්, ආධාර ප්‍රදානය කළ රට සහ අදාළ මුදල කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මෙම පාලමේ ඉදිකිරීම් කටයුතු කරනු ලබන ආයතනයේ නම කවරේද;

(ii) එම ආයතනයට ඉදිකිරීම් කටයුතු පවරනු ලැබූ පදනම කවරේද;

(iii) ඉදිකිරීම් කටයුතු පැවරීම සඳහා ටෙන්ඩර් කැඳවන ලද්දේද;

(iv) එසේ නම්, ටෙන්ඩර් ඉදිරිපත් කරන ලද ආයතන හා ඉදිරිපත් කළ මිල ගණන් වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන් ද?

0564/'10

12.

ගරු ආර්. යෝගරාජන් මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) පුස්සැල්ලාව ප්‍රොටොෆ් (Protoft) වතුයායේ පිහිටා ඇති වතු රෝහල 2009 වර්ෂයේදී රජයට පවරා ගත් බවත්;

(ii) වර්ෂයකට ඉහත එහි නව ගොඩනැගිල්ලක් ඉදිකොට වැඩ නිම කළ බවත්;

(iii) එම ගොඩනැගිල්ල වසා දමා තිබෙන බවත් සහ එය මහජනයාගේ ප්‍රයෝජනය සඳහා විවෘත කර නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම ගොඩනැගිල්ල විවෘත කොට එය මහජනයාගේ ප්‍රයෝජනය සඳහා යෙදවීමට පියවර ගන්නේද;

(ii) එසේ නම්, එය විවෘත කරනු ලබන්නේ කවදාද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0095/'10

13.

ගරු රවී කරුණානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) 2010.05.01 දින සිට 2010.07.01 දින දක්වා කැබිනට් අමාත්‍යවරුන් සහ නියෝජ්‍ය අමාත්‍යවරුන් හට ගෙවූ මුදල් ප්‍රමාණය කොපමණද;

(ii) අමාත්‍යවරුන් සහ ඔවුන්ගේ කාර්ය මණ්ඩලය භුක්ති විඳින අනෙකුත් ප්‍රතිලාභ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0503/'10

14.

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) හම්බන්තොට දිස්ත්‍රික්කයේ තිබෙන මිරිදිය ධීවර තොටුපලවල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම තොටුපලවල් ආශ්‍රිතව පිහිටුවා ඇති ධීවර සමිති සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත ධීවර තොටුපලවල් ආශ්‍රිත ධීවර ප්‍රජාව වෙනුවෙන් රාජ්‍ය මැදිහත්වීම තුළින් ක්‍රියාත්මක වන සහන වැඩ සටහන් කවරේද;

(ii) ඒ සඳහා වෙන් කර ඇති මුදල කොපමණද;

(iii) එම මුදල අදාළ කටයුතු සඳහා ප්‍රමාණවත්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0617/'10

15.

ගරු දයාසිරි ජයසේකර මහතා,— අධිකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) පිස්කල් භාරකාරමාතා තනතුර සඳහා මේ වන විට පවතින පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද;

(ii) එම පුරප්පාඩු සඳහා බඳවාගැනීම් සිදු කරන්නේද;

(iii) නොඑසේ නම්, මේ වන විට එම බඳවා ගැනීම් අවසන් කර තිබේද;

(iv) එම තනතුර සඳහා අවශ්‍ය අවම සුදුසුකම් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

## 2010 නොවැම්බර් මස 29 වැනි සඳුදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0376/'10

1\.

ගරු රවී කරුණානායක මහතා,— සමූපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) ආනයනික භාණ්ඩ වන කිරි පිටි, ගෑස්, සීනි, පරිප්පු, ළූණු, අර්තාපල්, සහල්, ටින් මාළු සහ ඛනිජ තෙල් මත පැනවෙන තීරු බදු සහ අනෙකුත් සියලු ආකාරයේ බදු ප්‍රමාණ කොපමණද;

(ii) පසුගිය වර්ෂ 10 තුළ ඉහත සඳහන් භාණ්ඩ ආනයනය කරන ලද ප්‍රමාණයන් කොපමණද;

(iii) පසුගිය වර්ෂ 5 තුළ බදු පැනවීමෙන් උපයාගත් ආදායම කොපමණද;

(iv) එකී භාණ්ඩ අතරින් දේශීය වශයෙන් නිෂ්පාදනය කෙරෙන යම් භාණ්ඩ වේ නම්, පසුගිය වර්ෂ 5 තුළ එම භාණ්ඩවල නිෂ්පාදන ප්‍රමාණයන් වාර්ෂික පදනමින් කොපමණද;

(v) පසුගිය වර්ෂ 5 තුළ එම භාණ්ඩවල වාර්ෂික පරිභෝජනය කොපමණද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0506/'10

2\.

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) 2006, 2007, 2008, සහ 2009 යන වර්ෂයන්හිදී හම්බන්තොට දිස්ත්‍රික්කය තුළ රජය විසින් ඉදිකළ නිවාස සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම නිවාස ඉදිකිරීම වෙනුවෙන් වැය කළ මුදල කොපමණද;

(iii) හම්බන්තොට දිස්ත්‍රික්කය තුළ ඉදිකර ඇති නිවාස සංඛ්‍යාව ප්‍රමාණවත්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0619/'10

3\.

ගරු දයාසිරි ජයසේකර මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) දික්වැල්ල ප්‍රාදේශීය සභාව, එම බල ප්‍රදේශයට අයත් බතීගම ගම මැද ආදාහනාගාරයක් ඉදි කිරීමට කටයුතු කරන බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම ඉදි කිරීම නවතා වෙනත් ජන ශූන්‍ය ස්ථානයක එය ඉදි කරන ලෙස පළාත් සභා හා පළාත් පාලන කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව මෙයට පෙර දැනුම් දීමක් කර තිබේද;

(ii) එසේ නම්, එම දැනුම්දීම් අනුව අදාළ ප්‍රාදේශීය සභා සභාපතිවරයා කටයුතු කර තිබේද;

(iii) නොඑසේ නම්, මෙම උත්තරීතර සභාවේ තීරණවලට එරෙහිව යමින් ප්‍රාදේශීය සභා සභාපතිවරයා විසින් මෙම ගරු සභාව හැල්ලුවට ලක් කරමින් තම අභිමතය මත කටයුතු කරන්නේද;

(iv) එසේ නම්, ඊට අදාලව ඔහුට එරෙහිව ගන්නා ක්‍රියා මාර්ගය කුමක්ද;

(v) එම ඉදිකිරීම ඉවත් කිරීමට කටයුතු කරන්නේද ;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0659/'10

4.

ගරු රවුෆ් හකීම් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) අධ්‍යාපන අමාත්‍යාංශය මගින් අඩු පහසුකම් සහිත පාසල් ලෙස හඳුනාගෙන තිබෙන පළාත් සභා සහ මධ්‍යම රජය යටතේ පවතින පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පාසල් අතුරින් මුස්ලිම් පාසල් හා වතු පාසල් කවරේද;

(iii) එම පාසල්වල දියුණුව උදෙසා ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරන වැඩ සටහන් දිස්ත්‍රික් මට්ටමින්, වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0661/'10

5.

ගරු වාසුදේව නානායක්කාර මහතා,— වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) හිටපු පුරාවිද්‍යා කොමසාරිස් ශිරාන් දැරණියගල මහතා විසින් 1996 දී ප්‍රකාශ කර ඇති පරිදි ශ්‍රී ලංකාවේ පැවති ලක්ෂයක් පමණ වන කුඩා වැව් සංඛ්‍යාවෙන් මේ වන විට භාවිත කරනු ලබන වැව් සංඛ්‍යාව කොපමණද;

(ii) වර්ෂ 1996 සිට ශ්‍රී ලංකාවේ කුඩා වැව් පද්ධතිය පිළිසකර කරලීම සඳහා පියවර ගෙන තිබේද;

(iii) නොඑසේ නම්, ඊට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකාවේ කුඩා වැව් පද්ධතිය පිළිසකර කොට යථා තත්වයට පැමිණවීම රජයේ සංවර්ධන ක්‍රියාවලියේ මූලික පියවරක් බවත්;

(ii) මහින්ද චින්තනයේ අපේක්ෂාවක් ලෙස එහි සඳහන් වී ඇති වැව් දස දහසේ ව්‍යාපෘතිය සම්පූර්ණ කිරීම සඳහා පියවර ගැනීමට වාරිමාර්ග අමාත්‍යාංශය මේ දක්වා අපොහොසත් වී ඇති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඇ) එසේ නම්, ඊට හේතු කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) වැව් දස දහසේ ව්‍යාපෘතිය වශයෙන් මහින්ද චින්තනයේ ද සඳහන් ශ්‍රී ලංකාවේ කුඩා වැව් පද්ධතිය පුනරුත්ථාපනය කිරීම සඳහා අධිකාරියක් පිහිටුවීමට නොපමාව පියවර ගන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0380/'10

6.

ගරු රවී කරුණානායක මහතා,— අධිකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) ශ්‍රේෂ්ඨාධිකරණයෙහි, අභියාචනාධිකරණයෙහි, මහාධිකරණයෙහි සහ මහේස්ත්‍රාත් අධිකරණවල සේවය කරන සියලු විනිශ්චයකාරවරුන්ගේ නම් සහ උපන් දිනයන් කවරේද;

(ii) ඔවුන්ගේ සුදුසුකම් සහ දැනට දරන තනතුරෙහි පළපුරුද්ද කවරේද;

(iii) නිල නිවාස සපයා ඇති සියලු කාණ්ඩවල විනිශ්චයකාරවරුන්ගේ සංඛ්‍යාව කොපමණද;

(iv) සියලු විනිශ්චයකාරවරුන්ට නිල නිවාස නොසැපයීමට හේතු කවරේද;

(v) නිල නිවාස නොලැබෙන්නේ නම්, ඔවුන්ට නිවාස දීමනාවක් ගෙවනු ලබන්නේද;

(vi) එසේ නම්, ගෙවනු ලබන මුදල සහ එය කොපමණ කාලයක් ගෙවා තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0507/'10

7\.

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— කම්කරු සබඳතා හා ඵලදායිතා ප්‍රවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) ශ්‍රී ලංකාවේ වත්මන් විරැකියා ප්‍රතිශතය කොපමණද;

(ii) විරැකියාවෙන් පෙළෙන ප්‍රතිශතය අවම කිරීමට රජය ගන්නා වූ ක්‍රියා මාර්ග කවරේද;

(iii) එම ක්‍රියාවලිය වෙනුවෙන් රජය වැය කළ මුදල කොපමණද;

(iv) රජය විසින් ක්‍රියාත්මක කළ ඉහත ක්‍රියා මාර්ගයන් විරැකියාව අඩුකිරීම සඳහා ප්‍රමාණවත්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0714/'10

8\.

ගරු දයාසිරි ජයසේකර මහතා,— වරාය හා ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) වරාය අධිකාරියේ වත්මන් සභාපතිවරයාගේ සම්පූර්ණ නම සහ වයස කවරේද;

(ii) එම තනතුරට ඔහු පත් කළ බලධාරියා කවරෙක්ද;

(iii) එම සභාපතිවරයා මෙයට පෙර සේවය කළ ස්ථානය සහ තනතුර කවරේද;

(iv) ඔහුගේ අධ්‍යාපන සුදුසුකම් සහ වෘත්තීය පළපුරුද්ද කවරේද;

(v) ඔහුගේ මාසික වැටුප සහ ලැබෙන වෙනත් දීමනා කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2010 නොවැම්බර් මස 30 වැනි අඟහරුවාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0381/'10

1\.

ගරු රවී කරුණානායක මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) පසුගිය වර්ෂ 15 තුළ එක් එක් වර්ෂයේදී පළමුවැනි ශ්‍රේණියට ඇතුළු වූ සිසුන් සංඛ්‍යාව;

(ii) සාමාන්‍ය පෙළ හා උසස් පෙළ සඳහා වසරකට පෙනී සිටින සිසුන් සංඛ්‍යාව;

(iii) විශ්වවිද්‍යාල අධ්‍යාපනය සඳහා වසරකට සුදුසුකම් ලබන සිසුන් සංඛ්‍යාව;

(iv) දේශීය විශ්වවිද්‍යාලවලට ඇතුළුවීමට සුදුසුකම් නොලැබීම හේතුවෙන් විශ්වවිද්‍යාල අධ්‍යාපනය සඳහා වසරකට විදේශගත වන සිසුන් සංඛ්‍යාව;

කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) විදේශිය විශ්වවිද්‍යාලවල අධ්‍යාපන ලැබීම වෙනුවෙන් ගෙවන ගාස්තු වශයෙන් රටෙන් බැහැර යැවෙන මුළු විදේශ විනිමය ප්‍රමාණය කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0508/'10

2.

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— සම්ප්‍රදායික කර්මාන්ත හා කුඩා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) ශ්‍රී ලංකාවේ ග්‍රාමීය කර්මාන්ත දියුණු කිරීම උදෙසා රජය අනුගමනය කරන ක්‍රියා මාර්ග කවරේද;

(ii) ඒ සඳහා මේ වන විට වැය කර ඇති මුදල කොපමණද;

(iii) ග්‍රාමීය කර්මාන්ත පද්ධතිය ශක්තිමත් කිරීම උදෙසා ක්‍රියාත්මක කර ඇති ව්‍යාපෘති ප්‍රමාණවත්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0662/'10

3.

ගරු වාසුදේව නානායක්කාර මහතා,— වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) වර්ෂ 1818 වන විට ශ්‍රී ලංකාවේ තිබූ කුඩා වැව් සංඛ්‍යාව කොපමණද:

(ii) වර්ෂ 1948 වන විට ශ්‍රී ලංකාවේ භාවිතා කළ කුඩා වැව් සංඛ්‍යාව කොපමණද;

(iii) වර්ෂ 1977 වන විට ශ්‍රී ලංකාවේ භාවිතා කළ කුඩා වැව් සංඛ්‍යාව කොපමණද;

(iv) වර්ෂ 2005 වන විට ශ්‍රී ලංකාවේ භාවිතා කළ හා භාවිතා කිරීමට හැකිව තිබූ කුඩා වැව් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) වර්ෂ 2005 සිට මේ දක්වා මහ නැගුම ව්‍යාපෘතිය සහ වෙනත් සංවර්ධන ක්‍රියාවලි නිසා අභාවයට පත්වූ කුඩා වැව් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0685/'10

4.

ගරු රවුෆ් හකීම් මහතා,— ජාතික උරුමයන් හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමියගෙන් ඇසීමට,—

(අ) ජාතික උරුමයන් හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය හා ටවර් හෝල් රඟහල පදනම ඒකාබද්ධව වර්ෂ 2010 දී සමස්ත ලංකා පාසල් නාට්‍ය තරඟ පැවැත්වීම සඳහා අයදුම්පත් කැඳවා ඇති බවත්, එයට දිවයිනේ ඕනෑම පාසලකට සහභාගිවීමට හැකි පරිදි අධ්‍යාපන අමාත්‍යාංශයේ පූර්ණ අනුග්‍රහය ලබාදී තිබෙන බවත් එතුමිය දන්නෙහිද?

(ආ) එම නාට්‍ය තරඟ සිංහල මාධ්‍යයෙන් පමණක් පැවැත්වීමට තීරණයක් කර ඒ අනුව අයදුම්පත් කැඳවා තිබීම නිසා, දෙමළ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලබන සිසු දරුවනට බලවත් අසාධාරණයක් සිදු වී ඇති බව එතුමිය පිළිගන්නෙහිද?

(ඇ) එසේ නම්, දෙමළ මාධ්‍යයෙන් ඉගෙනුම ලබන සිසුන්ට සහ දෙමළ මාධ්‍ය පාසල්වලටද එම අවස්ථාව ලැබෙන පරිදි එම නාට්‍ය තරඟ දෙමළ මාධ්‍යයෙන්ද පැවැත්වීමට එතුමිය නොපමාව පියවර ගන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0716/'10

5.

ගරු දයාසිරි ජයසේකර මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) 2010 වර්ෂයේ යල කන්නයේ දී ලබාගත් වී අස්වනු ප්‍රමාණය ශ්‍රී ලංකාවේ ප්‍රධාන වශයෙන් වී වගා කරන දිස්ත්‍රික්ක දහය හැර ඉතිරි දිස්ත්‍රික්ක සඳහා වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) මෙම යල කන්නයට පෙර යල කන්නයේ වී අස්වනු ප්‍රමාණය එම එක් එක් දිස්ත්‍රික්කය අනුව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) මෙම යල කන්නයේ රටේ සමස්ත වී අස්වැන්නෙන් රජය විසින් මිල දී ගෙන තිබෙන ප්‍රමාණය කොපමණද;

(ii) වී මිලදී ගත් මිල ගණන් කවරේද;

(iii) යල කන්නයේ වී මිලදී ගැනීම සඳහා වෙන් කළ මුදල් ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0382/'10

6.

ගරු රවී කරුණානායක මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) ඩෙංගු උණ හේතුවෙන් පසුගිය වර්ෂ 2 තුළ කොළඹ දිස්ත්‍රික්කයේ මියගිය සංඛ්‍යාව කොපමණද;

(ii) වාර්ෂික පදනමින් සහ දිස්ත්‍රික් පදනමින් පසුගිය වර්ෂ 5 තුල වාර්තා වී ඇති ඩෙංගු මරණ සංඛ්‍යාව කොපමණද;

(iii) මෙම ඩෙංගු ව්‍යසනය මර්ධනය කිරීම සඳහා රජය දරන පිරිවැය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) පසුගිය වර්ෂ 2 තුළ මෙරට පැතිර ගිය අනෙකුත් වසංගතවල නම් කවරේද;

(ii) එකී එක් එක් රෝගයෙන් මියගිය සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0509/'10

7.

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— පරිසර අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) හම්බන්තොට දිස්ත්‍රික්කය ප්‍රමුඛ ශ්‍රී ලංකාවේ ප්‍රචලිත ග්‍රාමීය කර්මාන්තයන් වන ස්වර්ණාභරණ කර්මාන්තය අප රටට වැදගත් වන බව එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) හම්බන්තොට දිස්ත්‍රික්කය ඇතුළුව ශ්‍රී ලංකාවේ සවර්ණාභරණ කර්මාන්තය සිදු කරන ගම්මාන සංඛ්‍යාව කොපමණද;

(ii) එම ගම්මානවල නම් කවරේද;

(iii) දේශීය ස්වර්ණාභරණ කර්මාන්තය වැඩි දියුණු කිරීමට රජය ගෙන ඇති ක්‍රියා මාර්ග කවරේද;

(iv) ඒ සඳහා වැය කර ඇති මුදල කොපමණද;

(v) වැයකළ එම මුදල සහ ක්‍රියාත්මක කළ ව්‍යාපෘති සංඛ්‍යාව ඉහත කර්මාන්තය වැඩිදියුණු කිරීම සඳහා ප්‍රමාණවත්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0717/'10

8.

ගරු දයාසිරි ජයසේකර මහතා,— වරාය හා ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) වර්ෂ 1994 සිට මේ දක්වා කටුනායක ගුවන්තොටුපලේ තිබෙන තීරුබදු රහිත වෙළෙඳසැල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් තීරුබදු රහිත වෙළෙඳසැල් ලබා දී ඇති හෝ බදු දී ඇති පුද්ගලයන්ගේ නම් සහ ලිපිනයන් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම සාප්පු සංකීර්ණ ලබා දී ඇති මුළු මුදල හෝ ස්ථිර වශයෙන් පවරා දීමට රජය ලබා ගත් මුදල් ප්‍රමාණය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) කටුනායක ගුවන්තොටුපල තුළ නව සාප්පු සංකීර්ණයක් ඉදි කිරීම සඳහා කටයුතු යොදා තිබේද;

(ii) එසේ නම්, එය ආරම්භ කරන දිනය කවරේද;

(iii) ඒ යටතේ ඉදිකිරීමට අපේක්ෂිත වෙළෙඳසැල් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2010 දෙසැම්බර් මස 01 වැනි බදාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0316/'10

1.

ගරු රවී කරුණානායක මහතා,— කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) ඉන්දු - ලංකා නිදහස් වෙළඳ ගිවිසුම අත්සන් කරන ලද දිනය කවරේද;

(ii) පසුගිය වර්ෂ දහය තුළදී ශ්‍රී ලංකාව සහ ඉන්දියාව සිදු කරන ලද ආනයන සහ අපනයන පිළිබඳ වෙළඳ සංඛ්‍යා දත්ත කවරේද ;

(iii) "සීපා" ගිවිසුමෙහි වර්තමාන තත්ත්වය කවරේද;

(iv) "සීපා" ගිවිසුම සම්බන්ධව රජයේ ස්ථාවරය කවරේද;

(v) "සීපා" ගිවිසුම අත්සන් කිරීමට නියමිතද;

(vi) "සීපා" ගිවිසුම සම්බන්ධයෙන් ඉන්දියාව සමඟ සාකච්ඡා පවත්වන පුද්ගලයන්ගේ නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0510/'10

2\.

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) හම්බන්තොට දිස්ත්‍රික්කය ප්‍රමුඛ ශ්‍රී ලංකාවේ පාසල් දරුවන්ගේ ඉංග්‍රීසි භාෂා දැනුම ප්‍රගුණ කිරීම උදෙසා රජය විසින් ගෙන ඇති පියවර කවරේද;

(ii) එම පියවරයන්හි ඉලක්කයන් කවරේද;

(iii) ඒ සඳහා වෙන් කළ මුදල කවරේද;

(iv) මේ වන විට එම ඉලක්කයන් සපුරා තිබෙන්නේද;

(v) ඉංග්‍රීසි භාෂා ප්‍රගුණත්වය වෙනුවෙන් ගෙන ඇති පියවර ප්‍රමාණවත්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0689/'10

3\.

ගරු ගයන්ත කරුණාතිලක මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) දුම්රිය මාර්ග හරහා වැටී ඇති ප්‍රධාන හා අතුරු මහා මාර්ගයන්හි පිහිටුවා ඇති දුම්රිය හරස් ගේට්ටු සංඛ්‍යාව කොපමණද;

(ii) දුම්රිය හරස් ගේට්ටු නොමැති අනාරක්ෂිත දුම්රිය හරස් මාර්ග ඇති ස්ථානයන්හි වර්ෂ 2000 සිට 2009 දක්වා කාල සීමාව තුළ සිදුවූ දුම්රිය අනතුරු සංඛ්‍යාව කොපමණද;

(iii) එම අනතුරුවලින් මියගිය හා ආබාධිතවූ සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) දුම්රිය මාර්ග හරහා වැටී ඇති අනාරක්ෂිත මාර්ග ස්ථානයන්හි ආරක්ෂිත ගේට්ටු සවි කිරීමට පියවර ගන්නෙහිද;

(ii) එසේ නම්, එය ආරම්භ කරන දිනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0694/'10

4\.

ගරු බුද්ධික පතිරණ මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයේ දකුණු පළාතට අයත් ඩිපෝවල සේවකයින් සඳහා හිඟ වැටුප් ගෙවීමට තිබෙන බව එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) හිඟ වැටුප් ගෙවිය යුතු සේවක සංඛ්‍යාව කොපමණද;

(ii) හිඟ වැටුප් ගෙවීම සඳහා අවශ්‍යවන මුදල් ප්‍රමාණය කොපමණද;

(iii) හිඟ වැටුප් ගෙවීම සඳහා කිසියම් වූ ක්‍රමවේදයක් සකස් කර තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) හිඟ වැටුප් සඳහා හිමිකම් ඇති දැනට විශ්‍රාම ගොස් සිටින සේවකයින්ට එම හිඟ මුදල් නොගෙවා, දැනට සේවයේ නියුතු සේවකයින්ට පමණක් හිඟ වැටුප් ගෙවීමට කටයුතු කරන බව එතුමා පිළිගන්නෙහිද?

(ඈ) විශ්‍රාමික හා දැනට සේවයේ නියුතු සේවකයින්ට හිමි හිඟ වැටුප් ගෙවනු ලබන දිනය කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0726/'10

5.

ගරු දයාසිරි ජයසේකර මහතා,— මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) පඩුවස්නුවර බටහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ගිරාතලාන උතුර මාර්ගය අයත් වන ආයතනය කවරේද;

(ii) එම මාර්ගයට තාර දැමීම සඳහා අදාළ ආයතනයෙන් අවසර ලබාගෙන තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද;

(ආ) (i) එම මාර්ගයට තාර දැමීම භාරදුන් ආයතනය හෝ පුද්ගලයින් කවුරුන්ද;

(ii) ඒ සඳහා වෙන් කළ ඇස්තමේන්තු ගත මුදල කොපමණද ;

(iii) එම ඇස්තමේන්තුව අනුව තාර දැමීම සිදුකළ යුතු දුර ප්‍රමාණය හා පාරේ පළල කොපමණද ;

(iv) මේ වන විට තාර දමා ඇති දුර ප්‍රමාණය කොපමණද;

(v) තාර දමීම අවසන් කළ දිනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) එම මාර්ගයට තාර දැමීම ප්‍රමිතියට අනුකූලව සිදු කර නොමැති බවත්, මේ වන විට බොහෝ ස්ථාන ගිලා බැස ඇති බවත්, නියමිත දුර ප්‍රමාණය තාර දමා නොමැති බවත් එතුමා දන්නෙහිද?

(ඈ) එසේ නම්, ප්‍රමිතීන්ට අනුකූල නොවන ඉදි කිරීම් කළ ආයතනය හෝ පුද්ගලයින් සම්බන්ධයෙන් ගන්නා ක්‍රියා මාර්ගය කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0383/'10

6.

ගරු රවී කරුණානායක මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) පසුගිය වර්ෂ 5 තුළ සර්පයන් විසින් දෂ්ට කරනු ලැබීම නිසා සිදුවූ මරණ සංඛ්‍යාව වාර්ෂික පදනමින් කොපමණද;

(ii) සර්පයන් දෂ්ට කළ අවස්ථාවලදී ප්‍රතිකාර ලෙස ලබාදෙන ප්‍රති විෂ එන්නත් ශ්‍රී ලංකාව තුළ ප්‍රමාණවත් තරමින් තිබේද;

(iii) නොඑසේ නම්, එම එන්නත් නොතිබීමට හේතුව කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) සර්පයන් විසින් දෂ්ට කරනු ලැබීමෙන් රෝගී තත්ත්වයට පත්වන පුද්ගලයින් සංඛ්‍යාව අඩු කරන්නේ කෙසේද;

(ii) සර්පයන් විසින් දෂ්ට කරනු ලබන අවස්ථා අඩුකර ගැනීමට අදාළ දැනුවත්කිරීමේ වැඩසටහන් මෙරට තුළ පවත්වනු ලබන්නේද;

(iii) එසේ නම්, එම වැඩසටහන් පවත්වනු ලබන ස්ථාන, අදාළ බලධාරීන් සහ එවැනි වැඩ සටහන් පැවැත්වීමේ ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0511/'10

7\.

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) හම්බන්තොට දිස්ත්‍රික්කය ප්‍රමුඛ ශ්‍රී ලංකාවේ තොරතුරු තාක්ෂණ සහ පරිගණක අධ්‍යාපනය ප්‍රගුණ කිරීම උදෙසා රජය ගෙන ඇති පියවර කවරේද;

(ii) ඒ සඳහා වෙන් කර ඇති මුදල කොපමණද;

(iii) රජයේ මැදිහත්වීමෙන් ගෙන ඇති ඉහත ක්‍රියා මාර්ග ප්‍රමාණවත්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0727/'10

8\.

ගරු දයාසිරි ජයසේකර මහතා,— මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) පඩුවස්නුවර බටහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පොල්තවාන, ගොරකදෙණිය මාර්ගය අයත් වන ආයතනය කවරේද;

(ii) එම මාර්ගයට තාර දැමීම සඳහා අදාළ ආයතනයෙන් අවසර ලබාගෙන තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද;

(ආ) (i) එම මාර්ගයට තාර දැමීම භාරදුන් ආයතනය හෝ පුද්ගලයින් කවුරුන්ද;

(ii) ඒ සඳහා වෙන් කළ ඇස්තමේන්තු ගත මුදල කොපමණද ;

(iii) එම ඇස්තමේන්තුව අනුව තාර දැමීම සිදුකළ යුතු දුර ප්‍රමාණය හා පාරේ පළල කොපමණද ;

(iv) මේ වන විට තාර දමා ඇති දුර ප්‍රමාණය කොපමණද;

(v) තාර දැමීම අවසන් කළ දිනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) එම මාර්ගයට තාර දැමීම ප්‍රමිතියට අනුකූලව සිදු කර නොමැති බව සහ නියමිත දුර ප්‍රමාණය නොමැති බව එතුමා දන්නෙහිද?

(ඈ) එසේ නම්, ප්‍රමිතීන්ට අනුකූල නොවන ඉදි කිරීම් කළ ආයතනය හෝ පුද්ගලයින් සම්බන්ධයෙන් ගන්නා ක්‍රියා මාර්ගය කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

## 2010 දෙසැම්බර් මස 02 වැනි බ්‍රහස්පතින්දා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0318/'10

1\.

ගරු රවී කරුණානායක මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) පසුගිය වර්ෂ 5 තුළ රජය, පළාත් සභා හෝ අනෙකුත් කවර හෝ පළාත් පාලන ආයතනයක් විසින් ඉන්දියාව සහ චීනය සමඟ අත්සන් කළ සියලුම කොන්ත්‍රාත් ගිවිසුම්වල නම් කවරේද;

(ii) එළඹෙන වර්ෂය තුළ ඉහත සඳහන් රටවල් සමඟ අත්සන් කිරීමට බලාපොරොත්තුවන ගිවිසුම් තිබේ නම්, ඒවායේ නම් කවරේද;

(iii) ඉහත (i) හි දක්වා ඇති කොන්ත්‍රාත්තුවල සමස්ත පිරිවැය කවරේද;

(iv) එම පිරිවැය දැරීම සඳහා ආදායම් උපයාගන්නේ කෙසේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) එවැනි ගිවිසුම්වලට එළඹෙන ලද්දේ ටෙන්ඩර් පටිපාටි අනුගමනය කිරීමෙන් හෝ සාකච්ඡා කිරීමෙන් අනතුරුවද;

(ii) ටෙන්ඩර් කැඳවූයේ නම්, ලැබුණ ටෙන්ඩර් ප්‍රමාණය සහ ඉදිරිපත් කළ මිල ගණන් කවරේද;

(iii) එය සාකච්ඡා පදනමක් මත සිදුවන්නේ නම්, දේශීය පාර්ශ්වකරුවන්ගේ නම් කවරේද;

(iv) නියෝජිතවරුන්ට කොමිස් වශයෙන් ගෙවන මුදල් ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0512/'10

2.

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) හම්බන්තොට දිස්ත්‍රික්කයේ, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් සමෘද්ධි සහනාධාරය ලබන පවුල් සංඛ්‍යාව කොපමණද;

(ii) එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමෙන් ලබා දෙන විවිධ සමෘද්ධි මුද්දර වර්ගයන්, ප්‍රමාණයන් සහ පුද්ගලයන් සංඛ්‍යාව කවරේද;

(iii) සමෘද්ධි සහනාධාර ලෙස ලබා දෙන මුද්දරවල අගයන් ප්‍රමාණවත්ද;

(iv) මෙම ප්‍රතිලාභය තුළින් දුගී දුප්පත්කම තුරන් කළ හැකිද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0695/'10

3.

ගරු බුද්ධික පතිරණ මහතා,— අධිකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) 1980 වර්ෂයේ සිට මේ දක්වා මාතර දිස්ත්‍රික්කය තුළ සාම විනිසුරු පත්වීම්ලාභීන්ගේ සංඛ්‍යාව කොපමණද;

(ii) එම පත්වීම්වලින් මාතර අධිකරණ බල ප්‍රදේශයට පමණක් පත්කළ සහ මුළු දිවයිනටම බලපාන පරිදි පත්කළ පත්වීම් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) මාතර දිස්ත්‍රික්කයේ එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨායේ, 1980 වර්ෂයේ සිට මේ දක්වා සාම විනිසුරු තනතුරු ලැබූ අයගේ නම් සහ ලිපිනයන් වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0728/'10

4.

ගරු දයාසිරි ජයසේකර මහතා,— මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) පඩුවස්නුවර බටහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මුණිහිරිගම, පටපිලිගම මාර්ගය අයත් වන ආයතනය කවරේද;

(ii) එම මාර්ගයේ කොන්ක්‍රීට් ඇතිරීම සඳහා අදාළ ආයතනයෙන් අවසර ලබාගෙන තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම මාර්ගයට කොන්ක්‍රීට් ඇතිරීම භාරදුන් ආයතනය හෝ පුද්ගලයින් කවුරුන්ද;

(ii) ඒ සඳහා වෙන් කළ ඇස්තමේන්තු ගත මුදල කොපමණද ;

(iii) එම ඇස්තමේන්තුව අනුව කොන්ක්‍රීට් ඇතිරීම සිදුකළ යුතු ඝණකම, පළල සහ දුර ප්‍රමාණය කොපමණද ;

(iv) මේ වන විට කොන්ක්‍රීට් අතුරා ඇති දුර ප්‍රමාණය කොපමණද;

(v) කොන්ක්‍රීට් අතුරා අවසන් කළ දිනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) එම මාර්ගයේ කොන්ක්‍රීට් ඇතිරීම ප්‍රමිතියට අනුකූලව සිදු කර නොමැති බවත්, සිමෙන්ති ගැලවී ඉවත්ව ගල් මතුව ඇති බවත් එතුමා දන්නෙහිද?

(ඈ) එසේ නම්, ප්‍රමිතීන්ට අනුකූල නොවන පරිදි එම ඉදි කිරීම් කළ ආයතනය හෝ පුද්ගලයින් සම්බන්ධයෙන් ගන්නා ක්‍රියාමාර්ගය කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0324/'10

5.

ගරු රවී කරුණානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) සිගරට් පරිභෝජනය තුරන් කර දැමීම 'මතට තිත' වැඩසටහනට ඇතුළත් කර තිබේද;

(ii) පසුගිය වර්ෂ 5 තුළ ශ්‍රී ලංකාවේ සිගරට් සහ බීඩි පරිභෝජනය වාර්ෂික පදනමින් කොපමණද;

(iii) පසුගිය වර්ෂ 6 තුළ දේශීය වශයෙන් නිපදවන ලද සිගරට් සහ බීඩි ප්‍රමාණය වාර්ෂික පදනමින් කොපමණද;

(iv) පසුගිය වර්ෂ 6 තුළ රටට ආනයනය කරන ලද සිගරට් ප්‍රමාණය කොපමණද;

(v) දේශීය වශයෙන් නිෂ්පාදිත හා ආනයනික සිගරට් මත බදු පැනවීමෙන් පසුගිය වර්ෂ 6 තුළ උපයා ගන්නා ලද ආදායම වාර්ෂික පදනමින් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0514/'10

6.

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— සම්ප්‍රදායික කර්මාන්ත හා කුඩා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) හම්බන්තොට දිස්ත්‍රික්කය ප්‍රමුඛ ශ්‍රී ලංකාවේ ප්‍රචලිත ග්‍රාමීය කර්මාන්තයන් වන මැටි කර්මාන්තය අප රටට වැදගත් වන බව එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) හම්බන්තොට දිස්ත්‍රික්කය ඇතුළු ශ්‍රී ලංකාවේ මැටි කර්මාන්තය සිදු කරන ගම්මාන සංඛ්‍යාව කොපමණද;

(ii) එම ගම්මානවල නම් කවරේද;

(iii) මැටි කර්මාන්තය වැඩි දියුණු කිරීමට රජය ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(iv) ඒ සඳහා වැය කර ඇති මුදල කොපමණද;

(v) වැයකළ එම මුදල සහ ක්‍රියාත්මක කළ ව්‍යාපෘති සංඛ්‍යාව ඉහත කර්මාන්තය වැඩිදියුණු කිරීම සඳහා ප්‍රමාණවත්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0696/'10

7.

ගරු බුද්ධික පතිරණ මහතා,— ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) මාතර දිස්ත්‍රික්කයේ පිටබැද්දර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ගම්මාන රාශියකට පානීය ජලය ලබා දීම සඳහා ආරම්භ කළ පිටබැද්දර ජල යෝජනා ක්‍රමය මගින් ජලය සැපයීමට අපේක්ෂිත පවුල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම ජල යෝජනා ක්‍රමය සඳහා ඇස්තමේන්තුගත මුළු මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) පිටබැද්දර ජල යෝජනා ක්‍රමය මේ වන විට අතරමග නවතා දමා ඇති බව එතුමා දන්නෙහිද?

(ඇ) (i) එසේ නම් , ඊට හේතු කවරේද;

(ii) නැවත එම ජල යෝජනා ක්‍රමය ආරම්භ කිරීම සඳහා කටයුතු කරන්නේද;

(iii) එසේ නම්, එම කටයුතු ආරම්භ කරන දිනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0729/'10

8.

ගරු දයාසිරි ජයසේකර මහතා,— මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) පඬුවස්නුවර බටහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, හෙට්ටිපොල, අඹගහමුලවත්ත පුබුදු මාවත අයත් වන ආයතනය කවරේද;

(ii) එම මාර්ගයේ කොන්ක්‍රීට් ඇතිරීම සඳහා අදාළ ආයතනයෙන් අවසර ලබාගෙන තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම මාර්ගයට කොන්ක්‍රීට් ඇතිරීම භාරදුන් ආයතනය හෝ පුද්ගලයින් කවුරුන්ද;

(ii) ඒ සඳහා වෙන් කළ ඇස්තමේන්තු ගත මුදල කොපමණද ;

(iii) එම ඇස්තමේන්තුව අනුව කොන්ක්‍රීට් ඇතිරීම සිදුකළ යුතු ඝණකම, පළල සහ දුර ප්‍රමාණය කොපමණද ;

(iv) මේ වන විට කොන්ක්‍රීට් අතුරා ඇති දුර ප්‍රමාණය කොපමණද;

(v) කොන්ක්‍රීට් අතුරා අවසන් කළ දිනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) එම මාර්ගයට කොන්ක්‍රීට් ඇතිරීම ප්‍රමිතියට අනුකූලව සිදු කර නොමැති බවත්, සිමෙන්ති ගැලවී ඉවත්ව ගල් මතුවී ඇති බවත්, නියමිත දුර ප්‍රමාණය නොමැති බවත් එතුමා දන්නෙහිද?

(ඈ) එසේ නම්, ප්‍රමිතීන්ට අනුකූල නොවන පරිද එම ඉදි කිරීම් කළ ආයතනය හෝ පුද්ගලයින් සම්බන්ධයෙන් ගන්නා ක්‍රියාමාර්ගය කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2010 දෙසැම්බර් මස 03 වැනි සිකුරාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0067/'10

1.

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) දැනට වර්ෂයකට පෙර කොන්ක්‍රීට් අතුරා සකසන ලද හම්බන්තොට දිස්ත්‍රික්කයේ, අඟුණුකොළපැලැස්ස ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, තලාව ග්‍රාම නිලධාරි වසමේ, තලාව හංදිය, දඹරැල්ල මාර්ගයේ කි.මී. 01 ක දුර ප්‍රමාණයෙහි මේ වන විට කොන්ක්‍රීට් ඉරිතලා, වලවල් සෑදී, අබලන්ව ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම මාර්ගය සංවර්ධනය කිරීම සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන කොපමණද;

(ii) ඉදිකිරීම් සඳහා මුදල් නිදහස් කිරීමේදී ප්‍රමිතීන්ට අනුව වැඩ නිම කළ බවට කාර්මික නිලධාරීන්ගේ නිර්දේශ ලබාගෙන තිබේද;

(iii) එම මාර්ගය සඳහා ගෙවීම් කටයුතු වලදී වෙනත් කුමන ආයතනවලින් නිර්දේශ ලබාගෙන තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) මේ පිළිබඳව විධිමත් පරීක්ෂණයක් පැවැත්වීමටත් එම මාර්ගය යථා තත්වයට පත් කිරීමටත් එතුමා කටයුතු කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0303/'10

2.

ගරු දයාසිරි ජයසේකර මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) 2008 සහ 2009 වර්ෂවලදී ඖෂධ මිලදී ගැනීම සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශයට වෙන් කළ ඇස්තමේන්තු ගත මුදල කොපමණද;

(ii) එම මුදලින් එකී වර්ෂයන් සඳහා අමාත්‍යාංශය වෙත ලැබුණු සත්‍ය මුදල කොපමණද;

(iii) එක් එක් වර්ෂය සඳහා ඖෂධ මිලදී ගැනීමට පත් කර තිබෙන කමිටුවේ සාමාජිකයින්ගේ නම් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) පසුගිය කාලයේ ඇති වූ ඖෂධ හිඟයට හේතුව ඒ සඳහා වෙන් කළ මුදල් ප්‍රමාණවත් නොවීම බව එතුමා පිළිගන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0321/'10

3.

ගරු රවි කරුණානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) අතීතයේ සිදුවූ සිද්ධීන් සලකා බැලීම සඳහා ප්‍රතිසන්ධාන මණ්ඩලය හෝ කොමිෂන් සභාව පත් කළ දිනය කවරේද;

(ii) ඉහත සඳහන් කොමිෂන් සභාවේ හෝ මණ්ඩලයේ සාමාජිකයන්ගේ නම් කවරේද;

(iii) ඉහත සඳහන් කොමිෂන් සභාවේ හෝ මණ්ඩලයේ වාර්තාව බලාපොරොත්තු වන දිනය කවරේද;

(iv) කොමිෂන් සභාව / මණ්ඩලය අද වන විට රැස් වී ඇති වාර ගණන කවරේද;

(v) මෙම කොමිෂන් සභාවේ / මණ්ඩලයේ පවත්වාගෙන යෑම සඳහා වෙන් කර ඇති මුදල් ප්‍රමාණය කොපමණද;

(vi) එම වෙන් කරන ලද මුදල් ප්‍රමාණය ඒ සඳහා ප්‍රමාණවත්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0698/'10

4.

ගරු බුද්ධික පතිරණ මහතා,— රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) දැනට ශ්‍රී ලංකාව තුළ ඇති ග්‍රාම නිලධාරී කොට්ඨාස සංඛ්‍යාව කොපමණද;

(ආ) (i) ග්‍රාම නිලධාරී තනතුරෙහි පුරප්පාඩු පවතින කොට්ඨාසවල වැඩ බලන ග්‍රාම නිලධාරීන්ට ගෙවනු ලබන දීමනාව ඔහුගේ / ඇයගේ මුල් පත්වීම ලබන අවස්ථාවේ ලැබූ මූලික වැටුපෙන් 1/4 ක් බවත්;

(ii) එම පදනම මත වැඩ බැලීමේ දීමනාව ගෙවීම නිසා මීට වසර 10 - 15 ට පෙර පත්වීම් ලැබූ ග්‍රාම නිලධාරීන්ට ලැබෙන එම දීමනාව ඉතා අල්ප මුදලක් බැවින් එවැනි නිලධාරීන්ට මූල්‍යමය අසාධාරණයක් සිදුවන බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඇ) (i) එවැනි නිලධාරීන්ට සාධාරණයක් ඉටු කිරීම සඳහා එතුමා කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, ඊට අදාළව පියවර ගනු ලබන දිනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0226/'10

5\.

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) හම්බන්තොට දිස්ත්‍රික්කයේ, හම්බන්තොට කලාප අධ්‍යාපන කාර්යාලයට අයත් අම්බලන්තොට කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයෙන් පාලනය වන රජයේ පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පාසල්වල නම් කවරේද;

(iii) එම පාසල්වලින් දැනට වසා ඇති හෝ වැසීමට තීරණය කර ඇති පාසල් සංඛ්‍යාව කොපමණද;

(iv) එම පාසල්වල නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මෙම කොට්ඨාසයට අයත් පාසල්වල අතිරික්ත ගුරුවරුන් සිටින්නේද;

(ii) එම පාසල්වල නම් කවරේද;

(iii) ගුරු ඌණතා ඇති පාසල්වල නම් කවරේද;

(iv) ඌණතාවයන් පවතින්නේ කුමන විෂයයන් සඳහාද;

(v) මෙම ගුරු ඌණතා පවතින පාසල් සඳහා ගුරුවරුන් ලබාදීමට කටයුතු කරන්නේද;

(vi) එසේ නම්, ඒ කොපමණ කාලයක් තුළදී ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0323/'10

6\.

ගරු රවී කරුණානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) රජය "මතට තිත" වැඩසටහන ඇරඹූ දිනය එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) මේ දක්වා වූ පසුගිය වර්ෂ දහයක කාලය තුළ, එක් එක් වර්ෂයේදී,

(i) බියර් සහ සැර මත්පැන් පරිභෝජනය වෙන වෙනම කොපමණද;

(ii) ශ්‍රී ලංකාව තුළ නිෂ්පාදනය කරන ලද බියර් සහ සැර මත්පැන් ප්‍රමාණය කොපමණද;

(iii) ශ්‍රී ලංකාව ආනයනය කරන ලද බියර් සහ සැර මත්පැන් ප්‍රමාණය කොපමණද;

(iv) බියර් සහ සැර මත්පැන් ආනයනයේදී සහ දේශීයව නිෂ්පාදනය කිරීමේදී පනවනු ලබන සියලු ආකාර බදු වලින් රජය උපයන ලද මුළු ආදායම කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) ශ්‍රී ලංකාව තුළ සිදුවන නීති විරෝධී මත්පැන් පෙරීම මගින් නිපදවනු ඇතැයි ගණන් බලා ඇති මත්පැන් ප්‍රමාණය පසුගිය වර්ෂ තුන තුළදී කොපමණ ප්‍රමාණයක් වීද යන්න වාර්ෂික පදනමින් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0699/'10

7.

ගරු බුද්ධික පතිරණ මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයේ දකුණු පළාතට අයත් ඩිපෝවල 2005 සිට මේ දක්වා විශ්‍රාම ගිය සේවකයින්ට විශ්‍රාමික පාරිතෝෂික මුදල් ගෙවා නොමැති බව එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) එසේ ගෙවීමට ඇති මුළු පාරිතෝෂික මුදල කොපමණද;

(ii) විශ්‍රාම යාමෙන් පසු එම සේවකයින්ට හිමි පාරිතෝෂික මුදල ගෙවිය යුතු කාල සීමාව කොපමණද:

(iii) 2005 සිට විශ්‍රාම ගිය සේවකයින්ගෙන් මේ වන විට පාරිතෝෂික මුදල් ගෙවා ඇති සේවක සංඛ්‍යාව සහ ගෙවීමට ඇති සේවක සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) පාරිතෝෂික මුදල් මේ දක්වා ගෙවා නොමැති විශ්‍රාමිකයින් සඳහා එම මුදල් ගෙවනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0730/'10

8.

ගරු දයාසිරි ජයසේකර මහතා,— මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) පඬුවස්නුවර බටහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පතිරණවත්ත මාර්ගය අයත් වන ආයතනය කවරේද;

(ii) එම මාර්ගයේ කොන්ක්‍රීට් ඇතිරීම සඳහා අදාළ ආයතනයෙන් අවසර ලබාගෙන තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම මාර්ගයට කොන්ක්‍රීට් ඇතිරීම භාරදුන් ආයතනය හෝ පුද්ගලයින් කවුරුන්ද;

(ii) ඒ සඳහා වෙන් කළ ඇස්තමේන්තු ගත මුදල කොපමණද ;

(iii) එම ඇස්තමේන්තුව අනුව කොන්ක්‍රීට් ඇතිරීම සිදුකළ යුතු ඝණකම, පළල සහ දුර ප්‍රමාණය කොපමණද ;

(iv) මේ වන විට කොන්ක්‍රීට් අතුරා ඇති දුර ප්‍රමාණය කොපමණද;

(v) කොන්ක්‍රීට් අතුරා අවසන් කළ දිනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) එම මාර්ගයට කොන්ක්‍රීට් ඇතිරීම ප්‍රමිතියට අනුකූලව සිදු කර නොමැති බවත් මතුපිට ගැටි සහිත සහ සමතල මට්ටමේ නොමැති බවත් සිමෙන්ති ගැලවී ඉවත්ව ගල් මතුව ඇති බවත් එතුමා දන්නෙහිද?

(ඈ) එසේ නම්, ප්‍රමිතීන්ට අනුකූල නොවන පරිදි එම ඉදි කිරීම් කළ ආයතනය හෝ පුද්ගලයින් සම්බන්ධයෙන් ගන්නා ක්‍රියා මාර්ගය කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

## 2010 දෙසැම්බර් මස 04 වැනි සෙනසුරාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0227/'10

1\.
ගරු සජිත් ප්‍රේමදාස මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) හම්බන්තොට දිස්ත්‍රික්කයේ, තංගල්ල කලාප අධ්‍යාපන කාර්යාලයට අයත් අඟුණුකොළපැලැස්ස කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයෙන් පාලනය වන රජයේ පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පාසල්වල නම් කවරේද;

(iii) එම පාසල්වලින් දැනට වසා ඇති හෝ වැසීමට තීරණය කර ඇති පාසල් සංඛ්‍යාව කොපමණද;

(iv) එම පාසල්වල නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මෙම කොට්ඨාසයට අයත් පාසල්වල අතිරික්ත ගුරුවරුන් සිටින්නේද;

(ii) එම පාසල්වල නම් කවරේද;

(iii) ගුරු ඌණතා ඇති පාසල්වල නම් කවරේද;

(iv) ඌණතාවයන් පවතින්නේ කුමන විෂයයන් සඳහාද;

(v) මෙම ගුරු ඌණතා පවතින පාසල් සඳහා ගුරුවරුන් ලබාදීමට කටයුතු කරන්නේද;

(vi) එසේ නම්, ඒ කොපමණ කාලයක් තුළදී ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0284/'10

2\.
ගරු රවී කරුණානායක මහතා,— ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) 1978 - 1988, 1989 - 1994, 1995 - 2009, සහ 2010 සිට මේ දක්වා, යන කාල පරිච්ඡේද තුළ දී රජය විසින් ඉදිකරන ලද නිවාස සංඛ්‍යාව කොපමණද යන්න වාර්ෂික පදනමින් සහ දිස්ත්‍රික් පදනමින් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉදි කිරීමට නියමිත නිවාස සංඛ්‍යාව වැඩිකිරීම පිණිස ගැනීමට අදහස් කරන පියවර කවරේද;

(ii) නිවාස ඉදිකිරීම සඳහා මුදල් සපයාගන්නා ප්‍රභවයන් මොනවාද සහ අවශ්‍යතාව ඇති ජනතාව අතර මුදල් බෙදා දෙනු ලබන්නේ කුමන ආකාරයටද;

(iii) නිවාස හිමි සමාජයක් ඇති කිරීම උදෙසා ගැනීමට නියමිත පියවර කවරේද;

යන්න එතුමා තවදුරටත් සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0344/'10

3.

ගරු දයාසිරි ජයසේකර මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) කුරුණෑගල දිස්ත්‍රික්කයේ එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ වර්ෂ 2005 සිට 2009 දක්වා සෑම වර්ෂයකම ජූනි මස 30 දිනට හිමිකම් ලබමින් සිටි සමෘද්ධිලාභීන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද?

(ආ) (i) වර්ෂ 2005 සිට 2009 දක්වා කුරුණෑගල දිස්ත්‍රික්කයේ එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සමෘද්ධිලාභීන් වෙනුවෙන් වාර්ෂිකව වෙන් කළ මුදල් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) වර්ෂ 2005 සිට 2009 දක්වා කාල සීමාවේදී පඬුවස්නුවර නැගෙනහිර හා බටහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල සමෘද්ධිලාභීන්ව සිට ඉවත් කරන ලද අයගේ නම් හා ලිපිනයන් කවරේද;

(iii) එම පුද්ගලයන් ඉවත්කරන ලද පදනම කුමක්ද;

(iv) එම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස දෙකහි සමෘද්ධිලාභීන් ලෙස අලුතින් එක් කරන ලද අයගේ නම් සහ ලිපිනයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0759/'10

4.

ගරු වසන්ත අලුවිහාරේ මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) ශ්‍රී ලංකාව තුළ ජලභීතිකා රෝගය හේතුවෙන් වාර්ෂිකව රෝගීහු සිය ගණනක් මිය යන බව එතුමා දන්නෙහිද?

(ආ) ජලභීතිකා රෝගය වැළැක්වීම සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් ආනයනය කරනු ලබන එන්නත් සඳහා පසුගිය වර්ෂයේදී වැය කරන ලද මුදල් ප්‍රමාණය කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) ඒ සඳහා වැය කරනු ලබන මුදල් ප්‍රමාණය වාර්ෂිකව ඉහළ යන බව එතුමා පිළිගන්නෙහිද?

(ඈ) දිවයින පුරා ව්‍යාප්තව ඇති ජලභීතිකා රෝගය වැළැක්වීම සඳහා ගෙන ඇති පියවර කවරේද යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0827/'10

5.

ගරු වික්ටර් ඇන්ටනි මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) හලාවත මූලික රෝහල මහ රෝහලක් බවට පත් කර මධ්‍යම රජයට පවරා ගැනීමේ වැඩකටයුතු අවසන් වී තිබේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) හලාවත මූලික රෝහලේ එක්ස් - කිරණ යන්ත්‍රය ක්‍රියා විරහිතව නැවත අලුත්වැඩියා කළ නොහැකි තත්වයක පවතින බවත්;

(ii) එම එක්ස් - කිරණ යන්ත්‍රය ක්‍රියා විරහිතවීම නිසා රෝගීන් විශාල පිරිසක් හලාවත රෝහලේ සිට මාරවිල රෝහල දක්වා දිනපතා රැගෙන යාමට සිදු වී ඇති බවත්;

(iii) ඒ සඳහා සේවකයින් යෙදීමේදී අඩුපාඩු සිදුවන බවත්;

එතුමා දන්නෙහිද?

(ඈ) (i) මෙම තත්ත්වය නිසා රෝගීන් දැඩි අපහසුතාවයකට පත්වන බවත්;

(ii) ඒ සඳහා විශාල අමතර මුදලක් වැය කිරීමට සිදුවන බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඇ) එසේ නම්, ක්‍රියා විරහිතවූ යන්ත්‍රය වෙනුවට නව එක්ස් - කිරණ යන්ත්‍රයක් හලාවත මූලික රෝහලට කඩිනමින් ලබාදීමට පියවර ගන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0228/'10

6.

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) හම්බන්තොට දිස්ත්‍රික්කයේ, තංගල්ල කලාප අධ්‍යාපන කාර්යාලයට අයත්, බෙලිඅත්ත කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයෙන් පාලනය වන රජයේ පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පාසල්වල නම් කවරේද;

(iii) එම පාසල්වලින් දැනට වසා ඇති හෝ වැසීමට තීරණය කර ඇති පාසල් සංඛ්‍යාව කොපමණද;

(iv) එම පාසල්වල නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මෙම කොට්ඨාසයට අයත් පාසල්වල අතිරික්ත ගුරුවරුන් සිටින්නේද;

(ii) එම පාසල්වල නම් කවරේද;

(iii) ගුරු ඌණතා ඇති පාසල්වල නම් කවරේද;

(iv) ඌණතාවයන් පවතින්නේ කුමන විෂයයන් සඳහාද;

(v) මෙම ගුරු ඌණතා පවතින පාසල් සඳහා ගුරුවරුන් ලබාදීමට කටයුතු කරන්නේද;

(vi) එසේ නම්, ඒ කොපමණ කාලයක් තුළදී ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0384/'10

7.

ගරු රවී කරුණානායක මහතා,— වරාය සහ ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) ගාලු මුව දොර සිට වැල්ලවත්ත දක්වා මුහුදු ප්‍රදේශය තුළ අක්කර 500 ක් ගොඩ කරනු පිණිස ශක්‍යතා අධ්‍යයනයක් සිදු කෙරෙමින් පවතින බව සත්‍යයක් දැයි එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මෙම ශක්‍යතා අධ්‍යයනය සිදු කරන්නේ කවරෙක්ද;

(ii) මුහුදු පතුල පිරවීමට යන වියදම කොපමණද;

(iii) එයින් පරිසරයට බලපෑම් ඇති කෙරෙන්නේද;

(iv) මෙම ව්‍යාපෘතියේ දේශීය හා විදේශීය විශේෂඥ උපදේශකවරු සහ අයෝජකයෝ යන පාර්ශ්ව කවරේද;

(v) එබඳු ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමේ පරමාර්ථය කුමක්ද;

(vi) ඒ සඳහා වැයකරනු ලබන මුදල ආපසු ගෙවිය යුතු කාලසීමාව කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0485/’10

8.

ගරු දයාසිරි ජයසේකර මහතා,— වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) බහුකාර්ය ජල සම්පත් සැලසුම්කරන ජාතික ව්‍යාපෘතිය යනුවෙන් ව්‍යාපෘතියක් ක්‍රියාත්මක වන්නේද;

(ii) එහි අරමුණු කවරේද;

(iii) ගංගා නිම්න සංවර්ධන නමින් වැඩ සටහනක් තිබේද;

(iv) එහි අරමුණු කවරේද;

(v) මෙම වැඩ සටහන් ආරම්භ කර ඇති දිස්ත්‍රික්ක සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත ව්‍යාපෘති සඳහා මුදල් ලබා ගන්නේ ණය ලෙසද; ආධාර ලෙස ද;

(ii) එම මුදල් ලබා දෙන ආයතනය හෝ ආයතන කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2010 දෙසැම්බර් මස 06 වැනි සඳුදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0229/'10

1.

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) හම්බන්තොට දිස්ත්‍රික්කයේ, වලස්මුල්ල කලාප අධ්‍යාපන කාර්යාලයට අයත්, වලස්මුල්ල කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයෙන් පාලනය වන රජයේ පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පාසල්වල නම් කවරේද;

(iii) එම පාසල්වලින් දැනට වසා ඇති හෝ වැසීමට තීරණය කර ඇති පාසල් සංඛ්‍යාව කොපමණද;

(iv) එම පාසල්වල නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මෙම කොට්ඨාසයට අයත් පාසල්වල අතිරික්ත ගුරුවරුන් සිටින්නේද;

(ii) එම පාසල්වල නම් කවරේද;

(iii) ගුරු ඌණතා ඇති පාසල්වල නම් කවරේද;

(iv) ඌණතාවයන් පවතින්නේ කුමන විෂයයන් සඳහාද;

(v) මෙම ගුරු ඌණතා පවතින පාසල් සඳහා ගුරුවරුන් ලබාදීමට කටයුතු කරන්නෙහිද;

(vi) එසේ නම්, ඒ කොපමණ කාලයක් තුළදී ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0315/'10

2\.

ගරු රවී කරුණානායක මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) අයිෆා උළෙල කොළඹදී පැවැත්වීමට ශ්‍රී ලංකාව එකඟතාවකට පැමිණියේ කවදාද;

(ii) එම උළෙල සඳහා කරන ලද වියදම් සඳහා ගෙවීම් කරන පාර්ශ්වය කවරෙක්ද;

(iii) ඒ සඳහා මුදල් ලැබුනු දිනය කවරේද;

(iv) ඉහත සඳහන් ආකාරයට මුදල් ගෙවීම සිදු කරනු නොලබන්නේ නම්, අදාළ වියදම පියවනු ලබන්නේ කවරෙක්ද;

(v) උළෙල සඳහා වැය වූ මුළු වියදම කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) අයිෆා උළෙල තුළින් ලබා ගැනීමට අපේක්ෂා කරන ලද ප්‍රතිලාභ කවරේද;

(ii) එවැනි ප්‍රතිලාභ ලබා ගැනීමට හැකිවූයේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0330/'10

3\.

ගරු දයාසිරි ජයසේකර මහතා,— මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) පසුගිය වර්ෂ 20 ක කාලය තුළ මහාමාර්ග ඉදි කිරීම සඳහා වාර්ෂිකව පවරා ගත් ඉඩම් ප්‍රමාණයන් වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඒ සඳහා ගෙවිය යුතු වන්දි ප්‍රමාණය කොපමණද;

(iii) එයින් දැනටමත් ගෙවා ඇති මුදල් ප්‍රමාණය කොපමණද;

(iv) තවදුරටත් ගෙවීමට ඇති මුදල කොපමණද;

(v) එම මුදල් ගෙවා නිමකරන්නේ කවදාද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0828/'10

4\.

ගරු වික්ටර් ඇන්ටනි මහතා,— ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) හලාවත ධීවර වරාය ඉදිකිරීමේ කටයුතු සම්පූර්ණයෙන් අවසන් වී තිබේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) පොදු මාලු වෙළඳපොළේ වෙන්දේසි පොළ සඳහා ගොඩනැගිල්ලක් ඉදිකිරීමද හලාවත ධීවර වරායේ සංවර්ධන ව්‍යාපෘතියට අයත්වන බවත්;

(ii) කිසියම් හේතුවක් නිසා එම වෙන්දේසි පොළ ගොඩනැගිල්ල ඉදිකර නොමැති බවත්;

(iii) මෙම පොදු වෙන්දේසි පොළ ඉදිනොවීමෙන් එම ධීවර වරායේ ඇති වටිනාකම් බොහෝ අඩු වී ඇති බවත්;

(iv) අති විශාල මුදලක් වැයකර ඉදි කළ මෙම ධීවර වරාය සංකීර්ණයේ පාරිභෝගික ජනතාවට හෝ ධීවර ජනතාවට අවශ්‍ය ජල පහසුකම් හෝ වැසිකිලි /කැසිකිලි පහසුකම් හෝ නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ඇ) එසේ නම්, එම අඩුපාඩු සකස් කිරීමට එතුමා කඩිනම් පියවර ගන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0230/'10

5.

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) හම්බන්තොට දිස්ත්‍රික්කයේ, හම්බන්තොට කලාප අධ්‍යාපන කාර්යාලයට අයත්, සූරියවැව කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයෙන් පාලනය වන රජයේ පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පාසල්වල නම් කවරේද;

(iii) එම පාසල්වලින් දැනට වසා ඇති හෝ වැසීමට තීරණය කර ඇති පාසල් සංඛ්‍යාව කොපමණද;

(iv) එම පාසල්වල නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මෙම කොට්ඨාසයට අයත් පාසල්වල අතිරික්ත ගුරුවරුන් සිටින්නේද;

(ii) එම පාසල්වල නම් කවරේද;

(iii) ගුරු ඌණතා ඇති පාසල්වල නම් කවරේද;

(iv) ඌණතාවයන් පවතින්නේ කුමන විෂයයන් සඳහාද;

(v) මෙම ගුරු ඌණතා පවතින පාසල් සඳහා ගුරුවරුන් ලබාදීමට කටයුතු කරන්නෙහිද;

(vi) එසේ නම් ඒ කොපමණ කාලයක් තුළදී ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0444/'10

6.

ගරු රවී කරුණානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) පසුගිය වර්ෂ පහ තුළදී වාර්තා වූ අසාර්ථක මූල්‍ය සමාගම් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) තැන්පත්කරුවන් ආරක්ෂා කිරීම ශ්‍රී ලංකා මහ බැංකුවේ වගකීම බව එතුමා පිළිගන්නෙහිද?

(ඇ) (i) තැන්පත්කරුවන්ගේ මුදල් භාරගත් සමාගම් මගින් මුදල් ගෙවනු නොලැබූ සමස්ත තැන්පත්කරුවන් සංඛ්‍යාව කොපමණද;

(ii) ගෙවීම පැහැර හරින ලද සමාගම් කවරේද;

(iii) මහ බැංකුව මැදිහත් වී කිසිදු සමාගමක් බංකොලොත්භාවයට පත් නොවනු ඇති බවට සහතිකවීමෙන් පසුවත් 2010.06.01 දිනට IFC සහ CIFC තැන්පත්කරුවන්ට තම ඉතිරිකිරීම් අහිමි වූයේ කෙසේද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) (i) එම සමාගම් වල අධ්‍යක්ෂවරුන්ට සිදුවී ඇත්තේ කුමක්ද;

(ii) මෙම මූල්‍ය සමාගම් පිළිබඳ වාර්තා කිරීමේදී බැංකු විසින් අධ්‍යක්ෂවරුන් සම්බන්ධයෙන් එකිනෙකට වෙනස් සම්මතයන් යෙදවීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට පැහැදිලි කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0575/'10

7.

ගරු දයාසිරි ජයසේකර මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) මේ වනවිට එක් එක් දිස්ත්‍රික්කයේ රජයේ පාසල්වල සේවය කරන ස්වේච්ඡා ගුරුවරුන්ගේ සංඛ්‍යාව පාසල් වර්ගීකරණය අනුව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම ස්වේච්ඡා ගුරුවරුන් ස්ථිර කිරීම සඳහා යම් වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කරන්නේද;

(iii) පසුගිය අයවැය යටතේ ඒ සඳහා මුදල් වෙන් කර තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) අධ්‍යාපන අමාත්‍යාංශ චක්‍රලේඛ 2008/50 හි 2 කොටසේ VI වැනි වගන්තියට යටත් ස්වේච්ඡා ගුරුවරුන් මේ වන තෙක් ස්ථිර සේවයේ පිහිටුවා නොමැති බව එතුමා දන්නෙහිද?

(ඇ) එසේ නම්, ඔවුන් සේවයේ ස්ථිර කිරීම සම්බන්ධයෙන් ගන්නා වූ ක්‍රියා මාර්ග කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0829/'10

8.

ගරු වික්ටර් ඇන්ටනි මහතා,— ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) හලාවත ධීවර වරාය සංවර්ධන ව්‍යාපෘතිය යටතේ මෝය කට සංවර්ධනය කිරීම හා සෑම දිනකම මෝය කටේ වැලි ඉවත් කිරීමේ යන්ත්‍රයක් යෙදීම කළ යුතු බවත්;

(ii) ඒ අනුව එම මෝය කටේ වැලි ඉවත් කිරීම සඳහා යෙදවූ එම ව්‍යාපෘතියට අයත් යන්ත්‍රය ධීවර වරාය සංවර්ධන ව්‍යාපෘතිය විවෘත කර සතියක් යාමට පෙර ආපසු රැගෙන ගොස් ඇති බවත්;

(iii) එම යන්ත්‍රය නොමැති වීමෙන් නිතරම මෝය කටේ වැලි පිරීම නිසා ධීවර ජනතාවට අති මහත් දුෂ්කරතාවයන්ට මුහුණ දීමට සිදුවී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් වැලි ඉවත් කිරීමේ යන්ත්‍රය ආපසු රැගෙන යාමට හේතු කවරේද;

(ii) දැනට අවහිරව ඇති මෝය කටෙහි වැලි තාවකාලිකව හෝ ඉවත් කිරීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

## 2010 දෙසැම්බර් මස 07 වැනි අඟහරුවාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0231/'10

1\.

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) හම්බන්තොට දිස්ත්‍රික්කයේ, තංගල්ල කලාප අධ්‍යාපන කාර්යාලයට අයත්, තංගල්ල කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයෙන් පාලනය වන රජයේ පාසල්වල යටිතල පහසුකම් සහ පොදු අවශ්‍යතාවයන්ගේ ඌණතාවයන් පවතින බැව් එතුමා දන්නෙහිද?

(ආ) (i) එම පාසල් පද්ධතිය තුළ ඇති විදුලිය නොමැති පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පාසල්වල නම් කවරේද;

(iii) එම පාසල් පද්ධතිය තුළ ඇති විදුලිය නොමැති ගුරු නිවාස සංඛ්‍යාව කොපමණද;

(iv) ඒවා අයත් පාසල්වල නම් කවරේද;

(v) ලී බඩු අවශ්‍යතා ඇති පාසල් සංඛ්‍යාව කොපමණද;

(vi) එම අවශ්‍යතාවන් කවරේද;

(vii) විද්‍යාගාර සහ පුස්තකාල නොමැති පාසල් සංඛ්‍යාව කොපමණද;

(viii) එම පාසල්වල නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) ඉහත සඳහන් අවශ්‍යතා ඉටුකරලීමට අවශ්‍ය ප්‍රතිපාදන එම පාසල් සඳහා වෙන් කර දීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, ඒ කොපමණ කාලයක් තුළදී ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0314/'10

2\.

ගරු රවී කරුණානායක මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) මෙරට රජයේ පාසල් සහ රජයට අනුබද්ධිත පාසල්වල සේවය කරන ඉංග්‍රීසි ගුරුවරු සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන්ට මසකට ගෙවනු ලබන මුදල කොපමණද;

(iii) ඔවුන්ට හිමිවන අනෙකුත් ප්‍රතිලාභ කවරේද;

(iv) ශ්‍රී ලංකාවේ ඉංග්‍රීසි ගුරු අවශ්‍යතාව එක් එක් දිස්ත්‍රික්කය අනුව කොපමණද;

(v) ඉංග්‍රීසි ගුරුවරුන්ගේ හිඟය මගහරවා ගැනීම පිණිස ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලාංකික ඉංග්‍රීසි ගුරුවරුන් 2000 කොරියාවට යැවිය යුතු යැයි එතුමා විසින් යෝජනාවක් හෝ ප්‍රකාශයක් කිරීමට හේතු කවරේද;

(ii) එසේ කිරීමෙන් ශ්‍රී ලංකාවට ලැබෙන ප්‍රතිලාභ කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0712/'10

3\.

ගරු දයාසිරි ජයසේකර මහතා,— වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) ගිංගඟ යෝජනා ක්‍රමය නමින් වැඩ සටහනක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබේද;

(ii) එසේ නම් එයට යටත් වන ප්‍රදේශ සහ අවදානම් ප්‍රදේශ කවරේද;

(iii) එම ප්‍රදේශවල අවතැන්වන ජනතාව සම්බන්ධයෙන් ගන්නා ක්‍රියා මාර්ග කවරේද;

(iv) ඔවුන් නැවත පදිංචි කිරීමට බලාපොරොත්තුවන ප්‍රදේශ කවරේද;

(v) ඔවුන් වෙනුවෙන් වන්දි ලබා දීමේ පදනම කුමක්ද;

(vi) ගිංගඟ යෝජනා ක්‍රමය ආරම්භ කරන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0830/'10

4\.

ගරු වික්ටර් ඇන්ටනි මහතා,— ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) ධීවර ප්‍රජාවට උසස් සමාජ තත්වයක් ලබාදීම සඳහා ධීවර සම්පත් වර්ධනය කිරීම, ධීවර පහසුකම් වැඩි දියුණු කිරීම, අලෙවි පහසුකම් සලසා දීම සහ ධීවර ජනතාවගේ සකසුරුවම්කම පිළිබඳව දැනුම වර්ධනය කිරීම ආදි කටයුතු සම්බන්ධයෙන් වැඩ සටහන් ආරම්භ කර තිබේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) වාරකන් කාලයේදී ධීවර ජනතාවගේ ආර්ථිකය තිරසාරව පවත්වා ගැනීම සඳහා ගෙන ඇති විකල්ප ක්‍රියා මාර්ග කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) කරවල වේලීම, ජාඩි දැමීම, සත්ව ආහාර නිෂ්පාදනය සඳහා මසුන් සැකසීම, තල් කොල භාණ්ඩ සැකසීම, මැහුම් කටයුතු සහ සිප්පිකටු විසිතුරු භාණ්ඩ නිෂ්පාදනය වැනි ජීවනෝපායන් සඳහා ධීවර කාන්තාවන් පුහුණු කිරීමේ වැඩ පිළිවෙලක් ආරම්භ කර තිබේද ;

(ii) එම නිෂ්පාදන අලෙවිය සඳහා වැඩ පිළිවෙලක් සකස් කර තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0232/'10

5\.

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) හම්බන්තොට දිස්ත්‍රික්කයේ, වලස්මුල්ල කලාප අධ්‍යාපන කාර්යාලයට අයත්, කටුවන කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයෙන් පාලනය වන රජයේ පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පාසල්වල නම් කවරේද;

(iii) එම පාසල්වලින් දැනට වසා ඇති හෝ වැසීමට තීරණය කර ඇති පාසල් සංඛ්‍යාව කොපමණද;

(iv) එම පාසල්වල නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මෙම කොට්ඨාසයට අයත් පාසල්වල අතිරික්ත ගුරුවරුන් සිටින්නේද;

(ii) එම පාසල්වල නම් කවරේද;

(iii) ගුරු ඌණතා ඇති පාසල් වල නම් කවරේද;

(iv) ඌණතාවයන් පවතින්නේ කුමන විෂයයන් සඳහාද;

(v) මෙම ගුරු ඌණතා පවතින පාසල් සඳහා ගුරුවරුන් ලබාදීමට කටයුතු කරන්නේද;

(vi) එසේ නම් ඒ කොපමණ කාලයක් තුළදී ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0445/'10

6.

ගරු රවී කරුණානායක මහතා,— විදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) මේ දක්වා වූ පසුගිය වර්ෂ පහක කාලය තුළ එක් එක් වර්ෂයේදී විදේශ රැකියා සඳහා පිටත්ව ගිය පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) රැකියා සඳහා විදේශගත වන පුද්ගලයන් රක්ෂණ සැලැස්මක් තුළින් ආරක්ෂා කළ යුතු බව එතුමා පිළිගන්නෙහිද?

(ඇ) එසේ නම්, එවැනි රක්ෂණ ආවරණයක් සඳහා එක් පුද්ගලයකුගෙන් කොපමණ මුදලක් අයකරන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) පසුගිය වර්ෂ 5 තුළ එක් එක් වර්ෂයේදී ඉල්ලා සිටි රක්ෂණ හිමිකම් සංඛ්‍යාව කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) රක්ෂණ ගිවිසුම සඳහා මුදල් ගෙවා තිබුනද, රක්ෂණ හිමි පුද්ගලයන්ට හිමිකම් නොලැබීමට හේතු කවරේද යන්න එතුමා පැහැදිලි කරන්නෙහිද?

(ඊ) නොඑසේ නම්, ඒ මන්ද?

0713/'10

7.

ගරු දයාසිරි ජයසේකර මහතා,— වරාය හා ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) හම්බන්තොට වරාය විවෘත කිරීමේ කරදියවර මංගල්‍යය නම් උත්සවය සඳහා වැය කළ මුළු මුදල කොපමණද;

(ii) එම උත්සවයේ ප්‍රසාංගික කටයුතු භාරව ක්‍රියා කළ පුද්ගලයාගේ හෝ ආයතනයේ නම කවරේද;

(iii) එම කටයුතු ඉටු කරන ලද්දේ ආයතනයක් විසින් නම්, එහි ප්‍රධානියාගේ සහ අධ්‍යක්ෂ මණ්ඩලයේ නම් කවරේද;

(iv) එම ආයතනයට හෝ පුද්ගලයාට ගෙවන ලද මුළු මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0831/'10

8.

ගරු වික්ටර් ඇන්ටනි මහතා,— ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) කරදිය සහ කළපු ආශ්‍රිතව මසුන් ඇල්ලීම සඳහා තහනම් දැල් භාවිතය නිසා සිදුවන මත්ස්‍ය පැටවුන් විනාශය හේතුවෙන් මත්ස්‍ය සම්පත් අඩුවී ඇති බවත්;

(ii) ඒ හේතුවෙන් ධීවර කාර්මිකයින්ට ප්‍රමාණවත් මත්ස්‍ය සම්පත් නෙලා ගැනීමට නොහැකි වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) දැනට භාවිත වන සියලුම තහනම් දැල් වර්ග අත්අඩංගුවට ගැනීමට සහ තහනම් දැල් වර්ග භාවිතය සඳහටම ඉවත් කිරීම සඳහා ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වැඩසටහන් කවරේද;

(ii) තහනම් දැල් වර්ග භාවිතයට නොගැනීමට හා විනාශ කිරීමට මෙතෙක් ගෙන ඇති ක්‍රියා මාර්ග කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) කරදිය හා කිවුල් දිය (කළපු) මත්ස්‍යයින් බහුල කරවීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

(ii) තහනම්, අවිධිමත් දැල්ක්‍රම නිසා විනාශ වී ඇති ස්වභාවික මත්ස්‍ය ප්‍රජනන මධ්‍යස්ථාන ආරක්ෂා කිරීමට හා ඒවා වර්ධනය කිරීමට ගෙන ඇති ක්‍රියා මාර්ග කවරේද;

(iii) මත්ස්‍ය ප්‍රජනනය සඳහා විශේෂිත වූ කලාප වෙන් කිරීමට අදහස් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2010 දෙසැම්බර් මස 08 වැනි බදාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0233/'10

1.

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) හම්බන්තොට දිස්ත්‍රික්කයේ, වලස්මුල්ල කලාප අධ්‍යාපන කාර්යාලයට අයත්, කටුවන කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයෙන් පාලනය වන රජයේ පාසල්වල යටිතල පහසුකම් සහ පොදු අවශ්‍යතාවයන්ගේ ඌනතාවයන් පවතින බැව් එතුමා දන්නෙහිද?

(ආ) (i) එම පාසල් පද්ධතිය තුළ ඇති විදුලිය නොමැති පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පාසල්වල නම් කවරේද;

(iii) එම පාසල් පද්ධතිය තුළ ඇති විදුලිය නොමැති ගුරු නිවාස සංඛ්‍යාව කොපමණද;

(iv) ඒවා අයත් පාසල්වල නම් කවරේද;

(v) ලී බඩු අවශ්‍යතා ඇති පාසල් සංඛ්‍යාව කොපමණද;

(vi) එම අවශ්‍යතාවන් කවරේද;

(vii) විද්‍යාගාර සහ පුස්තකාල නොමැති පාසල් සංඛ්‍යාව කොපමණද;

(viii) එම පාසල්වල නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් අවශ්‍යතා ඉටුකරලීමට අවශ්‍ය ප්‍රතිපාදන එම පාසල් සඳහා වෙන් කර දීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, ඒ කොපමණ කාලයක් තුළදී ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0472/'10

2.

ගරු රවි කරුණානායක මහතා,— ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට "හෙජින්" ගනුදෙනු ක්‍රමය හඳුන්වාදුන්නේ කවරෙක්ද;

(ii) එම ගනුදෙනුව ඉදිරිපත් කිරීමේ අරමුණ කුමක්ද;

(iii) ඒ සඳහා කිසියම් ටෙන්ඩර් කැඳවීමක් කරන ලද්දේද;

(iv) ටෙන්ඩර් ඉදිරිපත් කරන ලද අයගේ නම් කවරේද;

(v) නොඑසේ නම්, ඒ සඳහා හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) මේ දක්වා, හෙජින් ගනුදෙනු සඳහා වැය කරන ලද මුළු මුදල කොපමණද;

(ii) මෙම ගනුදෙනුවට විරුද්ධව මහජනයා විසින් පවරන ලද නඩු සංඛ්‍යාව කොපමණද;

(iii) එවැනි නඩු පැවරූ අයගේ නම් සහ එම නඩු පැවරූ දිනයන් කවරේද;

(iv) එමගින් ලැබී ඇති ප්‍රතිඵලය කවරක්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) අභ්‍යන්තර සමථකරණයක් සඳහා කිසියම් බැංකුවක් විසින් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව තෝරාගෙන තිබේද;

(ii) එසේ තෝරාගෙන තිබේ නම්, ඒ කොපමණ මුදලකටද සහ එය සිදුකළ ස්ථානය කවරේද;

(iii) සිදු කරන ලද නීතිමය කටයුතු වෙනුවෙන් මේ දක්වා ගෙවීමට තිබෙන මුළු මුදල කොපමණද;

(iv) නීතිමය කටයුතු සඳහා වියදම් ලෙස ගෙවීමට නියමිත මුදල කොපමණද;

(v) ඉහත නඩු සඳහා සම්භාව්‍ය වගකීම් වටිනාකම කොපමණද;

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0715/'10

3.

ගරු දයාසිරි ජයසේකර මහතා,— මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) මගනැගුම යන්ත්‍රෝපකරණ හා ඉදිකිරීම් සමාගමේ සභාපතිවරයා පත් කළ බලධාරියා කවුරුන්ද;

(ii) එම සභාපතිවරයාගේ වයස කවරේද;

(iii) ඔහු මෙයට පෙර සේවය කළ ස්ථානය හා තනතුර කවරේද;

(iv) ඔහුගේ වෘත්තීය පලපුරුද්ද කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0836/'10

4.

ගරු වික්ටර් ඇන්ටනි මහතා,— සමූපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) මහින්ද චින්තන වැඩසටහන යටතේ අති සාර්ථක වී මිලදී ගැනීමේ ක්‍රමයක් ඇතිවී තිබෙන බව එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) එසේ වුවත් නාත්තන්ඩිය ප්‍රදේශයේ වී මිලදී ගැනීමේ වැඩපිළිවෙල වී ගබඩා පහසුකම් නොමැතිවීම හේතුකොටගෙන අසාර්ථක වී ඇති බවත්;

(ii) එම ප්‍රදේශය තුළ පිහිටි වී ගබඩා කිරීමට ඉතාමත් යෝග්‍ය, වයඹ (පේෂකර්ම) සමූපකාර ව්‍යාපාරයට අයත් දැවැන්ත ගොඩනැගිල්ලක් කිසිදු ප්‍රයෝජනයක් නොගෙන වර්ෂ ගණනාවක් තිස්සේ වසා තබා ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ඇ) අදාළ සමූපකාර ප්‍රධානීන් සමඟ සාකච්ඡා කොට මෙම ගොඩනැගිල්ල ප්‍රදේශයේ ගොවි ජනතාවගේ වී ගබඩා කිරීම සඳහා යොදා ගැනීමට හා රජයට පවරා ගැනීමට කටයුතු කරන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0234/'10

5.

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) හම්බන්තොට දිස්ත්‍රික්කයේ, වලස්මුල්ල කලාප අධ්‍යාපන කාර්යාලයට අයත්, වලස්මුල්ල කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයෙන් පාලනය වන රජයේ පාසල්වල යටිතල පහසුකම් සහ පොදු අවශ්‍යතාවයන්ගේ ඌණතාවයන් පවතින බැව් එතුමා දන්නෙහිද?

(ආ) (i) එම පාසල් පද්ධතිය තුළ ඇති විදුලිය නොමැති පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පාසල්වල නම් කවරේද;

(iii) එම පාසල් පද්ධතිය තුළ ඇති විදුලිය නොමැති ගුරු නිවාස සංඛ්‍යාව කොපමණද;

(iv) ඒවා අයත් පාසල්වල නම් කවරේද;

(v) ලී බඩු අවශ්‍යතා ඇති පාසල් සංඛ්‍යාව කොපමණද;

(vi) එම අවශ්‍යතාවන් කවරේද;

(vii) විද්‍යාගාර සහ පුස්තකාල නොමැති පාසල් සංඛ්‍යාව කොපමණද;

(viii) එම පාසල්වල නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) ඉහත සඳහන් අවශ්‍යතා ඉටුකරලීමට අවශ්‍ය ප්‍රතිපාදන එම පාසල් සඳහා වෙන් කර දීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, ඒ කොපමණ කාලයක් තුළදී ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0577/'10

6.

ගරු රවී කරුණානායක මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) ශ්‍රී ලංකා සෞඛ්‍ය සේවාවට අවශ්‍යවන හෙදියන් සංඛ්‍යාව කවරේද;

(ii) දැනට සේවයේ නියුතු හෙදියන් සංඛ්‍යාව කවරේද;

(iii) හෙදියකගේ වැටුප සහ ඔවුන්ට ලැබෙන අමතර ප්‍රතිලාභ කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකාවේ හෙද අභ්‍යාස විද්‍යාල පිහිටා ඇති ස්ථාන කවරේද;

(ii) වසරකට පුහුණු කරනු ලබන හෙදියන් සංඛ්‍යාව කවරේද;

(iii) එක් හෙදියක් පුහුණු කිරීම වෙනුවෙන් වසරකට වැයවන මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) ශ්‍රම සඵලතාව සඳහා යොදා ගතහැකි අයුරින් මෙම ප්‍රමාණයට වඩා වැඩියෙන් හෙදියන් පුහුණු කිරීමට හැකියාවක් නොතිබේද යන්න වැඩිදුරටත් සඳහන් කරන්නෙහිද;

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0718/'10

7.

ගරු දයාසිරි ජයසේකර මහතා,— සමූපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) 2010 වර්ෂයේ අප්‍රේල් මාසයේ සිට මේ දක්වා ආනයනය කරන ලද මුළු කුකුල් මස් ප්‍රමාණය කොපමණද;

(ii) එම ප්‍රමාණය එක් එක් මාසය සඳහා වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම කුකුල් මස් ආනයනය කරන ලැබූ රටවල් කවරේද;

(iv) කුකුල් මස් කිලෝවක් ආනයනය සඳහා වැය වූ මුදල කොපමණද;

(v) ආනයනික මස් අලෙවි කිරීම සඳහා ලබා දුන් ආයතනවල නම් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0837/'10

8.

ගරු වික්ටර් ඇන්ටනි මහතා,— ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) කල්පිටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ අසාරවත් වැලිබිම් තීරුව මත රසායනික පොහොර සහ පළිබෝධ නාශක වර්ග යොදමින් එළවළු සහ පළතුරු වගා කරන බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම අසාරවත් බිමට යොදන යූරියා ඇතුළු රසායනික පොහොර වර්ගයන්හි ඇති නයිට්‍රේට් සහ නයිට්‍රයිට් යන විෂ රසායනික එම ප්‍රදේශවල භූගත ජලයට එකතු වී එම ජලය දැඩි ලෙස අපවිත්‍ර වී ඇති බවත්;

(ii) වෛද්‍ය විශේෂඥයින්ගේ මතය අනුව එම අපවිත්‍ර ජලය භාවිත කරන ජනතාව රෝගීන් වන බවත්;

(iii) එම නිසා කල්පිටිය ප්‍රදේශයේ ජනතාවට පිරිසිදු පානීය ජලය ලබාදීම සඳහා විශේෂ වැඩ පිළිවෙළක් සකස් කිරීම කඩිනම් කළයුතු බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඇ) එසේ නම්, එවැනි වැඩ පිළිවෙළක් කඩිනමින් සැකසීමට කටයුතු කරන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2010 දෙසැම්බර් මස 09 වැනි බ්‍රහස්පතින්දා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0120/'10

1\.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) ශ්‍රී ලංකාවේ ඖෂධ හිඟයක් ඇතිවී තිබෙන බවට 2010 මැයි මාසයේදී පළ වූ මාධ්‍ය වාර්තා එතුමා පිළිගන්නෙහිද?

(ආ) එම ඖෂධ හිඟයට හේතු කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) ඖෂධ වැනි අත්‍යාවශ්‍ය ද්‍රව්‍ය ප්‍රමාණවත් තරමින් තොග ගබඩාවල තිබිය යුතු බව එතුමා පිළිගන්නෙහිද?

(ඈ) (i) රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව මගින් නිපදවන ඖෂධ වර්ග ප්‍රමාණය කොපමණද;

(ii) ශ්‍රී ලංකාවට පිටරටින් ගෙන්වන ඖෂධ වර්ග ප්‍රමාණය කොපමණද;

(iii) රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව ලබා ඇති පාඩුව හෝ ණය වී ඇති ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0235/'10

2\.

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) හම්බන්තොට දිස්ත්‍රික්කයේ, තංගල්ල කලාප අධ්‍යාපන කාර්යාලයට අයත්, අඟුණුකොළපැලැස්ස කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයෙන් පාලනය වන රජයේ පාසල්වල යටිතල පහසුකම් සහ පොදු අවශ්‍යතාවයන්ගේ ඌණතාවයන් පවතින බැව් එතුමා දන්නෙහිද?

(ආ) (i) එම පාසල් පද්ධතිය තුළ විදුලිය නොමැති පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පාසල්වල නම් කවරේද;

(iii) එම පාසල් පද්ධතිය තුළ ඇති විදුලිය නොමැති ගුරු නිවාස සංඛ්‍යාව කොපමණද;

(iv) ඒවා අයත් පාසල්වල නම් කවරේද;

(v) ලී බඩු අවශ්‍යතා ඇති පාසල් සංඛ්‍යාව කොපමණද;

(vi) එම අවශ්‍යතාවන් කවරේද;

(vii) විද්‍යාගාර සහ පුස්තකාල නොමැති පාසල් සංඛ්‍යාව කොපමණද;

(viii) එම පාසල්වල නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) ඉහත සඳහන් අවශ්‍යතා ඉටුකරලීමට අවශ්‍ය ප්‍රතිපාදන එම පාසල් සඳහා වෙන් කර දීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, ඒ කොපමණ කාලයක් තුළදී ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0542/'10

3.

ගරු එම්. ටී. හසන් අලි මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) අම්පාර දිස්ත්‍රික්කයේ කාරතීව් රෝහලට අයත් ගිලන් රථය පසුගියදා නාඳුනන පිරිසක් විසින් ගිණි තබා විනාශ කළ බවත්;

(ii) එම නිසා රෝහලේ අසාධ්‍ය රෝගීන් සහ ගර්භණී මව්වරුන් හදිසි ප්‍රතිකාර සඳහා වෙනත් රෝහලකට රැගෙන යෑමේ අපහසුතාවයක් පවතින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) කාරතිව් රෝහලට ගිලන් රථයක් ලබාදීමේ අවශ්‍යතාව පිළිබඳව අම්පාර දිස්ත්‍රික් සංවර්ධන සහ සම්බන්ධීකරණ කමිටුව මඟින් අදාළ බලධාරීන් දැනුවත් කර තිබුණත් මේ දක්වා ගිලන් රථයක් ලබා දීමට පියවර ගෙන නොමැති බව එතුමා පිළිගන්නෙහිද?

(ඇ) එසේ නම්, එම රෝහලට නොපමාව ගිලන් රථයක් ලබා දීමට පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0559/'10

4.

ගරු අජිත් කුමාර මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) පසුගිය ජනාධිපතිවරණයේදී ඉදිරිපත් කළ මහින්ද චින්තන ඉදිරි දැක්ම යටතේ "විශ්‍රාමික දිවියට අත්වැලක්" යටතේ විශ්‍රාමිකයන්ට සහනයක් වශයෙන් 2006 ට පෙර විශ්‍රාම ලැබූ අයට 2006 වැටුප් ක්‍රමයට ගැලපෙන අයුරින් විශ්‍රාම වැටුප සකස් කොට ඊළඟ අයවැයේ සිට (2010) ක්‍රියාත්මක කරන බවට පොරොන්දු වූ බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ඒ අනුව 2010 අයවැයේදී 2006 ට පෙර විශ්‍රාම ගිය අයට, 2006 වැටුප් ක්‍රමයට ගැලපෙන ලෙස විශ්‍රාම වැටුප් ගෙවීමට කටයුතු කර තිබේද;

(ii) ඒ සඳහා වෙන් කොට ඇති මුදල කොපමණද;

(iii) එම සහනය 2010 අය වැයෙන් ලබා දී නැත්නම්, ඊට හේතු කවරේද;

(iv) එම විශ්‍රාම වැටුප් වැඩිවීම ලබා දෙන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0580/'10

5\.

ගරු රවී කරුණානායක මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) ශ්‍රී ලංකාවේ ප්‍රධාන වශයෙන් වී වගාකරනු ලබන දිස්ත්‍රික්ක 10 කවරේද;

(ii) ඉහත සඳහන් දිස්ත්‍රික්කවල වී වගාකරනු ලබන බිම් ප්‍රමාණය අක්කර කොපමණද;

(iii) පසුගිය වසර පහක කාලය තුළදී ඉහත සඳහන් ප්‍රදේශවලින් ලැබූ වී අස්වැන්න යල සහ මහ කන්නවලදී, වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) වී ගොවීන් විශාල සංඛ්‍යාවකට පොහොර සහනාධාරය ලබාගත නොහැකි බව සහ ඔවුන්ට එම සහනාධාරය ලැබුනත් එම පොහොරවල තත්වය පහල මට්ටමක පවතින බව එතුමා දන්නෙහිද?

(ඇ) (i) අවම තත්වය පිළිබඳ පාලනයක් පවත්වා ගැනීමේ ප්‍රමිතියක් සහිතව මෙම පොහොර සහනාධාරය විවෘත වෙළෙඳ පොලේදී මිලදී ගැනීමට අමාත්‍යාංශය විසින් ඉඩකඩ ලබා නොදීමට හේතු කවරේද;

(ii) ඉහත (අ) (i) හි සඳහන් කළ දිස්ත්‍රික්කවල පසුගිය වසර තුනක කාලය තුළ එක් එක් වර්ෂයේදී බෙදාහරින ලද සහනාධාර යටතේ ලබාදුන් පොහොර ප්‍රමාණය ටොන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0618/'10

6\.

ගරු දයාසිරි ජයසේකර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) මහව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ එච්. එම්. වසන්ත අනුර කුමාර මහතා සෙකරදාරිස් වත්තේ පවත්වාගෙන ගිය පැපොල් වගාව යම් අයෙකු හෝ කණ්ඩායමක් විසින් විනාශ කරනු ලැබ ඇති බව එතුමා දන්නෙහිද?

(ii) එසේ නම්, ඒ හේතුවෙන් ඔහුට සිදුවූ අලාභය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද;

(ආ) මේ සිදුවීම සම්බන්ධයෙන් වසන්ත මහතා කළ පැමිණිලි මහව පොලිසිය විසින් භාර නොගත් බවත්, මාධ්‍ය ආයතනයක ඉදිරිපත්වීම මත මේ පිළිබඳව පරීක්ෂණයක් ආරම්භ කර ඇති බවත් එතුමා පිළිගන්නෙහිද?

(ඇ) (i) එම පරීක්ෂණයේ වත්මන් ප්‍රගතිය කවරේද;

(ii) යම් අයෙකුගේ හෝ කණ්ඩායමකගේ බලපෑම මත එම පරීක්ෂණ අඩාල වී තිබේද;

(iii) වසන්ත මහතාට සිදුවූ අලාභය වෙනුවෙන් වන්දියක් ගෙවීමට රජය කටයුතු කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0236/'10

7\.

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) හම්බන්තොට දිස්ත්‍රික්කයේ, තංගල්ල කලාප අධ්‍යාපන කාර්යාලයට අයත්, බෙලිඅත්ත කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයෙන් පාලනය වන රජයේ පාසල්වල යටිතල පහසුකම් සහ පොදු අවශ්‍යතාවයන්ගේ ඌණතාවයන් පවතින බැව් එතුමා දන්නෙහිද?

(ආ) (i) එම පාසල් පද්ධතිය තුළ විදුලිය නොමැති පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පාසල්වල නම් කවරේද;

(iii) එම පාසල් පද්ධතිය තුළ ඇති විදුලිය නොමැති ගුරු නිවාස සංඛ්‍යාව කොපමණද;

(iv) ඒවා අයත් පාසල්වල නම් කවරේද;

(v) ලී බඩු අවශ්‍යතා ඇති පාසල් සංඛ්‍යාව කොපමණද;

(vi) එම අවශ්‍යතාවන් කවරේද;

(vii) විද්‍යාගාර සහ පුස්තකාල නොමැති පාසල් සංඛ්‍යාව කොපමණද;

(viii) එම පාසල්වල නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) ඉහත සඳහන් අවශ්‍යතා ඉටුකරලීමට අවශ්‍ය ප්‍රතිපාදන එම පාසල් සඳහා වෙන් කර දීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, ඒ කොපමණ කාලයක් තුළදී ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0581/'10

8\.

ගරු රවී කරුණානායක මහතා,— ජාතික උරුමයන් හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමියගෙන් ඇසීමට,—

(අ) (i) පසුගිය වර්ෂ 5 තුළ එක් එක් වර්ෂයේදී සංස්කෘතික ත්‍රිකෝණයට අයත් ප්‍රදේශයේ සංචාරය කිරීමට පැමිණි සංචාරකයින් සංඛ්‍යාව කවරේද;

(ii) සංස්කෘතික ත්‍රිකෝණයට අයත් ප්‍රදේශයේ පිහිටි ඓතිහාසික ස්ථානවලින් උපයන ලද විදේශ විනිමය ප්‍රමාණය කවරේද;

(iii) බෞද්ධාගම ප්‍රවර්ධනය කිරීම සහ සංචාරක වෙළෙඳපල ආකර්ශනය කර ගැනීම සඳහා සංස්කෘතික ත්‍රිකෝණය ප්‍රයෝජනයට නොගන්නේ කවර හේතු නිසාද;

(iv) දැනටමත් එසේ ප්‍රයෝජනයට ගෙන තිබේ නම්, ඒ සම්බන්ධයෙන් ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) බෞද්ධ සංචාරකයෙකුට නැරඹීම සඳහා උනන්දුවක් ඇතිකරවන සුළු ශ්‍රී ලංකාව තුළ පිහිටි වෙනත් ඓතිහාසික ස්ථාන පහක නම් කවරේද;

(ii) ඓතිහාසික වශයෙන් වැදගත් ස්ථාන නගා සිටුවීම සහ සුරැකීම සඳහා ඉහත ක්‍රියාවලිය තුළින් උපයාගත් මුදල් රජය පන්සල්වලට ලබා දෙන්නේද;

(iii) එසේ නම්, පසුගිය වර්ෂය තුළ එසේ මුදල් ලැබූ පන්සල් හෝ වෙනත් ස්ථානයන් කවරේද සහ එම එක් එක් ස්ථානයට ලැබුනු මුදල් ප්‍රමාණය කවරේද;

යන්න එතුමිය සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2010 දෙසැම්බර් මස 10 වැනි සිකුරාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0237/'10

1.

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) හම්බන්තොට දිස්ත්‍රික්කයේ, තංගල්ල කලාප අධ්‍යාපන කාර්යාලයට අයත්, තංගල්ල කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයෙන් පාලනය වන රජයේ පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පාසල්වල නම් කවරේද;

(iii) එම පාසල්වලින් දැනට වසා ඇති හෝ වැසීමට තීරණය කර ඇති පාසල් සංඛ්‍යාව කොපමණද;

(iv) එම පාසල්වල නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මෙම කොට්ඨාසයට අයත් පාසල්වල අතිරික්ත ගුරුවරුන් සිටින්නේද;

(ii) එම පාසල්වල නම් කවරේද;

(iii) ගුරු ඌණතා ඇති පාසල්වල නම් කවරේද;

(iv) ඌණතාවයන් පවතින්නේ කුමන විෂයයන් සඳහාද;

(v) මෙම ගුරු ඌණතා පවතින පාසල් සඳහා ගුරුවරුන් ලබාදීමට කටයුතු කරන්නේද;

(vi) එසේ නම්, ඒ කොපමණ කාලයක් තුළදීද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0465/'10

2.

ගරු නූර්දීන් මෂූර් මහතා,— නැවත පදිංචි කිරීමේ අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) 2007 වර්ෂයේදී නැවත පදිංචි කිරීමේ අමාත්‍යාංශයේ ප්‍රතිපාදනවලින් ඍජු වශයෙන් හෝ එම අමාත්‍යාංශ යෝජනා සැලැස්මක් අනුව වෙනත් අමාත්‍යාංශ ප්‍රතිපාදනවලින් හෝ ක්‍රියාත්මක කළ වැඩ සටහනක් යටතේ, මන්නාරම සහ වව්නියාව යන පරිපාලන දිස්ත්‍රික්කවල අවතැන්වූ ජනතාව නැවත පදිංචි කිරීමේදී, එම එක් එක් පවුලක් සඳහා ලබා දුන් සෙවිලි තහඩු සංඛ්‍යාව කොපමණද;

(ii) එම සෙවිලි තහඩු ලාභීන්ගේ නම්, ලිපිනයන් සහ ඒවා නිකුත් කරන ලද දිනයන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) එම සෙවිලි තහඩු ලබාදීම සඳහා මුදල් වියදම් කළ වැය ශීර්ෂය කුමක්ද;

(ii) ඒ සඳහා වෙන්කරන ලද මුළු මුදල සහ එයින් වියදම් කරන ලද මුදල් ප්‍රමාණය කොපමණද;

යන්න ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0560/10

3.

ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා,— සමූපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) ස.තො.ස. ආයතනයේ සිල්ලර ගබඩා පැය 24 පුරා විවෘතව තැබූ කාල සීමාවේදී එම ආයතනය භාරව කටයුතු කළ අමාත්‍යවරයා කවරෙක්ද;

(ii) එම අමාත්‍යවරයාගේ පෞද්ගලික කාර්ය මණ්ඩලය සඳහා ජනාධිපති ලේකම්ගේ අදාළ චක්‍රලේඛය ප්‍රකාරව අනුමත නිලධාරීන් සංඛ්‍යාව සහ ඔවුන්ගේ තනතුරු නාමයන් කවරේද;

(iii) එම තනතුරු හෙබවූ නිලධාරීන්ගේ නම්, ලිපිනයන්, ලැබූ වැටුප් හා දීමනාවන් වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත අමාත්‍යවරයා අමාත්‍ය පදවිය දැරූ කාල සීමාවේදී ඔහුගේ කාර්ය මණ්ඩලය සඳහා එම අමාත්‍යාංශයෙන්, රාජ්‍ය සංස්ථා සහ ව්‍යවස්ථාපිත මණ්ඩලවලින් හා ස.තො.ස වැනි අනුබද්ධ සමාගම්වලින් අනුයුක්ත කරන ලද නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන්ගේ නම්, ලිපිනයන්, දැරූ තනතුරු, වැටුප්, දීමනා සහ ලැබූ අනෙකුත් වරප්‍රසාද වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම නිලධාරීන් අමාත්‍ය කාර්ය මණ්ඩලයට අනුයුක්ත කිරීමට පෙර සේවය කළ ආයතන හා දැරූ තනතුරු වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0697/'10

4.

ගරු බුද්ධික පතිරණ මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) ගොවි ජනතාවගේ ජීවන තත්වය සුරක්ෂිත කිරීම සඳහා ක්‍රියාත්මක කර ඇති ගොවි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳව එතුමා දන්නෙහිද?

(ආ) (i) දැනට ගොවි විශ්‍රාම වැටුප් ලබන පුද්ගලයින් සංඛ්‍යාව කොපමණද;

(ii) ගොවි ජනතාව ගොවි විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක කර ගනු ලබන ක්‍රමවේදය කවරේද;

(iii) ගොවි විශ්‍රාම වැටුප වශයෙන් මාසයකට එක් පුද්ගලයෙකුට ලබා දෙන මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) දැනට ලැබෙන ගොවි විශ්‍රාම වැටුප පවතින ජීවන වියදම් තත්වය අනුව ප්‍රමාණවත් බව එතුමා පිළිගන්නෙහිද?

(ඈ) (i) දැනට ලබා දෙන ගොවි විශ්‍රාම වැටුප වර්තමාන ජීවන වියදම් තත්වයට ගැලපෙන අයුරින් වැඩි කිරීම සඳහා කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, ගොවි විශ්‍රාම වැටුප වැඩි කරනු ලබන මුදල කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0582/'10

5.

ගරු රවී කරුණානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) මෙරට ක්‍රියාත්මක වන සියලුම බ්‍රෝඩ්බෑන්ඩ් (පුළුල් තරංග මාලා) සේවා සපයන්නන්ගේ නම් කවරේද;

(ii) එම සමාගම්වල හිමිකරුවන්ගේ සහ අධ්‍යක්ෂවරුන්ගේ නම් කවරේද;

(iii) එම බ්‍රෝඩ්බෑන්ඩ් සේවා සපයන්නන් වෙත ලබාදී ඇති තරංගමාලා සංඛ්‍යාතයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) බ්‍රෝඩ්බෑන්ඩ් සේවා සපයන කාර්යාලවල සේවය කරන සේවකයන්ගේ සංඛ්‍යාව කවරේද;

(ii) බ්‍රෝඩ්බෑන්ඩ් සේවා සපයන්නන් සිය මෙහෙයුම් ආරම්භ කළ දිනයන් කවරේද;

(iii) පසුගිය වර්ෂ පහක කාලය තුළ එක් එක් වර්ෂයේදී බ්‍රෝඩ්බෑන්ඩ් සේවා සපයන්නන් විසින් ගෙවන ලද බදු මුදල් ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0609/'10

6.

ගරු මොහාන් ප්‍රියදර්ශණ ද සිල්වා මහතා,— දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) 2008 හා 2009 වර්ෂවලදී දේශීය වෛද්‍ය අවශ්‍යතාවය අනුව මෙරටට ආනයනය කරන ලද ඖෂධ පැළෑටි වර්ග සංඛ්‍යාව කොපමණද;

(ii) එම ඖෂධ පැළෑටි ආනයනය සඳහා ඉහත වර්ෂවලදී දැරූ මුළු වියදම කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම ඖෂධ පැළෑටි මෙරට වගා කිරීම සඳහා ක්‍රියාත්මක වැඩ පිළිවෙළක් තිබේද;

(ii) එසේ නම්, අදාළ ව්‍යාපෘති සඳහා මේවන විට වැය කර ඇති මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0238/'10

7.

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) හම්බන්තොට දිස්ත්‍රික්කයේ, හම්බන්තොට කලාප අධ්‍යාපන කාර්යාලයට අයත්, අම්බලන්තොට කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයෙන් පාලනය වන රජයේ පාසල්වල යටිතල පහසුකම් සහ පොදු අවශ්‍යතාවයන්ගේ ඌණතාවයන් පවතින බැව් එතුමා දන්නෙහිද?

(ආ) (i) එම පාසල් පද්ධතිය තුළ ඇති විදුලිය නොමැති පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පාසල්වල නම් කවරේද;

(iii) එම පාසල් පද්ධතිය තුළ විදුලිය නොමැති ගුරු නිවාස සංඛ්‍යාව කොපමණද;

(iv) ඒවා අයත් පාසල්වල නම් කවරේද;

(v) ලී බඩු අවශ්‍යතා ඇති පාසල් සංඛ්‍යාව කොපමණද;

(vi) එම අවශ්‍යතාවන් කවරේද;

(vii) විද්‍යාගාර සහ පුස්තකාල නොමැති පාසල් සංඛ්‍යාව කොපමණද;

(viii) එම පාසල්වල නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) ඉහත සඳහන් අවශ්‍යතා ඉටුකරලීමට අවශ්‍ය ප්‍රතිපාදන එම පාසල් සඳහා වෙන් කර දීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, ඒ කොපමණ කාලයක් තුළදීද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0583/'10

8.

ගරු රවී කරුණානායක මහතා,— විදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) ශ්‍රී ලංකා රජය විසින් 2009 සහ 2010 වර්ෂයන්හිදී ලොව පුරා පත් කරන ලද ගරු උපදේශකවරුන් සංඛ්‍යාව කවරේද;

(ii) එවැනි පත්කිරීම් සිදු කරන ලද්දේ කවර රටවල් සඳහාද සහ එම පත්වීම් ලබාදීමට හේතු කවරේද;

(iii) පත්වීම් ලබාදීම මගින් ශ්‍රී ලංකාවට ලැබුණු විශේෂ වාසි කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ගරු උපදේශකවරුන් වශයෙන් නව පත්වීම් ලබාදීමට නියමිත තැනැත්තන් සිටිත්ද;

(ii) එම නව පත් කිරීම් ලබාදීම සඳහා කිසියම් නිර්ණායකයක් තිබේද;

(iii) පසුගිය වර්ෂ 10 තුළ කවර හෝ උපදේශකවරයෙකු ඉවත් කරනු ලැබ තිබේද;

(iv) එසේ නම්, ඔවුන්ගේ නම් සහ එසේ ඉවත් කරනු ලැබීමට හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

## දින නියමයක් නොමැති යෝජනා පිළිබඳ දැනුම්දීම

*1.

ගරු අධ්‍යාපන අමාත්‍යතුමා,— ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තියක් සැකසීම සඳහා වන පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව,—

ශ්‍රී ලංකාවේ නිදහස් අධ්‍යාපන ක්‍රමය ක්‍රියාත්මක වීමෙන් පසුව අධ්‍යාපන ක්‍රමය ප්‍රමාණාත්මකව වර්ධනය වී ඇතත් ඊට සාපේක්ෂව අධ්‍යාපනය ගුණාත්මකව සහ ව්‍යුහාත්මකව වර්ධනය නොවීම නිසා ගුරුවරුන්ටත් සිසු දරු දැරියන් සහ දෙමාපියන්ටත් පීඩාකාරීවන වටපිටාවක් නිර්මාණය වී ඇති හෙයින් ද,

එම කරුණට අදාළව අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ විවිධ අකටයුතු හා අසාධාරණකම් මෙන්ම වංචා සහ දූෂණ සිදුවන බවට සමාජ මතයක් නිර්මාණය වී ඇති හෙයින් ද,

සමස්ථ අධ්‍යාපන ක්‍රමයේ සුවිශාල වෙනස්කම් සහ ප්‍රතිසංස්කරණ රැසක් සිදුවිය යුතු බවට පොදු ජන මතයක් ගොඩනැගී ඇති හෙයින් ද,

මහින්ද චින්තන ඉදිරි දැක්මෙහි දක්වා ඇති දැනුම කේන්ද්‍රීය සංවර්ධන උපාය මාර්ගය සැලකිල්ලට ගනිමින්ද,

සමස්ත ලාංකීය ශිෂ්‍ය පරම්පරාවේ අනාගතය නිර්මාණය කිරීමට අදාළ වන ලෙස ළදරු පාසල් අවධියේ සිට විශ්ව විද්‍යාල අධ්‍යාපනය දක්වා සිසුන්ගේ දැනුම, කුසලතා සහ ආකල්ප වර්ධනය කිරීමට අදාළවන පරිදි ජාතික අධ්‍යාපන ක්‍රමයක් සකස් කිරීම කල් දැමිය නොහැකි සහ ජාතික ප්‍රමුඛතාව ලැබිය යුතු කරුණක් හෙයින් ද,

(අ) පෙර පාසල්, ප්‍රාථමික, ද්විතියික සහ තෘතියික අධ්‍යාපනයෙහි ඇති විය යුතු ප්‍රමාණාත්මක, ගුණාත්මක සහ ව්‍යුහාත්මක වෙනස්කම් වේ දැයි සොයා බැලීම පිණිසද,

(ආ) ජාතික, ආගමික සහ සංස්කෘතික හර පද්ධතීන් ආරක්ෂා කිරීම සඳහා අධ්‍යාපන ක්‍රමය තුළ ඇති කළ යුතු වෙනස්කම් පිළිබඳව සොයා බැලීම පිණිසද,

(ඇ) පිරිවෙන් අධ්‍යාපනයේ සිදුවිය යුතු වෙනස්කම් පිළිබඳව සොයා බැලීම පිණිසද,

(ඈ) පළමු ශ්‍රේණියට ළමුන් ඇතුළත් කිරීමේදී නිශ්චිත ක්‍රමවේදයක් තිබේද යන්න සොයා බැලීම පිණිසද,

(ඉ) සියලුම විභාග සහ පරීක්ෂණ ප්‍රතිඵල ඉහළ මට්ටමකට ගෙන ඒම සහ උසස් අධ්‍යාපන සුදුසුකම් නොලබන සිසුන් වෙනුවෙන් අධ්‍යාපන ක්‍රමය තුළ ලබා දිය හැකි විකල්ප ක්‍රියා මාර්ග ඇතිකළ යුතුද යන්න සොයා බැලීම පිණිසද,

(ඊ) විශ්ව විද්‍යාලයට ඇතුල්වීම සඳහා සුදුසුකම් ලැබුවත් ශ්‍රී ලංකාවේ විශ්ව විද්‍යාලයකට ඇතුළත් නොවී විදේශයන්හි අධ්‍යාපනය ලැබීම පිණිස විදේශ ගතවන සිසුන්ට මෙරට තුළදීම අධ්‍යාපන ඉඩ ප්‍රස්ථා ලබා දිය හැකි ක්‍රමවේදයන් වේදැයි සොයා බැලීම පිණිසද,

(උ) අධ්‍යාපන ක්‍රමය ක්‍රියාත්මකවීම තුළ ප්‍රාදේශීය, ජාතීන් සහ ආගමික වශයෙන් පවතින විෂමතා ඉවත් කිරීමට ගතයුතු ක්‍රමවේදයන් කවරේදැයි සොයා බැලීම පිණිසද,

(ඌ) ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති ක්‍රියාත්මක වීමේදී මධ්‍යම රජය සහ පළාත් සභා අතර ඇතිවිය යුතු අන්තර් සම්බන්ධතාවන්හි ස්වභාවය පිළිබඳව සොයා බැලීම පිණිසද,

(එ) අධ්‍යාපන ක්‍රියාවලියේදී, ගුරුවරුන්, ගුරු උපදේශකවරුන්, විදුහල්පතිවරුන්, කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්, කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් සහ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් සමස්ථ අධ්‍යාපනවේදීන්ගේ වගකීම සහ කාර්යය නිශ්චය කිරීම සඳහා ගතයුතු පියවර කවරේදැයි සොයා බැලීම පිණිසද,

පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් පත් කළයුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(2.) (අ) එම කාරක සභාව සහ එහි සභාපති කථානායකතුමා විසින් නම් කළ යුතු වන්නේය.

(ආ) ස්ථාවර නියෝග 95 හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද, කාරක සභාව සාමාජිකයින් විසිඑක් (21) දෙනෙකුට නොවැඩි සංඛ්‍යාවකින් සමන්විත විය යුතු ය.

(ඇ) එහි වාර්තාව එහි පළමු රැස්වීමේ සිට මාස තුනක(03) කාලයක් හෝ පාර්ලිමේන්තුව විසින් දීර්ඝ කෙරෙන එවැනි කාල පරිච්ඡේදයක් තුළ දී පාර්ලිමේන්තුව ඉදිරිපත් කළ යුතුය.

(3.) ඒ කාරක සභාවට,—

(අ) සිය ගණපූරණය නියම කර ගැනීමට බලය තිබිය යුතුය.

(ආ) සිය කාරක සභාව ඉදිරියේ පෙනී සිටින ලෙස යම් තැනැත්තකු කැඳවීමට ද, යම් ලේඛනයක් හෝ වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස යම් තැනැත්තකුට නියම කිරීමට ද, ඉහත සඳහන් කරුණු පූර්ණ ලෙස සලකා බැලීම පිණිස අවශ්‍ය යයි කාරක සභාව කල්පනා කරන ලිඛිත හෝ වාචික සාක්ෂි ලබා ගැනීමට හා භාර ගැනීමට ද බලය තිබිය යුතුය.

(ඇ) කාරක සභාවේ සහාය පිණිස අදාළ ක්ෂේත්‍රයන්හි විශේෂඥ දැනුමක් ඇති පුද්ගලයන්ගේ සහ ප්‍රවීණයන්ගේ සේවය ලබා ගැනීමට ද බලය තිබිය යුතුය.

(ඈ) කලින් කල අන්තර්වාර වාර්තා ඉදිරිපත් කිරීමට ද, පාර්ලිමේන්තුව කල් තබන ලද්දේ වුව ද, රැස්වීම් පවත්වාගෙන යැමට බලය තිබිය යුතු ය.

පා. 37/’10

2.

ගරු රවී කරුණානායක මහතා
ගරු රන්ජන් රාමනායක මහතා
ගරු එච්. එම්. එම්. හරීස් මහතා
ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
ගරු අර්ජුන රණතුංග මහතා
ගරු නිමල් විජේසිංහ මහතා
ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
ගරු ජේ. ශ්‍රී රංගා මහතා
ගරු හරින් ප්‍රනාන්දු මහතා,— රට පුරා පවතින අත්‍යාවශ්‍ය ඖෂධවල උග්‍ර හිඟය පිළිබඳ කරුණු සොයා බලා වාර්තා කිරීම පිණිස වන පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව,—

අත්‍යාවශ්‍ය ඖෂධවල උග්‍ර හිඟයක් රට පුරා පවතින හෙයින් ද,

මෙම හිඟය සඳහා හේතු ගරු සෞඛ්‍ය අමාත්‍යතුමා පාර්ලිමේන්තුවේදී හෙළිදරව් කර ඇති හෙයින් ද,

මෙම තත්වය නිවැරදි කිරීම සඳහා වූ ක්‍රියාමාර්ග කඩිනමින් නොගතහොත්, මහත් ව්‍යසනයක් ඇතිවිය හැකි හෙයින් ද,

(අ) මෙම ඖෂධ හිඟය සඳහා හේතු විමසා බැලීම සඳහාත්;

(ආ) මෙම තත්වයෙන් මිදීම සඳහා අවශ්‍ය කෙටි කාලීන ක්‍රියාමාර්ග නිර්දේශ කිරීම සඳහාත්;

(ඇ) අනාගතයේ මෙබඳු තත්වයක් යළි ඇතිවීම වැළැක්වීමට ගතයුතු ස්ථිර ක්‍රියාමාර්ග නිර්දේශ කිරීම සඳහාත්;

පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් පත් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

2. (අ) එම කාරක සභාව සහ එහි සභාපති කථානායකතුමා විසින් නම් කළ යුතු වන්නේය.

(ආ) ස්ථාවර නියෝග 95 හි විධිවිධානවල කුමක් සඳහන් ව තිබුණ ද, කාරක සභාව සාමාජිකයින් විසි එක් (21) දෙනෙකුට නොවැඩි සංඛ්‍යාවකින් සමන්විත විය යුතු ය.

3. ඒ කාරක සභාවට,—

(අ) සිය ගණපූරණය නියම කර ගැනීමට ද;

(ආ) පුද්ගලයන්, ලිපි ලේඛන හා වාර්තා ගෙන්වා ගැනීමට ද, පාර්ලිමේන්තුව හෝ එබඳු කාරක සභාවක් ඉදිරියේ පෙනී සිටින ලෙස ඕනෑම පුද්ගලයෙකුට නියම කිරීමට ද, එබඳු පුද්ගලයන්ගේ සන්තකයේ හෝ පාලනය යටතේ පවතින යම් ලිපියක්, පොතක්, ලේඛනයක් හෝ වාර්තා ඉදිරිපත් කරන ලෙස නියම කිරීමට ද;

(ඇ) සාක්ෂ්‍යකරුවන් වාචිකව විභාග කිරීමෙන් සත්‍ය අසත්‍යතාව විමසා බැලීමට හෝ අන්‍යාකාරයෙන් තහවුරු කර ගැනීමට ද, කාරක සභාවේ සභාපති හෝ එම කාර්ය සඳහා විශේෂයෙන් බලය පවරනු ලැබූ තැනැත්තෙකු විසින් දිවුරවනු හෝ සහතික කරනු ලැබූ සාක්ෂ්‍යකරුවන් විභාග කිරීමට ද;

(ඈ) කාරක සභාවේ සහය පිණිස අදාළ ක්ෂෙත්‍රයන්හි විශේෂඥ දැනුමක් ඇති පුද්ගලයන්ගේ සහ ප්‍රවීනයන්ගේ සේවය ලබා ගැනීමට ; සහ

(ඉ) කලින් කල අන්තර්වාර වාර්තා ඉදිරිපත් කිරීමට ද, පාර්ලිමේන්තුව කල් තබන ලද්දේ වුව ද රැස්වීම් පවත්වාගෙන යෑමට ද;

බලය තිබිය යුතුය.

4. සිය පළමුවැනි රැස්වීම් දිනයේ සිට මාස 6ක කාලයක් තුළ හෝ පාර්ලිමේන්තුව විසින් වැඩිදුරටත් ලබා දෙන අන් කවර කාල සීමාවක් තුළ කාරක සභාව සිය වාර්තාව ඉදිරිපත් කළ යුතුය.

පා. 38/'10

3.

ගරු රවී කරුණානායක මහතා
ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
ගරු ජේ. ශ්‍රී රංගා මහතා
ගරු රන්ජන් රාමනායක මහතා
ගරු හරින් ප්‍රනාන්දු මහතා
ගරු පාලිත තෙවරප්පෙරුම මහතා
ගරු එච්. එම්. එම්. හරීස් මහතා
ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
ගරු අර්ජුන රණතුංග මහතා
ගරු නිමල් විජේසිංහ මහතා,— කොළඹ නගරය හා තදාසන්න ප්‍රදේශවල යළි යළිත් ජල ගැලීම් ඇති වීමට හේතු සොයා බලා වාර්තා කිරීම පිණිස වන පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව,—

පසුගිය දින ගණනාවක් තුළ කොළඹ මහ නගර සභා බල ප්‍රදේශයේ වැඩි කොටසක් සහ කොළඹ දිස්ත්‍රික්කයේ විශාල කොටස් තදබල ජල ගැලීම් වලට ගොදුරු වී ඇති හෙයින් ද,

මෙය, කොළඹ මහ නගර සභා බල ප්‍රදේශය සහ දිස්ත්‍රික්කය තුළ වෙසෙන පුරවැසියන්ගේ ජීවිත වල නිරන්තරයෙන් යළි යළිත් ඇතිවන ලක්ෂණයක් බවට පත්ව ඇති හෙයින් ද,

මේ පිළිබඳ වගකීම ඇත්තවුන් මෙම තත්ත්වය පාලනය කිරීමට කිසිදු ප්‍රයත්නයක් දරා නොමැති හෙයින් ද,

මෙම ජල ගැලීම් යළි යළිත් ඇතිවීම වැළැක්වීම පිණිස කිසිදු ක්‍රියාමාර්ගයක් ගනු ලැබ නොමැති හෙයින් ද,

කාලයත් සමඟ තත්ත්වය වඩ වඩාත් නරක අතට හැරී ඇති හෙයින් ද,

ජල ගැල්ම පහව යාමෙන් පසුව සියළු දෙයම අමතක කර දැමීමේ ප්‍රවණතාවක් ඇති හෙයින් ද,

මෙය ඉතාමත් අසතුටුදායක තත්ත්වයක් වන හෙයින් ද,

(අ) කොළඹ නගරයේ හා ඒ අවටද, එම දිස්ත්‍රික්කයේ ද යළි යළිත් ජල ගැලීම් ඇතිවීමට හේතු විමසා බැලීමට ද;

(ආ) ඉහත කී පරිදි ජල ගැලීම් ඇති වීම වැළැක්වීමට අවශ්‍ය ක්ෂණික හා කෙටි කාලීන ක්‍රියා මාර්ග පිළිබඳව විමසා බැලීමට ද;

(ඇ) මෙම ගැටළුව යළි යළිත් ඇතිවීම ස්ථිරව ම වැළැක්වීමේ ක්‍රම සහ විධි නිර්දේශ කිරීමට ද;

පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් පත් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

2. (අ) එම කාරක සභාව සහ එහි සභාපති කථානායකතුමා විසින් නම් කළ යුතු වන්නේය.

(ආ) ස්ථාවර නියෝග 95 හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද, කාරක සභාව සාමාජිකයන් විසි එක් (21) දෙනෙකුට නොවැඩි සංඛ්‍යාවකින් සමන්විත විය යුතුය.

3. ඒ කාරක සභාවට,—

(අ) සිය ගණපූරණය නියම කර ගැනීමට ද;

(ආ) පුද්ගලයන්, ලිපි ලේඛන හා වාර්තා ගෙන්වා ගැනීමට ද, පාර්ලිමේන්තුව හෝ එබඳු කාරක සභාවක් ඉදිරියේ පෙනී සිටින ලෙස ඕනෑම පුද්ගලයෙකුට නියම කිරීමට ද, එබඳු පුද්ගලයන්ගේ සන්තකයේ හෝ පාලනය යටතේ පවතින යම් ලිපියක්, පොතක්, වාර්තාවක් හෝ ලේඛනයක් ඉදිරිපත් කරන ලෙස නියම කිරීමට ද;

(ඇ) සාක්ෂ්‍යකරුවන් වාචිකව විභාග කිරීමෙන් සත්‍ය අසත්‍යතාව විමසා බැලීමට හෝ අන්‍යාකාරයෙන් තහවුරු කර ගැනීමට ද, කාරක සභාවේ සභාපති හෝ ඒ එම කාර්යය සඳහා විශේෂයෙන් බලය පවරනු ලැබූ තැනැත්තෙකු විසින් දිවුරවනු හෝ සහතික කරවනු ලැබූ සාක්ෂ්‍යකරුවන් විභාග කිරීමට ද;

(ඈ) කාරක සභාවේ සහාය පිණිස අදාළ ක්ෂේත්‍රයන්හි විශේෂඥ දැනුමක් ඇති පුද්ගලයන්ගේ හා ප්‍රවීනයන්ගේ සහාය ලබා ගැනීමට; සහ

(ඉ) කලින් කල අන්තර්වාර වාර්තා ඉදිරිපත් කිරීමට ද, පාර්ලිමේන්තුව කල් තබන ලද්දේ වුව ද රැස්වීම් පවත්වාගෙන යෑමට ද;

බලය තිබිය යුතුය.

4. සිය පළමුවැනි රැස්වීම් දිනයේ සිට මාස 6ක කාලයක් තුළ හෝ පාර්ලිමේන්තුව විසින් වැඩිදුරටත් ලබා දෙන අන් කවර කාල සීමාවක් තුළ කාරක සභාව සිය වාර්තාව ඉදිරිපත් කළ යුතුය.

පා. 58/’10

4.

ගරු කරු ජයසූරිය මහතා

ගරු ජෝන් අමරතුංග මහතා

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා

ගරු ඩී. එම්. ස්වාමිනාදන් මහතා

ගරු රවී කරුණානායක මහතා

ගරු ජේ. ශ්‍රී රංගා මහතා,— මැතිවරණ නීති සමාලෝචනය කිරීම හා සංශෝධන නිර්දේශ කිරීම සඳහා වන පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව,—

ශ්‍රී ලංකාවේ මැතිවරණ ක්‍රමය ප්‍රතිසංස්කරණය කිරීම සඳහා පසුගිය වර්ෂ ගණනාවක් මුළුල්ලේ විවිධාකාර ප්‍රයත්නයන් දරා ඇති හෙයින්ද,

5 වැනි පාර්ලිමේන්තුව කාලයේදී හා ඉන් අනතුරුව 2006, 6 වැනි පාර්ලිමේන්තුව කාලයේදී ද ඇතුළුව, අවස්ථා ගණනාවකදී මැතිවරණ ප්‍රතිසංස්කරණ පිළිබඳව විමසා බැලීම සඳහා විශේෂ කාරක සභා පත් කරනු ලැබ ඇති හෙයින් ද,

මෙම කාරක සභා විසින් අන්තර්වාර වාර්තා ගණනාවක් ඉදිරිපත් කරනු ලැබ ඇති හෙයින් ද,

මෙම කාරක සභාවල නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොමැති හෙයින් ද,

(අ) මැතිවරණ සම්බන්ධ නීති, විශේෂයෙන්ම ඡන්දදායකයන් ලියාපදිංචි කිරීමේ පනත, පළාත් පාලන මැතිවරණ පනත, පළාත් සභා මැතිවරණ පනත, පාර්ලිමේන්තු මැතිවරණ පනත සහ ජනාධිපති මැතිවරණ පනත හා සමඟ ඉහත කී පනත්වලට වසර ගණනාවක් පුරා සිදුකරන ලද විවිධ සංශෝධනද ඉහත දක්වා ඇති පනත්වල විධිවිධාන වලට අදාළ කරන ලද විශේෂ විධිවිධාන පනත් කෙටුම්පත්ද සමාලෝචනය කිරීමටත්;

(ආ) මෙම පනත් ප්‍රතිශෝධනය කිරීමට, සංශෝධනය කිරීමට හා ඒකාබද්ධ කිරීමට ඇති අවශ්‍යතාව තක්සේරු කිරීමටත්;

(ඇ) මැතිවරණවලට අදාළව දැනට පවත්නා නීති වලට අවශ්‍ය ප්‍රතිසංස්කරණ සහ සංශෝධන නිර්දේශ කිරීමටත්;

පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් පත් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

2. (අ) එම කාරක සභාව සහ එහි සභාපති කථානායකතුමා විසින් නම් කළ යුතු වන්නේය.

(ආ) ස්ථාවර නියෝග 95 හි විධිවිධාන වල කුමක් සඳහන්ව තිබුණ ද, කාරක සභාව සාමාජිකයන් (21) දෙනෙකුට නොවැඩි සංඛ්‍යාවකින් සමන්විත විය යුතුය.

3. ඒ කාරක සභාවට,—

(අ) සිය ගණපූරණය නියම කර ගැනීමට ද;

(ආ) යම් තැනැත්තෙකු කැඳවීමට, යම් ලේඛන හෝ වාර්තා ගෙන්වා ගැනීමට, පාර්ලිමේන්තුව හෝ සිය කාරක සභාව ඉදිරියේ පෙනී සිටින ලෙස යම් තැනැත්තෙකුට නියම කිරීමට හා එබඳු තැනැත්තෙකු සන්තකයෙහි හෝ පාලනය යටතේ පවතින යම් ලේඛනයක්, පොතක්, වාර්තාවක් හෝ ලියවිල්ලක් ඉදිරිපත් කරන ලෙස නියම කිරීමට ද;

(ඇ) සාක්ෂිකරුවන් වාචිකව විභාග කිරීමෙන් සත්‍ය අසත්‍යතාව විමසා බැලීමට හෝ අන්‍යාකාරයෙන් තහවුරු කර ගැනීමට හා කාරක සභාවේ සභාපති හෝ එම කාර්යය සඳහා විශේෂයෙන් බලය පවරනු ලැබූ තැනැත්තෙකු විසින් දිවුරවනු ලැබූ සාක්ෂිකරුවන් විභාග කිරීමට ද;

(ඈ) කාරක සභාවේ සහාය පිණිස අදාළ ක්ෂේත්‍රයන්හි විශේෂඥ දැනුමක් ඇති පුද්ගලයන්ගේ සහ ප්‍රවීනයන්ගේ සේවය ලබා ගැනීමට; සහ

(ඉ) කලින් කල අන්තර්වාර වාර්තා ඉදිරිපත් කිරීමට ද පාර්ලිමේන්තුව කල් තබන ලද්දේ වුවද රැස්වීම් පවත්වාගෙන යෑමට ද;

බලය තිබිය යුතුය.

4. සිය පළමුවැනි රැස්වීම් දිනයේ සිට වර්ෂයක කාලයක් තුළ හෝ පාර්ලිමේන්තුව විසින් වැඩිදුරටත් ලබා දෙන අන් කවර කාල සීමාවක් තුළ කාරක සභාව සිය වාර්තාව ඉදිරිපත් කළ යුතුය.

පා. 61/'10

5.

ගරු කරු ජයසූරිය මහතා
ගරු ජෝන් අමරතුංග මහතා
ගරු (වෛද්‍ය) ජයලත් ජයවර්ධන මහතා
ගරු ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා
ගරු තලතා අතුකෝරල මහත්මිය
ගරු චන්ද්‍රානි බණ්ඩාර ජයසිංහ මහත්මිය,— දහහත්වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම, සමාලෝචනය කිරීමට හා එය ක්‍රියාත්මක කිරීම සඳහා තවදුරටත් සංශෝධන අවශ්‍ය වන්නේද යන්න පිළිබඳව වාර්තා කිරීම පිණිස වන පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව,—

දහහත්වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය 2001 වර්ෂයේදී පාර්ලිමේන්තුව විසින් සම්මත කර සහතික කරන ලද හෙයින් ද;

රාජ්‍ය පරිපාලන සහ අධිකරණ නියෝජිත ආයතන ගණනාවක ස්වාධීනත්වය සහතික කරනු පිණිස වූ වැදගත් විධිවිධාන ගණනාවක් ඉහත කී සංශෝධනයෙහි විධිවිධාන මගින් හඳුන්වාදුන් හා එම විධිවිධානවලට අන්තර්ගත වූ හෙයින් ද;

ඉහත කී සංශෝධන මගින් සාධාරණ හා නිදහස් සමාජයක් සහතික කිරීම චේතනය කරන ලද හෙයින් ද;

දහහත්වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙහි විධිවිධාන උල්ලංඝනය වන බව නිරීක්ෂණය කරනු ලැබ ඇති හෙයින් ද;

(අ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දහහත්වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙහි විධිවිධාන ක්‍රියාත්මක කිරීම සමාලෝචනය කිරීමට ද;

(ආ) එහි විධිවිධාන අනුගමනය කිරීම සහතික කිරීම සඳහා අවශ්‍ය පියවර නිර්දේශ කිරීමට ද;

(ඇ) තවදුරටත් සංශෝධන අවශ්‍ය වන්නේද යන්න සලකා බැලීමට ද;

පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් පත් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

2. (අ) එම කාරක සභාව සහ එහි සභාපති කථානායකතුමා විසින් නම් කළ යුතු වන්නේය.

(ආ) ස්ථාවර නියෝග 95 හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද, කාරක සභාව සාමාජිකයන් විසි එක් (21) දෙනෙකුට නොවැඩි සංඛ්‍යාවකින් සමන්විත විය යුතුය.

3. ඒ කාරක සභාවට,—

(අ) සිය ගණපූරණය නියම කර ගැනීමට බලය තිබිය යුතුය.

(ආ) යම් තැනැත්තෙකු කැඳවීමට, යම් ලේඛන හෝ වාර්තා ගෙන්වා ගැනීමට, පාර්ලිමේන්තුව හෝ සිය කාරක සභාව ඉදිරියේ පෙනී සිටින ලෙස යම්

තැනැත්තෙකුට නියම කිරීමට හා එබඳු තැනැත්තෙකු සන්තකයෙහි හෝ පාලනය යටතේ පවතින යම් ලේඛනයක්, පොතක්, වාර්තාවක් හෝ ලියවිල්ලක් ඉදිරිපත් කරන ලෙස නියම කිරීමට බලය තිබිය යුතුය.

(ඇ) සාක්ෂිකරුවන් වාචිකව පරීක්ෂා කිරීමෙන් සත්‍ය අසත්‍යතාව විමසීමට හෝ අන්‍යාකාරයෙන් තහවුරු කරගැනීමට, කාරක සභාවේ සභාපති හෝ එම කාර්යය සඳහා විශේෂයෙන් බලය පවරනු ලැබූ තැනැත්තෙකු විසින් දිවුරවනු ලැබූ සාක්ෂිකරුවන් විභාග කිරීමට බලය තිබිය යුතුය.

(ඈ) කාරක සභාවේ සහාය පිණිස අදාළ ක්ෂේත්‍රයන්හි විශේෂඥ දැනුමක් ඇති පුද්ගලයන්ගේ සහ ප්‍රවීනයන්ගේ සේවය ලබා ගැනීමටද බලය තිබිය යුතුය.

(ඉ) කලින් කල අන්තර්වාර වාර්තා ඉදිරිපත් කිරීමට ද, පාර්ලිමේන්තුව කල් තබන ලද්දේ වුවද රැස්වීම් පවත්වාගෙන යෑමට බලය තිබිය යුතුය.

4. කාරක සභාව, සිය පළමුවැනි රැස්වීම් දිනයෙහි සිට එක් වර්ෂයක් හෝ පාර්ලිමේන්තුව ලබා දෙන්නාවූ එවැනි අන් කවර හෝ නැතහොත් දීර්ඝ වූ හෝ කාල සීමාවක් තුළ සිය වාර්තාව ඉදිරිපත් කළ යුතුය.

පා. 66/'10

6.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
ගරු කරු ජයසූරිය මහතා
ගරු ජෝන් අමරතුංග මහතා
ගරු රවුෆ් හකීම් මහතා
ගරු මංගල සමරවීර මහතා,— රාජ්‍ය මූල්‍යය පිළිබඳ කාරක සභාව,—

තේරීම් කාරක සභාව විසින් නම් කරනු ලබන සභාපතිවරයකුගෙන් සහ සාමාජිකයන් එකොළොස් දෙනෙකුගෙන් සමන්විත වන්නා වූ ද, එසේ වුවද සභාපතිවරයා විරුද්ධ පාර්ශ්වයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වන්නා වූ ද, රාජ්‍ය මූල්‍යය පිළිබඳ කාරක සභාව යැයි හැඳින්විය යුතු කාරක සභාවක් වන්නේය.

2. (අ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148 වැනි ව්‍යවස්ථාව යටතේ ආදායම් එකතු කිරීම ද;

(ආ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 149(1) ව්‍යවස්ථාව යටතේ ඒකාබද්ධ අරමුදලින් ගෙවීම් කිරීම ද;

(ඇ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 149(1) ව්‍යවස්ථාව යටතේ, නීතිය ප්‍රකාරව විශේෂිත පරමාර්ථ සඳහා රාජ්‍ය අරමුදල් උපයෝජනය කිරීම ද;

(ඈ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 150(1) සහ 150(2) ව්‍යවස්ථාව යටතේ රාජ්‍ය අරමුදල් භාවිතා කිරීම ද;

(ඉ) විසර්ජන පනතේ ඇතුළත් වන විසර්ජනයන් ප්‍රවර්තන වර්ෂය සඳහා ආපසු ගැනීම්, විසර්ජනයන් මාරු කිරීම් සහ අනපේක්ෂිත ශේෂය මාරු කිරීම ද;

(ඊ) ප්‍රවර්තන වර්ෂය සඳහා විසර්ජන පනත ක්‍රියාත්මක කිරීම ද;

(උ) රාජ්‍ය ණය සහ ණය පොලී ගෙවීම ද;

(ඌ) 2003 අංක 2 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ (වගකීම්) පනත යටතේ වාර්තා සහ ප්‍රකාශ ද;

පරීක්ෂා කිරීම එකී කාරක සභාවේ කාර්යය වන්නේය.

3. ඉහත 2 ඡේදයෙහි සඳහන් වන කරුණු වලින් පැන නගින කරුණු සම්බන්ධයෙන් කාරක සභාව වරින් වර පාර්ලිමේන්තුවට වාර්තා කළ යුත්තේ ය.

4. අයවැය ඇස්තමේන්තු කෙටුම්පත් සභාගත කරනු ලැබීමෙන් පසු සති 6ක් ඇතුළත කාරක සභාව, රජයේ ප්‍රතිපත්ති සීමාවන් ඇතුළත නිසි පරිදි මුදල් වැය කරනු ලැබේ ද යන්න සඳහන් කරමින් වාර්තාවක් ඉදිරිපත් කළ යුත්තේය.

5. අයවැය ඉදිරිපත් කරනු ලැබීමෙන් ඉක්බිතිව විසර්ජන පනත් කෙටුම්පත දෙවැනි වර කියවීමෙන් පසු දින 4ක් ඇතුළත කාරක සභාව, සමස්ත ඇස්තමේන්තුගත වියදම් සහ ලැබීම් නිගමනය කිරීමේදී පදනම් වශයෙන් භාවිත කරනු ලබන රාජ්‍ය මූල්‍ය, මූල්‍ය සහ ආර්ථික උපකල්පනයන් පිළිබඳ වාර්තාවක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුත්තේ ය.

පා 67/'10

7.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
ගරු කරු ජයසූරිය මහතා
ගරු ජෝන් අමරතුංග මහතා
ගරු රවුෆ් හකීම් මහතා
ගරු මංගල සමරවීර මහතා,— අධීක්ෂණ ස්ථාවර කාරක සභා,—

(අ) පහත ලැයිස්තුගත කර ඇති පරිදි, තම බල සීමාව යටතට එන විෂයයන්ට අදාළ සියලු පනත් කෙටුම්පත්, යෝජනා, ගිවිසුම්, වාර්තා හා අනෙකුත් කරුණු පරීක්ෂා කිරීමේ බලතල සහ බල සීමාවන් පහත දක්වා ඇති එක් එක් කාරක සභාවට පැවරෙන "අධීක්ෂණ ස්ථාවර කාරක සභා" යනුවෙන් හැඳින්වෙන කාරක සභා පාර්ලිමේන්තුවේ තිබිය යුතු යැයිද,

(ආ) එකී කාරක සභාවල බල සීමාව යටතට එන සියලු පනත් කෙටුම්පත්, යෝජනා, ගිවිසුම්, වාර්තා සහ අනෙකුත් කරුණු පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට ප්‍රථමයෙන් වාර්තා කිරීම සඳහා අදාළ කාරක සභාවලට යොමු කළ යුතු යැයිද,

මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

1. ජාත්‍යන්තර සබඳතා

   ජාත්‍යන්තර වෙළඳාම ඇතුළුව විදේශ රැකියා, ජාත්‍යන්තර සංවිධාන, ජාත්‍යන්තර සම්මේලන සහ ගිවිසුම්, කලාපීය සංවිධාන

2. ජාතික ආරක්ෂාව

   ශ්‍රී ලංකාවේ ආරක්ෂාව ඇතුළුව සන්නද්ධ හමුදා, රහස් තොරතුරු, මහජන නීතිය හා සාමය, පොලිසිය හා ආරක්ෂාව, විදේශීය රටවල් සමඟ සහයෝගීතාව

3. කෘෂිකර්ම සහ ඉඩම්

   වැවිලි කර්මාන්ත, මහවැලි අධිකාරිය, ඉඩම් සහ වාරිමාර්ග ඇතුළුව

4. මානව සම්පත් හා සංස්කෘතිය

   අධ්‍යාපනය, පුහුණුව, තරුණ කටයුතු, ක්‍රීඩා, සංස්කෘතිය හා ආගමික කටයුතු ඇතුළුව

5. මානව ජනාවාස හා බල ශක්තිය

   නාගරික හා ග්‍රාමීය යටිතල ව්‍යුහයක්, මහා මාර්ග, මාර්ග, දුම්රිය, නැව් කටයුතු, ගුවන් සේවා, තැපැල් සහ විදුලි සංදේශ

6. මානව සුබ සාධනය

   සෞඛ්‍යය, සමාජ සුබ සාධනය, දරිද්‍රතාව දුරලීම, අබාධිතයින්, ජ්‍යෙෂ්ඨ පුරවැසි හා ළමා සුබ සාධනය ඇතුළුව

7. අභ්‍යන්තර පරිපාලනය

8. පරිසර හා ස්වාභාවික සම්පත්

ජල කළමනාකරණය, ජලජ සම්පත්, විශේෂිත ආර්ථික කලාපය හා ධීවර කටයුතු ඇතුළුව

9. නෛතික හා කාන්තා කටයුතු

අධිකරණ, මානව හිමිකම්, මාධ්‍ය, කම්කරු, ජාතික ඒකාබද්ධතා හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය ඇතුළුව

(ඇ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි 44(ඇ) සහ 45(1) ව්‍යවස්ථා යටතේ අමාත්‍යාංශ වලට පවරා ඇති විෂයයන්, කාර්යයන්, දෙපාර්තමේන්තු හා ආයතන, ව්‍යවස්ථාදායක අධීක්ෂණ කාර්යය සඳහා පාර්ලිමේන්තුව විසින් යෝග්‍ය ස්ථාවර කාරක සභාවට වෙන් කරනු ලබන්නේය.

2 (අ) (i) (අ) පාර්ලිමේන්තුව විසින් සම්මත කරනු ලබන නීති භාවිතය, පරිපාලනය, ක්‍රියාත්මක කිරීම හා ඵලදායී බව; සහ

(ආ) නව හෝ අතිරේක නීති පැනවීමේ අවශ්‍යතාව හෝ යෝග්‍යතාව දැක්විය හැකි තත්ත්වයන් සහ අවස්ථා;

සම්බන්ධයෙන් සිය විශ්ලේෂණ ඇගයීම් කාර්යයේ දී ද; සහ

(ii) නීති හා අවශ්‍ය සහ යෝග්‍ය විය හැකි පරිදි එවැනි අතිරේක නීති සකස්කිරීමේදී සලකා බැලීමේදී හා නීති පැනවීමේදී හෝ වෙනස් කිරීමේදී ද;

පාර්ලිමේන්තුවට සහාය වීම පිණිස (ආ) ඡේදයෙහි විධිවිධාන සලස්වා ඇති පරිදි එකී විවිධ අධීක්ෂණ ස්ථාවර කාරක සභා වලට පොදු අධීක්ෂණ වගකීම් තිබිය යුත්තේය.

(ආ) කාරක සභාවක බල සීමාවට ඇතුළත් වන විෂයයන්ට අදාළ ව්‍යවස්ථා සම්පාදන ව්‍යාපෘති හා වැඩසටහන් පාර්ලිමේන්තුවේ අභිප්‍රායට අනුකූලව ක්‍රියාත්මක වන්නේද සහ ඉටු වන්නේද යන්න හා ඒවා දිගටම පවත්වා ගත යුතුද, සීමා කළ යුතුද නැතහොත් බැහැර කළ යුතුද යන්න තීරණය කරනු පිණිස සෑම ස්ථාවර කාරක සභාවක්ම අඛණ්ඩ පදනමක් මත—

(i) සිය බලසීමාවට ඇතුළත් වන විෂයයන්ට අදාළ ව්‍යවස්ථා සම්පාදනය ව්‍යාපෘති සහ වැඩසටහන් යෙදවුම, පරිපාලනය, ක්‍රියාත්මක කිරීම හා ඵලදායී බව;

(ii) සිය බලසීමාවට ඇතුළත් වන විෂයයන්ට අදාළ ව්‍යවස්ථා සම්පාදන සහ වැඩසටහන් පාලනය සහ ක්‍රියාත්මක කිරීම සඳහා වගකීම ඇති දෙපාර්තමේන්තු හා ආයතන වල සංවිධානය හා මෙහෙයුම;

(iii) සිය බලසීමාවට ඇතුළත් වන විෂයයන්ට අදාළව නව හෝ අතිරේක ව්‍යවස්ථා පැනවීමේ අවශ්‍යතාව හෝ යෝග්‍යතාව දැක්විය හැකි කවර හෝ තත්ත්වයන් හෝ අවස්ථා (එයට අදාළව පනත් කෙටුම්පතක් හෝ යෝජනාවක් හඳුන්වා දෙනු ලැබ ඇතිව හෝ නැතිව වුවද); සහ

(iv) සිය බල සීමාවට ඇතුළත් වන විෂයයන් පිළිබඳ අනාගත පර්යේෂණ හා පුරෝකථන;

අධීක්ෂණය කළ යුත්තේය.

(ඇ) සෑම කාරක සභාවක්ම විසින් සිය වගකීම් ඉටු කිරීමේදී අවශ්‍ය යැයි හෝ යෝග්‍ය යැයි හෝ එය සලකන පරීක්ෂණ හෝ අධ්‍යයනයන් කවර හෝ අවස්ථාවක සිදු කිරීමට එක් එක් කාරක සභාවට හැකිය.

(ඈ) පාර්ලිමේන්තුවේ පළමු සැසිවාරයෙහි ආරම්භයෙන් පසු සති හයකට නොවැඩි කාලයකදී එක් එක් ස්ථාවර කාරක සභාව, එම පාර්ලිමේන්තුව සඳහා සිය අධීක්ෂණ සැලැසුම සකස් කළ යුත්තේය. එකී සැලසුම පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවට ඉදිරිපත් කළ යුත්තේය. සිය සැලැස්ම සකස් කිරීමේදී එක් එක් කාරක

සභාව, හැකි තාක් දුරට—

(i) එකී ව්‍යවස්ථා සම්පාදන ව්‍යාපෘති, වැඩ සටහන් හෝ නියෝජිතායතන පිළිබඳ සමාලෝචන සිදුකිරීමේදී කාරක සභා අතර උපරිම සම්බන්ධීකරණය සහ සහයෝගය සහතික කිරීමේ අරමුණින් සමාන හෝ සම්බන්ධ ව්‍යවස්ථා සම්පාදන ව්‍යාපෘති, වැඩ සටහන් පිළිබඳ බල සීමාව සහිත අනෙකුත් කාරක සභා හෝ තම බල සීමාවට අයත් නියෝජිතායතන හෝ විමසා බැලිය යුතු අතර එකී සම්බන්ධීකරණය සහ සහයෝගය සහතික කරනු පිණිස ගනු ලැබ ඇති හෝ ගනු ලබන පියවර පැහැදිලි කිරීමක් සිය සැලසුමෙහි අන්තර්ගත කළ යුත්තේය;

(ii) නොපැහැදිලි, අත්තනෝමතික හෝ අර්ථයක් නැති හෝ පුද්ගලයන් මත උග්‍ර මූල්‍ය බර පටවනු ලබන ආණ්ඩුවේ රීති රෙගුලාසි, ව්‍යවස්ථා සහ අධිකරණ තීරණ පිළිබඳව නිශ්චිත ගැටලු සමාලෝචනය කළ යුත්තේය;

(iii) ස්ථිර අය වැය අධිකාරිය හෝ ව්‍යවස්ථාපිත අධිකාරිය හෝ යටතේ ක්‍රියාත්මක වන එකී ව්‍යවස්ථා සම්පාදන ව්‍යාපෘති, වැඩ සටහන් හෝ නියෝජිතායතන පිළිබඳ සමාලෝචන සිය සැලැස්මේ අන්තර්ගත කිරීම සඳහා ප්‍රමුඛතාව ලබා දිය යුත්තේය; සහ

(iv) සිය බල සීමාවට අයත් සියලු වැදගත් ව්‍යවස්ථා සම්පාදන ව්‍යාපෘති, වැඩසටහන් හෝ නියෝජිතායතන සෑම වසර 10 කට වරක්ම සමාලෝචනයකට භාජන කරන බවට සහතික කිරීමට කටයුතු කළ යුත්තේය.

(ඉ) පාර්ලිමේන්තුවේ පළමුවැනි සැසිය ආරම්භයෙන් පසු සති නවයකට නොවැඩි කාලයකදී, කාරක සභා විසින් ඉදිරිපත් කරනු ලැබූ අධීක්ෂණ සැලසුම් සහ එකී අධීක්ෂණ සැලැසුම් වඩාත්ම ඵලදායී ලෙස සම්බන්ධීකරණය සහතික කිරීම සඳහා සහ නැතහොත් මේ අනු ඡේදයේ අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා, එමගින් කිරීමට ඉඩ ඇති යම් නිර්දේශ වේ නම් ඒවාද සමගින්, පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාව පාර්ලිමේන්තුවට වාර්තා කළ යුත්තේය.

3 (අ) කවර හෝ විෂයයක් යම් ස්ථාවර කාරක සභාවකට යොමු කිරීමට පාර්ලිමේන්තුවට හැකිය.

(ආ) අමාත්‍යවරයා යටතේ ඇති විෂයයක්, කර්තව්‍යයක්, දෙපාර්තමේන්තුවක් හෝ ආයතනයක් පිළිබඳ අධිකාරී බලය ඇති අදාළ අධීක්ෂණ ස්ථාවර කාරක සභාවට යම් කරුණක් යොමු කිරීමට අමාත්‍යවරයාට හැකිය.

4 (අ) මෙම ඡේදයේ විධිවිධාන අනුව එම 1(අ) ඡේදය යටතේ නම් කර ඇති අධීක්ෂණ ස්ථාවර කාරක සභාවක් යටතේ ලැයිස්තු ගත කරන ලද විෂයයකට අදාළ සෑම පනත් කෙටුම්පතක්, නියෝගයක්, යෝජනාවක් හෝ අනෙකුත් කරුණක් කථානායකවරයා එයට යොමු කළ යුත්තේය.

(ආ) 1(අ) ඡේදයේ විධිවිධානයක ඇති විෂය කරුණක් සම්බන්ධයෙන් අධිකාරී බලය ඇති එක් එක් කාරක සභාවට එකී විධිවිධානය සලකා බලා ඒ පිළිබඳව පාර්ලිමේන්තුවට වාර්තා කිරීමට හැකිතාක් දුරට හැකිවන ආකාරයට කථානායකවරයා 4(අ) ඡේදය යටතේ කරුණු යොමු කළ යුත්තේය.

(ඇ) කිසියම් කරුණක් යොමුකිරීම සම්බන්ධයෙන් ඉහත (අ) සහ (ආ) ඡේද ක්‍රියාත්මකකිරීමේදී, කථානායකවරයා:—

(i) ප්‍රාථමික බලසීමාව ඇති කාරක සභාවක් නම් කළ යුත්තේය.

(ii) ප්‍රාථමික බලසීමාව ඇති කාරක සභාවේ මතය විමසීම සඳහා කරුණු යොමුකිරීමට පෙර හෝ පසු, එම කරුණු තවත් අතිරේක කාරක සභා එකකට හෝ වැඩි සංඛ්‍යාවකට හෝ යොමු කළ හැකිය.

(iii) යොමුකිරීමක් යෝග්‍ය කාල සීමාවකට යටත් කළ හැකිය; සහ

(iv) යෝග්‍යයැයි හැඟෙන පරිදි එබඳු අනෙකුත් විධිවිධාන සකස් කළ හැකිය.

(ඇ) මතයත්, ප්‍රකාශ කරන කාරක සභාවේ වගකීම් ක්ෂේත්‍ර යටතට ගැනෙන කරුණු පමණක් මතයට විෂය විය යුත්තේය.

(ඉ) ප්‍රාථමික බල සීමා කාරක සභාවේදී සලකා බැලිය යුතු වේ නම්, මතය විමසා සිටින කාරක සභාව ඉල්ලා සිටින කාල සීමාව තුළ එය ලබා දීම සඳහා ප්‍රාථමික බල සීමා අධිකරණය අවසන් කාල සීමාවක් නියම කළ යුත්තේය.

5 (අ) සිය බල සීමාව ක්‍රියාත්මක කිරීම සඳහා කටයුතු කිරීමේදී, එක් එක් කාරක සභාව එකී කාරක සභාව විසින් සලකා බලන ලද එක් එක් විෂයයට අදාළ වාර්තාවක් කථානායකවරයාට ඉදිරිපත් කළ යුත්තේය. එකී වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට කථානායකවරයා කටයුතු කළ යුත්තේය.

(ආ) (i) කිසියම් පනත් කෙටුම්පතක් හෝ නියෝගයක් පිළිබඳව කාරක සභාවක ඕනෑම වාර්තාවක් ක්ෂණික සාධාරණීකරණය අනුව යෝග්‍ය වේ නම් ඒ සමග දැක්වෙන යෝජනාවට යම් කෙටුම්පත් සංශෝධනයක් අවශ්‍ය නම් එයින් සමන්විත විය යුත්තේය.

(ii) කෙටුම්පතක් සඳහා වන එබඳු ඕනෑම සංශෝධනයක්, කාරක සභාවේ සභාපතිවරයා හෝ කාරක සභාව විසින් නම් කරනු ලැබූ එහි වෙනත් සාමාජිකයෙකු විසින් ඉදිරිපත් කරනු ලැබූ සංශෝධනයක් ලෙස, එකී පනත් කෙටුම්පතේ කාරක සභා අවස්ථාවේදී ස්ථාවර නියෝග 56 යටතේ කථානායකවරයා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබේ.

(iii) නියෝගයක් සඳහා වන එබඳු ඕනෑම සංශෝධනයක්, කාරක සභාවේ සභාපතිවරයා විසින් හෝ කාරක සභාව විසින් නම් කරනු ලැබූ එහි වෙනත් සාමාජිකයෙකු විසින් හෝ ඉදිරිපත් කරනු ලබන සංශෝධනයක් ලෙස, කථානායකවරයා විසින් ඉදිරිපත් කරනු ලැබේ.

(ඇ) පාර්ලිමේන්තුව හමුවේ තබන ලද කිසියම් ව්‍යවස්ථාදායක නොවන වාර්තාවක නිර්දේශ, පාර්ලිමේන්තුව විසින් යෝජනාවක් මගින් අනුමත කරනු ලැබිය හැකිය.

6 (අ) එක් එක් කාරක සභාව සිය රැස්වීම් පිළිබඳ දින දර්ශනයක් සකස් කර එය කථානායකවරයා වෙත ඉදිරිපත් කළ යුත්තේය.

(ආ) සෑම කාරක සභාවක්ම මසකට දින දෙකකට නොඅඩු දින ගණනක රැස් විය යුත්තේය. දින දර්ශනය/කාල සටහන කථානායකවරයා විසින් අනුමත කරනු ලැබීමෙන් පසු එක් එක් ස්ථාවර කාරක සභාවේ රැස්වීම් පවත්වනු ලැබිය යුත්තේය.

(ඇ) යම් ස්ථාවර කාරක සභාවක අතිරේක රැස්වීම් පාර්ලිමේන්තුවේ ඉල්ලීම පරිදි හෝ ස්ථාවර කාරක සභාවේ සාමාජිකයන්ගෙන් අඩක් විසින් කරනු ලැබූ ඉල්ලීම පරිදි හෝ කැඳවනු ලැබිය යුත්තේය.

(ඈ) ස්ථාවර කාරක සභාවක් වෙත යොමු කොට ඇති යම් කරුණක ප්‍රගතිය පිළිබඳ වාර්තාවක් ඉදිරිපත් කරන ලෙසට පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගෙන් තුනෙන් එකක සංඛ්‍යාවක් විසින් ලිඛිතව එකී කාරක සභාවෙන් ඉල්ලා සිටිය හැකිය. එවන් ඉල්ලීමක් ලැබී සති දෙකක කාලයක් ඇතුළත එකී කාරක සභාව පාර්ලිමේන්තුව වෙත වාර්තාවක් ඉදිරිපත් කළ යුතු අතර එකී වාර්තාව පාර්ලිමේන්තුවේ සභාභිමුඛ කරනු ලබන්නේය.

7 සෑම ස්ථාවර කාරක සභාවක්ම පාර්ලිමේන්තු කාලසීමාව තුළ ක්‍රියාත්මක වේ.

8 (අ) පහත දැක්වෙන අය හැර අනෙකුත් සියලු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් ස්ථාවර කාරක සභාවන්හි සාමාජිකයින් ලෙස කටයුතු කිරීමට සුදුසුකම් ලබති:

(i) කථානායකවරයා

(ii) නියෝජ්‍ය කථානායකවරයා

(iii) නියෝජ්‍ය කාරක සභා සභාපතිවරයා

(iv) අග්‍රාමාත්‍යවරයා

(v) සභානායකවරයා

(vi) විපක්ෂනායකවරයා

(vii) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(1) ව්‍යවස්ථාව ප්‍රකාරව පත් කරනු ලැබ ඇති කැබිනට් අමාත්‍යවරයන්

(viii) සිය අමාත්‍යාංශවල විෂයයන් හා කාර්යයන් කැබිනට් අමාත්‍යවරයකුගේ විෂය පථය යටතට නොගැනෙන, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 45(1) ව්‍යවස්ථාව යටතේ පත් කරනු ලබන අමාත්‍යවරයන් හෝ 45(4) ව්‍යවස්ථාව යටතේ විෂයයන් හා කාර්යයන් පවරනු ලැබ නොමැති අමාත්‍යවරයන්

(ආ) සුදුසුකම් ඇති සෑම මන්ත්‍රීවරයෙකුම එක් ස්ථාවර කාරක සභාවක සාමාජිකයකු ලෙස කටයුතු කළ යුත්තේය. එම 8(අ)(viii) ඡේදය යටතට නොගැනෙන නියෝජ්‍ය අමාත්‍යවරයන් සහ අමාත්‍යවරයන්, එකී නියෝජ්‍ය අමාත්‍යවරයා හෝ අමාත්‍යවරයා කටයුතු කරන්නේ තම කැබිනට් අමාත්‍යවරයාගේ විෂය පථය යටතට ගැනෙන යම් විෂයයක්, කර්තව්‍යයක්, දෙපාර්තමේන්තුවක් හෝ ආයතනයක් සම්බන්ධයෙන් ද, එකී විෂය පථයන් සහ ඒ හා සම්බන්ධ කාර්යයන්ට පැවරී ඇති යම් ස්ථාවර කාරක සභාවක කටයුතු නොකළ යුත්තේය.

(ඇ) (i) සුදුසුකම් ඇති මන්ත්‍රීවරයන්ගේ ලේඛනයක් කථානායකවරයා විසින් සකස් කළ යුත්තේය.

(ii) සුදුසුකම් ඇති මන්ත්‍රීවරයන්ගේ ලේඛනයේ සංඛ්‍යාත්මක අගය අනුව එක් එක් කාරක සභාවට අයත් ස්ථානය කථානායකවරයා විසින් පාර්ලිමේන්තුව නියෝජනය කරනු ලබන දේශපාලන පක්ෂ හා ස්වාධීන කණ්ඩායම් වෙත ලබා දෙනු ලැබිය යුත්තේය.

(ඈ) පාර්ලිමේන්තුවේ දේශපාලන පක්ෂවල හෝ ස්වාධීන කණ්ඩායම් වල නායකයින් විසින් එක් එක් ස්ථාවර කාරක සභාවේ සාමාජික නාම යෝජනා කථානායකවරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුත්තේය. තේරීම් කාරක සභාවේ අදහස් විමසා බලා කථානායකවරයා විසින් එකී නම් පාර්ලිමේන්තුවට නිවේදනය කරනු ලැබිය යුත්තේය.

(ඉ) 8(ඈ) ඡේදය යටතේ නම් කරන ලද ඕනෑම සාමාජිකයකු එකී ස්ථාවර කාරක සභාවෙන් ඉවත් කරන ලෙසට කථානායකවරයා වෙත ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කිරීමට පාර්ලිමේන්තුව නියෝජනය කරන දේශපාලන පක්ෂයක හෝ ස්වාධීන කණ්ඩායමක හෝ නායකයකුට හැකිය. එවැනි ඉල්ලීමක් ලැබීමෙන් පසු එය පාර්ලිමේන්තුවට දැනුම්දීමෙන් අනතුරුව කථානායකවරයා අදාළ මන්ත්‍රීවරයා එකී කාරක සභාවෙන් ඉවත් කළ යුත්තේය.

(ඊ) (i) සෑම ස්ථාවර කාරක සභාවක්ම සිය පළමු රැස්වීමේදී සහ සභාපති ධූරය පුරප්පාඩු වූ පසු එළඹෙන පළමු රැස්වීමේදී ස්ථාවර කාරක සභාවේ සභාපතිවරයකු පත් කර ගත යුත්තේය.

(ii) අමාත්‍යවරයෙකු හෝ නියෝජ්‍ය අමාත්‍යවරයෙකු ස්ථාවර කාරක සභාවක සභාපති වශයෙන් තෝරා පත් කර ගනු ලැබීමට සුදුසුකම් නොලබන්නේය.

(උ) කාරක සභාවේ රැස්වීම් වලට නොකඩවා තුන් වාරයක් සහභාගී නොවන මන්ත්‍රීවරයෙකු එකී කාරක සභාවේ සාමාජිකත්වය හැර ගියා සේ සලකනු ලබන්නේය.

9 අවශ්‍යයැයි හැඟෙන කරුණු පරීක්ෂා කර බලා කාරක සභාවට වාර්තා කිරීම සඳහා, අවශ්‍යයැයි එය සලකන අවස්ථාවලදී සිය සාමාජිකයන්ගෙන් සමන්විත වන අනු කාරක සභා පත් කිරීමට එක් එක් අධීක්ෂණ කාරක සභාවට හැකිය.

10 අධීක්ෂණ කාරක සභාවක් වෙත යොමු කරන ලද කරුණු අදාළ යොමු කිරීමෙන් මාස 3 ක් ඉකුත් වීමට පෙර පාර්ලිමේන්තුව විසින් සැලකිල්ලට භාජනය නොකළ යුත්තේය. එසේ වුවද, යම් නිශ්චිත කරුණක් පිළිබඳව වාර්තා කිරීමට පාර්ලිමේන්තුව විසින් යෝජනාවක් මගින් අදාළ කාල සීමාව දීර්ඝ කරනු ලැබ ඇති අවස්ථාවකදී එකී කාල සීමාව ඉකුත් වීමෙන් පසු පමණක් එකී කරුණ සලකා බලනු ලැබිය යුත්තේය.

11 පනත් කෙටුම්පතක් හෝ පොදු වැදගත්කමක් ඇති වෙනත් කරුණක් හෝ සම්බන්ධයෙන් කටයුතු කරන ස්ථාවර කාරක සභාවකට, එකී පනත් කෙටුම්පත හේතුවෙන් අගතියට පත්වන පාර්ශවයන්, ඒ සම්බන්ධයෙන් උනන්දුවක් දක්වන පාර්ශවයන් හෝ ඒ පිළිබඳ අත්දැකීම් ඇති පුද්ගලයින් සාක්ෂි සඳහා කැඳවීමට හැකිය.

12\. (අ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 152 ව්‍යවස්ථාවේ සඳහන් පනත් කෙටුම්පතක් හෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට කරනු ලබන සංශෝධනයක් හැර වෙනත් නීතියක් පැනවීම අධීක්ෂණ ස්ථාවර කාරක සභා වාර්තාවක් විසින් නිර්දේශ කරනු ලබන අවස්ථාවකදී එකී පරමාර්ථ සඳහා වාර්තාවේ විශේෂිතව සඳහන් කරනු ලබන කාරක සභාවේ සභාපතිවරයා හෝ වෙනත් සාමාජිකයකු හෝ විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 78 වැනි ව්‍යවස්ථාව ප්‍රකාර, දැනුම් දීමෙන් අනතුරුව, පාර්ලිමේන්තුවේ නියමයකින් තොරව පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවේ දී පළමුවැනි වර කියවීම සඳහා යෝජනාවක් ඉදිරිපත් කරනු ලැබිය හැකිය. පනත් කෙටුම්පතේ පිටපත් යෝජනාව සමග ඉදිරිපත් කළ යුතුය. යෝජනාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමෙන් සති හයක් ඇතුළත ඡන්දයක් සඳහා කථානායකවරයා විසින් එම යෝජනාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබිය යුත්තේය. එසේ වුවද එකී සති හයක කාල සීමාව විසර්ජන පනත් කෙටුම්පතේ දෙවැනි වර කියවීමේ හෝ කාරක සභා අවස්ථාවේ හෝ තුන්වැනි වර කියවීමේ කාල සීමාව තුළ යෙදෙන්නේ නම්, එකී යෝජනාව පාර්ලිමේන්තුව හමුවේ තැබිය යුත්තේ විසර්ජන පනත් කෙටුම්පත සලකා බැලීම අවසන් වූ පසුවය. එකී යෝජනාව පාර්ලිමේන්තුව විසින් අනුමත කරනු ලැබීමෙන් ඉක්බිතිව පනත් කෙටුම් පත පළමුවැනි වර කියවා මුද්‍රණය කිරීම සඳහා නියෝග කරනු ලැබිය යුත්තේය.

එසේ වුවද, එකී පනත් කෙටුම්පත අධීක්ෂණ ස්ථාවර කාරක සභාවේ සාමාජිකයින්ගෙන් 2/3ක සාමාජික සංඛ්‍යාවක් විසින් අනුමත කරනු ලැබිය යුතු අතර එකී සාමාජිකයින්ගේ නම් සමග එය වාර්තා කරනු ලැබිය යුත්තේය.

(ආ) පනත් කෙටුම් පත පළමුවැනි වර කියවා මුද්‍රණය කිරීමට නියෝගය ලබා දීමෙන් අනතුරුව, කථානායකවරයා විසින් එකී පනත් කෙටුම්පත අමාත්‍ය මණ්ඩලය වෙත යොමු කරනු ලැබිය යුතු අතර, අමාත්‍ය මණ්ඩලය විසින් ඒ පිළිබඳ වාර්තාවක් පාර්ලිමේන්තුව වෙත ලබා දෙන තුරු ඒ සම්බන්ධයෙන් තවදුරටත් සාකච්ඡා නොකළ යුත්තේය.

(ඇ) අමාත්‍ය මණ්ඩලය විසින් පාර්ලිමේන්තුව වෙත වාර්තාවක් ලබා දෙනු ලැබීමෙන් පසු හෝ පනත් කෙටුම් පත අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කළ දින සිට මාස දෙකක කාලයක් ඉකුත් වීමෙන් පසු පනත් කෙටුම් පත දෙවැනි වර කියවීම සඳහා නියම කළ යුත්තේය.

13 (අ) පුද්ගලයින්, ලිපි ලේඛන හා වාර්තා කැඳවීමට සෑම ස්ථාවර කාරක සභාවකටම බලතල තිබෙන අතර, ඔවුන් ඉදිරියේ ගනු ලැබූ සාක්ෂි වල කාර්යය සටහන් සමඟ, ඔවුන්ගේ අදහස් හා නිරීක්ෂණයන්ද සහිතව එක් එක් කාරක සභාව පාර්ලිමේන්තුව වෙත වාර්තා ඉදිරිපත් කළ යුත්තේය.

(ආ) ස්ථාවර කාරක සභාවක සාමාජිකයකුගේ විරෝධතාවයක් හෝ වෙනස් මතයක් එකී කාරක සභාවේ වාර්තාවට ඇමිණිය හැකිය.

14 (අ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 152 වැනි ව්‍යවස්ථාවේ දැක්වෙන ව්‍යවස්ථා පැනවීම ස්ථාවර කාරක සභාවක් විසින් නිර්දේශ කරනු ලබන ඕනෑම අවස්ථාවකදී එකී වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමෙන් මාස තුනක කාලයක් ඇතුළත අමාත්‍ය මණ්ඩලය ඒ සම්බන්ධයෙන් සිය මතය ඉදිරිපත් කළ යුත්තේය.

(ආ) ස්ථාවර කාරක සභාවක වාර්තාවක් ව්‍යවස්ථා පැනවීම සම්බන්ධ වාර්තාවක් නොවන අවස්ථාවකදී, එකී වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමෙන් මාස දෙකක් ඇතුළත අමාත්‍ය මණ්ඩලය සිය මතය ඉදිරිපත් කළ යුත්තේය. එවැනි වාර්තාවක් පාර්ලිමේන්තුව විසින් සලකා බලනු නොලබන්නේය.

15 යම් නීතියක් යටතේ යම් ආයතනයක්, සංගමයක්, නිලධාරියෙකු හෝ පුද්ගලයෙකු විසින් පෞද්ගලිකත්වය හෝ රහස්‍යභාවය ආරක්ෂා කළ යුතු අවස්ථාවකදී, අදාළ ස්ථාවර කාරක සභාව එකී නීතිය ප්‍රකාරව කටයුතු කළ යුත්තේය.

16 (අ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155 වැනි ව්‍යවස්ථාව යටතේ සාදනු ලබන මහජන ආරක්ෂාව සම්බන්ධ ඕනෑම නියෝගයක් සම්බන්ධයෙන් වාර්තා කිරීම සඳහා නෛතික හා කාන්තා කටයුතු පිළිබඳ ස්ථාවර කාරක සභාව වෙත යොමුකොට වාර්තාවක් ලබා ගත යුත්තේය. යම් නියෝගයක ලුහුඬු නාමය වෙනත් කාරක සභාවක බල සීමාව යටතේ එන නිශ්චිත විෂයයක් හා සම්බන්ධ වේ නම්, එම 4(ඇ)(ii) ඡේදය යටතේ කථානායකවරයා එකී නියෝග අදාළ කාරක සභාවට යොමු කළ යුත්තේය.

(ආ) (අ) ඡේදය යටතේ කරනු ලබන සඳහනට 7 ඡේදය අදාළ නොවන්නේය.

17 කථානායකවරයාගේ අනුමතිය ලබා ගැනීමෙන් පසුව, වෙනත් කාරක සභා එකක් හෝ වැඩි ගණනක් සමග සාකච්ඡා පැවැත්වීමට ඕනෑම අධීක්ෂණ ස්ථාවර කාරක සභාවකට හැකිය.

18 කවර හෝ විසර්ජනයන් හෝ වැය නොකරන ලද ශේෂයක් පැවරීම පිළිබඳව, මුදල් අමාත්‍යාංශයේ ලේකම්, අයවැය අධ්‍යක්ෂ සහ අදාළ අමාත්‍යාංශයේ ලේකම් රාජ්‍ය මූල්‍ය කාරක සභාවට වහාම දැනුම් දිය යුත්තේය.

19 බල සීමාව යන්නෙන් ව්‍යවස්ථාදායක අධීක්ෂණ බල සීමාව අදහස් වන අතර අනු ව්‍යවස්ථාවන් සම්බන්ධයෙන් වන බල සීමාවද ඊට ඇතුළත් වේ.

ඕනෑම විසර්ජනයක් හෝ වැය නොකරන ලද ශේෂයක් හෝ මාරු කිරීමේදී අදාළ අමාත්‍යාංශයේ ලේකම් ඒ බැව් වහාම අදාළ අධීක්ෂණ කාරක සභාව වෙත දැනුම් දිය යුත්තේය.

20. 8(අ) හා (ඊ)(ii) ඡේද රාජ්‍ය ගිණුම් කාරක සභාවට සහ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවට අදාළ වන්නේය.

* සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.